207 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 207 - இல. 3
**Volume 207 - No. 3**

2012 පෙබරවාරි 24 වන සිකුරාදා
2012 பெப்ரவரி 24, வெள்ளிக்கிழமை
**Friday, 24th February , 2012**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය :**
උපාධිධාරී අභ්‍යාසලාභීන් බඳවා ගැනීම

**ශෝක ප්‍රකාශය :**
ගරු රූපසේන කරුණාතිලක මහතා
එස්. සිවදාසන් මහතා

**කල්තැබීමේ යෝජනාව :**
රජයට එරෙහි ජාතික හා ජාත්‍යන්තර කුමන්ත්‍රණ පරාජය කිරීම

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**
பட்டதாரிப் பயிலுனர் ஆட்சேர்ப்பு

**அனுதாபத் தீர்மானம்:**
மாண்புமிகு ரூபசேன கருணாதிலக
மாண்புமிகு எஸ். சிவதாசன்

**ஒத்திவைப்புப் பிரேரணை:**
அரசுக்கெதிரான தேசிய மற்றும் சர்வதேச சதித்திட்டங்களை முறியடித்தல்

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Recruitment of Graduate Trainees

VOTE OF CONDOLENCE:
Hon. Rupasena Karunatillake
Hon. S. Sivathasan

ADJOURNMENT MOTION:
Defeating National and International Conspiracies against Government

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2012 පෙබරවාරි 24 වන සිකුරාදා***
*2012 பெப்ரவரி 24, வெள்ளிக்கிழமை*
*Friday, 24th February, 2012*

***පාර්ලිමේන්තුව අ. භා.1.30ට රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி.ப. 1.30 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.30 p.m.,* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 70 ආ වගන්තිය යටතේ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 පෙබරවාරි 22 දිනැති අංක 1746/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.- [උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු එස්.බී. දිසානායක මහතා]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, එය පිළිගැන්වීමට පමණයි මේ අවස්ථාවේදී අවසර තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා ළඟදී විවාදයක් දෙනවාද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා විවාදයක් ඉල්ලන්න. එවිට ලබා දෙන්න කටයුතු කරන්න පුළුවන්.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

අමාත්‍ය මණ්ඩලයේ විධානයන්ට අනුකූලව 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 40වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 51 වැනි වගන්තිය යටතේ පරිසර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 ජූනි 07 දිනැති අංක 1709/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග.- [පරිසර අමාත්‍ය ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Child Development and Women's Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම 2007 සහ 2008 වර්ෂ සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා ළමා සංවර්ධන හා කාන්තා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2009 වර්ෂය සඳහා ජාතික ශිල්ප සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2008-2009 සහ 2009-2010 වර්ෂ සඳහා ලෝක්සී සමාගමේ වාර්ෂික ගිණුම් සහ විගණන වාර්තා

මෙම වාර්තා සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர - புனர்வாழ்வளிப்பு, சிறைச் சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. Chandrasiri Gajadeera - Minister of Rehabilitation and Prison Reforms)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම 2007 සහ 2008 වර්ෂ සඳහා තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ වාර්ෂික වාර්තා සහ ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කරමි.

මෙම වාර්තා පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා - පැමිණ නැත.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දර්ගා නගරය, පොල්දූව, අංක 63හි පදිංචි පී.ජී. කොට්ටහච්චි මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා (බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன - பௌத்த சாசன, மத அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. M.K.A.D.S. Gunawardana - Deputy Minister of Buddha Sasana and Religious Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පානදුර, අළුබෝමුල්ල, පෝච් පාර්ක් කෝනර්, බෝධිරුක්ඛාරාම පාරහි පදිංචි එන්.එල්.ඩී. හෙට්ටිආරච්චි මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු අචල ජාගොඩගේ මහතා**
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගොඩකවෙල, පල්ලෙගම, කඩේ වලව්වහි පදිංචි එම්.එම්.එල්. විශාඛා කුමාරිහාමි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හපුතලේ, යහලබැද්ද, "වාන්දනී" හි පදිංචි ඩබ්ලිව්.එම්.එන්. වීරසේකර මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය - පැමිණ නැත.

ගරු හුනෙයිස් ෆාරුක් මහතා - පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### "රැකියා පියස" ව්‍යාපෘති සේවකයන් : වැටුප්
### `ரெகியா பியச' கருத்திட்ட ஊழியர்கள் : சம்பளம்
### EMPLOYEES OF "REKIYA PIYASA" PROJECT : SALARIES

1575/'11

3. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
එළදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2003 වර්ෂයේදී කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ රැකියා පියස නම් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද බවත්;

(ii) මෙම ව්‍යාපෘතියට අනුයුක්ත සේවකයින් 2003 වර්ෂයේ සිට මේ දක්වා කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන බවත්;

(iii) මේ වනවිට මාස කිහිපයක සිට එම සේවකයින් සඳහා වැටුප් ගෙවීම පවා නතර කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම සේවක පිරිස සඳහා කඩිනමින් වැටුප් ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රැකියා පියස යටතේ බඳවා ගන්නා ලද සේවක පිරිස මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවට අනුයුක්තකර ස්ථිර කිරීමේ සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(iii) එසේ අනුයුක්ත කිරීමක් කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வினைத்திறன் மேம்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2003ஆம் ஆண்டில் தொழில் உறவுகள், மனித வலு அமைச்சில் `ரெகியா பியச' எனும் கருத்திட்டமொன்று ஆரம்பிக்கப்பட்டது என்ப தையும்;

(ii) மேற்படி கருத்திட்டத்தில் இணைக்கப்பட்டுள்ள ஊழியர்கள் 2003 ஆம் ஆண்டு முதல் இன்று வரை, ஒப்பந்த அடிப்படையில் பணிபுரி கிறார்கள் என்பதையும்;

(iii) தற்போது சில மாதங்களாக, மேற்படி ஊழியர் களுக்கு சம்பளம் வழங்குவதும் நிறுத்தப் பட்டுள்ளது என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) இந்த ஊழியர்களுக்கு விரைவாக சம்பளம் வழங்குவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், அத்திகதி யாது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) `ரெகியா பியச'வின் கீழ் ஆட்சேர்க்கப்பட்ட ஊழியர்களை மனிதவலு, வேலைவாய்ப்புத் திணைக்களத்தில் இணைத்து, நிரந்தரமாக்கு வதற்கான திட்டமொன்று உள்ளதா என்ப தையும்;

(ii) ஆமெனில், அந்த முறைமை யாது என்பதையும்;

(iii) இணைத்துக்கொள்ளப்படுமாயின், அந்தத் திகதி யாது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Productivity Promotion:

(a) Is he aware that-

(i) a project named "Rekiya Piyasa" (JobsNet) was started under the Ministry of Labour Relations and Manpower in year 2003;

(ii) the employees attached to this project have been working on contract basis since 2003 up to now; and

(iii) even the payment of salaries of those employees have been stopped for a few months?

(b) Will he inform-

(I) whether action will be taken to pay the salaries of these employees expeditiously; and

(ii) if so, the date on which their salaries will be paid?

(c) Will he inform this House-

(i) whether there is a plan to attach the employees who were recruited under "Rekiya Piyasa" (JobsNet) to the Department of Manpower and Employment and confirm them in their service;

(ii) if so, what that plan is; and

(iii) if they are going to be attached to the aforesaid Department, the date on which it will be done?

(d) If not, why?

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - வினைத்திறன் மேம்பாட்டு அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - Minister of Productivity Promotion)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) දනිමි.

(ii) පිළිනොගනිමි. රැකියා පියස ආයතනයට බඳවා ගත් කොන්ත්‍රාත් සේවකයන් අතුරින් තුන් දෙනෙක් පමණක් 2011.12.31 දින වන විට සේවයේ යෙදී සිටි අතර එම අයගේ කොන්ත්‍රාත් කාලය එදිනෙන් අවසන් විය. ඒ අනුව, මේ වන විට රැකියා පියස ආයතනයෙහි කොන්ත්‍රාත් පදනම මත කිසිදු සේවකයකු නොමැත.

(iii) පිළිනොගනිමි. 2011.12.31 දින වන විට රැකියා පියස ආයතනයේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ලද්දේ තිදෙනෙක් පමණකි. එම තිදෙනා සඳහා 2011 දෙසැම්බර් මාසය දක්වා වූ සියලු වැටුප් මේ වන විට ගෙවා අවසන් කර ඇත. 2011 දෙසැම්බර් මාසයෙන් පසු එම කාර්ය මණ්ඩලය සේවයේ යොදවා නොමැති බැවින් වැටුප් ගෙවීමේ අවශ්‍යතාවයක් නොමැත.

(ආ) (i) අදාළ නැත.

(ii) අදාළ නැත.

(ඇ) (i) අදාළ නැත .

(ii) අදාළ නැත.

(iii) අදාළ නැත.

(ඈ) අදාළ නැත .

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. රැකියා පියස හා බැඳුණු වැඩ පිළිවෙළ ඉදිරියටත් පවත්වාගෙන යන්න රජයේ බලාපොරොත්තුවක් තිබෙනවාද? එහෙම නම් දැනට ඉන්න සේවකයෝ ප්‍රමාණවත්ද? නැත්නම් ඒ සම්බන්ධයෙන් තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද?

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

දැනට රැකියා පියසේ සේවකයෝ නැත.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඒ ආකාරයේ වැඩ පිළිවෙළක් ගෙන යන්න ඔබතුමන්ලාගේ බලාපොරොත්තුවක් තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ගරු මන්ත්‍රීතුමා මිනිත්තුවක් මට ඉඩ දෙන්න.

2010.01.01 දින මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව පිහිටෙව්වා. 2011.05.04 දින අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව, මේ ආයතනයේ විෂය පථයට රැකියා පියස ඇතුළත් කළා.

මිනිස් බල සහ රැකී රක්ෂා දෙපාර්තමේන්තුවට රටේම විසිරුණු ජාලයක් තිබෙනවා. ඒ කියන්නේ මානව සම්පත් නිලධාරීන් හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම සේවය කරනවා. ඒ වාගේම මහ දිසාපති කාර්යාලවලත් නිලධාරීන් දෙන්නා බැගින් සේවය කරනවා. එම නිසා මේ කාර්යය අපට වැඩි වියදමක් නැතිව, ඒ අය තුළින් කර ගන්න පුළුවන් ක්‍රමවේදයක්

[ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා]

දැන් සකසා ගෙන යනවා. එතකොට අපට විශාල වියදමක් කරන්න අවශ්‍ය වන්නේ නැහැ. මොකද, මේ මොහොතේත් ඒ සඳහා රජයේ නිලධාරින් පිරිසක් සේවයේ යෙදිලා ඉන්න නිසා. ඔවුන්ගෙන් ඒ වැඩ කොටස ගන්න තමයි මේ ක්‍රමවේදය හදලා තිබෙන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රැකියා පියස වැඩ පිළිවෙළ ආරම්භ කළේ පෞද්ගලික අංශයේ රැකියා ලෝකයට තරුණ පිරිස එකතු කරන්නයි. අවසානයේදී සිද්ධ වුණේ, මේ ආයතනයේ කොන්ත්‍රාත් පදනමෙන් වැඩ කළ, රටට රක්ෂා සොයලා දෙන්න මුල් වුණ තරුණ පිරිසට ඒ කොන්ත්‍රාත් පදනමේ රැකියාවත් නැති වීමයි.

මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. රැකියා පියස වැඩ පිළිවෙළ තුළ තිබුණේ, පෞද්ගලික අංශයෙන් රැකියා එකතු කරලා, රැකියා අවශ්‍යතා තිබෙන අයව ඒ රැකියාවලට යොමු කරන එක.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ඔව්

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මේ ක්‍රමවේදය සඳහා අන්තර් ජාලය සහ නූතන තාක්ෂණවේදය භාවිත කළා.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ඔව්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

නමුත් ඔබතුමා කියන ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ, මේ කටයුත්ත කලින් සිදු කළ ආකාරයටම කාර්යක්ෂමව සිදු කරන්න පුළුවන් කියලා ඔබතුමා විශ්වාස කරනවාද?

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ගරු මන්ත්‍රීතුමා, ඇත්තටම මේ ආයතනය පටන් ගත්තේ ස්වපිරිවැය ක්‍රමයකට. ඒ කියන්නේ තමන් උපයා ගෙන ආයතනය ගෙන යන ක්‍රමයකට. අපි online service එක ඉතාම ඉක්මනින් පටන් ගන්නවා. මෙහිදී සිදු වුණේ මේකයි. රැකියා ලබා ගන්න පිරිසක් ඉන්නවා. රැකියා ලබා දෙන්න පිරිසක් ඉන්නවා. රැකියා ගත්ත කට්ටිය කියන්නේත් නැහැ රැකියාවක් ලැබුණා කියලා. රැකියාව ලබා දුන්න කෙනා කියන්නේත් නැහැ රැකියාවක් ලබා දුන්නා කියලා. තමුන්නාන්සේ දන්නවා ඒ ගැන. රැකියාව ලබා ගත්ත කෙනා කවදාවත් කියන්නේ නැහැ රැකියාවක් ලැබුණා කියලා. මොකද, ඔහු ටික දවසක් බලා ගෙන ඉන්නවා වෙනින් තැනකට යන්න පුළුවන්ද කියලා.

ඒ නිසා කිසිම තැනක ඒ පිළිබඳ වාර්තාවක් නැහැ. කිසිම කෙනෙකු වාර්තාවක් දෙන්නේත් නැහැ. අපි පසු ගිය අවුරුදු ගණන තුළම මේ කරුණු හොයලා බැලුවා. රැකියා දෙන ආයතන අතරින් ඉතා අතළොස්සක් තමයි රැකියාවක් දුන්නා කියලා අමාත්‍යාංශය, රැකියා පියස දැනුවත් කරලා තිබෙන්නේ. ඒ අනුව මේ වැඩ පිළිවෙළ කර ගෙන යන්න බොහොම අමාරුයි. මේක හොඳ වැඩ පිළිවෙළක්. නමුත් ප්‍රායෝගිකව කරගෙන යන්න බැහැ. එම නිසා ඇමති මණ්ඩලයේ තීන්දුව තීරණය අනුව අපේ තිබෙන ජාලය තුළට මේ වැඩ පිළිවෙළ ඇතුළත් කෙරුවා. ඒ නිසා තිබුණාට වඩා පහසුවෙන් වඩාත් හොඳට ඒ කටයුත්ත කරගෙන යන්න පුළුවන්. මොකද, ඒ කාර්යාලවල ඉන්න මානව සම්පත් නිලධාරින් -ඒ ඒ ප්‍රදේශවල ඉන්න මානව සම්පත් නිලධාරින්- රැකියා හොයා ගත්තාට පස්සේ, අපි ප්‍රධාන කාර්යාලයෙන් online service එකට දෙනවා. ඒකෙන් අපි ආදායමක් බලාපොරොත්තු වෙන්නේ නැහැ. ආදායමක් බලාපොරොත්තු වුණොත් මේ වැඩේ කරන්න බැහැ. නමුත් මෙයට ඉස්සෙල්ලා මේ වැඩේ පටන් ගත්තේ ආදායමක් ඇතිව කරගෙන යන්නයි. ආදායමක් බලාපොරොත්තුවෙන් කර ගෙන යන්න නම්, රැකියාව ලබන කෙනාගෙන් මුදලක් ගන්න ඕනෑ. ඒ වාගේම රැකියාව දෙන කෙනාගෙනුත් මුදලක් ගන්නත් ඕනෑ. නමුත් ඒක කරන්න බැහැ. දැන් රජයෙන් ඒ කටයුත්ත කරන හන්දා අපි මුදලක් බලාපොරොත්තු වන්නේ නැහැ. අපි නොමිලේ සේවයක් කරනවා. තව ටික දවසකින් මෙය රටේ බරපතළ අවශ්‍යතාවක් වෙනවා. මේ වැඩ කටයුතු ටික තව මාස තුනක් විතර යද්දී අපට බොහොම හොඳින් ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ අවසාන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාට අවශ්‍ය නම් ඔය පැත්තට අදාළ විස්තර එවන්නත් පුළුවන්.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එවන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විධියට මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ඉදිරිපත් කරපු අමාත්‍ය මණ්ඩල සන්දේශයක ඡායා පිටපතක් මගේ අතේ තිබෙනවා. එහි සඳහන් වෙලා තිබෙනවා, "2011 වර්ෂයේ සිට වාර්ෂිකව දිස්ත්‍රික් රැකියා මධ්‍යස්ථාන පවත්වාගෙන යෑම සඳහා මිනිස් බල හා රැකියා දෙපාර්තමේන්තුවට රුපියල් දසලක්ෂ අටක අතිරේක ප්‍රතිපාදන භාණ්ඩාගාර අරමුදලෙන් ලබා ගැනීම, රැකියා පියස මූල්‍යමය බැඳීම් නිරවුල් කිරීම හා ප්‍රතිව්‍යුහගත කිරීමේ මූලික වියදම් දැරීම වෙනුවෙන් රුපියල් දසලක්ෂ 15ක භාණ්ඩාගාර අරමුදල් ලබා ගැනීම" යනුවෙන්. ඒ වාගේම මෙහි පැහැදිලිව කියනවා, "2012 වර්ෂයේ සිට මධ්‍ය කාලීන අය වැය රාමුව යටතේ වාර්ෂිකව අය වැය දෙපාර්තමේන්තුවට මේ යෝජනා ඇතුළත් කරන්න කටයුතු කරනවා" කියලා. එහෙම නම් ඒ තුළින් ලබා ගන්නා මුදල් යොදවන්නේ ඔබතුමා කියපු කාරණයකටද? එහෙම නැත්නම් වෙනම ඒකකයක් ගොඩ නඟන්නද?

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ඒ ලැබුණු මුදල්වලින් කළේ මොනවාද කියලා දන්නවාද? අපි ළඟ තිබෙන වාර්තාවල හැටියට පරණ ණය වශයෙන් රුපියල් මිලියන 13ක් ගෙවන්න තිබුණා. තවත් මුදලක් ගෙවන්න

තිබෙනවා. ඒ මුදල ගෙවන්න තවත් මුදලක් ලබා ගන්න ඕනෑ. ඒ මුදල් ගෙවන්න සිද්ධ වුණේ පරණ ණය වෙනුවෙන්. මෙම අමාත්‍යාංශය මම අලුතින් භාර ගනිද්දී,-

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මම ඔබතුමාට බාධා කරනවා නොවෙයි ගරු ඇමතිතුමා. ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ ඉන්න කොට, ඒ ආණ්ඩුව කාලයේදී තමයි රැකියා පියස වැඩ පිළිවෙළ ආරම්භ කළේ. විශේෂයෙන් මාතර රැකියා පියස මධ්‍යස්ථානය.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
නැහැ, ඔබතුමා වැරැදියි. ඒක පටන් ගත්තේ 2003 දී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
දැන් ඔබතුමා කියනවා නම් මේ කටයුතු දුර්වලයි කියලා, ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමන්ලාට තමයි එහෙම කියන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා, මේක සංවාදයකට අවස්ථාවක් නොවෙයි. ඔබතුමා ප්‍රශ්නය අහන්න. ගරු ඇමතිතුමා උත්තර දෙයි.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා, මේක කාටවත් ඇඟිල්ල දිගු කළ යුතු කාරණයක් නොවෙයි. බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා, මෙතැන තිබෙන ප්‍රශ්නය මොකක්ද දන්නවාද? මේ වැඩ පිළිවෙළට කාර්යාල ගත්ත නිසා රජයට විශාල වියදමක් දැරීමට සිදු වෙලා තිබෙනවා. හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම අපේ නිලධාරින් ඉන්න නිසා ඔවුන් තුළින් අපට ඒ කාර්යාල සඳහා යන වියදම ගොඩක් අඩු කර ගන්න දැන් පුළුවන් වෙලා තිබෙනවා. කැබිනට් මණ්ඩලයෙන් මේ තීන්දුව ගන්න ප්‍රධාන හේතුව ඒකයි. මූල්‍යමය වශයෙන් යම් මුදලක් අපට ලබා දීලා තිබෙනවා තමයි. ඒකෙන් යම් යම් ණය ගෙවන්න තිබෙනවා. කුලිය වශයෙන් පරණ කාර්යාලවලට විශාල මුදලක් ගෙවන්න තිබෙනවා. ඒ වාගේම විදුලි බිල් පත් ගෙවන්න තිබෙනවා. ඒවා ගෙවන්න තමයි මේ මුදල අපට ලබා දීලා තිබෙන්නේ. ඒවා ගෙවීමෙන් පස්සේ අපට මුදලක් අවශ්‍ය වන්නේ නැහැ. මේ තිබෙන ක්‍රමවේදය තුළින්ම ඉදිරියේදී අපට මේ කටයුතු දියත් කරන්න පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒ කියන්නේ ඔබතුමාට පිටු පස පේළියේ ඉන්න ඇමතිතුමා හරියට වැඩේ පටන් අරගෙන නැහැ කියන එකද?

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
නැහැ, නැහැ. ඒක වැරැදියි.

ගරු බුද්ධික මන්ත්‍රීතුමා, ගමේ ප්‍රශ්න මෙතැනට ගේන්න එපා. ගමේ ප්‍රශ්න ගේන්න එපා. වැඩේ හොඳට සිද්ධ වෙලා තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගමේ ප්‍රශ්න නොවෙයි. [බාධා කිරීමක්]

## දික්ඕවිට ධීවර වරාය ඉදි කිරීම: අරමුදල්
## திக்ஓவிட்ட கடற்றொழில் துறைமுக நிர்மாணம்: நிதி
## CONSTRUCTION OF DIKOVITA FISHERIES HARBOUR : FUNDS

1729/'11

6. **ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දික්ඕවිට ධීවර වරාය ඉදි කිරීම සඳහා කැබිනට් අනුමතිය ලැබී තිබේද;
(ii) එසේ නම්, එම අනුමතිය ලද දිනය කවරේද;
(iii) වරාය ඉදි කිරීම සඳහා අරමුදල් සපයා ගනු ලබන ආකාරය සහ අවශ්‍ය මුළු මුදල කවරේද;
(iv) එයින් ආධාර ලෙස ලැබෙන මුදල හා ණය වශයෙන් ලබා ගන්නා මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;
(v) ලබා ගන්නා ණය මුදලේ පොලී අනුපාතිකය හා ආපසු ගෙවිය යුතු කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ධීවර වරායේ ඉදි කිරීම් කටයුතු ලබා දුන් සමාගම කවරේද;
(ii) එම සමාගම තෝරා ගනු ලැබූ ක්‍රමවේදය කවරේද;
(iii) සමාගම තෝරා ගැනීමේදී ටෙන්ඩර් කැඳවන ලද්දේ නම්, අනෙකුත් සමාගම් ඉදිරිපත් කරන ලද මිල ගණන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திக்ஓவிட்ட கடற்றொழில் துறைமுகத்தை அமைப்பதற்கு அமைச்சரவையின் அங்கீகாரம் கிடைத்துள்ளதா என்பதையும்;
(ii) ஆமெனில், அந்த அங்கீகாரம் கிடைத்த திகதி யாதென்பதையும்;
(iii) துறைமுகத்தை அமைப்பதற்காக நிதியை பெற்றுக்கொள்ளும் விதம் மற்றும் தேவையான மொத்தப் பணத்தொகை யாதென்பதையும்;
(iv) இதில் உதவியாக கிடைக்கும் பணத்தொகை மற்றும் கடனாக பெற்றுக்கொள்ளும் பணத் தொகை தனித்தனியே யாதென்பதையும்;
(v) பெறப்படும் கடன் தொகையின் வட்டி வீதம் மற்றும் மீளச் செலுத்த வேண்டிய காலம் யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

[ගරු අනුර දිසානායක මහතා]

(ஆ) (i) கடற்றொழில் துறைமுகத்தின் நிர்மாணிப்புப் பணிகள் வழங்கப்பட்ட கம்பனி யாதென் பதையும்;

(ii) மேற்படி கம்பனி தேர்ந்தெடுக்கப்பட்ட முறைமை யாதென்பதையும்;

(iii) கம்பனியை தேர்ந்தெடுக்கின்றபோது கேள்விப் பத்திரம் கோரப்பட்டிருப்பின், ஏனைய கம்பனிகள் முன்வைத்த விலைகள் யாவை யென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development :

(a) Will he state-

(i) whether cabinet approval has been given for the construction of the fisheries harbour at Dikovita ;

(ii) if so, the date on which the above mentioned cabinet approval was granted ;

(iii) the sources that provide funds for the construction of the harbour and the total amount of money required ;

(iv) separately, the amount received as aid and amount of money received as a loan out of the aforesaid amount of money ; and

(v) the interest rate of the loan obtained and the repayment period?

(b) Will he inform this House of-

(a) the company to which the construction work of the harbour was assigned ;

(b) the system followed in selecting the aforesaid company ; and

(c) the bids offered by the other companies, if tenders were called in selecting the aforesaid company?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) 2007 දෙසැම්බර් මස 19 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත.

(iii) අරමුදල් -

* නෙදර්ලන්ත රජයේ ORET වැඩසටහනේ ප්‍රදාන

* HSBC බැංකුවේ ණය මුදල්

* ලංකා රජයේ මුදල් ප්‍රතිපාදනවලින් අරමුදල් සපයාගෙන ඇත.

මුළුමුදල - යුරෝ මිලියන 53

(iv) ආධාර ලෙස යුරෝ මිලියන 17.3 (මින් යුරෝ මිලියන 06ක් ණය මුදලෙහි පොලී ගෙවීම සඳහා වෙන් කර ඇත.) එම නිසා ආධාර මුදලින් යුරෝ මිලියන 11.3ක් පමණක් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා යොදවා ඇත.

ණය මුදල් ලෙස යුරෝ මිලියන 33.7ක්ද,

දේශීය අරමුදල් ලෙස යුරෝ මිලියන 8ක්ද වශයෙන් යොදවා ඇත.

(v) ණය මුදලේ පොලී ප්‍රතිශතය වාර්ෂිකව 5.25% වේ. (මෙම ප්‍රතිශතය යම් ප්‍රමාණයක් පමණක් රජය මඟින් ගෙවනු ලබන අතර, ඉතිරිය ඉහත කී ප්‍රදානයෙන් වෙන් කරනු ලැබූ යුරෝ මිලියන 6න් ගෙවනු ලබයි.)

ගෙවිය යුතු කාලය - සමාන අර්ධ වාර්ෂික 20කින් (වසර 10කින්)

(ආ) (i) නෙදර්ලන්තයේ Interbeton Bv සමාගම. (එහි වර්තමාන නාමය BAM International වේ.)

(ii) මෙම වරාය ව්‍යාපෘතිය ඉදි කිරීම සඳහා පළමුව ආයෝජකයින් තිදෙනෙකුගේ යෝජනා ඉදිරිපත් වුවද පසුව එම ආයෝජකයින් අසාර්ථක වීම නිසා නැවතත් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් සියලු තානාපති කාර්යාල දැනුවත් කර, මේ සඳහා ආයෝජකයින් කැඳවුවද, ඒ සඳහා නෙදර්ලන්තයේ Interbeton Bv සමාගම පමණක් ඉදිරිපත් වී තිබුණි.

අවසාන වශයෙන් එක් සමාගමක් පමණක් මෙම ව්‍යාපෘතිය ඉදි කිරීම සඳහා ඉදිරිපත් වීම තුළ ඔවුන් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා අමාත්‍ය මණ්ඩලය මඟින් පත් කරන ලද සාකච්ඡා කමිටුවක් - Cabinet Appointed Negotiating Committee (CANC) - හා ව්‍යාපෘති කමිටුවක අධ්‍යයනට ලක් කර ඇත.

ඉන් පසු එම අධ්‍යයනයන්ගෙන් ලබා ගත් වාර්තා මඟින් ඉදිරිපත් වූ කරුණු අමාත්‍ය මණ්ඩලයට දැනුම් දීමෙන් අනතුරුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ද අදහස් මේ සම්බන්ධයෙන් සැලකිල්ලට ගෙන මෙම ව්‍යාපෘතිය දියත් කිරීමට Interbeton Bv සමාගම වෙත අවශ්‍ය අනුමැතිය 2007 දෙසැම්බර් මස 19 වන දින පැවැත් වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ලබා දී ඇත.

(iii) අවසාන වශයෙන් මෙම ව්‍යාපෘතිය ඉදි කිරීම සඳහා ඉදිරිපත් වූයේ එක් සමාගමක් පමණක් බැවින් ටෙන්ඩර් කැඳවීමක් කර නොමැත.

(ඇ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමු වන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්ව පරිදි මේ සඳහා ආසන්න වශයෙන් ගත්තොත් රුපියල් මිලියන 6,000ක් පමණ වැය වෙලා තිබෙනවා?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔව්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ණය මුදලත් එකතු කළොත්-

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
රුපියල් මිලියන 6,000කට වැඩියි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පොලිය වෙන් කළොත් රුපියල් මිලියන 8,000ක් විතර වෙනවා. රුපියල් බිලියන 8ක විතර-

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
යුරෝ මිලියන 6 නේ. එතකොට තවත් වැඩියි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතකොට රුපියල් බිලියන 8ක් විතර වනවා. ගරු ඇමතිතුමනි, එතකොට දැන් මේ වරාය හදලා ඉවරද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම දැන් වරායේ වැඩ කටයුත්ත ඉවරයි. ඒකේ පාර උඩින් යන arch එකක් තිබෙනවා. ඒක ඒ ගොල්ලෝ හැදුවා. අපි භාර ගන්න බැහැයි කිව්වා. මොකද ඒකේ නිර්මාණය වැරදියි. දැන් ඒ ගොල්ලෝ පොරොන්දු වෙලා තියෙනවා, ඒක අයින් කරලා නැවත හදන්න. ඒක හැදුවාට පස්සේ -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් මේ වරායේ arch එක නිසා නොවෙයි, මේක විවෘත කරන්න බැරිව තියෙන්නේ. මේ වරාය සකස් කළාට පසුව මේ වරායට දැන් විශාල වැලි කන්දක් ගහමින් තියෙනවා. ඒ නිසා දැන් මේ වරායේ ප්‍රධාන ආදායම් මාර්ගය බවට පත් වෙලා තියෙන්නේ ධීවර බෝට්ටු ගෙනැල්ලා එතැන මත්ස්‍ය සම්පත නෙළීම නොවෙයි, වැලි ඉවත් කිරීමයි. ඒ දක්වා පත් වී තියෙනවා. ඒ නිසා මෙහි තාක්ෂණික දෝෂයක් තියෙනවාද කියලා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ, මන්ත්‍රීතුමා. කිරින්දේ ඉඳලා හදපු හැම වරායකම - කිරින්ද, පානදුර වැනි ස්ථාන හතක විතර- මේ ප්‍රශ්නය තියෙනවා. වැලි එකතු වීම සිදු වෙනවා, වරායක් හැදුවාට පස්සේ. කිරින්ද වරාය හැදුවේ ජපානයේ JICA එකෙන්. අන්තිමට ඒ ගොල්ලන්ට කර ගන්න දෙයක් නැතිව ඒ ගොල්ලන් "වැලි ගොව්වා" කියන dredger එක අපට දුන්නා. ඒක දුන්නාට පස්සේ ඒකත් සුනාමියට ගහගෙන ගියා. ඊට පස්සේ ඒ ගොල්ලන් තව එකක් නිකම් දුන්නා. මොකද දිගටම ඒ වැලි එකතු වීම තියෙන නිසා. මේකේ එහෙම ප්‍රශ්නයක් නැහැ. මෙහි ඇත්තටම මඩත් එක්ක වැල්ලක් තියෙනවා. ඒක අයින් කරන්න ඕනෑ. මොකද, මීටර් තුන හමාරකට තමයි basin එක මේ ගොල්ලෝ හදන්න ආරම්භ කරලා තියෙන්නේ. නමුත් මම කිව්වා, මීටර් තුන හමාරක basin එකෙන් කිසි වැඩක් නැහැ කියලා. මේක ආසියාවේ තියෙන විශාලම වරායක්. ඒ නිසා මීටර් පහකට හදන්න ඕනෑ. ඒකේ කටයුතු තමයි දැන් අවසාන අදියරේ කෙරෙන්නේ. ඒකේ කටයුතු බොහොමයක් නිම වෙලා ඉවරයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක දෙක.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා කෙසේ කිව්වත්, එහි ඉන්න ධීවරයන් පවසන්නේ මේ වැලි එන නිසා බෝට්ටු ගෙනෙන්න බැහැ කියලායි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ, තව පොඩි කාරණයක් තියෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හදලා අවුරුද්දක් විතර වෙනවා නේ. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මාළු අල්ලලා නොවෙයි, වැලි විකුණලායි ආදායම ගන්නේ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ, නැහැ. ඒ දික්ඕවිට නොවෙයි. දික්ඕවිට එච්චර අපට වැලි නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා කිව්වා, මෙය ඉදි කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමක් කළේ නැත්තේ එක සමාගමක් පමණක් ඉදිරිපත් වුණු නිසාය කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ඉදිරිපත් වූ රට ණය මුදලක් දෙන්න එකඟ වනවා.

[ගරු අනුර දිසානායක මහතා]

ණය මුදල මතම නෙදර්ලන්ත කොම්පැනියකුත් තෝරා ගෙන ඒ ගොල්ලන් එන්නේ. ඒක නේ සිද්ධ වුණේ. ඔබතුමන්ලාට ණය මුදල දුන්නාට පස්සේ, ඔබතුමන්ලාට අවසර දුන්නාද, අඩුම තරමේ නෙදර්ලන්තය තුළ ප්‍රසිද්ධියට පත් කරලා නෙදර්ලන්ත සමාගමක් හෝ තෝරා ගන්න? ඒකට ඔබතුමන්ලාට අවසර ලබා දුන්නේ නැහැ. නෙදර්ලන්තය විසින්ම නම් කරන ලද සමාගමක් ඔවුන්ගේ ණය මුදල් ලබා දීලා, අධික වියදමක් දරලා, සියයට පහේ පොලී අනුපාතිකයක් දරලා තමයි මේ කටයුත්ත කරලා තිබෙන්නේ. මෙය අවුරුද්දකට වඩා වැඩි කාලයක් ඉදි කරලා තිබෙනවා. තවම කිසි සේත් මෙයින් ප්‍රයෝජනයක් ගන්නේ නැහැ. ඒ නිසා මෙය රටට විශාල බරක් ඇති කරන ව්‍යාපෘතියක් බවට පත් වෙලා තිබෙනවාද නේද අවසානයේදී?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ. බරක් ඇති ව්‍යාපෘතියක් වන්නේ නැහැ ගරු මන්ත්‍රීතුමනි. මේක තමයි ආසියාවේ තිබෙන විශාලම ධීවර වරාය. මේකේ අඩු පාඩුකම් තිබුණා. ගිය අවුරුද්දේ තමයි මේක ඉවර කරන්න තිබුණේ. නමුත් අප ඒක ඉවර කරන්න දුන්නේ නැහැ. මොකද අපට විශාල ප්‍රශ්නයක් තිබුණා මේකට අවශ්‍ය පහසුකම් ඒකේ තිබුණේ නැහැ. ඒක හරියට negotiate කරලා තිබුණේ නැහැ. මේකේ එක කොටසක් ලංකාවේ හින්දා, එක කොටසක් නෙදර්ලන්තයේ හින්දා මම නෙදර්ලන්ත රජයට කිව්වා, "මේවා complete කරන්නේ නැත්නම් අපට අවශ්‍ය නැහැ" කියලා. අන්තිමට මම මේක suspend කළා. මේ ටෙන්ඩර් එක suspend කළාම තමයි ඒ ගොල්ලෝ ඔක්කොම කරන්න භාර ගත්තේ. නැත්නම් අපේ රජය ඉතුරු සල්ලි දමලා කරනවා කිව්වා. ඒ වාගේ ලොකු ප්‍රශ්න වගයක් තිබුණා. 2007 දී මම මේ ක්‍රියාවලියේ හිටියේ නැහැ. නමුත් මට දන්වලා තිබෙන්නේ, "මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් සියලු තානාපති කාර්යාල දැනුවත් කර, මේ සඳහා ආයෝජකයින් කැඳවුවද, ඒ සඳහා නෙදර්ලන්තයේ Interbeton Bv සමාගම පමණක් ඉදිරිපත් වී තිබුණි." කියලායි

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එහෙම සිදු වීමක් කිසි සේත්ම සිදු වුණේ නැහැ ගරු ඇමතිතුමනි. සිද්ධ වුණේ මේකයි. නෙදර්ලන්තයේ ණය මුදලයි -ඒ කියන්නේ ව්‍යාපෘතියයි- කොන්ත්‍රාත්කාරයායි දෙන්නාම අරගෙන ආවා ඇමතිතුමා ගාවට. ඇමතිතුමා ණය මුදල බැලුවා, කොන්ත්‍රාත්කාරයා බැලුවා, රට බැලුවා, ව්‍යාපෘතිය බැලුවා. ඒ අනුව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා අනුමැතිය දුන්නා. ඔබතුමාම පිළිගන්නවා 2007 වසරේ හිටපු අමාත්‍යවරයා -කවුරු හෝ වේවා- නිසි පරිදි මේක අධීක්ෂණයට ලක් කළේ නැති බව. බැරි වෙලාවත් ඔබතුමා කියන පරිදිම ඒ අමාත්‍යවරයාම තවදුරටත් ධීවර ඇමති හැටියට කටයුතු කළා නම් ඔබතුමාම කියපු ආකාරයේ දුබල සහිත, අඩු පාඩුකම් සහිත වරායක් නේද ඉදි වන්නේ?

ඔබතුමාම කියනවා, ඔබතුමාගේ මැදිහත් වීමෙන් තමයි මේක සම්පූර්ණ කළේ කියලා. එයින් පෙන්නුම් කරන්නේ හිටපු ඇමතිවරයා හිටියා නම් ධීවරයන්ට ධීවර කටයුතු කරන්න බැරි, අඩු පාඩුකම් සහිත වරායක් තමයි මේ මුදලට ඉදි වන්නේ කියන එක නේද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
වරායට අවශ්‍ය පහසුකම් තිබෙනවා, cold room එක, ice plant එක, fuel storage එක ආදි වශයෙන්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒවා කලින් හදන්න හැදුවේ නැහැ නේද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ, ඒවා තිබුණේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒවා තිබුණේ නැහැ නේ?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒ වෙලාවේ ඒවා තිබුණේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මා කියන්නේ ධීවර අමාත්‍යවරයාව හිටියේ කවුද කියන එක නොවෙයි. 2007 ලබා දෙන කොට ඒවා නැතිවයි දුන්නේ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මේක යාත්‍රා 400ක් විතර ගෙනෙන්න පුළුවන් වරායක්. ඒ වාගේ එකක basin එක තිබෙන්න ඕනෑ අඩුම ගණනේ මීටර් 5ක්වත්. ඒ අය දාලා තිබුණේ මීටර් තුනහමාරයි. මම ඇහුවා, ආසියාවේ ලොකුම වරාය කියලා හදලා මීටර් තුනහමාරක basin එකක් දමන්නේ කොහොමද කියලා. මීටර් තුනහමාරයි කියන්නේ පොඩි යාත්‍රා ගෙනෙන්න පුළුවන් වරායකට ගැළපෙන ප්‍රමාණයයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ වැඩේ කරන කොටත් ඔබතුමන්ලාගේ අමාත්‍යවරයකු නේ හිටියේ. ඔබතුමා ආවේ නැත්නම් අර විදියට නේ හැදෙන්නේ?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මා දන්නේ නැහැ. මා පළමුවැනි සැරේම-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා, පිළිතුර දී අවසානද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
තුන්වන අතුරු ප්‍රශ්නය අපේ ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා අහනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් ඔබතුමා අතුරු ප්‍රශ්න හයක් විතර ඇහුවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
දෙවැනි අතුරු ප්‍රශ්නයයි එතුමා ඇහුවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙක තුනෙන් වැඩි කරලායි ඇහුවේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය මම අහනවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව යටතේ ගරු ෆෙස්ටස් පෙරේරා ඇමතිතුමා ධීවර ඇමතිවරයා හැටියට සිටි කාලයේ මේ වරාය හදන්න අපි යෝජනා කරලා, මූලික සැලසුම් කරලා, සමීක්ෂණ වාර්තාවක් ගත්තා. ඒ වෙලාවේ කිව්වා එතැන වරායක් හදන්න සුදුසු නැහැ කියලා. ඒ, දිය වැල් සහ වැලි ඇවිල්ලා පිරෙන ප්‍රශ්නය උඩයි. ඒ නිසා එතැන අත් හැරලා තමයි කිරින්ද පැත්තට ගියේ. ඒවා මොකුත් බලන්නේ නැතිව ඒ වරාය හදන්න පටන් ගත්තා. අද ධීවරයෝ බලා ගෙන ඉන්නවා කවදාද ඒ වරාය පාවිච්චි කරන්නේ කියලා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
කිරින්ද ධීවර වරායයි දික්ඕවිට ධීවර වරායයි අතර සම්බන්ධයක් නැහැ. කිරින්ද ධීවර වරාය එතරම් ලොකු වරායක් නොවෙයි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මම කිව්වේ, එහාට ගෙන ගියේ ඊට පසුවයි කියා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ලංකාව වටේ දැනට ධීවර වරායවල් 18ක් හදලා තිබෙනවා. තව ධීවර වරායවල් හතක් හදන්න අපි කටයුතු සකස් කරමින් තිබෙනවා. ලංකාවට ධීවර වරාය 26ක් විතර අවශ්‍යව තිබෙනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මූලික සමීක්ෂණයේදී මෙතැන සුදුසු නැහැ කියන වාර්තාව ඔය අමාත්‍යාංශයේ තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒ පිළිබඳව හොඳට හොයලා බලා ආපහු කියන්නම්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒකයි මම කියන්න හදන්නේ. ඒක තමුන්නාන්සේ දන්නේ නැහැ. මීට ඉස්සෙල්ලා ඕක ආරම්භ කරද්දී හිටපු පුද්ගලයෝ ඒක දැන ගන්න ඕනෑ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේත් මේ පිළිබඳවම තව කරුණු වගයක් සම්බන්ධව අපේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඇහුවා. නමුත් මාර්ග තදබදය නිසා ප්‍රශ්න වෙලාවේ මට එන්න බැරි වුණා. ඒකටත් අද උත්තර දීලා ඉවර කරන්න පුළුවන්ද? දික්ඕවිට ධීවර වරාය පිළිබඳ ප්‍රශ්නයක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ප්‍රශ්න අවසානයේ අමාත්‍ය ප්‍රකාශයක් හැටියට ඔබතුමාට ඒ පිළිබඳව කරුණු දැක්වීමට අවසර ලබා දෙන්න පුළුවන්. මේ මොහොතේ නොවෙයි. ප්‍රශ්න වෙලාව අවසන් වුවාට පසුව. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ප්‍රශ්න අවස්ථාව අවසන් වූ පසු.

## තානාපති සේවයේ පළමු ලේකම් තනතුර : පත් කිරීම්
## வெளிநாட்டுத் தூதுவர் சேவையின் முதலாவது செயலாளர் பதவி: நியமனங்கள்
## POST OF FIRST SECRETARY IN OVERSEAS SERVICE : RECRUITMENT

1810/'11

8. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වර්ෂවල විදේශ රටවල තානාපති සේවයේ පළමු ලේකම් තනතුරට පත් කිරීම සඳහා තරග විභාග පැවැත්වූයේද;

(ii) එසේ නම්, එම විභාග පවත්වන ලද කාල සීමාවන් කවරේද;

(iii) එම ලේකම් තනතුර සඳහා නිලධාරීන් පත් කිරීමට අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (iii) හි සඳහන් ක්‍රමවේදය අනුව ඉහත එක් එක් වර්ෂවලදී පළමු ලේකම් තනතුර සඳහා පත්වීම් ලබා දුන් අයගේ නම් කවරේද;

(ii) එම තනතුර සඳහා විදේශ සේවයට පිටතින් පුද්ගලයින් බඳවා ගෙන තිබේද;

(iii) එසේ නම්, එම බඳවා ගැනීම් සිදු කළ පදනම කවරේද;

(iv) එලෙස බඳවා ගත් අයගේ සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) විදේශ සේවයට පිටතින් ඉහත තනතුර සඳහා පත්වීම් ලබා දුන්නේ නම්, ඔවුන් තෝරා ගැනීම සඳහා තරග විභාගයක් පැවැත්වූයේද;

(ii) නොඑසේ නම්, විදේශ සේවයේ නියුතු පිරිස එක් පදනමක් යටතේද, පිටස්තර පුද්ගලයින් වෙනත් පදනමක් යටතේද එම තනතුරට බඳවා ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු දයාසිරි ජයසේකර මහතා]

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2008 ஆம் ஆண்டு முதல் 2011 ஆம் ஆண்டு வரையிலான ஆண்டுகளில், வெளிநாடுகளில் தூதுவர் சேவையின் முதலாவது செயலாளர் பதவிக்கு நியமிப்பதற்கான போட்டிப் பரீட்சைகள் நடத்தப்பட்டனவா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி பரீட்சைகள் நடத்தப்பட்ட கால எல்லை யாது என்பதையும்;

(iii) மேற்படி செயலாளர் பதவிக்கு உத்தியோகத்தர்களை நியமிப்பதற்காக பின்பற்றப்பட்ட முறைமை யாது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேலே (அ) (iii) இல் குறிப்பிடப்பட்ட முறைமையின் பிரகாரம் மேற்குறிப்பிடப்பட்ட ஒவ்வொரு வருடத்திலும் முதலாவது செயலாளர் பதவிக்கான நியமனங்கள் வழங்கப்பெற்றவர் களின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி பதவிகளுக்காக வெளிநாட்டு சேவைக்குப் புறம்பாக நபர்கள் ஆட்சேர்க்கப்பட்டனரா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி நியமனங்கள் மேற்கொள்ளப்பட்ட அடிப்படை யாது என்பதையும்;

(iv) அவ்வாறு ஆட்சேர்க்கப்பட்டவர்களின் தகைமைகள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) வெளிநாட்டு சேவைக்குப் புறம்பாக மேற்படி பதவிகளுக்கான நியமனங்கள் வழங்கப்பட்டிருப்பின், அவர்களைத் தேர்ந்தெடுப்பதற்காக போட்டிப் பரீட்சை நடத்தப்பட்டதா என்பதையும்;

(ii) இன்றேல்,வெளிநாட்டு சேவையில் ஈடுபட்டுள்ளவர்களை ஓர் அடிப்படையிலும், வெளியாட்களை வேறோர் அடிப்படையிலும் ஆட்சேர்ப்பதற்கான காரணம் யாது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of External Affairs:

(a) Will he state-

(i) whether competitive examinations were conducted to recruit persons to the post of First Secretary of the Sri Lanka Overseas Service from 2008 to 2011;

(ii) if so, the periods during which such examinations were conducted; and

(iii) the procedure followed in recruiting officers to the post of First Secretary?

(b) Will he inform this House-

(i) the names of the persons who were recruited to the post of First Secretary according to the procedure mentioned in (a) iii above, in each year;

(ii) whether persons outside the Overseas Service have been recruited to this post;

(iii) if so, the basis on which such recruitments were made;and

(iv) the qualifications of the persons so recruited?

(c) Will he state-

(i) whether a competitive examination was conducted to select persons, if those who were outside the Sri Lanka Overseas Service were recruited to the above post;

(ii) if not, the reasons for adopting two different procedures for recruiting persons from within the Sri Lanka Overseas Service and outside, to that post?

(d) If not, why?

**ගරු නියෝමාල් පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நியோமால் பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Neomal Perera - Deputy Minister of External Affairs)

Mr. Deputy Speaker, on behalf of the Hon. Minister of External Affairs, I answer the Question as follows:

(a) (i) No.

(ii) Not applicable.

(iii) The officers who have been recruited to the Grade III of the Sri Lanka Foreign Service through open competitive examinations on completion of 7 years of service in Grade III having passed the First and the Second Efficiency Bar Examinations and fulfilled official link and foreign language requirements and earned all annual increments within that period, are qualified to be granted the diplomatic rank of First Secretary.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

Hon. Deputy Minister, can you answer the first Question? Are you saying that you have not conducted any examination for them?

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

Yes, the answer is "No".

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
No examinations have been conducted for them.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
That is right. There were no examinations. Now, I will come to answer (b).

(b) (i) List of officers of the Sri Lanka Foreign Service who have been granted the diplomatic rank of First Secretary according to the procedure mentioned in (a) above is attached. I **table*** the Annex.

(ii) No.

(iii) Not applicable.

(iv) Does not arise.

(c) (i) No.

(ii) Does not arise.

(d) Does not arise.

***** *සභාමේසය මත තබන ලද ඇමුණුම:*
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex t abled:*

***Annex***

List of SLFS Officers appointed as First Secretaries to the Sri Lanka Missions Abroad 2008 - 2011

| S/No | Name | | Mission | Date of appointment to the SLFS | Date of appointment to the First Secretary |
|---|---|---|---|---|---|
| 1 | Mr | Pathirana, S.P.W. | New Delhi | 03.01.2000 | 2008.09.29 |
| 2 | Mr | Daulagala, S. | Manila | 05.11.2001 | 2008.11.05 |
| 3 | Mr | Jayawardena, C.D.W. | Oman | 05.11.2001 | 2008.11.05 |
| 4 | Mr | Dharmapala, W.M. | Rome | 03.01.2000 | 2008.12.08 |
| 5 | Mr | Bandara, M.H.M.N. | Islamabad | 03.01.2000 | 2009.01.09 |
| 6 | Ms | Jhan, A.B. | Ottawa | 03.01.2000 | 2009.03.26 |
| 7 | Mr | Dissanayake, D.D.M.S.B. | The Hague | 03.01.2000 | 2009.07.01 |
| 8 | Mr | Hassen, M.R. | Washington DC | 03.01.2000 | 2009.08.10 |
| 9 | Mrs | Halliyadda H M M J | New York | 01.01.2003 | 2010.01.01 |
| 10 | Mr | Weerasena W K C | Tokyo | 01.01.2003 | 2010.01.01 |
| 11 | Mr | Seneviratne A S K | Berlin | 01.01.2003 | 2010.01.01 |
| 12 | Mrs | Paranavithana N I D | Yangon | 01.01.2003 | 2010.01.01 |
| 13 | Mrs | Mallikaratchy M K | Geneva | 01.01.2003 | 2010.01.01 |
| 14 | Mrs | Ponnamperuma P A P | Kuala Lumpur | 01.01.2003 | 2010.01.01 |
| 15 | Mr | Kadurugamuwa L.R.M.N.P.G.B | Bangkok | 01.01.2003 | 2010.01.01 |
| 16 | Mrs | Delpitiya R | Tokyo | 01.01.2003 | 2010.01.01 |
| 17 | Mr | Ambagolla J M C R K | Pretoria | 01.01.2003 | 2010.01.01 |
| 18 | Mr | Rodrigo W D T | Mumbai | 01.01.2003 | 2010.01.01 |
| 19 | Mrs | Edirisinghe E A S W | Islamabad | 01.01.2003 | 2011.04.04 |
| 20 | Mrs | Gunasekara T R N | Beijing | 01.01.2003 | 2011.07.06 |
| 21 | Mrs | Wijegunasekara JADSP | Beirut | 10.03.2003 | 2011.07.15 |
| 22 | Ms | Hewavitharana, L.V. | New York | 03.01.2000 | 2011.08.10 |

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නියෝජ්‍ය ඇමතිතුමා කියන විධියට මේ විදේශ සේවයට පිටතින් පුද්ගලයන් බඳවා ගෙන නැහැ. එහෙමයි ඔබතුමා කියන්නේ?

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
බඳවා ගෙන නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විදේශ සේවයට පිටින් බඳවා ගෙන තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා. ඒ, පළමුවන Secretary විධියට. මම මේ අහන ප්‍රශ්නයට ඒකත් අදාළයි. මම එක උදාහරණයක් ඔබතුමාට කියන්නම්. එතුමා බඳවා ගෙන තිබෙන්නේ diplomatic corps එකෙන්ද, නැත්නම් පිටින්ද?

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
ශවේන්ද්‍ර සිල්වා අරගෙන තිබෙන්නේ diplomatic corps එකෙන් නොවෙයි, පිටින්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක ඉතින් හරි නේ. ඒකයි මම අහන්නේ.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
මේ මන්ත්‍රීතුමා අහන ප්‍රශ්නය මේකට අදාළ නැහැ නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඇහුවේ, "එම තනතුර සඳහා විදේශ සේවයට පිටතින් පුද්ලයන් බඳවා ගෙන තිබේද?" කියලා.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
නැහැ. මන්ත්‍රීතුමා සමා වෙලා ප්‍රශ්නය කියවන්න. It states, "Will he state whether competitive examinations were conduced to recruit persons to the post First Secretary of the Sri Lanka Overseas Service from 2008 to 2011?"

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
That is my first Question.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
Yes. That is right.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, are you asking Supplementary Questions?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
No. This is (b)(ii).

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
You did not ask about Major General Shavendra Silva.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Mr. Deputy Speaker, this is (b) (ii).

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is (b)(ii) and the second Supplementary Question?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Yes. මම අහන්නේ මේ ප්‍රශ්නයට පිළිතුර. අර ප්‍රශ්නය වෙනයි.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
මොකක්ද දෙවැනි ප්‍රශ්නය?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉන්න, මම පොඩ්ඩක් කියලා දෙන්නම්. ඔබතුමාට ඉංග්‍රීසියෙන් ඔය උත්තරය ලැබිලා තිබෙන නිසා ඔබතුමා ඕක ඉංග්‍රීසියෙන් කියවා ගෙන ගියා. නමුත් මම කියන එකත් ඔබතුමා පොඩ්ඩක් අහන්න. ඔබතුමා සිංහල දන්නවා නේ. මම ප්‍රශ්නයේ (අ) (i) කොටසෙන් අහලා තිබෙන්නේ, "විදේශ රටවල තානාපති සේවයේ පළමු ලේකම් තනතුරට පත් කිරීම සඳහා තරග විභාග පැවැත්වූයේද?" කියලායි.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒවා ඔක්කොම නැහැ. හැබැයි, මා ඊළඟට (ආ) (ii) කොටසෙන් අහලා තිබෙන්නේ, "එම තනතුර සඳහා විදේශ සේවයට පිටතින් පුද්ගලයින් බඳවා ගෙන තිබේද?" කියලායි. ඒක මේ විභාගයට අදාළ කාරණයක් නොවෙයි.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
එම තනතුරට බඳවා ගෙන නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පළමු වැනි එක්කෙනා, මේජර් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
එම තනතුරට බඳවා ගෙන නැහැ. First Secretary තනතුර ගැනයි ඔබතුමා අහන්නේ.Hon. Deputy Speaker, he is asking about the post of First Secretary. We have not recruited anybody from outside for the post of First Secretary. Major General Shavendra Silva is not the First Secretary.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
So, how did you appoint Major General Shavendra Silva?

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
He is in the service of the United Nations in a different post but not as the First Secretary.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, you may reframe the Question and ask, without referring to the post of First Secretary.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Right. This is my Second Supplementary Question. මම අහන්න කැමැතියි, -

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
ඔය තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, නැහැ, මම මේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නේ. [බාධා කිරීමක්]

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
කමක් නැහැ, ඒකෙ ප්‍රශ්නයක් නැහැ. නමුත් වෙලාව -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බය වෙන්න එපා. යුද්ධයේ දී අපේ රටට විශාල සේවයක් කරපු, මේජර් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමාව ඊයේ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් විශේෂ උපදේශක කමිටුවෙන් එළියට දමලා තිබෙනවා කියලා අද දින "දිවයින" පත්‍රය වාර්තා කර තිබෙනවා.

මේ සම්බන්ධව විදේශ කටයුතු අමාත්‍යාංශය විධියට -

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
Hon. Deputy Speaker, that is not relevant to the Question.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, the Hon. Member is contravening all the sections of the Standing Orders. He has not raised a Question or given notice of what happened yesterday, elsewhere. මේජර් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා තමයි මේ ලංකාව බේරා ගත්තේ. අපේ වීරයෙක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is up to the Hon. Deputy Minister to answer.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මේජර් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා ජාතික වීරයෙක්. එතුමාටත් අකුල් හෙළනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Azwer, you sit down. Hon. Deputy Minister, you may decide whether it is relevant or not.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මේජර් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා තමයි රට බේරා ගත්තේ. මොකද කියන්නේ? [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නියෝජ්‍ය ඇමතිතුමා, එහෙම නම් එතුමාව පත් කරන්න- [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! Hon. Azwer, -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
රට බේරා ගත්තාට එතුමන්ලා විරුද්ධයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොඩ්ඩක් ඉඳ ගන්න කෝ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්නයක් ලෙස -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ ප්‍රශ්නය ඇහුවේ රටට වැදගත් ප්‍රශ්නයක් විධියටයි. රටට වැදගත් වන කොට උත්තර දෙන්නයි, ආණ්ඩුවට වැදගත් වන කොට උත්තර නොදෙන්නයි බැහැ. [බාධා කිරීම්] උත්තර දෙන්න ඕනෑ හරියට.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
ඒක ඔබතුමා වෙනම අහන්න. ඒ ප්‍රශ්නය මේකට අදාළ නැහැ. ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා විශාල සේවයක් කරපු පුද්ගලයෙක්. අපි ඒක පිළිගන්නවා. නමුත් අද මෙතැනට ඒක අදාළ නැහැ. රට පාවා දෙන්න එපා මේ වාගේ කථා අහලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නයට දුන් පිළිතුරෙන් පැන නඟින ප්‍රශ්නයක් අහන්න. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක තමයි මා කිව්වේ. විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා ඉන්න නිසා - [බාධා කිරීම්]

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
ඔබතුමාට ප්‍රශ්නයක් තිබෙනවා නම් අහන්න, අපි රනිල්ව තවම තබා ගෙන ඉන්නේ ඇයි කියලා. ඕනෑ නම් තානාපති තනතුරක් දීලා අපි රනිල් වික්‍රමසිංහ යවන්නම්. First Secretary නොවෙයි, තානාපති කරලා යවන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා ඔබතුමාගෙන් බොහොම ගෞරවයෙන් ඇහුවේ. මේකට උඩ ගෙඩි දෙන කට්ටියගෙන් ඇහුවේ නැහැ. තමුන්නාන්සේලා සඳුදාට උද්ඝෝෂණයක් කරන්න හදනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඉතින් මොකද? මුළු රටම ගෙනෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ මිනිස්සු දැන ගන්න ඕනෑ, මේජර් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමාව අයින් කිරීම උද්ඝෝෂණයට අදාළ වනවාද කියලා. මා ඒකයි ඇහුවේ. [බාධා කිරීම්] ඔබතුමා කවුද, ඕවා අහන්න. ඔබතුමා ඉඳ ගන්න. [බාධා කිරීම්] සිවිල් ගුවන් සේවා ඇමතිතුමා, - [බාධා කිරීම්] ඔබතුමා ගිහින් සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ පාඩුව පියවා ගන්න කෝ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් බොහොම ගෞරවයෙන් අහන්නේ, ඔබතුමායි මමයි අතර විතරයි -[බාධා කිරීමක්] අනෙක් අය පොඩ්ඩක් ඉන්න කෝ. මිහින් ලංකා ගුවන් සමාගම, එයාර්ලංකා සමාගම -ඔක්කෝම- පාඩුයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා මම දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට ඔබතුමාගෙන් බොහොම ගෞරවයෙන් අහන්නේ, මේජර් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමාට විරුද්ධව ඇති වෙලා තිබෙන කාරණය සම්බන්ධව ආණ්ඩුව විධියට ඔබතුමන්ලා ගන්නා පියවර මොකක්ද කියන එකයි. මොකද, මේක රටක් විධියට අපට විශාල ප්‍රශ්නයක් තිබෙන කාරණයක්.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
ගරු මන්ත්‍රීතුමා, ඒක මෙතැනට අදාළ නැහැ. අපි ඒකට අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ කියන්නේ ඔබතුමන්ලාට ඒක අදාළ නැහැ?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක තුන.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
මේ ප්‍රශ්නයට අදාළ නැහැ. ඒකට අවශ්‍ය පියවර රජයක් විධියට අපි ගන්නවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරි. ඒක ඔබතුමන්ලාට අදාළ නැහැ. මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
මේජර් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා වෙනුවෙන් රජය අනිවාර්යයෙන්ම පෙනී සිටිනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම නම් අදාළ නැහැ කිව්වේ කොහොමද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ප්‍රශ්නයට අදාළ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න. [බාධා කිරීම්] එතුමා කිව්වේ මේ ප්‍රශ්නයෙන් පැන නඟින අතුරු ප්‍රශ්නයක් විධියට අදාළ වෙන්නේ නැහැයි කියලායි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම කියන්නේ,-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමා ඉස්සෙල්ලා අදාළ වෙන්නේ නැහැ කියලා, දැන් අදාළ වෙනවා කිව්වා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම තුන්වැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්නේ, මේ වන කොට ඇමෙරිකාව ලංකාවට එරෙහිව, ලංකාවේ යුද අපරාධ -[බාධා කිරීමක්] ඔබතුමා පොඩ්ඩක් අහ ගෙන ඉන්න කෝ. ඔබතුමාට තේරෙන්නේ නැහැ. මේ විදේශ කටයුතු පිළිබඳ කාරණයක් කථා කරන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම අහන්න කැමැතියි -[බාධා කිරීමක්]

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ පාර තව ඇමති කෙනෙකු නැඟිටිනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු චන්ද්‍රසිරි ගජදීර ඇමතිතුමා, -[බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා ඉඳ ගන්න. මොකක්ද මේ? [බාධා කිරීම්] මට අතුරු ප්‍රශ්නයක් අහන්න අයිතියක් තිබෙන්න ඕනෑ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Chandrasiri Gajadeera, what is the point of Order?

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නයට අදාළවයි අතුරු ප්‍රශ්නයක් අහන්න ඕනෑ. රටේ ලෝකයේ තිබෙන සේරම අල්ලා ගෙන අතුරු ප්‍රශ්න අහන්න බැහැ නේ. [බාධා කිරීම්] ඒක ගරු සභාවේ කාලය අපතේ යැමක්. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා නීතිඥවරයෙක්. ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, මේ ගරු සභාවේ ස්ථාවර නියෝග පිළිබඳව හොඳ අවබෝධයක් ඔබතුමාට තිබෙනවා. ඒ නිසා කරුණාකරලා ඔබතුමා විසින් අසන ලද ප්‍රශ්නය ආශ්‍රිතව, එයින් පැන නඟිනු ලබන ප්‍රශ්නයක් පමණක් අහන්න. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය අහනවා. මේක වැදගත් අවස්ථාවක් නිසා අනෙක් ඇමතිවරු අපට අදාළ නැහැ. [බාධා කිරීම්] අපේ ගරු විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම තුන්වැනි අතුරු ප්‍රශ්නය අහනවා.දැන් ඇමෙරිකාව, ලංකාවට එරෙහිව යෝජනාවක් ගෙනෙන්න හදනවා. ඒකේ තිබෙනවා විදේශීය වශයෙන් යුද අපරාධ සම්බන්ධව වෙනම කොමිෂන් සභාවක් ස්ථාපිත කරන්න. මම අහන්න කැමැතියි-

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
This is not relevant to the Question, Hon. Deputy Speaker.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, නැහැ අතුරු ප්‍රශ්නය අහන්න දෙන්න කෝ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒ ප්‍රශ්නය අතුරු ප්‍රශ්නයක් විධියට අදාළ නැහැ. ඒ ප්‍රශ්නය ඇසීමට ඉඩ දිය නොහැකියි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමා,-

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මාධ්‍යට සටහන් වෙන්න දිගින් දිගටම ප්‍රශ්න ඇහුවාට වැඩක් නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්නයෙන් පැන නොනඟින අතුරු ප්‍රශ්න ඇසීමෙන් මේ ගරු සභාවේ කාලය ගන්නවා.

එයට ඉඩ දිය නොහැක. ප්‍රශ්නය අසා අවසානයි. [බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 10 - ගරු ඒ.ච්.එම්. අස්වර් මහතා. [බාධා කිරීමක්] ගරු අස්වර් මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහනවාද? [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
රටට අපහාස කරනවා. රණ විරුවන්ට අපහාස කරනවා. Sir, I rise to a point of Order. Standing Order No. 28(2) read with Standing Order No. 27, states, I quote:

"A supplementary question must not introduce matter not included in the original question."

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Azwer, I have given a Ruling that the Hon. Member cannot raise that Question. Hon. Azwer, are you asking Question No. 10?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, we have to follow the Standing Orders. So, whatever Supplementary Question he had asked not relating to his Question must be expunged.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Question No. 10 is your Question. Are you asking it? - [*Interruption.*] Hon. A. H .M. Azwer, ප්‍රශ්නය අහනවාද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ඔව්, අහනවා. රට පාවා දෙනවා. ඇමෙරිකාවේ ඒජන්තවරු.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඉඳගන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ඉඳගන්න? ඉඳ ගන්නවා ඔළුව පළලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යතුමා. [බාධා කිරීම්] ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. [බාධා කිරීම්] Order, please! Hon. Member, you have asked a Question. Let the Hon. Minister answer the Question.

## "ජන සෙවන" නිවාස ව්‍යාපෘතිය : ආදිවාසී කොට්ඨාස
## "ஜனசெவன" வீடமைப்புக் கருத்திட்டம்: ஆதிவாசிகள்
## "JANASEWANA" HOUSING PROJECT: ABORIGINAL FOLKS

2011/'11

**10. ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) "ජන සෙවන" නිවාස ව්‍යාපෘතිය යටතේ ආදිවාසීන් සඳහා නිවාස ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, ඒ යටතේ නිවාස ලබාදීම සඳහා තෝරා ගත් ආදිවාසී ජන කොට්ඨාස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිවාස අවශ්‍යතාවය ඇති බවට හඳුනාගත් ආදිවාසී පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) අදාළ නිවාස ආදිවාසී සංස්කෘතිකමය අවශ්‍යතාවන්ට අනුව ඉදිකිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) "ஜனசெவன" வீடமைப்புக் கருத்திட்டத்தின் கீழ் ஆதிவாசிகளுக்கு வீடுகளைப் பெற்றுக் கொடுப் பதற்கான வேலைத்திட்டமொன்று நடைமுறை யிலுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், இதன்கீழ் வீடுகளைப் பெற்றுக் கொடுப்பதற்காக தேர்ந்தெடுக்கப்பட்டுள்ள ஆதிவாசி மக்கள் பிரிவுகள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) வீட்டுத் தேவை உள்ளதென இனங்காணப் பட்டுள்ள ஆதிவாசிக் குடும்பங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) உரிய வீடுகளை ஆதிவாசிகளின் கலாசார தேவைகளின் பிரகாரம் நிர்மாணிப்பதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை யென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Will he inform this House-

(i) whether there is a programme implemented to provide houses for the aboriginal folks under the "Janasewana" Housing Project; and

(ii) as to what aboriginal communities have been selected for the purpose of providing such houses?

(b) Will he state-

(i) the number of aboriginal families that has been identified as those with housing needs; and

(ii) of the steps that have been taken to construct those houses in accordance with the cultural needs of such communities?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්. මොණරාගල, අම්පාර සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වේ.

(ii) අම්පාර හෙන්නානිගල ආදිවාසී ජනතාව

අම්පාර පොල්ලෙබැද්ද ආදිවාසී ජනතාව

මොණරාගල රතුගල ආදිවාසී ජනතාව

මඩකලපුව වාකරේ ආදිවාසී ජනතාව

(ආ) (i) අම්පාර පවුල් 50

මොණරාගල පවුල් 20

මඩකලපුව පවුල් 30

(ii) ගම්මානවල ආදිවාසී නායකයා සමඟ සාකච්ඡා කර ඔවුන්ගේ සංස්කෘතිකමය අවශ්‍යතාවය අනුව නිවාස ඉදි කිරීමට පියවර ගෙන ඇත.

(ඇ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න නැත. ප්‍රශ්න අංක 11 - ගරු සජිත් ප්‍රේමදාස මහතා, සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට. [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු ප්‍රශ්න තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අහන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ආදිවාසී පවුල්වල ජනතාවට "ජන සෙවන" නිවාස ව්‍යාපෘතියක් ලබා දීම පිළිබඳව අපි රජයට ස්තුතිවන්ත වන අතර මේ සඳහා තෝරා ගත් ආදිවාසී කොට්ඨාස කවරේද කියා මා අහනවා. [බාධා කිරීමක්] තමුන්නාන්සේගෙන් ඇහුවේ නැහැ නේ. [බාධා කිරීමක්] දන්නවා. එංගලන්තෙට ගිහින් බෝට්ටුවෙ ගියා වාගේ නොවෙයි -[බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මොනවා අහනවාද කියා මම දන්නේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
පවුල් සංඛ්‍යාව ගරු ඇමතිතුමා?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මොන පවුල්ද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ආදිවාසීන්ගේ. [බාධා කිරීම්] මේගොල්ලන්ගේ පවුල් නොවෙයි. පුංචිඅම්මලා නොවෙයි. ආදිවාසීන්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම උත්තර දුන්නා. අම්පාරේ පවුල් 50යි; මොනරාගල පවුල් 20යි; මඩකලපුවේ පවුල් 30යි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පවුල් ප්‍රමාණය සම්බන්ධයෙන් උත්තර දී ඇත. තුන්වන අතුරු ප්‍රශ්නය?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මේ ව්‍යාපෘතිය කවදා අවසන් වේද කියා අපට කියන්නට පුළුවන්ද, නිගමනයක් වශයෙන්වත්. එතකොට අප දඹානට ගිහිල්ලා ආදිවාසීන්ට කියන්නම්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම පිළිතුරක් දුන්නා. ආදිවාසී නායකයා සමග සාකච්ඡා කර ඔවුන්ගේ සංස්කෘතිකමය අවශ්‍යතාවන් අනුව නිවාස ඉදි කිරීමට පියවර ගෙන ඇත. ගරු අස්වර් මන්ත්‍රීතුමාටත් පුළුවන් ඊළඟ සාකච්ඡාවට සහභාගිවන්න. [බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
බොහොම ස්තුතියි. මගේ අතුරු ප්‍රශ්න තුනම අවසානයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 11- 2050/'11-(1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැඟිලි සහ වාහන : කුලිය/බද්ද

## பாராளுமன்ற அலுவல்கள் அமைச்சுக்குச் சொந்தமில்லாத கட்டிடங்கள் மற்றும் வாகனங்கள்: வாடகை/குத்தகை

## BUILDINGS AND VEHICLES NOT OWNED BY MINISTRY OF PARLIAMENTARY AFFAIRS : RENT/LEASE

1519/'11

12. ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2010 සහ 2011 යන වර්ෂයන්හිදී,

(i) පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය විසින්, එම අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැඟිලි කුලියට හෝ බද්දට ලබා ගැනීම සඳහා දරන ලද මුළු පිරිවැය කොපමණද;

(ii) කුලියට හෝ බද්දට ලබා ගත් ගොඩනැගිලිවල වර්ග අඩියක් සඳහා කුලිය කොපමණද;

(iii) එම ගොඩනැගිලිවල බදු කාලය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශය යටතේ ඇති කිසිදු ආයතනයකට අයත් නොවන වාහන කුලියට හෝ බද්දට ලබා ගැනීම සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) කුලියට හෝ බද්දට ලබාගත් මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) බාහිරින් ලබාගත් අනෙකුත් සේවාවන් කවරේද;

(iv) ඉහත සඳහන් බාහිරින් ලබාගත් සේවාවන් සඳහා දරනු ලැබූ පිරිවැය කොපමණද;

(v) බාහිරින් සේවා ලබා ගැනීමේ පදනමින් ගිවිසුම්වලට එළඹීමෙන් අනතුරුව සේවය සපයන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද; සහ

(vi) කාර්ය මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයට අදාළව ඉහත කී වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2010 மற்றும் 2011 ஆம் ஆண்டுகளில்,

(i) பாராளுமன்ற அலுவல்கள் அமைச்சுக்குச் சொந்தமல்லாத கட்டிடங்களை வாடகைக்கோ அல்லது குத்தகைக்கோ எடுப்பதற்கு ஏற்பட்ட மொத்தச் செலவினையும்;

(ii) வாடகைக்கோ அல்லது குத்தகைக்கோ எடுக்கப்பட்ட கட்டிடத்தின் ஒரு சதுர அடிக்கான செலவினையும்;

(iii) கட்டிடங்களின் குத்தகைக்கான கால அளவினையும்;

அவர் வெவ்வேறாகக் குறிப்பிடுவாரா?

(ஆ) மேலே சொல்லப்பட்ட ஆண்டுகளில், பாராளுமன்ற அமைச்சு தொடர்பாக,

(i) அமைச்சுடன் தொடர்புடைய எந்தவொரு அமைப்பிற்கும் சொந்தமல்லாத வாகனங்களை வாடகைக்கோ அல்லது குத்தகைக்கோ பெறுவதற்குச் செலவழிக்கப்பட்ட மொத்தச் செலவினையும்;

(ii) வாடகைக்கோ அல்லது குத்தகைக்கோ பெறப்பட்ட வாகனங்களின் மொத்த எண்ணிக்கையினையும்;

(iii) வெளிவளங்களிடமிருந்து பெறப்பட்ட ஏனைய சேவைகளையும்;

(iv) மேலே குறிப்பிடப்பட்ட வெளிவளச் சேவையினைப் பெறுவதற்கு ஏற்பட்ட செலவினையும்;

(v) வெளிவள அடிப்படையில் ஒப்பந்தம் செய்யப்பட்ட ஆட்களின் எண்ணிக்கையினையும்;

(vi) மொத்தப் பணியாளர் எண்ணிக்கையினையும்

அவர் வெவ்வேறாகக் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Parliamentary Affairs:

(a) Will he state for years 2010 and 2011, separately -

(i) the total cost for renting or leasing of buildings which are not owned by the Ministry of Parliamentary Affairs;

(ii) the rate per square feet of rented or leased buildings; and

(iii) the leasing period of the buildings?

(b) Will he also state in relation to the Ministry of Parliamentary Affairs for aforesaid years, separately-

(i) the total money spent on renting or leasing of vehicles which do not belong to any of the Ministry-related entities;

(ii) the total number of vehicles rented or leased;

(iii) the other outsourced services;

(iv) the cost incurred on outsourced services mentioned;

(v) the number of people who have been contracted on outsourced basis;

(vi) and the total staff strength?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය අමාත්‍යතුමිය වෙනුවෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2010 වර්ෂය සඳහා රු. 4896000/- + VAT
2011 වර්ෂය සඳහා රු. 6039000/- + VAT
(ii) (මාසික පදනම මත)
2010 - වර්ග අඩියක් සඳහා රු.39/-
2011- වර්ග අඩියක් සඳහා රු.51/-
(iii) එක්වර්ෂයකි.

(ආ) (i) මුදල් වැය කර නැත.
(ii) අදාළ නොවේ.
(iii) ආරක්ෂක සේවය
පවිත්‍රතා සේවය
(iv) ආරක්ෂක සේවය සඳහා
2010 - රු. 910800/- + VAT
2011- රු. 935760/-+ VAT
පවිත්‍රතා සේවය සඳහා
2010 - රු. 617311/- + VAT
2011- රු.672000/- + VAT
(v) ආරක්ෂක සේවයේ - 04 දෙනෙකි.
පවිත්‍රතා සේවයේ - 05 දෙනෙකි.
(vi) ඔව්.
2010 වර්ෂයට 63 දෙනෙකි.
2011 වර්ෂයට 64 දෙනෙකි.

(ඇ) පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 13 -1576/'11-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ජාතික පශු සම්පත් මණ්ඩලයේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය : වැටුප් සහ දීමනා
## தேசிய கால்நடை அபிவிருத்திச் சபையின் தவிசாளர் மற்றும் பணிப்பாளர்கள் : சம்பளம் மற்றும் கொடுப்பனவுகள்
## CHAIRMAN AND DIRECTORS OF NATIONAL LIVESTOCK DEVELOPMENT BOARD : SALARIES AND ALLOWANCES

1811/'11

15. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2004 වර්ෂයේ දී ජාතික පශු සම්පත් මණ්ඩලයේ සභාපතිවරයා, විධායක අධ්‍යක්ෂවරයා හෝ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා හා අධ්‍යක්ෂවරයකු ලැබූ වැටුප, ඉන්ධන දීමනා, දුරකථන දීමනා, වෙනත් දීමනා, සංග්‍රහ වියදම්, මාසික අධ්‍යක්ෂ මණ්ඩල දීමනා යනාදිය එක් එක් තනතුර අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2004 වර්ෂයෙන් පසු ඉහත තනතුරුවලට අදාළ වැටුප් හෝ අනෙකුත් දීමනා වෙනස් වූ වර්ෂ කවරේද;

(iii) 2011 වර්ෂයේදී ඉහත තනතුරුවලට අදාළ වැටුප් හා දීමනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கால்நடை வளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2004 ஆம் ஆண்டில் தேசிய கால்நடை அபிவிருத்திச் சபையின் தவிசாளர், நிறைவேற்று பணிப்பாளர் அல்லது செயற்பாட்டுப் பணிப்பாளர் மற்றும் பணிப்பாளர் ஒருவர் பெற்ற சம்பளம், எரிபொருள் கொடுப்பனவு, தொலைபேசி கொடுப்பனவு, ஏனைய கொடுப்பனவுகள், உபசரிப்புச் செலவினங்கள், மாதாந்த பணிப்பாளர் சபைக் கொடுப்பனவுகள் ஆகியன ஒவ்வொரு பதவிக்கும் ஏற்ப வெவ்வேறாக எவ்வளவென்பதையும்;

(ii) 2004 ஆம் ஆண்டின் பின்னர் மேற்படி பதவிகளுக்கு ஏற்புடைய சம்பளங்கள் அல்லது ஏனைய கொடுப்பனவுகள் மாற்றமடைந்த வருடங்கள் யாவை என்பதையும்;

(iii) 2011 ஆம் ஆண்டில் மேற்படி பதவிகளுக்கு ஏற்புடையதான சம்பளங்களும் கொடுப்பனவுகளும் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු දයාසිරි ජයසේකර මහතා]

asked the Minster of Livestock and Rural Community Development:

(a) Will he state-

(i) separately and in relation to each post, the salary, fuel allowances, telephone allowances, other allowances, entertainment allowances and monthly Director Board allowances received by the Chairman, Executive Director or Working Director or a Director of the National Livestock Development Board in 2004;

(ii) the years, after 2004 in which the salaries or other allowances pertaining to the above posts were varied; and

(iii) the salaries and allowances pertaining to the above posts in 2011?

(b) If not, why?

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)
Sir, on behalf of the Minister of Livestock and Rural Community Development, I answer Question No. 15.

(a) (i) The salaries or allowances for the year 2004.

| Designation | Salary (Rs.) Per month | Fuel Allowance Private running (Rs.) Per month | Telephone Allowance (Rs.) Per month | Other Allowances (Rs.) Per month | Entertainment Allowances (Rs.) Per month | Director Board Allowances (Rs.) Per month |
|---|---|---|---|---|---|---|
| Chairman | 30,000.00 | 960 Km. | No Allow-ances | 500.00 | No Allowances | No Allowances |
| Deputy Chair-man | 20,000.00 | 960 Km. | No Allow-ances | 500.00 | No Allowances | No Allowances |
| Directors | | | | | | Rs. 1500/- per sitting x 5 Directors = 37,500.00 |

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇහෙන්නේ නැහැ, ආපහු පොඩ්ඩක් කියන්න. එතුමාත් ඉංග්‍රීසියෙන් උත්තර දෙන්න පටන් අර ගෙන. හොඳයි, කමක් නැහැ.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
අහ ගෙන්න ඉන්න කෝ. පොඩ්ඩක් වැදගත් විධියට හැසිරෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මොනවාද? මට ඇහෙන්නේ නැහැ. No, no කියනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුර දුන්නාට පසු ඔබතුමා අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

(ii) The year after 2004 in which the salaries or the allowances pertaining to the above posts were varied - 1st May, 2011.

(iii) The salaries or allowances for the year 2011

| Designation | Salary (Rs.) Per month | Fuel Allowance Private running (Rs.) Per month | Telephone Allowance (Rs.) Per month | Other Allowances (Rs.) Per month | Entertainment Allowances (Rs.) Per month | Director Board Allowances (Rs.) Per month |
|---|---|---|---|---|---|---|
| Chairman | 60,000.00 | 960 Km. | No Allow-ances | 1000.00 | No Allowances | |
| Deputy Chairman | 40,000.00 | 960 Km. | No Allow-ances | 1000.00 | No Allowances | |
| Directors (Professional Fees) for 8 Directors | | | | 10,000.00 | | Rs. 1500/- per sitting Up to April 2011 |
| Directors (Professional Fees) for 8 Directors | | | | 10,000.00 | | Rs. 6000/- per sitting from May 2011 = 294,000.00 |

(b) Does not arise.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණා සියල්ලම බලපුවාම පෙනෙනවා, 2004 වසරට වඩා, 2011 වසර වන විට, සභාපතිවරයාගේ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් අයෙකුට රුපියල් 10,000ක Professional Fee එකක් ගෙවන බව. මම දන්නේ නැහැ ඒ මොන profession එකටද කියලා. අපි සාමාන්‍යයෙන් දන්නවා අධ්‍යක්ෂ මණ්ඩලයේ කෙනකුට පැමිණීමේ දීමනාව විධියට රුපියල් 1,000ක් හම්බ වෙන බව. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ආශ්චර්යවත් ආණ්ඩුවක් නිසා එක අධ්‍යක්ෂවරයෙකුට රුපියල් 10,000ක් දෙනවා ඇති. මම අහන ප්‍රශ්නය මේකයි. මේ දීමනාව රුපියල් 10,000 දක්වා වැඩි කර ගැනීමට මුදල් අමාත්‍යාංශයේ කුමන රෙගුලාසිය යටතේ ද ඔබතුමන්ලාට අනුමතිය ලැබුණේ?

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ප්‍රශ්නය අහලා නැහැ. මුදල් අමාත්‍යාංශයේ රෙගුලාසි ගැන අහලා නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම මේ අතුරු ප්‍රශ්නයක් අහන්නේ.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
You are asking about the Regulations of the Ministry of Finance and Planning. That is not relevant to the Question.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම අහන්නේ-

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

This Supplementary Question is not relevant to the Question which has been asked.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ස්ථාවර නියෝග අනුව ඔබතුමාට අවශ්‍ය නම් ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න පුළුවන්, නැත්නම් නොදී ඉන්නත් පුළුවන්.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ප්‍රශ්නය අහලා නැහැ. මුදල් රෙගුලාසි ගැන මගෙන් අහන්න එපා. ඒක මුදල් ඇමතිතුමාගෙන් අහන්න කියන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැන බොහොම පැහැදිලිව ඔබතුමාත් දන්නවා. මෙතුමා අවුරුදු ගණනක් තනතුරුවල හිටපු කෙනෙක්. මේවා ගැන නොදන්නා කෙනෙකු නොවෙයි නේ. ඒක නේ නියෝජ්‍ය ඇමතිකමක් දීලා තිබෙන්නේ, හරක් බලා ගන්න හරි. මම අහන්නේ-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අදාළ ප්‍රශ්නය අහන්න. ප්‍රශ්නයක් අහන්න වැඩියෙන්ම කාලය ගත්තේ ඔබතුමා තමයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා උත්තර දෙන්නේ නැහැ නේ.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

කිසි වැදගත්කමක් නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

අදාළ ප්‍රශ්නයක් අහන්න.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

ගරු මන්ත්‍රීතුමාට නඩු නැහැ, ඉතින් මෙහේ ඇවිල්ලා ඉන්නවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

එතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන දෙපාර්තමේන්තුවක අධ්‍යක්ෂවරයකුගේ දීමනාව රුපියල් දහදාහ දක්වා වැඩි කර ගෙන තිබෙනවා නම්, එතුමාගෙන් අපට අහන්න අයිතියක් තිබෙනවා කොහොමද ඒක වැඩි කර ගත්තේ කියලා.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

අධ්‍යක්ෂ මණ්ඩලය තමයි ඒ තීන්දු ගන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒකට උත්තර දෙන්න බැරි නම් නියෝජ්‍ය ඇමතිකමක් දරනවාට වැඩිය හොඳයි නේ හරක් පට්ටියක් බලා ගන්න එක.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීන්දුව පරිදි තමයි වැඩි කරන්නේ. නමුත් ගරු මන්ත්‍රීතුමා අහන්නේ, මුදල් රෙගුලාසියක් ගැන. ඒක මුදල් අමාත්‍යාංශයෙන් අහන්න කියන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රශ්නය අදාළ නැහැ කියලා කියනවා නම්, ස්ථාවර නියෝග ප්‍රකාරව වෙන පියවරක් ගන්න බැහැ. ඒ නිසා ඔබතුමා ඊ ළඟ ප්‍රශ්නයට යන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒකෙන්ම තේරෙනවා, පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඔබතුමාගේ ඊ ළඟ අතුරු ප්‍රශ්නය මොකක්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මට ඒකෙන්ම තේරෙනවා, පශු සම්පත් අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිතුමාට තමන්ගේ ආයතන පිළිබඳව කොච්චර දැනුම් සම්භාරයක් තිබෙනවාද කියලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවා නේ. [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, ඒකයි මම කියන්නේ. ඔව්, ඔව්. වැඩි කරලා. [බාධා කිරීමක්] ඔව්, ඔව්. ඒකට මොකුත් regulation එකක් නැහැ. ඒකයි මම කියන්නේ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ආදරයෙන් ඉල්ලනවා, කරුණාකරලා ඒ ආයතනයට ගිහිල්ලා හොයලා බලන්න මොන නියෝග යටතේද මේ මුදල වැඩි කර ගත්තේ කියලා.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ඒ ගැන වෙනම ප්‍රශ්නයක් අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අනෙක් කාරණය විධියට මේ ගැනත් මම අහන්න කැමැතියි. දෙයියනේ කියලා අද රාත්‍රී වෙන කොට පාන්වල මිල රුපියල් පහකින් වැඩි වෙනවා. ජයවේවා!

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
මොනවද මේ කථා කරන්නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කිරි පිටි මිල වැඩි කරන්නත් ඉල්ලීම් කරලා තිබෙනවා. අපේ ජනාධිපතිතුමා පොඩි බබෙක් වඩා ගෙන ඉන්න පින්තූරයක් තිබෙනවා. ඒ පොඩි එකා එතුමාගෙන් අහනවා, කිරි පිටි මිලත් නග්ගන්න හිතනවාද කියලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කිරි පිටි මිල වැඩි කිරීමත් එක්ක, ලංකාවට කිරි පිටි ගෙන්වන ප්‍රමාණයත් දැන් අඩු කරන්න හදනවා.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොනවාද මේ ප්‍රශ්න? ඔළුවේ අමාරුව-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කිරි පිටි ගෙන්වන ආනයනකරුවෝ, කිරි පිටි ගෙන්වන්නේ නැතුව ඉන්න හදනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නයෙන් පැන නඟින අතුරු ප්‍රශ්න අහන්න. කිරි පිටි ගැන ඔබතුමා දැන් අහන්න එපා. කිරි පිටි ගැන ඔබතුමා මුල් ප්‍රශ්නයෙන් අහලා නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හරක් බලන නියෝජ්‍ය ඇමතිතුමාගෙන් කිරි පිටි ගැන අහන්නේ නැතුව වෙන කාගෙන්ද මම ඒක අහන්නේ?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒක වෙනම ප්‍රශ්නයක් විධියට අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන ඇමතිගෙන් කිරි පිටි ගැන අහන්නේ නැතිව වෙන කාගෙන්ද අහන්නේ?

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ඉතින් අහන්න.

**ගරු පියංකර ජයරත්න මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - Minister of Civil Aviation)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order?

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
රෝසිගෙන් අහන්න ඕනෑ ඇන්කර් කිරි පිටි-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි. [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඕකට කියන්නේ ඉරිසියාව. [බාධා කිරීමක්] මම ඔබතුමාගෙන් අහන්නේ මෙකයි. කිරි පිටි මිල වැඩි කරන්න ඉඩ දුන්නේ නැත්නම් කිරි පිටි ගෙන්වන ආනයනකරුවෝ ලංකාවට කිරි පිටි ගෙන්වන එක නතර කරන්න ලෑස්ති වෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒ ප්‍රශ්නය අදාළ නැත. නියෝජ්‍ය ඇමතිතුමා ඒකට විරෝධතාවක් ප්‍රකාශ කර ඇත. එම නිසා ඒ ප්‍රශ්නය ඇසිය නොහැක.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට ප්‍රශ්නය අහන්න දෙන්න කෝ. මම දැනුයි ප්‍රශ්නයට එන්නේ. විස්තර කියලා නේ පටන් ගන්න ඕනෑ.

එතකොට ඒ තත්ත්වයට මුහුණ දීම සඳහා පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අපට ස්වාභාවික කිරි ලබා දෙන්න යම් කිසි විධියක තීන්දුවක් අරගෙන තිබෙනවාද? ජාත්‍යන්තර ප්‍රජාවෙන් එන බලපෑම්වලට යටත් වෙන්නේ නැතිව ඒකට විරුද්ධව නැඟිටින්න තමුන්නාන්සේලා දැන ගන්න ඕනෑ. ඒ නිසා මම අහන්න කැමැතියි, ඒ තත්ත්වයට විරුද්ධව යම් කිසි ක්‍රියා මාර්ගයක් අරගෙන ජනතාවට දියර කිරි බොන්න ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න ලැස්ති වෙනවාද කියලා.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා අහපු නැති ප්‍රශ්නයකට තමයි මට උත්තර දෙන්න වෙලා තිබෙන්නේ. එතුමාට දැන ගන්න ඕනෑ නම් මට දීර්ඝ විස්තරයක් කියන්න පුළුවන්. පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කාර්ය භාරය ගැන තමයි මෙතුමා අහන්නේ. 1977 ඇති කළ විවෘත වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමයත් එක්ක තමයි ලංකාවේ සියයට 75ක කිරි නිෂ්පාදනය සියයට 15 දක්වා පහළට වැටුණේ. ඒ කිරි නිෂ්පාදනය කඩා වැටුණාට පස්සේ දැන් තමයි කිරි නිෂ්පාදනය වැඩි කරන්නේ. දැන් තමයි මේ රටේ කිරි නිෂ්පාදනය වැඩි කරන්න මේ ආණ්ඩුව වැඩ කරගෙන යන්නේ. මහින්ද චින්තනය අනුව නිෂ්පාදකයාට දැන් කිරි ලීටරයකට රුපියල් 50ක් ගෙවනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ජයවේවා!

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ජයවේවා නොවෙයි, ගිහිල්ලා කිරි හරකෙක් හදා ගන්න. මොනවාද මෙතුමා අහන්නේ?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා මේ සභාවේ ගෞරවය ආරක්ෂා කර ගෙන අදාළ ප්‍රශ්න අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගෞරවය රැක ගෙන තමයි මේ අහන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
නැත්නම් මේක විහිළු සපයන ආයතනයක් බවට පත් වෙනවා. ඒ නිසා කරුණාකරලා ප්‍රශ්න අහන වෙලාවේ අසන ලද ප්‍රධාන ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න අහන්න. ඇමතිවරුත් ඊට අදාළව පිළිතුරු දෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා ඇමතිවරයෙක් මෙතැනට ආවට පස්සේ,-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම මේක කියන්න එපායැ. එහෙම නැත්නම් ඔබතුමා හිතනවා නේ මම වෙන ඒවා කියනවා කියලා. අපට ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න අයිතියක් තිබෙනවා. ඒක තමයි සම්ප්‍රදායය. ඒකට තමයි අතුරු ප්‍රශ්න 3ක් අහන්න අවස්ථාව දීලා තිබෙන්නේ. ඒ නිසා කරුණාකරලා මට ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න. ඇමතිතුමා පිළිතුරු දෙන්න කැමැති නැත්නම් ඒක කියන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
හොඳයි, ඔබතුමා ප්‍රශ්නය අහන්න. [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමා කැමැති නම් උත්තර දෙයි, නැත්නම් නිකම් ඉඳියි. මොකටද කලබල වෙන්නේ?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්ථාවර නියෝගවලට අනුව ප්‍රශ්නය ඇසීමේදී අනුගමනය කළ යුතු ක්‍රමයක් තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා කියනවා, නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ප්‍රශ්න අහන එක නවත්වලා එතුමාගෙන් අහන්නය, එතුමා උත්තර දෙන්නමය කියලා. එහෙනම් මා එතුමාගෙන් ප්‍රශ්න අහන්න කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා- [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් මා අහන්න කැමැතියි මේ වසරේ ඉදිරි මාස හය ඇතුළත කිරි පිටි ගෙන්වීම පිළිබඳව යම් කිසි ප්‍රශ්නයක් ආවොත් ඒක පශු සම්පත් සංවර්ධන- [බාධා කිරීමක්]

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු මන්ත්‍රීතුමා,-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කරුණාකර, ඔබතුමා ගිහිල්ලා මිහින් එයාර් එකේ ගණන අඩු කර ගන්න, ඒකෙන් හොරකම් කර කර ඉන්නේ නැතිව. ඊයේත් මට කිව්වේ- [බාධා කිරීමක්] එතුමාට කිසි බලයක් නැහැ මිහින් එයාර් එක ගැන. එතුමාගේ තීරණ ඔක්කෝම ගන්නේ සභාපතිතුමා. ඉතින් එතුමා කරන්නේ අනෙක් කට්ටියගේ ඒවාට මැදිහත් වන එක.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ප්ලේන් එකක් ගන්න එකවත් අහන්නේ නැහැ. කිසි දෙයක් කර ගන්න බැහැ. සිවිල් ගුවන් සේවා ඇමති නිකම්ම නිකම් පුටුවේ ඉඳගෙන ඉන්න මනුෂ්‍යයකු බවට පත් වෙලායි තිබෙන්නේ. ඉතින් එතුමා කරන්නේ අනෙක් අයගේ ඒවා හොයන එක. අනුන්ගේ කිරි හොයන එක.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකර, ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි. මා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි - [බාධා කිරීමක්] ඉඳ ගන්නකෝ පොඩ්ඩක්. කිසි බලයක් නැතිව අනෙක් කට්ටියගේ ඒවා හොය හොයා ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි ඉදිරි මාස හය ඇතුළත ඒ වාගේ ප්‍රශ්නයක් ඇති වුණොත් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ඒ සම්බන්ධව ගන්න පියවර මොකක්ද කියලා.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිරි පිටි මිල පිළිබඳව කටයුතු කරන්නේ වෙළෙඳ අමාත්‍යාංශයයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බොහොම ස්තුතියි. බලන්න, හොඳට උත්තර දුන්නානේ. පොඩ්ඩක් ඉන්නකෝ කෑ ගහන්නේ නැතිව. දැන් බලන්න, අපි දෙන්නා අතර ප්‍රශ්න-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්ථාවර නියෝග අංක 28 (2)ට ගරු මන්ත්‍රීතුමාගේ අවධානය යොමු කළ යුතුයි කියලා මා විශ්වාස කරනවා. මොකද, දිගින් දිගටම කාලය ගතවන නිසා. පොඩ්ඩක් අහ ගන්න. ස්ථාවර නියෝග අංක 28.(2)හි මෙසේ සඳහන් වනවා:

"මුල් ප්‍රශ්නයට ඇතුළත් නොවූ කරුණු අතුරු ප්‍රශ්නයක ඇතුළත් නොකළ යුතුය."

## ශ්‍රී ලංකාවේ ආයෝජකයන්: බදු ප්‍රතිලාභ/ නිදහස් කිරීම්

### இலங்கையில் முதலீடு செய்வோர்: வரிச் சலுகைகள்/ விடுவிப்புகள்

### INVESTORS IN SRI LANKA : TAX BENEFITS/EXEMPTIONS

1414/'11

1. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ප්‍රශස්ථ ආයෝජකයකු වෙත ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා හඳුන්වා දීමේදී උපයෝගී කර ගන්නා විශේෂිත විකුණුම් උපක්‍රම කවරේද;

(ii) ඉන්දියාව, ඉන්දුනීසියාව, බංග්ලාදේශය, චීනය, වියට්නාමය සහ කාම්බෝජය සමඟ මාසික පිරිවැය පදනමින් සංසන්දනය කිරීමේදී පිරිවැය හා සම්බන්ධ අපේ ශ්‍රමයේ තරඟකාරීත්වය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (ii) හි සඳහන් අනෙකුත් රටවල් සමග සංසන්දනය කිරීමේදී ශ්‍රී ලංකාව ආයෝජකයකු වීමට හැකියාව ඇති අයෙකුට ලබා දෙනු ලබන බදු ප්‍රතිලාභ කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ ආයෝජකයින්ට, නිෂ්පාදකයින්ට හා සේවා සැපයුම්කරුවන්ට දැනට අදාළ වන විවිධ බදු වර්ග කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ ආයෝජනය කරන ශ්‍රී ලාංකික ආයෝජකයකුට දැනට ලබා දෙන බදු ප්‍රතිලාභ සහ බදු නිදහස් කිරීම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சாத்தியமான முதலீட்டாளர்களுக்கு இலங்கை முதலீட்டுச் சந்தையை அறிமுகப்படுத்தும் பொழுது பயன்படுத்தப்படும் தனித்துவமான விற்பனைத் திட்டங்களையும்;

(ii) இந்தியா, இந்தோனேசியா, வங்காளதேசம், சீனா, வியட்நாம் மற்றும் கம்போடியா ஆகிய நாடுகளுடன் மாதமொன்றுக்கான உற்பத்திச் செலவின் அடிப்படையில் ஒப்பிடும்போது, உற்பத்திச் செலவுடன் தொடர்புடைய எமது உழைப்பின் போட்டித்தன்மை எவ்வளவு என்பதையும்

அவர் கூறுவாரா?

[ගරු රවි කරුණානායක මහතා]

(ஆ) (i) மேலே (II) இல் குறிப்பிடப்பட்ட நாடுகளுடன் ஒப்பிடுகையில், இலங்கையில் சாத்தியமான ஓர் முதலீட்டாளருக்கு உரித்தான வரிச் சலுகைகளையும்;

(ii) இன்றுள்ளவாறாக முதலீட்டாளர்கள், உற்பத்தியாளர்கள் மற்றும் சேவை வழங்குவோர் ஆகியோருக்கு இலங்கையில் பயன்படுத்தப்படும் பல்வேறு வகையான வரிகளையும்;

(iii) இலங்கையில் முதலீடு செய்யும் இலங்கை முதலீட்டாளர் ஒருவருக்கு இன்றுள்ளவாறாகக் கிடைக்கும் வரிச் சலுகைகளையும் வரி விடுவிப்புக்களையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development :

(a) Will he state-

(i) the unique selling propositions that are used, when marketing Sri Lanka to a potential investor; and

(ii) the competitiveness of our labour in terms of cost compared to India, Indonesia, Bangladesh, China, Vietnam, and Cambodia on the basis of per month cost?

(b) Will he also state-

(i) the tax benefits entitled to a potential investor in Sri Lanka, compared to the other countries referred in a (ii) above;

(ii) the various taxes that are applicable in Sri Lanka as at today for investors, manufacturers and service providers; and

(iii) the tax benefits and the taxes exempted for a Sri Lankan investor, investing in Sri Lanka as at today?

(c) If not why?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i)* භූගෝලීය පිහිටීම යෝග්‍ය පිහිටීම

* වර්ෂය පුරා පවතින හිතකර දේශගුණික තත්ත්වයන්ගෙන් සහ වැව්, දිය ඇලි, කඳු සහ වැසි වනාන්තර වැනි ස්වාභාවික පරිසරයකින් සමන්විත දර්ශනීයත්වයකින් යුක්ත වූද, ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක්

* තිස් වසරක යුද ගැටුම් නිමා වීම හේතුවෙන්, රටෙහි පවතින සාමකාමී වාතාවරණය හා දේශපාලනික ස්ථාවරත්වය

* පුරෝකථනය කළ හැකි සහ විශ්වාසනීය නෛතික, නියාමක හා ප්‍රතිපත්තිමය වාතාවරණය

* ආර්ථිකයේ ප්‍රධානතම අංශයන්හි, විශේෂයෙන්ම මහාමාර්ග, වරාය, ගුවන් තොටු පොළ වැනි අන්තර්ව්‍යුහ ක්ෂේත්‍රයන්හි, ශක්තිමත් ආර්ථිකමය ක්‍රියාකාරිත්වය

දැනුම් කේන්ද්‍රයක්, වාණිජ්‍ය කේන්ද්‍රයක්, නාවික හා සමුද්‍ර කේන්ද්‍රයක්, ගුවන් ගමන් කේන්ද්‍රයක් සහ බලශක්ති කේන්ද්‍රයක් වශයෙන් වැදගත් පංච කේන්ද්‍රයන් ප්‍රවර්ධනය කරමින්, ශ්‍රී ලංකාව උපාය මාර්ගිකව වැදගත් ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය.

විශේෂයෙන්ම තොරතුරු හා සංනිවේදන තාක්ෂණය සහ ගිණුම්කරණ ක්ෂේත්‍රයන්හි නිපුණත්වයකින් යුත් වෘත්තීයමය සුදුසුකම් ලත් මානව සම්පත් ලබා ගත හැකි ජනප්‍රිය ප්‍රභවයක් වීම.

ආර්ථික නිදහස් දර්ශකය මඟින් රටක ව්‍යවසාය-හිතකර ප්‍රතිපත්තිමය වාතාවරණය මැන බැලිය හැකිය. ආර්ථික නිදහස් දර්ශකය - 2011ට අනුව, ශ්‍රී ලංකාවට රටවල් 179ක් අතුරින් 107 වන ස්ථානයද, ආසියා ශාන්තිකර කලාපයේ රටවල් 41 අතුරින් 19 වන ස්ථානය ද මේ වන විට හිමි කර ගෙන ඇත.

විශාලතම වෙළෙඳ පොළ සඳහා ප්‍රවේශය-ඉන්දියාව හා පාකිස්තානය සමඟ නිදහස් වෙළෙඳ ගිවිසුම් තුළින්.

(ii) 13 වන වගුව - ශ්‍රම - පිරිවැය සැසඳුම

| රට | සාමාන්‍ය සේවකයකුගේ මාසික වේතනය (ඇ.ඩො.) - අග නගර | පළාත්බද ප්‍රදේශ |
|---|---|---|
| චීනය | 364 | 185-311 |
| හොංකොං-චීන | 1522 | - |
| වියට්නාමය | 96 | 107-114 |
| කාම්බෝජය | 101 | - |
| ඉන්දුනීසියාව | 186 | 240 |
| ඉන්දියාව | 294 | 196-306 |
| බංග්ලාදේශය | 54 | - |
| ශ්‍රී ලංකාව | 120 | - |

ප්‍රභවය: ජපාන විදේශීය වෙළෙඳ සංවිධානය, ආයෝජන ආශ්‍රිත

පිරිවැය සමීක්ෂණය- 2011 අප්‍රේල්

පිරිවැයට අදාළව ඉන්දුනීසියාව, ඉන්දියාව සහ චීනය හා සැසඳීමේදී, තෝරා ගත් රටවලින් ශ්‍රී ලංකාවේ ශ්‍රමය ඉතා ඉහළ තරගකාරී තත්ත්වයක පවතී. එසේ වුවද, වියට්නාමයේ හා බංග්ලාදේශයේ ඉතාමත් ලාභදායී ශ්‍රම වටිනාකමක් පවතී. කාම්බෝජයේ ශ්‍රම පිරිවැය සමඟ සැසඳීමේදී එය ශ්‍රී ලංකාව හා සමතුලිත මට්ටමක පවතී.

(ආ) (i) ඇමුණුම - 3 බලන්න. ඇමුණුම 3 **සහාගත*** කරමි.

(ii) 14 වන වගුව බලන්න.

14 වන වගුව - ශ්‍රී ලංකාවට අදාළ වන බදු වර්ග

| **බදු වර්ගය** | **අදාළ වන අනුපාතය** | **වැඩිදුර සටහන්** |
|---|---|---|
| සමාගමට අදාළ වන | | |
| 1. සාමූහික බදු (ආදායම් බදු) | අපනයන වෙළඳ පොළ නම් - 12% දේශීය වෙළෙඳ පොළ නම් - 28% | බදු සහන කාලයෙන් පසුව බලසහිත වෙයි. |
| 2. එකතු කළ අගය මත බදු | 12% | කාර්තුවක පිරිවැටුම රු. 650,000.00 ක් හෝ වසරකට රු. මිලියන 2.5ක් |
| 3. ආර්ථික සේවා ගාස්තු | ඇහලුම් අපනයනකරුවන් හා රෙදිපිළි නිෂ්පාදකයින් - 0.1% බදු සහන කාලය තුළ/සහනදායී බදු පදනම/ පාඩු ලබන ව්‍යවසායයන් - 0.25% වෙනත් - 01% | කාර්තුවක පිරිවැටුම රුපියල් මිලියන 25ක් හෝ ඊට වැඩි |
| 4. ජාතිය ගොඩනැඟීමේ බද්ද | 02% | කාර්තුවක පිරිවැටුම රුපියල් 500,000ක් හෝ වසරකට රුපියල් මිලියන 25 |
| 5. ලාභාංශ | 10% | |

ආනයනයන්ට අදාළ

| | | |
|---|---|---|
| 1. තීරු බදු | **<u>අපනයන</u>** ප්‍රාග්ධන භාණ්ඩ - බද්දෙන් නිදහස් කෙරේ. අමු ද්‍රව්‍ය - බද්දෙන් නිදහස් කෙරේ. **<u>දේශීය වෙළෙඳ පොළ</u>** ප්‍රාග්ධන භාණ්ඩ (ව්‍යාපෘතිය ස්ථාපනය කෙරෙන කාල වකවානුව තුළ) - බද්දෙන් නිදහස් කෙරේ. අමු ද්‍රව්‍ය භාණ්ඩවලට නිශ්චිත ගාස්තු | |
| 2. එකතු කළ අගය මත බද්ද | අපනයන ප්‍රවර්ධන කලාප තුළ - නිදහස් කෙරේ. අපනයන ප්‍රවර්ධන කලාපවලින් බැහැරව - අපනයන නම් වෙනස් වේ. වෙනත් 12% | |
| 3. ජාතිය ගොඩනැඟීමේ බද්ද | **<u>අපනයන</u>** ප්‍රාග්ධන භාණ්ඩ - 02% අමු ද්‍රව්‍ය - බද්දෙන් නිදහස් කෙරේ. **<u>දේශීය වෙළෙඳ පොළ</u>** ප්‍රාග්ධන භාණ්ඩ - 02% අමු ද්‍රව්‍ය - 02% | |
| 4. වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද | **<u>අපනයන</u>** ප්‍රාග්ධන භාණ්ඩ 05% අමු ද්‍රව්‍ය - බද්දෙන් නිදහස් කෙරේ. **<u>දේශීය වෙළෙඳ පොළ</u>** ප්‍රාග්ධන භාණ්ඩ - 05% අමු ද්‍රව්‍ය 05% | |
| 5. සෙස් බද්ද | **<u>අපනයන</u>** ප්‍රාග්ධන භාණ්ඩ - අදාළ වන (භාණ්ඩවලට නිශ්චිත ගාස්තු) අමු ද්‍රව්‍ය - බද්දෙන් නිදහස් කෙරේ. **<u>දේශීය වෙළෙඳ පොළ</u>** ප්‍රාග්ධන භාණ්ඩ - අදාළ වන (භාණ්ඩවලට නිශ්චිත ගාස්තු) අමුද්‍රව්‍ය - අදාළ වන (භාණ්ඩවලට නිශ්චිත ගාස්තු) | |

(iii) ශ්‍රී ලාංකිකයින් හා විදේශකයින් අතර වෙනස් අයුරින් සැළකීමක් නැත. කරුණාකර 14 වන වගුව සහ ඇමුණුම - 03 බලන්න.

ව්‍යවසාය වර්ග 05ක් සඳහා දිරිමත් කිරීමේ බදු සහන පිරිනැමේ.

15 වන වගුව බලන්න.

15 වන වගුව - දැනට ආයෝජකයින්ට පිරිනැමෙන දිරිමත් කිරීමේ බදු සහන

| **ව්‍යාපාර වර්ගය/ අංශය** | **අවම ආයෝජනය අවශ්‍යතාව** | **බදු ප්‍රතිලාභ (බදු සහන)** |
|---|---|---|
| 1. සුළු පරිමාණයේ ව්‍යාපාර • නිෂ්පාදන • කෘෂි/ සේවා | රු. මිලියන 50 රු. මිලියන 25 | වසර 04 වසර 04 |
| 2. මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර • නිෂ්පාදන/ කෘෂි/ සේවා | රු. මිලියන 50 - 100 රු. මිලියන 100 - 200 මිලියන 200ට වැඩි | වසර 04 වසර 05 වසර 06 |
| 3. විශාල පරිමාණයේ ව්‍යාපාර • කෘෂි/වන වගා • සාම්ප්‍රදායික නොවන භාණ්ඩ නිෂ්පාදනය/ නිපදවීම හෝ සැකසීම දේශීය හෝ අපනයන වෙළෙඳ පොළ සඳහා නිෂ්පාදනය • සේවා සැපයුම් | රු. මිලියන 300 - 500 රු. මිලියන 500-700 රු. මිලියන 700-1000 රු. මිලියන 1000-1500 රු. මිලියන 1500-2500 රු. මිලියන 2500ට වැඩි | වසර 6 වසර 7 වසර 8 වසර 9 වසර 10 වසර 12 |
| 4. ව්‍යාපාර ව්‍යාප්ත කිරීම් | රු. මිලියන 59 | ආයෝජන මුදල ආපසු උපයා ගැනීම සඳහා වසර 4ක් ඇතුළත සුදුසුකම් ලැබීමේ ගෙවීම්වලට අවසරය ලැබේ. |
| 5. උපාය මාර්ගික ආනයන ආදේශන ව්‍යාපාර රෙදිපිළි ඖෂධ කිරි පිටි සිමෙන්ති | ඇ. ඩො. මිලියන 05 10 30 50 | **<u>නව ව්‍යාපාර</u>** වසර 5ක මුළු බදු සහන. ඉන්පසු 12% **<u>පවතින ව්‍යාපාර</u>** පස් වසරකට සියයට 12ක සහනදායී බදු සහ ආයෝජන මුදල ආපසු උපයා ගැනීම සඳහා වසර 4ක් ඇතුළත සුදුසුකම් ලැබීමේ ගෙවීම්වලට අවසරය |
| 6. උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ උපාය මාර්ගික ව්‍යාපෘති | 25 වසරක් දක්වා | විස්තර සඳහා 1වන වගුව බලන්න. |

(ඇ) අදාළ නොවේ.

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

***සභාමේසය මත තබන ලද ඇමුණුම :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

| Tax Benefit | Sri Lanka | India | Indonesia | Bangladesh | China | Vietnam | Cambodia |
|---|---|---|---|---|---|---|---|
| Reduced Corporate Tax Rate | Standard Rate of 28% w.e f. 01/04/2012<br><br>Export Sector – 12%<br><br>Exports with more than 65% domestic 65% domestic value addition – 10%<br>Agric Sector – 10 -12%<br>Manufac. Sector (for local market)<br>i) Taxable income exceeds LKR 5mn - 28%<br>ii) Taxable income not exceeds LKR 5mn – 12%<br>Export Oriented services – 12%<br>Tourism – 12%<br>Infrastructure – 12%<br>Education services – 10%<br>Software development – 10%<br>Petroleum Exploration – 12%<br>Storage facilities -10%<br>Supply of Labour- 10% | 30% | 25%<br><br>Taxable income reduction as much as 30 % of the realized investment spread in 6 (six) years. | 27.5% (Publicly traded)<br>37.5% (if not Publicly traded)<br>Bank, Insurance, *leasing*& other Financial Institutions - 42.5%<br>Mobile Phone Operators – 45%, when transform to a Publicly traded by offering 10% of capital in IPO then tax rate 35% | standard 25%<br><br>For high tech companies 15% and<br>50%deduction for qualifying R & D Expenditure<br><br>For small businesses -20% | 10 – 20% for period of 10 – 15 years | 20% |
| Corporate Tax exemption (period and Rate) | Exemption – 100%<br>Small scale : 4 years<br>Medium Scale : 4-6 years<br>Large scale 6 – 12 years<br><br>Strategic Import Replacement Enterprises – 5 years<br><br>Strategic Development Projects – up to 25 years | 100% - for 10 years – Knowledge based enterprises<br><br>100% - for 5 years – power projects, export oriented enterprises, new industries | | Location specific: up to 30th June 2012<br>Dakha & Chittagong – 5 years –<br>First 2 yr – 100%<br>Next 2 yrs – 50%<br>Last 1 yr – 25%<br><br>Khulna,Sylhet, Barisal & Rajshahi divisions – 7 years | 2 years exemption and followed by 3 years tax at 12.5% rate for high technology enterprises established after 2008. | 100% for 4 years<br>50% up to 9 years | A tax holiday period is composed of "Trigger period" + 3 years + Priority Period upto maximum 9 years.<br>• Priority Period depend on investment<br>• light industries – 0<br>• below US$ 5 million-1 yr |

| Tax Benefit | Sri Lanka | India | Indonesia | Bangladesh | China | Vietnam | Cambodia |
|---|---|---|---|---|---|---|---|
| | | in notified states and promoted Zones | | First 3 yrs- 100%<br>Next 3 yrs – 50%<br>Last 1 yr – 25%<br><br>For Private Power Companies - 15 years (100%)<br>Applicable to 24 sectors<br><br>Accelerated Depreciation allowance in leiu of tax holiday for new industrial undertakings<br>1st year undertaking starts – 50% of the actual cost of plant & machinery<br>Next following 2nd year -30% of the actual cost of plant & machinery<br>Next following 3rd year – 20% of the actual cost of plant & machinery | | | US$5 - 20 million-2 yr |
| Concessionary Tax Rate (period & Rate) | Standard rates after Tax holiday period<br>For Strategic Import Replacement Enterprises – 12% for five years coupled with qualifying payment relief | | | Industries and service sector companies set up between July 1st 2009 and June 30th 2012:<br>In Dhaka and Chittagong – 1st &2nd Year -5%<br>For 3rd & 4th Year – 10% and<br>Fifth year – 15%<br>Khulna,Sylhet, Barisal | | | |

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

| Tax Benefit | Sri Lanka | India | Indonesia | Bangladesh | China | Vietnam | Cambodia |
|---|---|---|---|---|---|---|---|
| | | | | & Rajshahi divisions<br>$1^{st}$,$2^{nd}$ & $3^{rd}$ year – 5%<br>$4^{th}$,$5^{th}$ & $6^{th}$ year – 10%<br>$7^{th}$ year 15% | | | |
| Import Duty Exemption for Capital Goods | Yes (during project establishment period) | | All investment projects approved by the Investment Coordinating Board or by the Office of Investment in the respective districts, Relief from import duty so that the final tariffs become 0 %.<br>• Importation of capital goods namely machinery, equipments, spare parts and auxiliary equipments for an import period of 2 (two) years, started from the date of stipulation | 1% import duty on machinery & spares – for initial installation (80 -100% export oriented industries)<br><br>3% import duty on machinery & spares – for initial installation – other Industries<br><br>VAT is exempted for imported capital machinery & spares. | Exemption for Machinery and Equipment. | Import duty exemption for projects in encouraged sectors<br><br>VAT exemption for exported goods | • Domestically oriented: production equipment, construction materials<br>• Export oriented: Production equipment, construction materials, raw materials, intermediate goods and accessories |
| For Raw Materials | Yes if Export oriented | | •Goods and materials or raw materials regardless of their types and composition, which are used as materials or components to produce finished goods or to produce services for the purpose of two years full | | | | |

| Tax Benefit | Sri Lanka | India | Indonesia | Bangladesh | China | Vietnam | Cambodia |
|---|---|---|---|---|---|---|---|
| | | | production (accumulated production time). (not applied to the assembling of cars and motor bikes except for its component industries.) | | | | |
| Tax relief on Reinvestments (Reinvestment Allowance) | The Investment will be treated as a qualifying payment deductible from the assessable income of the enterprise subject to a maximum of 25% of the investment for each year of assessment falling within the period of 4 years commencing from the year of investment since 01 st April 2011, and for Strategic Import Replacement Enterprises. | | | | | | |

References :

China foreign Investments incentives, www.worldwide-tax.com; **India foreign Investments incentives.www.worldwide-tax.com** www.cambodiainvestment.gov.kh,; Board of Investment Sri Lanka. www.investsrilanka.com,; Indonesia Investment Coordinating Board, www.bkpm.go.id ; Tax incentives for Investment: Making it Cost effective and competitive, Institute of Policy Studies, Sri Lanka (unpublished report); Investing in Bangladesh, Hand Book & Guidelines, Board of Investment, Bangladesh

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මම ඔබතුමාව අගය කරනවා, මේ වාගේ පිළිතුරක් ලබා දීම සම්බන්ධයෙන්. මා හිතන හැටියට මෙය පාර්ලිමේන්තුවට විතරක් නොවෙයි, සමස්ත ආයෝජකයන්ටත් උදවුවක් වෙනවා. මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය අහන්න ඉස්සර වෙලා මම එක එකතු කිරීමක් කරනවා. ඔබතුමන්ලා වෙළෙඳ ගිවිසුමුත් පාවිච්චි කරන්න. මේ Unique Selling Proposition එකක් යටතේ ලංකාව ඉන්දියාවත් එක්ක තිබෙන වෙළෙඳ ගිවිසුම ඔබතුමා පාවිච්චි කරන්න අවශ්‍යයි. ඒක අපේ කාලයේ ගත්ත එකක්. මා හිතන හැටියට ඒක වටිනවා ඔබතුමන්ලාට විකුණන්න. ඒක දමලා තිබුණේ නැහැ. මොකද වෙළෙඳ ගිවිසුම් අපට-

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ, මම කිව්වා. අපේ වෙළෙඳ ගිවිසුම් තුනක් තිබෙනවා නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Indian market එකට ඒක ලොකු-

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ, මම කිව්වා. ඔබතුමා ඒක අහගෙන හිටියේ නැහැ. ඉන්දියාව සමඟයි, පාකිස්තානය සමඟයි, චීනය සමඟයි අපේ වෙළෙඳ ගිවිසුම් තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි. මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මේකයි. Hotelsවලට දීලා තිබෙනවා විදුලි බිල වැඩි කිරීම සියයට 15ක්. නමුත් ගෘහස්ථ පාරිභෝගිකයාට සියයට 40ක් වැඩි කර තිබෙනවා. මේ අසාධාරණය යම් විධියකින් සාධාරණීකරණය වන විධියකට ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයට ක්‍රියා කරන්න බැරිද? Hotelsවලට ගෙවන්නේ සුද්දන්ට.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු මන්ත්‍රීතුමනි, ඒකක ගණන අනුව තමයි මේ බද්ද තිබෙන්නේ. ගෘහස්ථ පාරිභෝගිකයාට බින්දුවේ ඉඳලා ඒකක 25ක්-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක පැන්නොත්, අපි කියමු ඒකක 60ක් හෝ ඒකක 90ක් කියලා. ඒ ලාංකිකයා සියයට 40ක් ගෙවන්න ඕනෑ. නමුත් මේ සුද්දන්ගේ hotelsවලට සියයට 15යි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
සුද්දෝ නොවෙයි නේ, මේ hotels කරන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙනම් ලංකාවේ කට්ටියද යන්නේ? ෂැන්ග්‍රී-ලා හෝටලයට-

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මේක ඉන්ධන මිල-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පරස්පරය-

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මේක බද්දක් නොවෙයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලා එක පැත්තකින් සුද්දන්ට බණිනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැරදි මතයක් රටට යනවා. මේක ඉන්ධන ගැළපුම් ගාස්තුවක් මිස බද්දක් නොවෙයි. පටන් ගන්න වෙලාවේදීත් විපක්ෂය කියන එක කාරණයක් මම දැක්කා. ඒක තමයි, සියයට 25කින්, සියයට 40කින්,සියයට 50කින්, සියයට 60කින් විදුලි බිල වැඩි කරලාය කියන එක. හැබැයි මේක ඉන්ධන ගැළපුම් ගාස්තුවක් විතරයි. ඒකයි බද්දක් හැටියට මෙතුමන්ලා නිකම් අර්ථ කථනය කරන්න හදන්නේ. ඒ නිසා මේ තිබෙන විදුලි ගාස්තුවෙන් සියයට 25ක් වැඩි වෙන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොනවා වුණත් අන්තිමට බිල නේ? බිලට ලාංකිකයා සියයට 40ක් ගෙවන කොට, මොකද සුද්දන්ගේ හෝටලයේ ඉන්න එක්කෙනා සියයට 15ක් ගෙවන්න ඕනෑ වන්නේ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔබතුමාත් හොඳ ව්‍යාපාරිකයෙක්. ඔබතුමා ගණන් හදලා බලන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකේ ඉතාමත්ම සුළු ගණනක් වැඩි වන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සුළු ගණනක්?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඉතාමත්ම සුළු ගණනක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අයියෝ! එහෙනම් ඇයි සුළු ගණනක් විතරක් වැඩි කළේ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
හිටපු විදුලිබල ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. එතුමාගෙන් අහන්න. මෙහිදී බිලෙන් සියයට 25ක් නොවෙයි වැඩි වන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ගරු නියෝජ්‍ය ඇමතිතුමා දැන් පිළිතුරක් දුන්නා නේ. ඔබතුමා දැන් දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම මේ ප්‍රශ්නය අහන්නේ ඔබතුමාට විරුද්ධව නොවෙයි. ඔබතුමාගේ අදක්ෂ, බොරු කරන ආණ්ඩුවට විරුද්ධවයි. දැන් ඔබතුමන්ලාගේ මේ- [බාධා කිරීමක්] අහගන්න කෝ ඉතින්. ඔබතුමන්ලා පාන් මිල වැඩි කරනවාද, කිරි පිටි මිල වැඩි කරනවාද-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නෙස්ලේ කොම්පැනිය, ලංකා ඩේරිස් පෞද්ගලික සමාගම, ඇන්කර් කොම්පැනිය කියන ඒවාට තිබෙන බදු ප්‍රතිපත්තියත්, ලක්ස්ප්‍රේ කොම්පැනිය සහ මම හිතන විධියට දේශීය වශයෙන් තිබෙන තවත් කොම්පැනිවලට තිබෙන බදු ප්‍රතිපත්තියත් අතර ලොකු වෙනසක් තිබෙනවා.

පාරිභෝගික ආරක්ෂක අධිකාරියෙන් අද ඉල්ලා තිබෙනවා කිරි පැකට් එකකින් රුපියල් 35ක් වැඩි කරන්න කියලා. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් බදු ප්‍රතිපත්තියක් ඇති කරලා කිරි පිටි මිල වැඩි කරන්නේ නැතිව තියා ගන්න ඔබතුමන්ලාට බැරි ඇයි?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු මන්ත්‍රීතුමනි, මා හිතන්නේ ඔබතුමා ඒකත් අර්ථ කථනය කරනවා වැරැදියි කියලායි. ඔබතුමා සඳහන් කරපු ඇන්කර්- [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලා ජාතිකත්වය ආරක්ෂා කරන බව කියනවා; සුද්දන්ට බණිනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ජාතිකත්වය ආරක්ෂා කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නවසීලන්තයේ හරකුන්ට බණිනවා. ඒ ඔක්කෝම කරන්නේ මේ ආණ්ඩුව.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
දේශීය හා විදේශීය කියන බදු ක්‍රමයේ ලොකු වෙනසක් නැහැ. BOI එකේ ලියා පදිංචි වෙච්ච, ඒ ක්‍රමය යටතේ තිබෙන ආයෝජනයක් සඳහා එක සැරයයි බදු සහනයක් තිබෙන්නේ. අනෙක් ඒවායේ පොදු බදු සහන තිබෙනවා. පොදු tax එකක් තමයි තිබෙන්නේ. විදේශීය සමාගම්වලට බදු සහනයක් දෙනවා කියන එක වැරැදියි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇයි ඒ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
එක වතාවකදී විතරයි ඒක තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒක වැරැදියි නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අදාළ කාල සීමාව පැන්නාම ඒ බදු සහනය නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තවම දෙවැනි අතුරු ප්‍රශ්නයේයි ඉන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්නය ඇහුවා. එතුමා උත්තර දුන්නා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම නැහැ. දක්ෂ ලෙස උත්තර දෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එහෙම දිගින් දිගටම අහන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා. දැන් පස් වරු 2.35යි වෙලාව. ප්‍රශ්නවලට නියමිත පැය ඉක්මවලායි තිබෙන්නේ. අද ශෝක ප්‍රකාශ යෝජනා දෙකක් තිබෙනවා. අභාවප්‍රාප්ත හිටපු ගරු මන්ත්‍රීවරුන් දෙදෙනකුගේ පවුල්වලින් ඇවිල්ලා ඉන්නවා. යාපනයේ ඉඳලාත් ඇවිල්ලා ඉන්නවා. ඒ නිසා කරුණාකර තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බලන්න කෝ. මේකත් වළලන්න හදනවා. තුන්වන අතුරු ප්‍රශ්නය වශයෙන් අහන්නේ මේකයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඊයේත් උත්තර දුන්නා, අදත් උත්තර දෙනවා; ඔබතුමාගේ ඇමුණුම්වලට අදාළව ඔබතුමන්ලාගේ බදු ප්‍රතිපත්තිය අනුව China Merchants Holdings එකට ඔබතුමන්ලා අවුරුදු 20කට සම්පූර්ණයෙන්ම බදු නැති කරලා තිබෙනවා. නමුත් දේශීය වශයෙන් තිබෙන වරාය අධිකාරියේ JCT, SAGT වාගේ ඒවාට සියයට 25ක බද්දක් තිබෙනවා. මා කියන්නේ මෙහි පරස්පරයක් තිබෙනවා කියායි. අපේ දේශීය ආයෝජකයා පුළුවන් තරම් ආයෝජනය කළත් ඔහුට බදු විරාමයක් නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමා අතුරු ප්‍රශ්නය ඇහුවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පක්ෂයට තිබෙන එකම ප්‍රශ්නය චීනයෙන් සල්ලි ගෙනෙන එකයි. චීන ආයෝජනයට විරුද්ධව තමයි හැම තැනම කථා කළේ. [බාධා කිරීමක්] හර්ෂ ද සිල්වා මහත්මයා මේ පාර්ලිමේන්තුවේදීම කිව්වා, ෂැංග්‍රි-ලා හෝටලට හදන්න එක උදැල්ලක්වත් ගහලා නැහැ කියලා. අද උදේ ෂැංග්‍රි-ලා එක වැඩ පටන් ගත්තා. හෙට හම්බන්තොට වැඩ පටන් ගන්නවා. හැම තිස්සේම බොරු මතයක් රටට ගෙන යන්න හදනවා, අපට ආයෝජන එන්නේ නැහැ, අප වැඩ කරන්නේ නැහැ කියලා.

## දික්කුඹුර ආදර්ශ කනිටු විදුහල : විස්තර
## திக்கும்புர மாதிரி கனிஷ்ட வித்தியாலயம்: விபரம்
## DIKKUMBURA ADARSHA KANITU VIDUHALA : DETAILS

1538/'11

2. **ගරු අනුර දිසානායක මහතා (ගරු අජිත් කුමාර මහතා වෙනුවට)**
(மாண்புமிகு அநுர திஸாநாயக்க - மாண்புமிகு அஜித் குமார சார்பாக)
(The Hon. Anura Dissanayake on behalf of the Hon. Ajith Kumara)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) හබරාදූව අධ්‍යාපන කොට්ඨාසයේ, දික්කුඹුර ආදර්ශ කනිටු විදුහලේ, වර්ෂ 2003 සිට 2010 දක්වා කාලය තුළ, එක් එක් වර්ෂයේ ආරම්භයේදී;

(i) අධ්‍යාපනය ලැබූ මුළු සිසුන් සංඛ්‍යාව හා එක් එක් ශ්‍රේණිවල සිසුන් සංඛ්‍යාව;

(ii) ගුරුවරුන් සංඛ්‍යාව;

(iii) පළමුවැනි ශ්‍රේණියට අයදුම් කළ සිසුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) එම පාසලේ 2003 සිට 2010 වර්ෂය දක්වා කාල සීමාවේදී,

(i) ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති;

(ii) එම ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දුන් පුද්ගලයන් හා ආයතන;

(iii) රජයේ ආයතනයකින් මෙම පාසලට ලබා දුන් සංවර්ධන ව්‍යාපෘති;

කවරේද යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම් ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) ஹபராதூவ கல்வி வலயத்தில் திக்கும்புர மாதிரி கனிஷ்ட வித்தியாலயத்தில் 2003 ஆம் ஆண்டு தொடக்கம் 2010 ஆம் ஆண்டு வரையிலான காலப்பகுதியில் ஒவ்வொரு வருடத்தின் ஆரம்பத்திலும்,

(i) கல்விகற்ற மொத்த மாணவர்களின் எண்ணிக்கை மற்றும் ஒவ்வொரு தரத்திலுமான மாணவர்களின் எண்ணிக்கை;

(ii) ஆசிரியர்களின் எண்ணிக்கை;

(iii) முதலாவது தரத்துக்கு விண்ணப்பித்த மாணவர் களின் எண்ணிக்கை

எவ்வளவு என்பதை வெவ்வேறாக அவர் குறிப்பிடு வாரா?

(ஆ) மேற்படி பாடசாலையில் 2003 தொடக்கம் 2010ஆம் ஆண்டு வரையிலான காலப்பகுதியில்,

(i) நடைமுறைப்படுத்தப்பட்ட அபிவிருத்திக் கருத் திட்டங்கள்;

(ii) மேற்படி கருத்திட்டங்களுக்கு நிதி வழங்கிய நபர்கள் மற்றும் நிறுவனங்கள்;

(iii) அரச நிறுவனங்களினால் இப்பாடசாலைக்கு வழங்கப்பட்ட அபிவிருத்திக் கருத்திட்டங்கள்

யாவை என்பதை வருடாந்த அடிப்படையில் வெவ் வேறாக குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state separately-

(i) the total number of students who received education and the number of students in each grade;

(ii) the number of teachers;

(iii) the number of students who applied for the admission to Grade one;

in Dikkumbura Adarsha Kanitu Viduhala in Habaraduwa Educational Zone at the beginning of each year during the period from the year 2003 up to 2010?

(b) Will he state separately with respect to the aforesaid school;

(i) the number of development projects implemented;

(ii) the persons or institutions that provided financial allocations for the aforesaid projects; and

(iii) the development projects granted by Government institutions;

in each of the years during the period from year 2003 up to the year 2010?

(c) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

(ii) ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

(iii)

| වර්ෂය | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|---|---|---|
| ශිෂ්‍ය සංඛ්‍යාව | නැත | නැත | 31 | 31 | 45 | 89 | 67 | 58 |

(ආ) (i) ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

(ii) ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

(iii) ඇමුණුම 03 මඟින් දක්වා ඇත. (පාසල් පෝෂණ ව්‍යාපෘතිය හා පාසල් පිරියත අලංකරණය යන ව්‍යාපෘති ක්‍රියාත්මක වීම තුළින් පාසල වෙත දරුවන්ගේ ආකර්ශනය වැඩි වී තිබේ.)

(ඇ) අදාළ නොවේ.

**ඇමුණුම 01**

| වර්ෂය | ශිෂ්‍ය සංඛ්‍යාව (ශ්‍රේණි අනුව) | | | | | |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | එකතුව |
| 2003 | නැත | 1 | 3 | 2 | 5 | 11 |
| 2004 | නැත | නැත | නැත | 2 | නැත | **2** |
| 2005 | 31 | නැත | නැත | නැත | 2 | **33** |
| 2006 | 26 | 30 | නැත | නැත | නැත | **56** |
| 2007 | 35 | 27 | 30 | නැත | නැත | **92** |
| 2008 | 38 | 36 | 27 | 30 | නැත | **131** |
| 2009 | 42 | 37 | 37 | 22 | 29 | **167** |
| 2010 | 28 | 34 | 36 | 32 | 20 | **150** |

ගුරුවරුන් සංඛ්‍යා

| **වර්ෂය** | **ගුරුවරුන් සංඛ්‍යාව** |
|---|---|
| 2003 | 3 |
| 2004 | 2 |
| 2005 | 3 |
| 2006 | 4 |
| 2007 | 5 |
| 2008 | 6 |
| 2009 | 7 |
| 2010 | 7 |

**ඇමුණුම 02**

ගා/දික්කුඹුර කනිෂ්ඨ විද්‍යාලය, පණුගල්ගොඩ, දික්කුඹුර

(1) විදුහලට ගාල්ල අධ්‍යාපන කාර්යාලය මඟින් වන ගුණාත්මක යෙදවුම් ලැබීම්.

| **වර්ෂය** | **ලැබුණු මුදල් රු.** |
|---|---|
| 2003 | 25,690.00 |
| 2004 | ලැබී නැත. |
| 2005 | 23,680.00 |
| 2006 | 44,400.00 |
| 2007 | 44,000.00 |
| 2008 | 23,450.00 |
| 2009 | 7,820.00 |
| 2010 | 3,698.00 |
| 2011 | 12,550.00 |

(2) සියලුම සිසුන්ට වර්ෂයන්ට නියමිත නිල ඇඳුම් රෙදි ලබා දෙන ලදී.

(3) සියලුම සිසුන්ට පාසල් පෙළ පොත් නොමිලේ ලබා දෙන ලදී.

**ඇමුණුම 03**

ගා/දික්කුඹුර කනිෂ්ඨ විද්‍යාලයය, පණුගල්ගොඩ, දික්කුඹුර

1 **ශ්‍රේණියට ඇතුළත් වන සිසු දරුවන් සඳහා පාසල් උපකරණ හා සපත්තු ලබා දීම**

| ***වර්ෂය*** | ***ශිෂ්‍ය සංඛ්‍යාව*** | ***ලබා දුන් ආයතනය*** |
|---|---|---|
| 2003 | - | ලබා දී නැත. |
| 2004 | - | ලබා දී නැත. |
| 2005 | 31 | නැණ උල්පත ප්‍රජා මණ්ඩලය |
| 2006 | 26 | නැණ උල්පත ප්‍රජා මණ්ඩලය |
| 2007 | 35 | නැණ උල්පත ප්‍රජා මණ්ඩලය |
| 2008 | 38 | ලැබී නැත |
| 2009 | 42 | ලැබී නැත |
| 2010 | 28 | ලැබී නැත |
| 2011 | 37 | ලැබී නැත |

 නැණ උල්පත ප්‍රජා මණ්ඩලය යනු එක්සත් ජනතා නිදහස් සන්ධාන ගාල්ල දිස්ත්‍රික් ගරු පා. මන්ත්‍රී අජිත් කුමාර මැතිතුමාගේ ග්‍රාමීය පාසල් සංවර්ධනය කිරීම සඳහා දායකත්වය ලබා දුන් වැඩසටහනකි.

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

ගා/දික්කුඹුර කනිෂ්ඨ විද්‍යාලය. පණුගල්ගොඩ, දික්කුඹුර.

**පාසලේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති - පාසල් පෝෂණ ව්‍යාපෘතිය**

| වර්ෂය | ශ්‍රේණි | ශිෂ්‍ය සංඛ්‍යාව | ප්‍රතිපාදනය ලබා දුන් ආයතනය |
|---|---|---|---|
| 2005 | 1,5 | 33 | අධ්‍යාපන අමාත්‍යාංශය, ක. අ. කාර්යාලය, ගාල්ල |
| 2006 | 1,2 | 56 | අධ්‍යාපන අමාත්‍යාංශය, පාසල් පෝෂණ ව්‍යාපෘතිය |
| 2007 | 1,2,3 | 92 | අධ්‍යාපන අමාත්‍යාංශය, පාසල් පෝෂණ ව්‍යාපෘතිය |
| 2008 | 1,2,3,4 | 131 | අධ්‍යාපන අමාත්‍යාංශය, පාසල් පෝෂණ ව්‍යාපෘතිය |
| 2009 | 1,2,3,4,5 | 167 | අධ්‍යාපන අමාත්‍යාංශය, පාසල් පෝෂණ ව්‍යාපෘතිය |
| 2010 | 1,2,3,4,5 | 150 | අධ්‍යාපන අමාත්‍යාංශය, පාසල් පෝෂණ ව්‍යාපෘතිය |
| 2011 | 1,2,3,4,5 | 162 | අධ්‍යාපන අමාත්‍යාංශය, පාසල් පෝෂණ ව්‍යාපෘතිය |
| 2012 | 1A, 1B, 2, 3, 4, 5 | 213 | අධ්‍යාපන අමාත්‍යාංශය, පාසල් පෝෂණ ව්‍යාපෘතිය |

- ග්‍රාමීය පාසලකට දරුවන් කැඳවා ගැනීමට මෙම ව්‍යාපෘතිය බෙහෙවින් උපකාරි විය. 2003, 2004 වර්ෂවල ලැබී නැත.

ගා/දික්කුඹුර කනිෂ්ඨ විද්‍යාලයය. පණුගල්ගොඩ, දික්කුඹුර.

**ග්‍රාමීය පාසලක ඉංග්‍රීසි විෂයය ඉගැන්වීම ප්‍රචලිත කිරීම මගින් පාසල ජනප්‍රිය කරවීම**

| වර්ෂය | කරන ලද කාර්යයන් |
|---|---|
| 2003 | විශේෂ වැඩසටහනක් නැත. |
| 2004 | විශේෂ වැඩසටහනක් නැත. |
| 2005 | 5 ශ්‍රේණිය කාල සටහන, 1 ශ්‍රේණිය කවි, ගීත, ඉංග්‍රීසියෙන් ඉදිරිපත් කිරීම. |
| 2006 | සහෝදර පාසල් 4ක් සමඟ ඉංග්‍රීසි camp එකක් පැවැත්වීම. |
| 2007 | 3 ශ්‍රේණිය සිසුන් කොට්ඨාස තරගවලට ඉදිරිපත් කිරීම, ඉංග්‍රීසියෙන් ක්‍රියාකාරකම් කාමරය ගොඩ නැංවීම |
| 2008 | 3,4 ශ්‍රේණි සිසුන් කොට්ඨාස තරගවලට ඉදිරිපත් කිරීම, ADOP Sri Lanka මඟින් ඉංග්‍රීසි පොත් ලබා ගැනීම |
| 2009 | 3,4,5 ශ්‍රේණි සිසුන් තරගවලට ඉදිරිපත් කිරීම. |
| 2010 | 3,4,5 ශ්‍රේණි සිසුන් තරගවලට ඉදිරිපත් කිරීම, ඉංග්‍රීසි camp එකක් පැවැත්වීම, උදෑසන රැස්වීම ඉංග්‍රීසියෙන් ඇමතීම. |

ගා/දික්කුඹුර කනිෂ්ඨ විද්‍යාලයය. පණුගල්ගොඩ, දික්කුඹුර.

**භෞතික සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය**

| වර්ෂය | සංවර්ධනය කරන ලද අංශය | ප්‍රතිපාදනය රු. | ලබා දුන් පුද්ගලයින් හෝ ආයතන |
|---|---|---|---|
| 2003 | නැත | - | - |
| 2004 | පාසලේ (1) ශාලාව පංති කාමර වෙන් කිරීම. (1) පංති කාමර දැල් ගැසීම | 50,000.00 | ගාල්ල දිස්ත්‍රික් ගරු පා. මන්ත්‍රී අජිත් කුමාර මැතිතුමා - මන්ත්‍රී ප්‍රතිපාදන |
| 2005 මාර්තු | පාසලට විදුලි බලය ලබා දීම | - | නැණ උල්පත ප්‍රජා මණ්ඩලය |
| | සෙල්ලම් මිදුලට ඔංචිල්ලාවක් ලබා දීම | 20,000.00 | ඩබ්.වී. දයාරත්න මහතා ආදි ශිෂ්‍ය ඇ. අංක 094 |
| | කොඩි කණු සහිත වේදිකාව සැකසීම | 15,000.00 | ජී.වී. සරත් චන්ද්‍රතිලක මහතා ආදි ශිෂ්‍ය ඇ. අංක 675 |
| | බුදු ගෙය සෑදීම | 20,000.00 | එන්.වී. බන්දුසේන මහතා ආදි ශිෂ්‍ය ඇ. අංක 466 |

| වර්ෂය | සංවර්ධනය කරන ලද අංශය | ප්‍රතිපාදනය රු. | ලබා දුන් පුද්ගලයින් හෝ ආයතන |
|---|---|---|---|
| | පාසල් නාම පුවරු සැකසීම | 10,000.00 | චන්දිම සේනානායක මහතා (සුභ පතන්නා) |
| 2005 ඔක්තෝබර් | පාසලට නළ ජලය ලබා දීම | - | නැණ උල්පත ප්‍රජා මණ්ඩලය |
| | සෙල්ලම් මිදුලට ලිස්සන ඔරුව ලබා දීම | - | නැණ උල්පත ප්‍රජා මණ්ඩලය |
| | පාසලේ 2 ශාලාව II පංති කාමරය දැල් ගැසීම | 50,000.00 | මන්ත්‍රී ප්‍රතිපාදන, ගාල්ල දිස්ත්‍රික් ගරු පා. මන්ත්‍රී අජිත් කුමාර මැතිතුමා |
| 2005 දෙසැම්බර් | පාසලේ වැට සකස් කිරීම, ගොඩනැගිලි පින්තාරු කිරීම, ළිඳ පිළිසකර කිරීම | 10,000.00 | ප්‍රියමනාප පාසලක් දරුවන් සඳහා (අධ්‍යාපන අමාත්‍යාංශය, ක. අ. කාර්යාලය, ගාල්ල) මව්පිය සහාය |
| 2006 | වැසිකිළි 1ක්, කැසිකිළි ඒකක 3ක් පිරිමි ළමුන් සඳහා සෑදීම | 100,000.00 | ADOP Sri Lanka, කිකිළි හවුස්, ඉහළ ඩික්සන් පාර, ගාල්ල. |
| | I ශාලාව කොටසක් දැල් ගැසීම | 50,000.00 | මන්ත්‍රී ප්‍රතිපාදන - ගාල්ල දිස්ත්‍රික් ගරු පා. මන්ත්‍රී අජිත් කුමාර මැතිතුමා |
| 2007 | I ශාලාව ඉතිරි කොටස දැල් ගැසීම | 149,639.00 | මන්ත්‍රී ප්‍රතිපාදන - ගාල්ල දිස්ත්‍රික් ගරු පා. මන්ත්‍රී අජිත් කුමාර මැතිතුමා |
| | ඉංග්‍රීසි ක්‍රියාකාරකම් කාමරය ගොඩනැඟීම | 850,000.00 | ADOP Sri Lanka (අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය මත) |
| 2008 | ඌෂා විදුලි පංකා 2 | 8,500.00 | ADOP Sri Lanka (අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය මත) |
| 2009 | ඌෂා විදුලි පංකා 3 | 45,000.00 | ADOP Sri Lanka (අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය මත) |
| | පොත් රාක්ක 5, ළදරු මේස 12, පුටු 30 | - | දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| 2010 | ශබ්ද විකාශන යන්ත්‍රයට ඇම්ප්ලිෆයර් එකක්, මයික් එකක් ලබා දීම | 25,000.00 | සිහ ශක්ති සුභසාධක සංගමය, පණුගල්ගොඩ |

## වෙළෙඳ ක්ෂේත්‍රයේ සංවර්ධන ව්‍යාපෘති : ප්‍රතිලාභ
### வர்த்தகத்துறை அபிவிருத்திக் கருத்திட்டங்கள்: நன்மைகள்
### DEVELOPMENT PROJECTS IN THE FIELD OF TRADE : BENEFITS

1676/'11

4. **ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා (ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும - மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா )
(The Hon. J.R.P. Sooriyapperuma on behalf of the Hon. Mohan Priyadarshana De Silva)

සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ වෙළෙඳ ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) වෙළෙඳ ක්ෂේත්‍රයේ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2006ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரையான காலப்பகுதியில் வர்த்தகத்துறையில் நடைமுறைப்படுத்தப்பட்ட அபிவிருத்திக் கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(ii) இக்கருத்திட்டங்களினூடாக மக்களுக்குக் கிடைத்துள்ள நன்மைகள் யாவை என்பதையும்;

(iii) வர்த்தகத்துறையில் எதிர்காலத்தில் நடைமுறைப் படுத்த எதிர்பார்த்துள்ள அபிவிருத்திக் கருத் திட்டங்கள் யாவை என்பதையும்;

(iv) அவற்றிலிருந்து எதிர்பார்க்கப்படுகின்ற நன்மைகள் யாவை என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Co-operatives and Internal Trade:

(a) Will he inform this House -

(i) the development projects implemented in the field of trade during the period from year 2006 up to now;

(ii) the benefits received by the people through these projects;

(iii) the development projects expected to be implemented in the field of trade, in future; and

(iv) the results expected through them?

(b) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***** සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඇමුණුම Iහි දක්වා ඇත.

(ii) ඇමුණුම IIහි දක්වා ඇත.

(iii) ඇමුණුම IIIහි දක්වා ඇත.

(iv) ඇමුණුම IVහි දක්වා ඇත.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම I

**Annexure I**

**அட்டவணை I**

අ(i)

**2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ වෙළෙඳ ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන්**

- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
  - දැනුවත් කිරීමේ වැඩසටහන් (පාසල්, සිසුන්, වෙළෙඳ ප්‍රජාව සහ මහජනතාව) ප්‍රාදේශිය කොට්ඨාශ මට්ටමෙන් දිවයින පුරා පැවැත්වීමට කටයුතු කිරීම යටතේ වැඩසටහන් 1165ක් ක්‍රියාත්මක කර අවසන්කර ඇත.
  - වෙළෙඳපොළ විධිමත් කිරීම මගින් පාරිභෝගික සුරක්ෂිතතාවය ඇති කිරීම. වෙළෙඳපොළ වැටලීම් ක්‍රියාත්මක කිරීම යටතේ වැටලීම් 51,203ක්ද, දඩ මුදල් වශයෙන් රු.මි. 164.89 ක්ද අයකරගෙන ඇත.
  - පාරිභෝගික සංවිධාන පිහිටුවීම සහ ප්‍රවර්ධනය යටතේ වැඩසටහන් 295ක් ක්‍රියාත්මක කර ඇත.
  - පාරිභෝගික පැමිණිලි සඳහා විසඳුම් ලබා දීම යටතේ එක් එක් වර්ෂයේදී ලැබීඇති පැමිණිලි සංඛ්‍යාව පහත පරිදි වේ.
    - 2005 - 445
    - 2006 - 1169
    - 2007 - 1199
    - 2008 - 1318
    - 2009 - 1378
    - 2010 - 1792
  - පාරිභෝගික අයිතිවාසිකම් දින සැමරුම යටතේ සැමරුම් වැඩසටහන් 6 ක් පැවැත්වීම.
  - 2007, 2008, 2009, 2010, 2011 වර්ෂවල දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහනට සහභාගි වීම. 2012 වර්ෂය සඳහා දැනටමත් ප්‍රාදේශිය සංවර්ධන කටයුතු සඳහා සහාය වීම.

- සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව
  - සුනාමියෙන් විනාශ වී ගිය ගාල්ල ගබඩාව නැවත පිළිසකරකොට විවෘත කර දීම
  - කුරුඳුවත්ත (ගම්පොල) ගබඩාව විවෘත කිරීම
  - සංඝරාජ වෙළෙඳ ප්‍රදර්ශනාගාරය නව මුහුණුවරකින් ආරම්භ කිරීම සහ වෙනත් සමාගම්වල නිෂ්පාදනයන් අලෙවි කිරීම සඳහා හවුල්කරුවන් පත්කරගන්නා ලදී. මෙම විවෘත කිරීමට සමගාමීව "පිරිපුන් පියස" නමින් වෙළෙඳ ප්‍රදර්ශනයක්ද පවත්වනු ලැබිය.
  - අකර්මන්‍යව තිබූ අනුරාධපුර ගබඩාව රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව සමඟ ඒකාබද්ධව එම ගොඩනැගිලි නවීකරණය කොට නව මුහුණුවරකින් ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරීම.
  - ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් වසා තිබූ මඩකලපුව ගබඩාව වෙළෙඳ කටයුතු සඳහා යළි විවෘත කරන ලදී. එමෙන්ම මන්නාරම වසා තිබූ ගබඩාවද අලුත්වැඩියාකොට අවසන් අතර ඉදිරි සති 2 ඇතුළතදී විවෘත කිරීමට නියමිතය.
  - සංස්ථාව විසින් පුද්ගලික සමාගමක් සමඟ මාර්ගයේ ඇතිරීම සඳහා කොන්ක්‍රීට් ගල් නිපදවීමට බද්ධ ව්‍යාපාරයක් රත්නපුර ගබඩාව මුල්කොට ගෙන ආරම්භ කරන ලදී.

- ලංකා සතොස සමාගම
  - 2005 සහ 2006 වර්ෂය තුළ ලංකා සතොස අලෙවි සැල් 46ක් විවෘත කිරීම.
  - 2007 වර්ෂය තුළ ලංකා සතොස අලෙවි සැල් 20ක් විවෘත කිරීම.
  - 2008 වර්ෂය තුළ ලංකා සතොස අලෙවි සැල් 32ක් විවෘත කිරීම.
  - 2009 වර්ෂය තුළ ලංකා සතොස අලෙවි සැල් 43ක් විවෘත කිරීම.
  - 2010 වර්ෂය තුළ ලංකා සතොස අලෙවි සැල් 88ක් විවෘත කිරීම.
  - 2011 වර්ෂයේ 2011.11.29 දින දක්වා ලංකා සතොස අලෙවි සැල් 29ක් විවෘත කිරීම.
  - ලංකා සතොස බෙදාහැරීම් ගබඩා 07ක් 2005 වර්ෂයේ සිට මේ දක්වා විවෘත කිරීම.

- වී අලෙවි මණ්ඩලය
  - 2008 වර්ෂයේ මහින්ද චින්තනයට අනුව වී අලෙවි මණ්ඩලය නැවත ආරම්භ කරන ලද අතර ගොවි ජනතාවගෙන් පහත සඳහන් අන්දමට වී මිලදී ගැනීමේ කටයුතු ආරම්භ කරන ලදී

| වර්ෂය | ගැනුම් මිල රු. | | මිලදී ගත් ප්‍රමාණය මෙ. ටො. |
|---|---|---|---|
| | සම්බා | නාඩු | |
| 2008 යල | 30 | 28 | 5,772 |
| 2008/09 මහ | 30 | 28 | 37,400 |
| 2009 යල | 30 | 28 | 13,039 |
| 2009/10 මහ | 30 | 28 | 70,771 |
| 2010 යල | 30 | 28 | 111,789 |
| 2010/11 මහ | 30 | 28 | 3,470 |
| 2011 යල | 30 | 28 | 75,171 |

  - වී අලෙවි මණ්ඩලය සතු බදු දී සහ වෙනත් ක්‍රමවලින් යම් යම් පුද්ගලික අංශයට ලබා දී තිබූ දිවයිනේ ප්‍රදේශ ගණනාවක ගබඩා 145ක් පමණ වී අලෙවි මණ්ඩලය නැවත් අත්පත් කර ගන්නා ලදී
  - 2011 වර්ෂයේ නව ගබඩා 4ක් අලුතින් ඉදිකරන ලද අතර ගබඩා 26ක් අලුත්වැඩියා කටයුතු කරන ලදී

- විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන
  - 2007.08.16 වේයන්ගොඩ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය විවෘත කිරීම
  - 2008.12.04 නාරාහේන්පිට විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය විවෘත කිරීම
  - 2009.03.28 රත්මලාන විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය විවෘත කිරීම
  - 2009.12.04 නාරාහේන්පිට විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ රෙදි පිළි පරිශ්‍රය විවෘත කිරීම
  - 2010.03.22 පිළියන්දල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය විවෘත කිරීම

- මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව
  - අනුරාධපුර, මොණරාගල, මඩකලපුව සහ පොළොන්නරුව නව දිස්ත්‍රික් කාර්යාල හා විද්‍යාගාර ඉදි කිරීම
  - මාතර, මාතලේ, මඩකලපුව, මොණරාගල දිස්ත්‍රික් කාර්යාල අලුත්වැඩියා කටයුතු කිරීම
  - වාහන වායු විමෝචන පරීක්ෂණ උපකරණ සඳහා මිදිලි අනුමැතිය හා සත්‍යායන කටයුතු ආරම්භ කිරීම
  - ශ්‍රී ලංකාවේ සම්මත වේලාව විකාශය සඳහා www.sltime.org වෙබ් අඩවිය විවෘත කිරීම
  - පරිමාමිතික මිනුම් සඳහා නව විද්‍යාගාරයක් ඉදි කිරීම සහ මයික්‍රෝ පිපෙට්ටු අංක ශෝධන කටයුතු ආරම්භ කිරීම
  - 2T - ලිහිසි තෙල් විකිණීම සඳහා නව මිනුම් උපකරණයක් හඳුන්වා දීම
  - සෞඛ්‍ය ක්ෂේත්‍රයේ භාවිතාවන මිනුම් උපකරණ අංක ශෝධනය

- සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
  - සුපිරි වෙළෙඳ සැල් පිහිටුවීම
  - පාසල් දියර කිරි ව්‍යාපෘතිය යටතේ පාසැල් ළමුන් සඳහා නොමිලේ පෝෂණ ගුණය සහිත කිරි විදුරුවක් ලබා දීම සහ පාසැල් 04ක කිරිහල් ආරම්භ කිරීම
  - නැගෙනහිර නවෝදය යටතේ සුනාමිය හා ත්‍රස්තවාදී උවදුරින් විනාශ වූ සමුපකාර ව්‍යාපාරය යළි නගා සිටුවීම පිණිස එම ප්‍රදේශවල කෝප් සිටි නමින් වෙළෙඳසැල් 08 ක් පිහිටුවීම සහ උතුරු නැගෙනහිර ඇතුළු සියලු පළාත්වල කෝප් සිටි වෙළෙඳසැල් 375ක් පිහිටුවීම
  - විශ්ව විද්‍යාල සමුපකාර සමිති පිහිටුවීම
  - විවිධ සේවා සමුපකාර සමිතිවල ණය කපා හැරීම තුළින් වැසී යාමට ආසන්න සමුපකාර සමිති යළි නගා සිටුවීම
  - වතුකරයේ සහ අවට ප්‍රදේශවල ජනතාවට සහල් සහනාධාර ලබා දීම
  - සමුපකාර ගිණුම් ප්‍රමිත අත්පොත 2 කාණ්ඩය මුද්‍රණය කිරීම
  - සමුපදීපනි පුවත්පත මුද්‍රණය කිරීම සහ පුවත්පත් අතිරේකය පළ කිරීම
  - 2008 අයවැය යෝජනා අනුව අත්‍යාවශ්‍ය භාණ්ඩ අඩුමිලට බෙදා හැරීම හා දිවයිනේ සියලුම සමුපකාර සමිති වසර 5ක කාලයක් සඳහා පහත සඳහන් බදු වලින් නිදහස් කිරීම
  - එකතු කළ අගය මත බදු
    - ආදායම් බදු
    - කර බද්ද
    - පිරිවැටුම් බද්ද
    - මුද්දර බද්ද
  - මිනි කෝප් සිටි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
  - උතුරු වසන්තය යටතේ සෙට්ටිකුලම සහන ගම්මානයේ මිනි කෝප් සිටි 33ක් පිහිටුවීම, වි. සේ. ස. සමිති 17ක්, ප්‍රාදේශික 55ක් සහ මන්නාරම සහල්මෝල ආරම්භ කිරීම

- සමුපකාර ව්‍යාපාරය පරිගණක ජාලගත කිරීම (කෝප් නෙට් ව්‍යාපෘතිය)
- දැයට කිරුළ වෙළෙඳ හා අධ්‍යාපන ප්‍රදර්ශනය හරහා සමුපකාර ක්ෂේත්‍රය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම
- 2009 සිංහල හින්දු අලුත් අවුරුද්දට පැළ 2,900,000 ක් රෝපණය කිරීමේ වැඩසටහන
- 2010.01.06 සිට පාරිභෝගික ජනතාව වෙත සහන මිලට සහල් බෙදා හැරීම
- 2010.12.02 කෝප් සිටි වෙළෙඳ ප්‍රදර්ශනය
- ඒකාබද්ධ මිලදී ගැනුම් වැඩසටහන ආරම්භ කිරීම
- වී මිලදී ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- වී මෝල් නවීකරණය කිරීම
- දිවයින පුරා උප කොමසාරිස් කොට්ඨාශ මට්ටමින් සුපිරි වෙළෙඳ සැල් 27ක් ආරම්භ කිරීම
- ජාත්‍යන්තර සමුපකාර දින උත්සව සැමරීම
- කුකුල් මස් හා බිත්තර නිෂ්පාදන ව්‍යාපෘතිය
- වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව පිළියෙල කිරීම
- ගංවතුරෙන් අනාථ වූවන් සඳහා සහනාධාර ලබා දීම

- <u>සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව</u>
  - සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව ටෙලිකොම් මොබිටෙල් සමාගම හා එක්ව රාජ්‍ය අංශයේ සියලු නියුක්තිකයන්ට සහ විශ්‍රාමිකයන් සඳහා "උපහාර" නමින් සන්නිවේදන පැකේජයක් හඳුන්වා දීම
  - රාජ්‍ය සේවකයින් සඳහා විශේෂ වට්ටම් සහිතව පහසු ගෙවීමේ ක්‍රමයට TVS යතුරුපැදි ලබා දීම

- <u>ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව</u>
  - වෙළෙඳ පොළ මිල පාලනය සඳහා ආරක්ෂිත තොග පවත්වාගෙන යෑම.
  - එම ආරක්ෂිත තොග පවත්වාගෙන යෑම පහත පරිදි වේ
    - 2006 වර්ෂයේ සහල් මෙට්‍රික් ටොන් 3,977
    - 2007 වර්ෂයේ සහල් මෙට්‍රික් ටොන් 7,884
    - 2008 වර්ෂයේ සහල් මෙට්‍රික් ටොන් 215
    - 2011 වර්ෂයේ සහල් මෙට්‍රික් ටොන් 24,132

- <u>සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව</u>
  - දේශීය සහල් වෙළෙඳ පොළේ සහල්මිල ශීඝ්‍රයෙන් ඉහළ ගිය බැවින් 2005 සහ 2006 වර්ෂවල වෙළෙඳ අමාත්‍යාංශයේ මැදිහත්වීම මත මහජන බැංකුවෙන් ඩොලර් මිලියන 10ක බැඳුම්කරයක් ලබාගෙන පකිස්ථානයෙන් සහ ඉන්දියාවෙන් සහල් ආනයනය කර දේශීය වෙළෙඳ පොළට නිකුත් කිරීමට කටයුතු කිරීම
  - ලංකා සතොස ආයතනය විවෘත කරනලද අවස්ථාවේ සතොස ආයතනයසතුව තිබූ ගබඩා, වෙළෙඳසැල් සහ අනෙකුත් ස්ථාවර වත්කම් පවරා දී එම ආයතනයේ යටිතල පහසුකම් සැපයීමට සහාය වීම
  - සතොස සිල්ලර සමාගමේ කටයුතු නතර කර දැමීමෙන් පසු එහි සේවකයන්ගේ හිඟ වැටුප්, වන්දි මුදල් සහ සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් ආදිය මහා භාණ්ඩාගාරය දැනුවත්කර ඒ මාර්ගයෙන් ලබා දීම
  - 2008 වර්ෂයේ රු.මිලි. 456 ක් වටිනා ආහාර ද්‍රව්‍ය ආනයනය කර යාපනය වෙත නැව් මගින් ප්‍රවාහනය කර යාපනය දිස්ත්‍රික් ලේකම් මාර්ගයෙන් බෙදා හැරීමට කටයුතු කිරීම
  - එළවළු ගොවීන් දිරිමත් කිරීමේ අරමුණින් කැප්පිටිපොළ, දඹුල්ල, හම්බන්තොට වැනි ප්‍රදේශවල සුලභව තිබූ එළවළු ආයතනය සතු ලොරි මගින් කොළඹට ප්‍රවාහනය කර බෙදාහැරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
  - මානුෂික මෙහෙයුමේදී අවතැන්වූවන් සඳහා වවුනියා දිස්ත්‍රික්කයේ සෙට්ටිකුලම් කලාපයේ පිහිටුවන ලද සහන ගම්මානවල නිවැසියන්ට අවශ්‍ය බේකරි නිෂ්පාදන සැපයීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළ අතර පදිංචි කරුවන් ස්ථාවර ස්ථානයට පත්වූ පසු 2010 වර්ෂයේදී මෙය වසා දමන ලදි.
  - සතොස ආයතනයට අයත් දීර්ඝ කාලයක් අකර්මන්‍යව තිබූ හිඟුරක්ගොඩ සහ පන්නෙගමුව සහල් සංකීර්ණ නැවත අලුත්වැඩියා කර වී අලෙවි මණ්ඩලය සතුව තිබූ වී තොග කොටා ලක් සතොස ආයතනය මගින් සහල් බෙදා හැරීමේ කටයුතු ආරම්භ කිරීම
  - දිවයින පුරා සියලුම පළාත් ආවරණය වන පරිදි සමුපකාර සමිතිවලට අවශ්‍ය අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය බෙදා හැරීම පිණිස ප්‍රාදේශීය තොග ගබඩා 12ක් පිහිටුවීම
  - 2010 වර්ෂයේ අග භාගයේ කුකුළු මස් සහ බිත්තර මිල ගණන් ශීඝ්‍ර ලෙස ඉහළ ගිය බැවින් කුකුළු ගොවිපලවලින් බිත්තර මිලයට ගෙන ආර්ථික මධ්‍යස්ථානවල වෙළෙඳසැල් පිහිටුවා අඩු මිලකට විකිණීමට කටයුතු කිරීම
  - ග්‍රෑම් 125 සහ ග්‍රෑම් 425 ප්‍රමාණවල ටින් මාළු ආනයනය කර ලංකා සතොස සහ ප්‍රධාන පෙළේ සුපිරි වෙළෙඳසැල් මාර්ගයෙන් බෙදා හැරීමට කටයුතු කිරීම
  - එළවළු සහ පළතුරු ප්‍රවාහනයේදී සිදුවන නාස්තිය අවම කර ගැනීම පිණිස වෙළෙඳපොළෙහි මිලට වඩා ඉතා අඩු මිලට ප්ලාස්ටික් ඇසුරුම් භාජන වෙළෙඳුන් වෙත බෙදා හැරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම

ඇමුණුම II

**Annexure II**

அட்டவணை II

අ(ii)

<u>2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ වෙළෙඳ ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ</u>

- <u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය</u>
- පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ මහජනතාව දැනුවත් වීම.
- වෙළෙඳපොළේ බුද්ධිමත්, නිවැරදි තීරණයන් ගැනීම සඳහා පාරිභෝගිකයින් දැනුවත් වීම.
- පාරිභෝගික නීතිරීති පිළිබඳ වෙළෙඳ සංවිධාන, වාණිජ මණ්ඩල සහ ව්‍යාපාරික ප්‍රජාවට දැනුම ලබා දීම.
- අනාගතයේදී දැනුවත් පාරිභෝගිකයන් වීම සඳහා පාසැල් සිසුන් සූදානම් කිරීම.
- පාසැල් පාරිභෝගික සව ඇති කිරීම තුළින් පාසැල් සිසුන් තුළ සංවිධාන ශක්තිය හා නායකත්ව ගුණාංග වැඩි දියුණු කිරීම.
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සේවාවන් ග්‍රාමීය මට්ටම දක්වා පුළුල් කිරීම
- වෙළෙඳාම පිළිබඳ නීතිරීති සම්බන්ධයෙන් වෙළෙඳුන් දැනුවත් කිරීම.
- අසාධාරණ වෙළෙඳුන් මගින් පාරිභෝගිකයන්ට සිදුවන අකටයුතුකම්වලින් ඔවුන් ආරක්‍ෂා කිරීම.
- රජයට ආදායමක් උපයා දීම
- පාරිභෝගිකයන්ට බලපාන පොදු ගැටලුවලදී ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ශක්තිමත් ලෙස ඉදිරිපත් වියහැකි පාරිභෝගික කණ්ඩායම් ඇති කිරීම.
- භාණ්ඩ සේවා මිලදී ගැනීම්වලදී පාරිභෝගිකයන් මුහුණදෙන ගැටලු විසඳීම.

- <u>සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව</u>
- ඉදි කිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය ලබා ගැනීමට පෞද්ගලික ව්‍යවසාය වෙතට යෑමට මහජනතාවට සිදුවේ. ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව මගින් ශාඛා කාර්යාල හා ගබඩා විවෘත කිරීම තුළින් මහජනතාවට තරඟකාරී මිලකට උසස් ප්‍රමිතියෙන් යුත් ගොඩනැගිලි ද්‍රව්‍ය ලබා ගැනීමට හැකි වේ.
- සංස්ථාව විසින් එම පෞද්ගලික සමාගම සමඟ ආරම්භ කර ඇති ව්‍යාපාරය හේතුවෙන් පළාත් සභා සහ ප්‍රාදේශිය සභා මගින් ඒ ඒ පළාත්වල තනනු ලබන මාර්ගයන්ට කොන්ක්‍රීට් ගල් සැපයෙන අතර මහජනතාවගේ ගමනාගමනයට සුදුසු පරිදි මෙම මාර්ග සකස් කෙරේ.
- 2011 වර්ෂයේ මුල් මාස 10 අවසන් වන විට රු. මිලි. 773.4 ක අලෙවියක් ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට සිදු කර ඇත. 2005 වර්ෂයේදී මුළු ආදායම රු. මිලි. 163කි.

- <u>ලංකා සතොස සමාගම</u>
- ප්‍රාදේශීය වශයෙන් වෙළෙඳ සැල් ව්‍යාප්ත කිරීම නිසා ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවටද ගුණාත්මයෙන් උසස් භාණ්ඩ පරිභෝජනය කිරීමට අවස්ථාව සැලසීම
- අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ස්ථාවර මට්ටමක පවත්වාගත හැකි වීම
- පාරිභෝගිකයන්ට පහසු මිලට භාණ්ඩ ලබා ගැනීමට අවස්ථාව සැලසීම

- <u>වී අලෙවි මණ්ඩලය</u>
- ගොවි ජනතාවට තම අස්වැන්න විකුණාගැනීමට අපහසු අවස්ථාවලදී තම අස්වැන්න හොඳ මිලකට විකුණා ගැනීමට හැකි වීම

- <u>විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන</u>
- ආර්ථික මධ්‍යස්ථාන ජාලය හරහා ගුණාත්මයෙන් උසස් පාරිභෝගික භාණ්ඩ සාධාරණ මිලකට පාරිභෝගිකයාට ලබා දීමට හැකි වීම
- නිෂ්පාදකයාට තම නිෂ්පාදන තරඟකාරී හා සාධාරණ මිලකට අලෙවි කිරීම සඳහා වෙළෙඳ පොළ පහසුකම් සපයා දීම
- ආර්ථික මධ්‍යස්ථාන හරහා ආර්ථිකයේ මිල මට්ටමට බලපෑම් කිරීමට හැකියාව ලැබීම තුළින් එළවළු හා පළතුරුවල මිල මට්ටම් අධික ලෙස ඉහළ යාම පාලනය කළ හැකි වීම
- ආර්ථික මධ්‍යස්ථාන හරහා සෘජු හා වක්‍ර රැකියා අවස්ථා රාශියක් බිහි වීම

- <u>මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව</u>
- නව දිස්ත්‍රික් කාර්යාල හා විද්‍යාගාර ඉදි කිරීම මගින් ඒ ඒ දිස්ත්‍රික්කයන්හි භාවිතාවන කිරුම් මිනුම් උපකරණවල සත්‍යායන කටයුතු නිරවද්‍යතාවයකින් හා ක්‍රමානුකූලව පවත්වාගෙන යාමට හැකිවන අතර වෙළෙඳාමේදී නිවැරදි කිරුම් මිනුම් භාවිතය මගින් එම ප්‍රදේශයන්හි සාධාරණ වෙළෙඳාමක් ඇති කිරීම
- වායු ගෝලය දූෂණය වීම අවම කිරීමේ අරමුණින් රජය හඳුන්වාදුන් වායු විමෝචන පරීක්‍ෂණ උපකරණ සඳහා මාදිලි අනුමැතිය ලබා දීම සහ ඒවායේ නිරවද්‍යතාවය සනාථ කිරීම තුළින් පරිසර දූෂණය අවම වන අතර මහජනතාව ස්වසන පද්ධතිය ආශ්‍රිත රෝගවලට ගොදුරු වීමේ අවදානම අවම වනු ඇත.
- වෛද්‍ය පරීක්‍ෂණාගාරයන්හි භාවිතාවන මයික්‍රෝ පිපෙට්ටු අංක ශෝධනය මගින් ඒවායේ නිරවද්‍යතාවය සනාථ කරනු ලබන අතර එමගින් වෛද්‍ය ක්ෂේත්‍රයේ පර්යේෂණ කටයුතු හා රෝග විනිශ්චයන්හි විශ්වසනියත්වය ඉහල නැංවේ.
- නියමිත ප්‍රමිතියකින් යුතු උපකරණ නොමැති වීම නිසා මහජනයා විසින් ගෙවනු ලබන මිලට නියමිත ප්‍රමාණයෙන් ලිහිසි තෙල් නොලැබීමේ තත්වයක් පැවති අතර නව උපකරණ හඳුන්වා දීම තුළින් එම තත්වය සමනය වී ඇත.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

- සෞඛ්‍ය ක්ෂේත්‍රයේ භාවිතාවන කිරුම් මිනුම් යන්ත්‍ර, උණ කටු, රුධිර පීඩන මාන වැනි උපකරණ අංක ශෝධනය මගින් ඒවායේ නිරවද්‍යතාවය සහතික කරන අතර එමගින් නිරවද්‍ය හා විශ්වසනීය රෝග විනිශ්චය කිරීමේ තත්ත්වයන් ඇතිවේ.

- **සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**
- කෘෂිකාර්මික ප්‍රදේශවල නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම
- ගොවියාට සාධාරණ මිලක් ලබා දීම
- පාරිභෝගිකයාට සහනදායී මිලකට සහල් සැපයීම
- වී නිෂ්පාදකයා අතරමැදියාගෙන් ආරක්‍ෂා කර ගැනීම
- පාරිභෝගිකයාට අවශ්‍යකරන සිය භාණ්ඩ එකම වෙළෙඳ සැලකින් ලබා ගැනීමට හැකි වීම
- ගුණාත්මක තත්ත්වයෙන් හා උසස් තත්ත්වයෙන් යුතු භාණ්ඩ අවම මිලකට පාරිභෝගිකයාට ලබා දීම
- තරඟකාරී වෙළෙඳපොලට සාර්ථකව මුහුණ දිය හැකි පරිදි සමුපකාර ව්‍යාපාරය මගින් සුපිරි වෙළෙඳ සැල් පිහිටුවීම
- සමුපකාර ව්‍යාපාරය කෙරෙහි පාරිභෝගිකයා ආකර්ෂණීය භාවයක් ඇති කර ගැනීම
- පාසැල් ළමුන් සඳහා නොමිලේ පෝෂණ ගුණය සහිත කිරි විදුරුවක් ලබා දීම මගින් පාසැල් ළමුන්ගේ පෝෂණ මට්ටම් වැඩි දියුණු කිරීම සහ පාසැල් ළමුන් අතර පිටිකිරි භාවිතය අඩු කිරීම හා පිටිකිරි භාවිතය වෙනුවට පෝෂණ ගුණයෙන් යුත් දියර කිරි භාවිතයට හුරු කිරීම
- කෝප් සිටි ව්‍යාපෘතිය මගින් උතුරු නැඟෙනහිර ප්‍රදේශයේ මෙන්ම සියලු පළාත්වල පාරිභෝගික ජනතාවට අවශ්‍ය කරන ආහාර ද්‍රව්‍ය හා අනෙකුත් ද්‍රව්‍ය පහසු මිල ගණන් යටතේ හිඟයකින් තොරව ලබා ගැනීමට හැකි වීම
- දේශීය කිරි ගොවියාගේ කිරි සාධාරණ මිල ගණන් යටතේ ලබාගනිමින් ඔවුන් ආරක්‍ෂා කර ගැනීම
- විශ්ව විද්‍යාල අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සමුපකාරය පිළිබඳ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කිරීම හා සමුපකාර ව්‍යාපාරය තුළට උගතුන් ප්‍රවේශ කිරීම
- වැඩි යාමට ආසන්න සමුපකාර සමිති නැවත නඟා සිටුවීම හා යහපත් ආර්ථික ඒකකයක් වශයෙන් සමුපකාර ව්‍යාපාරය පවත්වාගෙන යාම
- සහල් සහනාධාරය මගින් වතුකරයේ වතුකරයේ ජනතාවගේ පෝෂණ තත්ත්වය හා ඔවුනගේ ආර්ථික තත්ත්වය නගා සිටුවීම
- නව ව්‍යාපාර ලෝකයට සරිලන පරිදි සමුපකාර ව්‍යාපාරයට ගිණුම් ප්‍රමිත හඳුන්වා දීම තුළින් ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සැකසීමට හැකි වීම
- සමුපදීපනී පුවත්පත දිනමිණ පුවත්පතේ අතිරේකයක් ලෙස මාස්පතා පළ කිරීම තුළින් සමුපකාර ව්‍යාපාරය ජනතාව තුළ ප්‍රචලිත වීම
- වසර 05 ක් සඳහා බදුවලින් නිදහස් කිරීම නිසා පාරිභෝගිකයාට සහන මිලකට භාණ්ඩ සැපයීමට හැකි වීම හා එමගින් සමුපකාර ව්‍යාපාරයට පැමිණෙන පුද්ගලයන්ගේ සංඛ්‍යාව වැඩිකර ගැනීමට හැකි වීමෙන් සමිතිවල දෛනික පිරිවැටුම වැඩි වීම
- කෝප්නෙට් ව්‍යාපෘතිය මගින් සමුපකාර ආයතන අතර තොරතුරු හුවමාරු කර ගැනීම පහසු වීම
- ඒකාබද්ධ මිලදී ගැනුම් වැඩ සටහන ආරම්භ කිරීම තුළින් සමුපකාර ජාලය තුළින් පාරිභෝගික ජනයාට අඩු මිලකට භාණ්ඩ ලබා ගැනීමට හැකි වීම
- එළඹි සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් පාරිභෝගික ජනතාවට හිඟයකින් තොරව බිත්තර සහ කුකුළු මස් සැපයීමට හැකි වීම

- **සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව**
- "උපහාර" පැකේජය මගින් ජනතාවගේ වැඩිවන ජීවන වියදමට සහනයක් ලබා දී ඇති අතර මොබිටෙල් ජාලය ඇතුලු සියලු ස්ථාවර දුරකථන ජාලයන් වෙත නොමිලයේ ඇමතුම් ලබා ගැනීමේ පහසුකම සපයා දී ඇති අතර විනාඩියකට රු.6.00 ක් පමණ තිබූ දුරකථන ඇමතුම් ගාස්තුව රු.3.00 ක් පමණ තෙක් අඩු කිරීමට හැකි විය.

- යතුරුපැදි ව්‍යාපෘතිය මගින් රාජ්‍ය සේවයේ නියුක්තිකයන්ට සාමාන්‍ය මිලට වඩා රු. 10,000.00 ක වට්ටමක් සහිතව යතුරු පැදි ලබා ගැනීමට හැකි වීමෙන් නියමිත වේලාවට රාජකාරි සඳහා වාර්තා කිරීමට හැකි වීම සහ කාර්යක්‍ෂම සහ ඵලදායී සේවයක් ලබා ගැනීමට හැකි වීම

- **ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව**
- වෙළෙඳ පොළ සහල් මිල උච්චතම අවස්ථාවලදී මෙම ආරක්ෂිත තොග නිදහස් කිරීමෙන් වෙළෙඳ පොළ මිල පාලනය කිරීමට දායක වීම.

- **සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව**
- 2005 සහ 2006 වර්ෂවල ඉන්දියාවෙන් හා පකිස්තානයෙන් සහල් ආනයනය කිරීම නිසා ඉහළ යමින් තිබූ සහල් මිල ගණන් ස්ථාවර මට්ටමක පවත්වාගෙන යාමට හැකි වීම

- කැප්පිටිපොළ, දඹුල්ල, හම්බන්තොට වැනි ප්‍රදේශවල සුලභව තිබූ එළවළු ආයතනය සතු ලොරි මගින් කොළඹට ප්‍රවාහනය කර බෙදාහැරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම නිසා ගොවීන්ගේ නිෂ්පාදනවලට හොඳ මිලක් ලබා දී ඔවුන් ඔවුන් වගා කටයුතුවලින් ඉවත් වීමේ ප්‍රවණතාවය අඩු කර ගත හැකි වීම

- දිවයින පුරා සියලුම පළාත් ආවරණය වන පරිදි සමුපකාර සමිතිවලට අවශ්‍ය අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය බෙදා හැරීම පිණිස ප්‍රාදේශීය තොග ගබඩා 12ක් පිහිටුවීම මගින් 2011 වර්ෂය තුළ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ස්ථාවර මට්ටමක පවත්වාගෙන යාමට හැකි වීම.

- ආර්ථික මධ්‍යස්ථාන තුළ වෙළෙඳසැල් පිහිටුවා අඩු මිලකට බිත්තර අලෙවි කිරීමෙන් ඉහල මිලක පැවති බිත්තරවල සිල්ලර මිල මේ වන විට රු.9/-,රු.10/- දක්වා අගයකට පහත දැමීමට හැකි වීම

ඇමුණුම III

Annexure III

அட்டவணை III

(අ)(iii)

**වෙළෙඳ ක්ෂේත්‍රයේ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන්**

- **පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**
- දැනුවත් කිරීමේ වැඩසටහන් (පාසල්, සිසුන්, වෙළෙඳ ප්‍රජාව සහ මහජනතාව) ප්‍රාදේශීය කොට්ඨාශ මට්ටමෙන් දිවයින පුරා පැවැත්වීමට කටයුතු කිරීම.
- වෙළෙඳපොළ විධිමත් කිරීම මගින් පාරිභෝගික සුරක්ෂිතතාවය ඇති කිරීම. වෙළෙඳපොල වැටලීම් ක්‍රියාත්මක කිරීම සහ දඩ මුදල් අයකර ගැනීම.
- පාරිභෝගික සංවිධාන පිහිටුවීම සහ ප්‍රවර්ධනය.
- පාරිභෝගික පැමිණිලි සඳහා විසඳුම් ලබා දීම.
- පාරිභෝගික අයිතිවාසිකම් දින සැමරුම.
- දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහනට සහභාගී වීම.
- ඖෂධ සඳහා මිලකරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදීම.

- **සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව**
- ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය පිහිටි කොළඹ 12, සංඝරාජ මාවත දේපළ කොටසක් HDFC බැංකුව පසුගිය කාල පරිච්ඡේදයේදී විකුණා ඇති අතර එයින් තවත් පර්චස් 100ක් ලංකා බැංකුවට ගෙවීමට ඇති ණය මුදලක් සඳහා සින්න වී ඇත. එම ඉඩමෙන් තවත් පර්චස් 100 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් විකිණීමට කටයුතු කර ඇත. මෙම ආයතනය සතු ඉතා වටිනා දේපළක් වන සහ ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය සඳහා දිවයිනේ නම් දරා ඇති ඉතා ඉහළ වටිනාකම් සහිත දේපළක් වන මෙය ඒකාබද්ධ විදේශ ආයෝජනයක් වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලත් ව්‍යාපෘතියක් සඳහා යෙදවීමට මෙම සියලු ඉඩම් කොටස් ආපසු ලබා ගෙන සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත. මෙමගින් තව දුරටත් ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ ප්‍රධාන ප්‍රදර්ශනාගාරය මෙම ස්ථානයේම පවත්වාගෙන යාමට සැලසුම් කර ඇත.
- මන්නාරම ගබඩාව අලුත්වැඩියාකොට අවසන් කර ඇති අතර දෙසැම්බර් මාසයේදී මෙය විවෘත කිරීමට නියමිතය.
- දැනට ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථා ගබඩා නොමැති දිස්ත්‍රික්කවල අවම වශයෙන් එක් ගබඩාවක් බැගින් හෝ 2013 අවසානයට ප්‍රථම ආරම්භකිරීමට නියමිය.
- කළුතර ගබඩාව මේ වසර අවසානයට පෙර විවෘත කිරීමට නියමිතය.
- සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව විසින් "ලංකා බී එම් සී" සිමෙන්ති ආනයනය කර අලෙවි කිරීමට 2012 වර්ෂයේ කටයුතු කරනු ලැබේ.

- ප්ලයිවුඩ් ලෑලි ආනයනය කොට අලෙවි කිරීමට මේ වන විටත් කටයුතු යොදා ඇත.

- **ලංකා සතොස සමාගම**
- 2012 වර්ෂය තුළදී ලංකා සතොස අලෙවිසැල් 50ක් ආරම්භ කිරීම සඳහා 2012 අයවැය මගින් රු.මිලි.98 ක ප්‍රතිපාදන වෙන් කර දී ඇත

- **වී අලෙවි මණ්ඩලය**
- සමේ නිෂ්පාදන මිලට ගැනීම සහ රටේ ආහාර සුරක්ෂිතතාවය පවත්වා ගැනීම සඳහා තව දුරටත් අවශ්‍ය ගබඩා ඉදි කිරීම, සකස් කිරීම සහ නවීන පහසුකම්වලින් යුත් වී මෝල් ඉදිකර අවශ්‍ය තරම් සහල් රටතුළ ඇති කිරීම සහ අතිරික්ත නිෂ්පාදන විදේශ රටවල්වලට යැවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම

- **මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව**
- ජාතික මිනුම් පර්යේෂණාගාරය ඉදි කිරීම
- යාපනය, මන්නාරම, අම්පාර, කිලිනොච්චිය ප්‍රදේශවල නව දිස්ත්‍රික් කාර්යාල හා විද්‍යාගාර ඉදි කිරීම
- ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල පරිගණක ජාලගත කිරීම
- සම්මත වේලාව විකාශය - II අදියර යටතේ රේඩියෝ තරංග මගින් සම්මත වේලාව විකාශය කිරීම
- කුලී රථ මනු මාදිලි අනුමැතිය හා සත්‍යායනය

- **විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන**
- නාරාහේන්පිට විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය කේන්ද්‍රකොට ගෙන සියලුම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ජාලය සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කරනු ඇත. මෙමගින් ගොවි ජනතාවට සහ දේශීය නිෂ්පාදකයන්ට සාධාරණ මිලකට භාණ්ඩ අලෙවි කිරීමටත් පාරිභෝගිකයන්ට නැවුම් නිෂ්පාදන දැරිය හැකි මිලකට ලබා ගැනීමටත් සෙත සැලසේ.
- විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සඳහා වෙබ් අඩවියක් ආරම්භ කිරීමටත් ඒ අනුව භාණ්ඩවල විශේෂයෙන් එළවළු හා පලතුරුවල තොග හා සිල්ලර මිල ගණන් පාරිභෝගිකයාටත්, නිෂ්පාදකයාටත් දැන ගැනීමට හැකි වීම.
- අමාත්‍යාංශය කේන්ද්‍ර කොටගෙන සියලුම ආර්ථික මධ්‍යස්ථාන ජාලය පරිගණක ජාලගත කිරීම
- මෙම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල සංවර්ධන කටයුතු වෙනුවෙන් අරමුදලක් සඳහා කළමනාකරණ භාරයක් පිහිටුවීමටද මෙම වසර තුළ කටයුතු කරනු ලැබේ.

- **සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**
- මෙගා කෝප් සිටි 25ක් ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය
- සහතික කරන ලද උසස් තත්ත්වයේ අර්තාපල් නිපදවීමේ ව්‍යාපෘතිය
- සංඛ්‍යාලේඛන වාර්තාව සහ පාලන වාර්තාව ප්‍රකාශයට පත් කිරීම
- සමුපදීපනී පුවත්පත් අතිරේකය පළ කිරීමේ ව්‍යාපෘතිය
- කාර්ය මණ්ඩල පුහුණු වැඩ සටහන් ව්‍යාපෘතිය

- දැයට කිරුළ ව්‍යාපෘතිය ;
  - මෙගා කෝප් සිටි 4ක් පිහිටුවීම
  - අනුරාධපුර විවිධ සේවා සමුපකාර සමිතිය මඟින් සමුපකාර රෝහල නවීකරණය කිරීම
  - විලච්චිය වී මෝල නවීකරණය කිරීම
  - පාසල් දියර කිරි වැඩසටහන
  - තලාව වී මෝල නවීකරණය කිරීම
- සමුපකාර ව්‍යාපාරයට සම්බන්ධ ආයතන ජාලගත කිරීමේ ව්‍යාපෘතිය (කෝප්නෙට් ව්‍යාපෘතිය)

- <u>සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව</u>
- සෑම ශ්‍රී ලාංකිකයෙකුටම පරිගණකයක් යන රාජ්‍ය ප්‍රතිපත්තිය පෙරදැරිව සුවිශේෂී වූ මිලකට පරිගණක ලබා දීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම
- සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව, අධ්‍යාපන අමාත්‍යාංශය සහ එට්සලාට් සමාගම හා එක්ව අන්තර්ජාලය හරහා සාධාරණ මිලකට උපකාරක පංති මාලාවක් ආරම්භ කිරීම

- <u>ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව</u>
- ආහාර දෙපාර්තමේන්තුව සතු වර්තමාන ගබඩා ව්‍යුහය තුළ ආරක්ෂිත තොග පවත්වාගෙන යාමේදී මතුවී ඇති ගැටලු හඳුනාගෙන එයට පිළියම් වශයෙන් තාක්ෂණික වශයෙන් දියුණු කළ ක්‍රම 4ක් යටතේ වර්ෂයකට වඩා වැඩි කාලයක් සහල් ගබඩා කළ හැකි පරිදි ගබඩා ක්‍රමයක් හඳුන්වා දීම. එකී ක්‍රම හතර,
  - Improved Natural Ventilated Rice Storage System
  - Mechanical Ventilated Rice Storage System
  - Refer Container System
  - Insulted Container System

- <u>සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව</u>
- 2012 වර්ෂයේ සතොස සතු මැකලම් ගබඩා සංකීර්ණයේ පවත්නා ඇසුරුම් අංශය නවීකරණය කර ද්‍රව්‍ය පැකට් කර ලංකා සතොස වෙත අලෙවි කිරීම
- මැකලම් ගබඩා සංකීර්ණයේ හෝටල් ව්‍යාපෘතියක් ආරම්භ කිරීම
- 2012 වර්ෂයේ ලොරි රථ 03ක් මිලදී ගැනීම

**ඇමුණුම IV**

**Annexure IV**

**அட்டவணை IV**

அ(iv)

**<u>වෙළෙඳ ක්ෂේත්‍රයේ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් මඟින් අපේක්ෂිත ප්‍රතිලාභ</u>**

- <u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය</u>
  - පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම
  - වෙළෙඳපොළේ බුද්ධිමත් නිවැරදි තීරණ ගැනීම සඳහා පාරිභෝගිකයින් දැනුවත් කිරීම.
  - පාරිභෝගික නීතිරීති පිළිබඳ වෙළෙඳ සංවිධාන, වාණිජ මණ්ඩල සහ ව්‍යාපාරික ප්‍රජාවට දැනුම ලබා දීම.
  - අනාගතයේදී දැනුවත් පාරිභෝගිකයන් වීමසඳහා පාසැල් සිසුන් සූදානම් කිරීම.
  - පාසැල් පාරිභෝගික සව ඇති කිරීම තුළින් පාසැල් සිසුන් තුළ සංවිධාන ශක්තිය හා නායකත්ව ගුණාංග වැඩිදියුණු කිරීම.
  - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සේවාවන් ග්‍රාමීය මට්ටම දක්වා පුළුල් කිරීම.
  - වෙළෙඳාම පිළිබඳ නීතිරීති සම්බන්ධයෙන් වෙළෙඳුන් දැනුවත් කිරීම.
  - අසාධාරණ වෙළෙඳුන් මගින් පාරිභෝගිකයන්ට සිදුවන අකටයුතුකම්වලින් ඔවුන් ආරක්‍ෂා කිරීම.
  - රජයට ආදායමක් උපයා දීම.
  - පාරිභෝගිකයන්ට බලපාන පොදු ගැටලුවලදී ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ශක්තිමත් ලෙස ඉදිරිපත් විය හැකි පාරිභෝගික කණ්ඩායම් ඇති කිරීම.
  - භාණ්ඩ හා සේවා මිලදී ගැනීම්වලදී පාරිභෝගිකයන් මුහුණ දෙන ගැටලු විසඳීම.
  - ජාත්‍යන්තර පාරිභෝගික තේමාවන්ට අනුගතව කටයුතු කිරීම.
  - ආදර්ශමත් වෙළෙඳසැල් තේරීමේ තරඟය තුළින් වෙළෙඳුන් දැනුවත් කිරීම.
  - පාසැල් සිසුන් අතර තරඟ පැවැත්වීම තුළින් පාසැල් සිසුන් දැනුවත් කිරීම.
  - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ජංගම සේවා වැඩසටහන්වලට සහභාගි වීම තුළින් මහජනතාව දැනුවත් කිරීම.
  - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පාරිභෝගික සංවිධාන පිහිටුවීම සහ ප්‍රවර්ධනය.
  - සාධාරණ මිලකට ඖෂධ ලබා ගැනීම සඳහා පාරිභෝගිකයන්ට අවස්ථාවක් ලබා දීම.

- <u>සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව</u>
  - සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ ආදායම සහ ලාභ ප්‍රමාණයන් වැඩි කර ගැනීම
  - මහජනතාවට අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය උසස් ප්‍රමිතියෙන් යුක්තව තරඟකාරී මිලකට අලෙවි කිරීම
  - රාජ්‍ය අංශයේ අවශ්‍යතාවයන් සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම

- <u>ලංකා සතොස සමාගම</u>
  - ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවටද සාධාරණ මිලකට පහසුවෙන් අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථාව සැලසීම

- <u>වී අලෙවි මණ්ඩලය</u>
  - කෘෂි නිෂ්පාදකයාට හොඳ සාධාරණ මිලක් ලැබෙන අතර ගොවි ජනතාවගේ ජීවන තත්වය ඉහල නැංවේ.
  - පාරිභෝගිකයාට සාධාරණ මිලකට කෘෂි නිෂ්පාදන මිලට ගැනීමට හැකි වීම

- <u>මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව</u>
- ජාතික මිනුම් පර්යේෂණාගාරය ඉදි කිරීම මගින් අන්තර් ජාතික මිනුම් ප්‍රමිතින්වලට අගය සම්බන්ධ වන පරිදි නිරවද්‍ය ජාතික මිනුම් ප්‍රමිතීන් රටෙහි කර්මාන්ත, වෙළෙඳ ආදි ක්ෂේත්‍ර කරා ව්‍යාප්ත කිරීමෙන් ශ්‍රී ලංකාවේ මිනුම් කෙරෙහි ජාත්‍යන්තර පිළිගැනීමක් ලැබීම
- ජාතික හා ජාත්‍යන්තර වෙළෙඳාම, ද්විතීය පරීක්‍ෂණාගාර, කර්මාන්ත ප්‍රජාව, සෞඛ්‍ය ක්ෂේත්‍රය, පරිසර ආරක්‍ෂණය ආදි ක්ෂේත්‍රවලට නිරවද්‍ය මිනුම් සේවා ලබා දීමෙන් සමස්ත මහජනතාවට ප්‍රතිලාභ අත්වේ
- නව දිස්ත්‍රික් කාර්යාල හා විද්‍යාගාර ඉදි කිරීම මගින් මිනුම් සේවා ලබා ගැනීමට පැමිණෙන වෙළෙඳුන් කර්මාන්ත ප්‍රජාව ආදියට මෙන්ම පාරිභෝගික ආරක්‍ෂණ ප්‍රතිලාභද අත්වේ
- ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල පරිගණක ජාලගත කිරීම මගින් දෙපාර්තමේන්තුව තුළ වේගවත් තොරතුරු හුවමාරුව සහ රජයේ ආදායම් එකතු කිරීම කාර්යක්‍ෂම හා ක්‍රමවත් වීම.
- රේඩියෝ තරංග මගින් සම්මත වේලාව විකාශය කිරීම මගින් රටෙහි ඕනෑම තැනක ඇති රේඩියෝ ඔරලෝසුවල වේලාව එකම වේලාව දක්වන ලෙස සකස් කිරීමට හැකි වීම
- කාල සංඥා අවශ්‍යවන පර්යේෂකයන් ආදීන්ට පහසුකම් සැලසීම
- සත්‍යායනය කරන ලද කුලී රථ මනු මගින් නිරවද්‍ය හා විශ්වසනීය ගාස්තුවක් පෙන්නුම් කරන බැවින් මගී ජනතාවට ප්‍රතිලාභ අත්වේ.

- <u>විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන</u>
  - කිලිනොච්චි විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය ඉදි කිරීම තුළින් උතුරු ප්‍රදේශයේ කෘෂි නිෂ්පාදනවලට සාධාරණ මිලක් ලබා දීම
  - උතුරු හා දකුණු ප්‍රදේශයේ කෘෂි භෝග හුවමාරු කිරීම සඳහා හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස වෙළෙඳපොළ පහසුකම් ඇති කිරීම

- <u>සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව</u>
  - පුද්ගලික වෙළෙඳ ඒකාධිකාරිත්වයේ පීඩනයෙන් පාරිභෝගිකයා ගලවා ගැනීම
  - අඩු මිලට උසස් තත්වයෙන් බීජ අර්තාපල් ගොවීන් වෙත ලබා දී නිෂ්පාදනය වැඩි කිරීම
  - සමුපකාර ව්‍යාපාරය පිළිබඳ කළමනාකරණ තීරණ ගැනීම සඳහා සංඛ්‍යා දත්ත ලබා දීම
  - සමුපකාර ව්‍යාපාර පිළිබඳ ජනතාව දැනුවත් කර අනාගත මානව සම්පත සමුපකාරය කෙරෙහි නැඹුරු කර ගැනීම
  - ආයතනික මානව සම්පත් සංවර්ධනය
  - ජාතික සංවර්ධන වැඩසටහනක් වශයෙන් දැයට කිරුළ ව්‍යාපෘතිය සඳහා සමුපකාර අංශයේ දායකත්වයක් ලබා දීම
  - නව සංවර්ධන ප්‍රතිලාභ සමුපකාරික ප්‍රජාව වෙත ලබා දීමට දායක වීම
  - සමුපකාර ආයතන ඇතුළත තොරතුරු හුවමාරු කර ගැනීම

- <u>සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව</u>
  - රාජ්‍ය සේවකයන් හට පහසු ගෙවීමේ ක්‍රමයට සුවිශේෂ වූ Hp පරිගණක මාදිලි 5 ක් රාජ්‍ය බැංකු සහභාගිත්වයෙන් වගකීමක් සහිතව ලබා ගැනීමට හැකි වීම
  - ඉන්ටනෙට් පැකේජයට සමගාමීව පාසැල් ගුරුවරුන් සඳහා සුවිශේෂී වූ වට්ටමකට යටත්ව පරිගණක ලබා දීමට කටයුතු කිරීම සහ එමගින් දරුවන්ගේ දැනුම වර්ධනය කිරීමත් පාසැල් දසදහසක් සඳහා නොමිලයේ පරිගණක ලබා දීමත් මෙම ව්‍යාපෘතිය මගින් ඉටු කිරීමට නියමිතය.

- <u>ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව</u>
  - වෙළෙඳ පොළ සහල් මිල ස්ථාවරව පවත්වා ගැනීමට හැකි වන පරිදි ආරක්ෂිත තොග පවත්වාගෙන යෑම
  - නවීන තාක්ෂණික ක්‍රම භාවිතය මගින් ගබඩාගත සහල්වලට හානි කරන කෘමි සතුන් මර්දනය කිරීම
  - අවම ලෙස රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් වැඩි කාලයක් සහල් තොග ගබඩාගත කිරීම
  - ශ්‍රී ලංකාව සඳහා සහල් ගබඩාගත කිරීමට නව ක්‍රමවේදයක් සකස් කිරීම

- <u>සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව</u>
  - මැකලම් ගබඩා සංකීර්ණයේ ආරම්භ කිරීමට නියමිත හෝටල් ව්‍යාපෘතිය මඟින් 2016 වර්ෂයේදී ආදායම් ඉපයීමට බලාපොරොත්තු වන අතර එම අරමුදල් ගිහ බැංකු ණය ගෙවීමට යොදා ගැනීම
  - 2012 වර්ෂයේදී මිලදී ගැනීමට අපේක්ෂිත ලොරි රථ මගින් අඩු ගාස්තුවක් යටතේ ලංකා සතොස සහ වී අලෙවි මණ්ඩලය වැනි ආයතනවලට ප්‍රවාහන පහසුකම් සැපයීම තුළින් සහල් ඇතුළු අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍යවල මිල ස්ථාවරව පවත්වා ගැනීම

## සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන ක්ෂේත්‍රයේ සංවර්ධන ව්‍යාපෘති : ප්‍රතිලාභ
பாரம்பரிய கைத்தொழில்கள், சிறு தொழில்முயற்சி அபிவிருத்திக் கருத்திட்டங்கள் : நன்மைகள்
DEVELOPMENT PROJECTS IN THE FIELD OF TRADITIONAL INDUSTRIES AND SMALL ENTERPRISE DEVELOPMENT : BENEFITS

1688/'11

5. **ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා (ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும - மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன சார்பாக)
(The Hon. J.R.P. Sooriyapperuma on behalf of the Hon. Eric Prasanna Weerawardhana)

සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பாரம்பரிய கைத்தொழில்கள், சிறு தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2006ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரையான காலப்பகுதியில் பாரம்பரிய கைத்தொழில்கள், சிறு தொழில்முயற்சி அபிவிருத்தி துறையில் நடைமுறைப்படுத்தப்பட்ட அபிவிருத்திக் கருத் திட்டங்கள் யாவை என்பதையும்;

(ii) இக்கருத்திட்டங்களினூடாக மக்களுக்குக் கிடைத்துள்ள நன்மைகள் யாவை என்பதையும்;

(iii) எதிர்காலத்தில் பாரம்பரிய கைத்தொழில்கள் மற்றும் சிறு தொழில்முயற்சி அபிவிருத்தி துறையில் நடைமுறைப்படுத்த எதிர்பார்த்துள்ள அபிவிருத்திக் கருத்திட்டங்கள் யாவை என்ப தையும்;

(iv) அவற்றிலிருந்து எதிர்பார்க்கப்படுகின்ற நன் மைகள் யாவை என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Traditional Industries and Small Enterprise Development:

(a) Will he inform this House -

(i) the development projects implemented in the field of Traditional Industries and Small Enterprise Development during the period from year 2006 up to now;

(ii) the benefits received by the people through these projects;

(iii) the development projects expected to be implemented in the field of Traditional Industries and Small Enterprise Development, in future; and

(iv) the results expected through them?

(b) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය 2010 අප්‍රේල් 30 දින අංක 1651/20 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කර ඇත. 2006 වසරේ සිට 2010 අප්‍රේල් දක්වා ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය ලෙස හඳුන්වා ඇති අතර, 2006 වසරේ සිට 2010 වසර දක්වා ක්‍රියාත්මක කර ඇති සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව තොරතුරු වාර්ෂික ප්‍රගති වාර්තා මගින් පාර්ලිමේන්තුව වෙත වාර්තා කර ඇත.

ඒ අනුව මෙම අමාත්‍යාංශය අලුතින් ස්ථාපිත කරන ලද 2010 වසරේ සිට මේ දක්වා කාලසීමාවට අදාළව පමණක් මා විසින් ඔබගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමි.

මෙම අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, ජාතික ශිල්ප සභාව, ජාතික මෝස්තර මධ්‍යස්ථානය, තල් සංවර්ධන මණ්ඩලය, නෝර්ත්සී ලිමිටඩ් ආයතන එක්ව සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධනය තුළින් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කර ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම, ඔවුන්ගේ ආදායම් මාර්ග දියුණු කිරීම, දරිද්‍රතාවය අවම කිරීම තුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම අරමුණු කොට විවිධ සංවර්ධන වැඩසටහන් රැසක් මාගේ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. ඒවා පහත දක්වා ඇත.

**2010 අප්‍රේල් මස සිට 2011 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන්**

| ආයතනය | වැඩසටහන | ක්‍රියාකාරකම් |
|---|---|---|
| **අමාත්‍යාංශය හා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**<br><br>රේඛීය අමාත්‍යාංශ 5ක්: කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය, යෞවන කටයුතු හා කුසලතා සංවර්ධන අමාත්‍යාංශය, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය; හා ඒවාට අනුබද්ධ ආයතන 14ක් සමග එක්ව කටයුතු කරමින් සිටී | "දිවි නැගුම" ජාතික වැඩසටහන යටතේ ගෘහස්ථ කර්මාන්ත ස්ථාපිත කිරීම | තාක්ෂණික ප්‍රදර්ශනය හා දැනුවත් කිරීමේ වැඩසටහන - සුදුසු ගෘහ කර්මාන්ත තෝරාගැනීම සඳහා ජනතාවට සහායවීම පිණිස පැවැත්වෙන දිස්ත්‍රික් මට්ටමේ ප්‍රදර්ශන<br><br>ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතා හඳුනාගැනීම හා අවශ්‍ය මැදිහත්වීම් සැලසුම් කිරීම පිණිස පැවැත්වෙන වැඩිදුර ඇගයීමේ වැඩසටහන (Sensitization Programme)<br><br>අවශ්‍ය ප්‍රතිලාභීන් සඳහා ව්‍යවසායකත්ව කුසලතා හා තාක්ෂණය ලබාදීම පිණිස පුහුණු වැඩසටහන් පැවැත්වීම<br><br>ප්‍රතිලාභියකු සඳහා සම්පූර්ණ වටිනාකම රු.10,000/-ක් වන පරිදි මූලික උපකරණ හා අමුද්‍රව්‍ය ලබාදීම<br><br>බැංකු හා මූල්‍ය ආයතනවලින් සහනදායි ණය ලබාගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු |
| අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන | "ශිල්ප" හස්ත කර්මාන්ත ජාතික ප්‍රදර්ශනය, අලෙවි සල්පිල හා "ශිල්ප" ජාතික සම්මාන ප්‍රදානෝත්සවය | හස්ත කර්මාන්ත අංශයේ නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලෙවිය |
| අමාත්‍යාංශය හා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය | නිෂ්පාදන ගම්මාන සංවර්ධන වැඩසටහන | නිෂ්පාදන ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ ගම්මාන 105 ක පොදු පහසුකම් මධ්‍යස්ථාන ඉදි කිරීම |

| ආයතනය | වැඩසටහන | ක්‍රියාකාරකම් |
|---|---|---|
| අමාත්‍යාංශය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | කිතුල් සංවර්ධන ජාතික වැඩසටහන | මල් මදින්නන් පුහුණු කිරීම . මල් මදින්නන් සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල ලබාදීම, කිතුල් කාර්මිකයන් ලියාපදිංචි කිරීම, ඔවුන්ගේ සුභ-සාධනය උදෙසා සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළක් සකස් කිරීම, කැස්පර් තාක්ෂණය හඳුන්වාදීම, තෙලිඳිය අස්වනු ඉහළ නැංවීම හා තත්ත්ව පාලන ක්‍රම හඳුන්වාදීම |
| ජාතික මෝස්තර මධ්‍යස්ථානය<br>. | .මෝස්තර නිර්මාණ සංවර්ධන වැඩසටහන් | නව මෝස්තර හා සංකල්ප හඳුන්වාදීම හා එවා සංවර්ධනය කිරීම, මෝස්තර නිර්මාණය පිළිබඳ උපදේශක සේවා ලබාදීම, මෝස්තර නිර්මාණය පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම. |
| ජාතික ශිල්ප සභාව | කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් / ප්‍රදර්ශන හා අලෙවි සල්පිල් / හස්ත කර්මාන්ත සංවර්ධන හා ශිල්පී සුබසාධන වැඩසටහන් | හස්ත කර්මාන්ත සංවර්ධනය, වැඩිදියුණු කිරීම හා ප්‍රවර්ධනය, අමුද්‍රව්‍ය සැපයීම හා කළමනාකරණය,(පේක්ක, උණ, පන්, හණ, කළුවර, වේවැල් ආදී අමුද්‍රව්‍ය වගා කිරීම, හා රිදී, පිත්තල අමුද්‍රව්‍ය බෙදාහැරීම) හස්ත කර්මාන්ත නිෂ්පාදන ජනප්‍රිය කරවීම හා අලෙවි සහාය ලබාදීම, හස්ත කර්මාන්තකරුවන්ගේ හැකියාවන් වර්ධනය සඳහා වැඩමුළු හා විදේශ චාරිකා සංවිධානය කිරීම, හස්ත කර්මාන්ත ගම්මාන ස්ථාපිත කිරීම, හස්ත කර්මාන්ත ප්‍රදර්ශන හා සම්මාන උළෙල පැවැත්වීම |
| ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය හා සංවර්ධන වැඩසටහන්, කුඩා ව්‍යවසායකයින්ට ණය ලබා දීම පිළිබඳ උපාය මාර්ග සකස් කිරීම | දේශීය කුඩා කර්මාන්තකරුවන් සඳහා සහනදායි මිලකට අමුද්‍රව්‍ය ලබාදීම (තඹ,පිත්තල,ඇලුමිනියම් හා අබලි යකඩ), කාර්මික ජනපදවල යටිතල පහසුකම් සංවර්ධනය |
| තල් සංවර්ධන මණ්ඩලය | තල් වගා වැඩසටහන් / තල් ආශ්‍රිත හස්ත කර්මාන්ත පුහුණු වැඩසටහන් | තල් ආශ්‍රිත නිෂ්පාදන වැඩිදියුණු කිරීම (හකුරු, පැණි බීම, විනාකිරි, තල් රා, තල් යුෂ ආශ්‍රිත නිෂ්පාදන) තල් ආශ්‍රිත හස්ත කර්මාන්ත නිෂ්පාදන ඉහළ නැංවීම, තල් බීජ වගා කිරීම හා ආදර්ශ ගොවිපොලවල් සංවර්ධනය කිරීම, " කට්පගම් " අලෙවි මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම. |
| නෝර්ත්සී සමාගම | උසස් මට්ටමේ මත්ස්‍ය දැල් නිෂ්පාදනය හා සැපයීම | ධීවර නිෂ්පාදන ප්‍රවර්ධනයට අවශ්‍ය මත්ස්‍ය දැල් නිෂ්පාදනය කිරීම. |

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

(ii) 2010 වසරේ සිට 2011 වසර දක්වා ක්‍රියාත්මක විවිධ ව්‍යාපෘතින් වලින් ලබාගත් ප්‍රතිලාභ

| වැඩසටහන | ප්‍රතිලාභ |
|---|---|
| "දිවි නැගුම" ජාතික වැඩසටහන යටතේ ගෘහස්ථ කර්මාන්ත ස්ථාපිත කිරීම | දිවි නැගුම ජාතික වැඩසටහන යටතේ ව්‍යවසායකයින් 1822ක් පුහුණු කර ඇත. |
| නිෂ්පාදන ගම්මාන සංවර්ධන වැඩසටහන | පොදු පහසුකම් මධ්‍යස්ථාන 25 ක් ජනතා අයිතියට පත්කර ඇත. මෙහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1204 කි.<br><br>නිෂ්පාදන ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 24.77 ක් වැය කර ඇත. එම ගම්මානවල ප්‍රතිලාභීන් සඳහා රුපියල් මිලියන 6.41 ක ප්‍රාග්ධන භාණ්ඩ ලබා දී ඇත. පොදු පහසුකම් මධ්‍යස්ථාන සඳහා රු. මි. 15.75 ක ප්‍රාග්ධන භාණ්ඩ ලබා දී ඇත. |
| "ශිල්ප" හස්ත කර්මාන්ත ජාතික ප්‍රදර්ශනය, අලෙවි සල්පිල හා "ශිල්ප" ජාතික සම්මාන ප්‍රදානෝත්සවය | 2010 වර්ෂයේ ප්‍රදර්ශන කුටි 150 ක්ද, 2011 වර්ෂයේදී ප්‍රදර්ශන කුටි 193ක්ද, ශිල්පීන්ට ලබා දී ඇති අතර මෙම අලෙවි ප්‍රදර්ශනය නැරඹීම සඳහා වසරකදී 20000 කට අධික නරඹන්නන් ප්‍රමාණයක් පැමිණ ඇත.<br><br>2010 වර්ෂයේදී ජයග්‍රාහකයින් 177 දෙනෙකු සඳහා ශිල්ප ජාතික සම්මාන ප්‍රදානයේදී මුදල් ත්‍යාග, සම්මාන හා සහතිකපත් ලබා දී ඇත.<br><br>මීට අමතරව ඉන්දියාවේ සුරාජ් කුන්ඩ් හා දිල්ලියේ පැවැති ජාත්‍යන්තර අලෙවි සල්පිල් දෙකක් සඳහා ශිල්පීන් 20දෙනෙකු සහභාගි වී ඇත. |
| කිතුල් සංවර්ධන ජාතික වැඩසටහන | නව ස්වයං රැකියා අවස්ථා 2053 ක්, කුඩා පරිමාණ කර්මාන්ත ඒකක 67 ක්, විදේශ වෙළඳපොළ දක්වා සංවර්ධනය කරන ලද කර්මාන්ත ඒකක 12 ක් හා කිතුල් කාර්මිකයන් පුහුණු කිරීමේ වැඩසටහන් 406 ක් පවත්වා ඇත.<br><br>කිතුල් කාර්මිකයන් 6633 ක් ලියාපදිංචි කර ඇති අතර, 866 දෙනෙක් සඳහා හැඳුනුම්පත් නිකුත් කර ඇත. |
| මෝස්තර නිර්මාණ සංවර්ධන වැඩසටහන් | නව නිර්මාණාත්මක මෝස්තර 941 ක් හඳුන්වාදී ඇත. මෝස්තර සංවර්ධනය, නව නිර්මාණ හා පුහුණු කිරීමේ වැඩමුළු සඳහා ප්‍රතිලාභීන් 2190 කට අධික ප්‍රමාණයක් සහභාගිවී ඇත. |

| වැඩසටහන | ප්‍රතිලාභ |
|---|---|
| කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් / ප්‍රදර්ශන හා අලෙවි සල්පිල් / හස්ත කර්මාන්ත සංවර්ධන හා ශිල්ප සුබසාධන වැඩසටහන් / හස්ත කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය වගා කිරීම හා බෙදා හැරීම | හස්ත කර්මාන්ත පුහුණු වැඩමුළු 63 ක් ප්‍රතිලාභීන් 1460 ක් සඳහා පවත්වා ඇති අතර ගුරු ශිල්ප පන්ති 80 ක් ප්‍රතිලාභීන් 902 ක් සඳහා පවත්වා ඇත.<br><br>කොළඹදී පැවැති ශිල්පීය හුවමාරු/ප්‍රදර්ශන වැඩසටහන සඳහා ඉන්දීය ශිල්පීන් 06ක් හා ශ්‍රී ලාංකික ශිල්පීන් 06ක් සහභාගි වූ අතර ඔවුන්ගේ ශිල්පීය ක්ෂේත්‍රවලට අදාළ කුසලතාවන් එකිනෙකා සමග හුවමාරු කර ගැනීමට එය අවස්ථාවක් විය.<br><br>දේශීය හස්ත කර්මාන්ත සඳහා යොදා ගන්නා, වඳ වී යාමේ තර්ජනයට ලක්වී ඇති ශාකවල පැළ 139,804 ක් අමුද්‍රව්‍ය වගා කිරීමේ ව්‍යාපෘති යටතේ බෙදා දී ඇත.<br><br>හස්ත කර්මාන්ත ශිල්පීන්ට රිදී, පිත්තල වැනි ලෝහ වර්ග සහනදායි මිල ගණන් යටතේ ලබා දී ඇත.<br><br>මැටි ලබාගැනීම සහ ප්‍රවාහනය සඳහා පතල් හා කැනීම් කාර්යාංශය හරහා ජාතික ශිල්ප සභාවේ ලියාපදිංචි ශිල්පීන්ට අවසර ලබාදීම.<br><br>හස්ත කර්මාන්ත ශිල්පීන් 1357 ක් ලියාපදිංචි කර ඇත. |
| සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය හා සංවර්ධන වැඩසටහන්,කුඩා ව්‍යවසායකයින්ට ණය ලබා දීම පිළිබඳ උපාය මාර්ග සකස් කිරීම | නව කර්මාන්ත ස්ථාපනය හා පැවැති කර්මාන්ත වැඩි දියුණු කිරීම යටතේ බිහිවූ කර්මාන්ත සංඛ්‍යාව 8792 කි.<br><br>කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ඇප සුරැකුම් නොමැතිව මූලාධාර ලබා දීමට කටයුතු කිරීම |
| තල් වගා වැඩසටහන් / තල් ආශ්‍රිත හස්ත කර්මාන්ත පුහුණු වැඩසටහන් | තල් ආශ්‍රිත හස්ත කර්මාන්ත පුහුණු වැඩසටහන් යටතේ ප්‍රතිලාභීන් 614 දෙනෙකු හා ආදර්ශ ගොවිපල සංවර්ධනය මගින් ප්‍රතිලාභීන් 18000ක් සඳහා අවශ්‍ය සහාය ලබාදීම. |
| උසස් මට්ටමේ මත්ස්‍ය දැල් නිෂ්පාදනය හා සැපයීම | මත්ස්‍ය දැල් නිෂ්පාදන ධාරිතාවය වසරකට මෙට්‍රික් ටොන් 60 ක් පමණ වන අතර එය යාපනයේ ජනතාවගේ ඉල්ලුම් අවශ්‍යතාවයෙන් 12% ක් පමණ වේ.<br><br>වෙළඳපොලේ මිලට වඩා 10% - 20% ක් පමණ අඩු මුදලකට මාළු දැල් ලබා දීම. |

(iii) 2011 වර්ෂයේ අමාත්‍යාංශයේ කාර්යය සාධන වාර්තාවෙහි, 2012 වසර සඳහා අපේක්ෂිත ඉලක්කයන් දක්වා ඇති අතර එය ඇමුණුමේ හි දක්වා ඇත.

(iv) සාම්ප්‍රදායික කර්මාන්ත මෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් හා ව්‍යවසායකයින් මෙරට ආර්ථිකයේ කැපී පෙනෙන වැදගත් අංශයක් බවට පත්කරවීමෙන් දේශිය හා විදේශිය වෙළඳපොළේ තරඟකාරිත්වයට මුහුණ දීමට ඔවුන් ශක්තිමත් කිරීම, පාරම්පරික ශිල්පීය කුසලතා මතුපරපුර ආරක්ෂා කරදීම සහ වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීම, කුඩා කර්මාන්ත 5000 ක් මධ්‍ය පරිමාණ මට්ටමට ගෙන ඒමටත්, මධ්‍ය පරිමාණ කර්මාන්ත 200 ක් මහා පරිමාණ මට්ටමට ගෙන ඒමටත්, ග්‍රාමීය මට්ටමින් සුළු කර්මාන්ත ස්ථාපිත කොට රැකියා පහසුකම් ඇති කිරීමටත් එතුළින් පුළුල් ආර්ථික වර්ධනයක් හා ව්‍යවසායකත්ව සංස්කෘතියක් ඇති කිරීමටත් කටයුතු කරනු ඇත. 80,000 කට වැඩි ගෘහස්ත කර්මාන්ත ඇතිකිරීමෙන් ගෘහස්ථ කර්මාන්ත පදනම් කරගත් සාර්ථක ව්‍යවසායකයින් බිහිකිරීමට හැකි වීමෙන් ඔවුන්ගේ ආර්ථික සාමාජිය තත්වය ඉහළ මට්ටමකට ගෙන ඒමත්, ඒ මගින් ජාතික ආර්ථිකයේ සංවර්ධනයට සැලකිය යුතු ලෙස දායක වීමටත් අපේක්ෂා කරනු ලැබේ. දශක තුනකට ආසන්න කාලයක් යුද්ධය නිසා සංවර්ධනය අඩාල වී තිබූ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල, ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කර ඇති අතර (අච්චුවේලි කාර්මික ජනපදය, අලිමංකඩ ලුණු ලේවාය, තල් පර්යේෂණ ආයතනය, උතුරු මුහුදු සමාගම) එම වැඩසටහන් ජාතික ආර්ථිකයට හා සේවා නියුක්තියට මෙන්ම දරිද්‍රතාවය අවම කිරීමට ප්‍රබල දායකත්වයක් ලබාදෙනු ඇත.

(ආ) අදාළ නොවේ.

## කෝන්ගහගෙදර - පූගල්ල මාර්ගය කාපට් කිරීම : ඇස්තමේන්තුගත මුදල

கோன்கஹகெதர - பூகல்ல வீதி `காபட்' இடல்: மதிப்பீட்டுத் தொகை

CARPETING OF KOANGAHAGEDARA-PUGALLA ROAD : ESTIMATED COST

1804/'11

7. **ගරු රවි කරුණානායක මහතා (ගරු අකිල විරාජ් කාරියවසම් මහතා වෙනුවට)**

(மாண்புமிகு ரவி கருணாநாயக்க - மாண்புமிகு அகில விராஜ் காரியவசம் சார்பாக)

(The Hon. Ravi Karunanayake on behalf of the Hon. Akila Viraj Kariyawasam)

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) කුලියාපිටිය, කෝන්ගහගෙදර සිට පූගල්ල දක්වා මාර්ගයේ කාපට් ඇතිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම මාර්ගය කාපට් ඇතිරීමේ ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iii) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරනු ලැබූ කොන්ත්‍රාත්කරුවන් කවුරුන්ද;

(iv) එම එක් එක් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குளியாப்பிட்டிய, கோன்கஹகெதர தொடக்கம் பூகல்ல வரையிலான வீதியில் `காபட்' இடுவதற்காக மதிப்பிடப்பட்ட தொகை எவ்வளவென்பதையும்;

(ii) இந்த வீதியில் காபட் இடுவதற்கான கருத்திட்டத்தின் பொருட்டு கேள்விப்பத்திரங்கள் கோரப்பட்டனவா என்பதையும்;

(iii) ஆமெனில், இதற்காக கேள்விப்பத்திரங்களை முன்வைத்த ஒப்பந்தகாரர்கள் யாவர் என்பதையும்;

(iv) இந்த ஒவ்வொரு ஒப்பந்தகாரரினாலும் முன்வைக்கப்பட்ட விலைகள் தனித்தனியாக எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he inform this House-

(i) the total estimated amount of money for carpeting the road from Kuliyapitiya, Koangahagedara to Pugalla ;

(ii) whether tenders have been called for the project of carpeting the aforesaid road ;

(iii) if so, the contractors who forwarded tenders for the aforesaid project ; and

(iv) separately the bids submitted by each of the aforesaid contractors?

(b) If not, why ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**

(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)

(The Hon. Lakshman Yapa Abeywardena )

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) උක්ත මාර්ගයෙහි කිලෝ මීටර් 10.5ක් කාපට් අතුරා සංවර්ධනය කරන අතර ඒ සඳහා ලබා දී ඇති දළ ඇස්තමේන්තුව අංක 10/2775/424/026 හා 2010.11.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පත් කරන ලද ස්ථාවර තාක්ෂණ කමිටුවෙහි අනුමතියට ඉදිරිපත් කර ඇත. එම අනුමතිය ලැබෙන තෙක් මාර්ග දුර කිලෝ මීටරයක් කාපට් ඇතිරීම සඳහා දළ වශයෙන් රුපියල් මිලියන 10ක් වැයවෙනු ඇතැයි උපකල්පනය කර, ඒ අනුව දළ ඇස්තමේන්තුව සකසා ඉදිකිරීම් ආයතන සමඟ ගිවිසුමකට එළඹ ඇත.

---

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු රවි කරුණානායක මහතා]

(ii) නැත. අංක 11/1071/519/014 හා 2011.05.12 දරන අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් වයඹ සහ බස්නාහිර පළාත්වල මාර්ග සංවර්ධන කටයුතු බස්නාහිර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට පවරා ඇත.

වයඹ පළාතේ සිදු කරනු ලබන මාර්ග සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණ කරනු ලබන්නේ වයඹ පළාත් මාර්ග දෙපාර්තමේන්තුව මඟිනි.

(iii) අදාළ නැත.

(iv) අදාළ නැත.

(ආ) පැන නොනඟී.

## මරණීය දණ්ඩනයට යටත් සිරකරුවන් : අපරාධ
### மரண தண்டனைக் கைதிகள்: குற்றங்கள்
### DEATH SENTENCE TO PRISONERS : CRIMES

1919/'11

9. **ගරු රවි කරුණානායක මහතා (ගරු අජිත් පී. පෙරේරා මහතා වෙනුවට)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க - மாண்புமிகு அஜித் பீ. பெரேரா சார்பாக)
(The Hon. Ravi Karunanayake on behalf of the Hon. Ajith P. Perera)

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2011.09.01 දින වන විට මරණීය දණ්ඩනයට යටත් කොට ඇති (සියලු අභියාචනා අවසන්ව ඇති) බන්ධනාගාරගත සිරකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් සිරකරුවාට මරණ දඬුවම හිමි වීමට හේතු වූ ඔවුන් විසින් සිදුකර ඇති "අපරාධ" වල වර්ගීකරණය කවරේද;

(iii) එම සිරකරුවන්ට නියමිත මරණීය දඬුවම ක්‍රියාත්මක නොකිරීමට හේතුව හෝ හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මරණ දඬුවම නියම වූ ඇතැම් අයට සමාව දීමේදී රජය විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය කුමක්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2011.09.01ஆந் திகதியாகும்போது மரண தண்டனை விதிக்கப்பட்டு (சகல மேன்முறையீடுகளும் நிறைவடைந்துள்ள) சிறையிலடைக்கப்பட்டுள்ள சிறைக்கைதிகளின் எண்ணிக்கை எவ்வளவு;

(ii) மேற்படி ஒவ்வொரு சிறைக்கைதிக்கும் மரண தண்டனை விதிக்கப்படுவதற்கு காரணமாயமைந்த அவர்களினால் செய்யப்பட்டுள்ள `குற்றங்களின்' வகைகள் யாவை;

(iii) மேற்படி சிறைக்கைதிகளுக்குரிய மரண தண்டனை நிறைவேற்றப் படாமைக்கான காரணம் அல்லது காரணங்கள் யாவை

என்பதை அவர் இச் சபையில் அறிவிப்பாரா?

(ஆ) மரண தண்டனை விதிக்கப்பட்ட சிலருக்கு மன்னிப்பு வழங்கும்போது அரசினால் பின்பற்றப்படும் கொள்கை யாதென்பதை அவர் இச்சபையில் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Rehabilitation and Prison Reforms:

(a) Will he inform this House-

(i) the number of prisoners who have been sentenced to death (having concluded all appeals) by 01-09-2011;

(ii) the classification of "crimes" which caused each of the aforesaid prisoners to be sentenced to death; and

(iii) the reason or reasons for not executing the death sentence given to those prisoners?

(b) Will he state the policy followed by the Government, in granting pardon to some of the individuals who have been sentenced to death?

(c) If not, why?

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர )
(The Hon. Chandrasiri Gajadeera )

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2011.09.01 වන දිනට මරණීය දණ්ඩනයට යටත් කොට ඇති සිරකරුවන් සංඛ්‍යාව පහත සඳහන් කරමි.

| | |
|---|---|
| පිරිමි | 356 |
| ස්ත්‍රී | 05 |
| එකතුව | 361 |

(ii) මරණීය දණ්ඩනය දෙන ලද අපරාධවල වර්ගීකරණය "මිනීමැරීම් සහ මත් ද්‍රව්‍ය"

| | පිරිමි | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| මිනීමැරුම් | 345 | 03 | 348 |
| මත් ද්‍රව්‍ය | 11 | 02 | 13 |
| එකතුව | 356 | 05 | 361 |

(iii) මරණීය දණ්ඩනය නියම වූ සිරකරුවන්ගේ දණ්ඩනය ක්‍රියාත්මක කිරීම සිදු වන්නේ ඒ සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් තහවුරු කිරීමේ නියෝගයක් නිකුත් කිරීමෙනි.

(ආ) ඔව්.

මරණීය දණ්ඩනය නියමවූ අයට සමාව දීම සිදුවන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34(1) වගන්තිය අනුව අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලය අනුවය.

(ඇ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 14 -1775/'11- (1), ගරු අජිත් කුමාර මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon.  Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு  தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

# පෞද්ගලිකව  දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
# தனி அறிவித்தல் மூல வினா
# QUESTION BY PRIVATE NOTICE

## උපාධිධාරී අභ්‍යාසලාභීන් බඳවා ගැනීම
## பட்டதாரிப் பயிலுநர் ஆட்சேர்ப்பு
## RECRUITMENT OF GRADUATE TRAINEES

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රකාශය කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා.

විධිමත් බඳවා ගැනීමේ පටිපාටියක් අනුගමනය නොකරමින් හා සියලු උපාධිධාරින්ට සම අවස්ථා දීමකින් තොරව තෝරා ගත් උපාධිධාරින් පිරිසක් සඳහා රැකියා ලබා දීමේ වැඩ පිළිවෙළ පිළිබඳ මෙම ගරු සභාවේ අවධානය යොමු කරමි.

මේ දිනවල රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ මඟ පෙන්වීමකට අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් උපාධිධාරින්ට අභ්‍යාසලාභී පත්වීම් ලබා දීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කොට ඇත. උපාධිධාරින් බඳවා ගැනීම් ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්කවල පෙබරවාරි මස 14, 15, 16, 17යන දිනවලද සිදු විය. දිවයිනේ තවත් දිස්ත්‍රික්ක කීපයකම මේ අයුරින් මේ ආසන්න දිනවලදී පත්වීම් ලබා දීම සිදු විය. මෙම පත්වීම් නම් කර තිබුණේ උපාධිධාරී අභ්‍යාසලාභී තනතුර යනුවෙනි. සම්මුඛ පරීක්ෂණයට කැඳවූ දිනයේම රැකියාව ලබා දීමද එහිදී සිදු විය. මෙලෙස උපාධිධාරින්ට රැකියා ලබා දුන්නේ අයදුම් පත් කැඳවීමකින් තොරවය.

මා ගරු ඇමතිතුමාගෙන් අහනවා, අයදුම් පත් කැඳවූවා නම් කැඳවන්න කරපු ගැසට් නිවේදනය, පුවත් පත් දැන්වීම මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියා. අයදුම් පත් කැඳවීමකින් තොරවයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා ලබා දුන්නේ.

රජයේ රැකියාවක් ලබා දීමේ පිළිගත් ක්‍රමවේදය වනුයේ රජයේ ප්‍රසිද්ධ ගැසට් පත්‍රයේ නිවේදනය කොට, අයදුම් පත් කැඳවීමෙන් පසු සම්මුඛ පරීක්ෂණ පවත්වා සුදුසුකම් සහිත පිරිස්වලට රැකියා ලබා දීම එම ක්‍රමවේදය වේ.

එසේ නැත්නම් තරග විභාග විසින් රැකියා ලබා දිය යුතුව තිබෙනවා.

මෙම පිළිගත් ක්‍රමවේදය මුළුමනින්ම නොසලකා හැර ආණ්ඩුවේ කිසියම් බලවතෙක් විසින් සකසන ලද නාම ලේඛනයට මෙලෙස පත්වීම් ලබා දෙමින් පවතී.

පැහැදිලිව මෙම පත්වීම් ආණ්ඩුවේ දේශපාලන වුවමනාව මත දෙනු ලබන පත්වීම් වේ. මෙලෙස විනිවිදභාවයෙන් තොරව රස්සා ලබා දෙනවාට එරෙහිව රටේ සෑම ක්ෂේත්‍රයකම පාහේ විරෝධයක් මතු වුණා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එම රැකියා ලබා දීමේ  ක්‍රමවේදයෙහි නීත්‍යානුකූලභාවය විවිධ පාර්ශ්ව වෙතින් ප්‍රශ්න කෙරුණා.  මෙම විරෝධතා  මඟ හරවා ගැනීම සඳහා ආණ්ඩුව යෙදූ උපක්‍රමය වූයේ "අභ්‍යාසලාභී" තනතුර සඳහා උපාධිධාරින් බඳවා ගන්නා බවට පුවත් පත් නිවේදන දැමීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,  මේ තිබෙන්නේ  එම පුවත් පත්  නිවේදනය. මේ  වර්ෂ 2012ක් වූ පෙබරවාරි මාසයේ  16 වන බ්‍රහස්පතින්දා පළ කරපු පුවත් පත්  නිවේදනය. මේ පුවත් පත් නිවේදනයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොකක්ද කියන්නේ?  මම එය කෙටියෙන් කියන්නම්.

එහි මෙසේ තිබෙනවා:

"මෙම කාර්යය ඉටු කිරීම සඳහා ඒ ඒ දිස්ත්‍රික්ක වලට අවශ්‍ය තොරතුරු රැස් කිරීම, ව්‍යාපෘති සහ වැඩසටහන් හඳුනා ගැනීම, දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති තක්සේරු කිරීම සහ ඒවා විවිධ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතර සමබරව බෙදා හැරීම සහ පවතින ගැටළු හා බාධක හඳුනා ගැනීම සඳහා අවශ්‍ය වන දත්ත විශ්ලේෂණය කිරීමට හැකියාවක් ඇති අදාල දිස්ත්‍රික්කයන්හි පදිංචි රැකියා විරහිත උපාධිධාරීන්, උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගැනීමට රජය  තීරණය කර ඇත. මේ සඳහා උනන්දුවක් දක්වන උපාධිධාරීන්ට තම ස්ථිර පදිංචි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් වෙතට පහත සඳහන් ආදර්ශ අයදුම්පතට අනුව සකස් කර ගනු ලැබූ තම අයදුම්පත් 2012.03.30 දිනට පෙර ඉදිරිපත් කරන ලෙසට මෙයින් දන්වනු ලැබේ."

දැන් මේ දැන්වීමෙන් කියනවා, මේ අභ්‍යාසලාභී තනතුරු ලබා ගැනීම සඳහා 2012 මාර්තු මාසයේ 30 වන දාට පෙර අයදුම් පත් දෙන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අයදුම් පත්වල ආකෘතියකුත් මෙම පුවත් පත් දැන්වීමට අනුව තිබෙනවා. එම පුවත් පත් නිවේදනය පළ වූයේ 2012 පෙබරවාරි මස 16 වැනි දාය. එම පුවත් පත් නිවේදනය මම **සභාගත*** කරනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එය හැන්සාඩගත කරන්න කියලා ඉල්ලනවා, මොකද, මෙය ඓතිහාසික පුවත් පත් දැන්වීමක් නිසා.

එම පුවත් පත් නිවේදනයට අනුව අයදුම් පත් භාර ගන්නා අවසන් දිනය 2012 මාර්තු 30 වැනි දාය. අයදුම් පත් භාර ගෙන අවසන් කරන්නේ 2012 මාර්තු මස 30 වැනි දාය. නමුත් හාස්‍යජනක කරුණ වන්නේ ඒ වන විටත් බොහෝ ප්‍රදේශවල උපාධිධාරින් බඳවා ගැනීමට කටයුතු කර තිබීමයි. මාර්තු මාසයේ 30 වන දා උපාධිධාරින්ගේ අයදුම් පත් කැඳවන අවසාන දිනය කියලා නම් කර තිබෙනවා. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි,  එතකොටත් බඳවා ගෙන තිබෙනවා. එලෙස අයදුම් පත් කැඳවන ලද  පෙබරවාරි මාසයේ 16 වන දිනට පෙර ලබා දුන් පත් වීම් ලිපි කීපයක් මම සභාගත කරන්නම්.

***  පුස්තකාලයේ තබා ඇත.**
*  *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*  *Placed in the Library.*

[ගරු අනුර දිසානායක මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාර්තු මාසයේ 30 වන දා තමයි අයදුම් පත් කැඳවීමේ අවසාන දිනය. පෙබරවාරි මාසයේ තමයි දැන්වීම පත්තරයේ දමන්නේ. මේ පත්වීම දමලා තිබෙන්නේ කවදාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ළඟ තිබෙනවා, පත්වීම් ලියුම. එහි මෙසේ සඳහන් වනවා:

" දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට"

හම්බන්තොට තමයි මේ වැඩේ වැඩියෙන්ම සිදු කෙරුණේ. එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් කළමනාකරණය සඳහා වන ව්‍යාපෘතිය

2012 වසර සඳහා ඉදිරිපත් කර ඇති, අයවැය ලේඛනය මඟින් අනුමත විවිධ සංවර්ධන යෝජනා පිළිබඳ තොරතුරු හා දත්ත රැස් කිරීම අත්‍යවශ්‍ය හා හදිසි කරුණක්ව පවතී. එම වැඩසටහනට අදාලව 2012/03/01 දින සිට හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමීක්ෂණ/දත්ත රැස් කිරීමේ කටයුතු සඳහා මාස හයක කාල සීමාවකට ඔබ හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ..... ප්‍රාදේශීය කාර්යාලය වෙත අනුයුක්ත කරන බව සතුටින් දන්වමි."

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Public Administration and Home Affairs)

මෙම ප්‍රකාශය ගරු මන්ත්‍රීතුමා කරන්නේ, ස්ථාවර නියෝග 23 (2) යටතේයි. ස්ථාවර නියෝග 23(2) යටතේ කරන ප්‍රකාශයක් පළමුවෙන් ගරු කථානායකතුමා වෙත ඉදිරිපත් කර, කථානායකතුමාගේ අනුමැතිය ලබා ගෙනයි මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ. එම ප්‍රකාශයට බාහිරව කරුණු ඉදිරිපත් කරන්නට බැහැ. එම ප්‍රකාශයට බාහිරව ලිපි ලේඛන ඉදිරිපත් කරන්නත් බැහැ. එම නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බාහිරව ඉදිරිපත් කළ සියලුම කරුණු හැන්සාඩ් වාර්තාවෙන් කපා හරින ලෙසත්, කරුණාකර එම ප්‍රකාශය අනුව කරුණු ඉදිරිපත් කිරීමට ගරු මන්ත්‍රීතුමාට උපදෙස් දෙන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මම ඔබතුමාට මේ වාර්තාවෙන් පෙන්වා දෙන්නේ මොකක්ද? පුවත් පත් දැන්වීම තිබෙනවා කියනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විසින් -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මම ප්‍රකාශයේ කියලා තිබෙන්නේ මොකක්ද? පුවත් පත් දැන්වීම තිබෙනවා කියලා කියනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඉදිරිපත් කර ඇති ප්‍රකාශය කියවීමට ඔබතුමාට අවසර තිබෙනවා, ස්ථාවර නියෝග 23(2) යටතේ. එයින් පරිබාහිරව යම් කරුණක් ඉදිරිපත් කරන්නේ නම් එකී කරුණු හැන්සාඩ් වාර්තාවෙන් කපා හැරීමට තීන්දු කරනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒක අසාධාරණයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙම ප්‍රකාශයේ කියලා තිබෙන්නේ මොකක්ද? අදාළ පුවත් පත් දැන්වීම සභාගත කරනවා කියලා මම කියා තිබෙනවා. ඒ පුවත් පත් දැන්වීම තමයි මම මේ කියවන්නේ. අමුතු දෙයක් කියවන්නේ නැහැ. මම මේ ප්‍රකාශයේ කියා තිබෙනවා, අදාළ ලිපිය සභාගත කරනවා කියලා. ඒ ලිපිය තමයි මම කියවන්නේ. ඊට අමතරව මම මොකුත් කියවන්නේ නැහැ. මොනවාද මේ කියවන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණාවට මේ විධියට නැඟිටින්න ඕනෑ තමයි. මාර්තු මාසයේ 30 වැනිදා ළමයින් බඳවා ගන්නවා කියලා පත්තරේ -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රකාශයට පටහැනි දෙයක් කියලා නැත්නම්, කියන්නේ නැත්නම් ඒ පිළිබඳ කලබල විය යුතු නැහැ. ඔබතුමා 23(2) ස්ථාවර නියෝගය යටතේ ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශයේ සඳහන් නොවන යම් කාරණයක් ප්‍රකාශ කරන්නේ නම් පමණක් එම කාරණා සභාගත නොවනු ඇත.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

කලබල වන්නේ මෙතුමායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක වහන්න ඉඩ දෙන්න එපා. පත්තරේ දැන්වීම් දමලා තිබුණා මාර්තු මාසයේ 30වැනිදා තෙක් applications කැඳවනවා කියලා. ඊට කලින් අයදුම්පත් භාර දෙන්න කියලා. හැබැයි පෙබරවාරි මාසයේ 16වැනිදා ඉඳලා තවත් පත්වීම් දෙනවා. මොකක්ද මේ විගඩම? [බාධා කිරීමක්] ප්‍රකාශයේ ඒක තමයි කියලා තිබෙන්නේ. මේවාට උත්තර දෙන්න බැරිව දඟලන්න ඕනෑ, තමුන්නාන්සේ මේ කරලා තිබෙන අපරාධවලට, මේ රටේ උපාධිධාරින්ට.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශය කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්නම්. [බාධා කිරීමක්] නමුත් හාස්‍යජනක කරුණ වන්නේ -

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ස්ථාවර නියෝග 23(2) යටතේ කරන ප්‍රකාශය, 23(2) යටතේම කරන ප්‍රකාශයක් වන්නට ඕනෑ. වෙනත් දෙයක් මෙතැන කියන්න බැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඔව්, ගරු ඇමතිතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ ඉදිරිපත් කර ඇති ප්‍රකාශය කරන්න පමණයි එතුමාට ඉඩ දීලා තිබෙන්නේ. එතුමාට එම ප්‍රකාශය කරන්න පුළුවන්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේකට ඉඩ දෙන්න බැහැ තමයි. මීට අමතරව මොකුත් කියලා නැහැ, පැහැදිලි කිරීම විතරයි කළේ. එතුමාට අමතරව මොනවා හරි කිව්වා නම්, එතුමාගෙන් මම ඇහුවා නම්, හෝටලයේ මොකද වුණේ කියලා, එතකොට ඔබතුමා ප්‍රශ්න කරන එක හරි. මම මේ ප්‍රකාශයේ තිබෙන කාරණයක් ගැන කියන්නේ. මේකට එතුමාට උත්තර දෙන්න පුළුවන්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රකාශය කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම අමතර දේවල් කියලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බඳවා ගැනීම සඳහා මාර්තු මාසයේ 30වැනිදා තෙක් අයදුම් පත් කැඳවනවා. අවසාන දිනය මාර්තු මාසයේ 30වැනිදා. පත්‍රයේ දැන්වීම දැම්මේ පෙබරවාරි මාසයේ 16වැනිදා. නමුත් පෙබරවාරි මාසයේ 16වැනිදා ළමයින්ට පත්වීම් දෙනවා. ලැයිස්තුවලට දෙන දේශපාලන පත්වීමක්. මොනරාගලට ලැයිස්තු යැව්වා; හම්බන්තොටට ලැයිස්තු යැව්වා, මේ උපාධිධාරීන්ට. පෙබරවාරි මාසයේ 16වැනිදා පත්වීම් දෙනවා. මාර්තු මාසයේ 30 වැනිදා තමයි applications කැඳවා අවසන් කරන්නේ. පෙබරවාරි මාසයේ 16වැනිදා පත්තරේ දැන්වීම දමනවා. පෙබරවාරි මාසයේ 16වැනිදා පත්තරේ දැන්වීම දමන කොට, පත්වීම දෙන ලිපි තිබෙනවා. [බාධා කිරීමක්] හරි, අහ ගෙන ඉන්න. ලජ්ජයි මේවාට. නැඟිටින්න ඕනෑ තමයි මේ වාගේ අපරාධ කළාම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් හාස්‍යජනක කරුණ වන්නේ ඒ වන විටත් බොහෝ ප්‍රදේශවල උපාධිධාරීන් බඳවා ගැනීමට කටයුතු කොට තිබීමයි. එලෙස අයදුම් පත් කැඳවන ලද පෙබරවාරි මාසයේ 16වන දිනට පෙර ලබා දුන් පත්වීම් ලිපියක් **සභාගත*** කරමි.

ඒ පත්වීම් ලිපි තමයි මා කිව්වේ. පත්‍රයේ දැන්වීම් පළ කරපු දවසේම පත්වීම් ලිපි දීලා තිබෙනවා. රැකියා විරහිත උපාධිධාරීන් 40,000ක් විරැකියා පෝලිම්වල රස්තියාදු වන තත්ත්වයක් යටතේ සියලු දෙනාට රැකියා ලබා දෙනු වෙනුවට යම් පිරිසකට පමණක් දේශපාලන මැදිහත් වීම් මත රැකියා ලබා දීම අපි තරයේ හෙළා දකින්නෙමු.

ගෙවී ගිය වසර 07 තුළ උපාධිධාරීන්ට රැකියා ලබා දීමට වර්තමාන ආණ්ඩුව අසමත් වී ඇත. 2005 වසරේ ජනාධිපතිවරයා බලයට පැමිණෙන විට රැකියා විරහිත උපාධිධාරීන් සිටියේ 10,000ක් පමණි. මහින්ද චින්තන වැඩ පිළිවෙළේ පිටු අංක 9 යටතේ සඳහන් කර තිබුණේ 2006 වසර තුළ උපාධිධාරීන් 10,000කට රැකියා ලබා දෙන බවයි. නමුත් ගෙවී ගිය වසර 07 තුළම එම පොරොන්දු මිථ්‍යාවක් බවට පත් කරන ලදී. එපමණක් නොව, 2007 අය වැය යෝජනා තුළින්ද 10,000කට රැකියා ලබා දෙන බවට යෝජනා කළා. එයින් නොනැවතී 2008 අය වැය යෝජනාවලිනුත් උපාධිධාරීන්ට රැකියා ලබා දෙන බව අවධාරණය කළා. නමුත් සැබෑ ලෙසම උපාධිධාරීන්ට රැකියා දීමට ආණ්ඩුව අසමත් වුණා. වසරක් පාසා දිවයිනේ විශ්වවිද්‍යාලවලින් උපාධි ලබා ගන්නා අභ්‍යන්තර සිසුන් වාගේම බාහිර සිසුන් රැකියා පෝලිමට එක් වුණා. වසරින් වසර පෝලිම දික් වුණා. රක්ෂාවක් නොකර තවදුරටත් දෙමවුපියන්ගෙන් යැපෙන්න බැරිම තැන සමහර සෞන්දර්ය උපාධිධාරීන් බස්වල ගීත ගායනා කරලා කීයක් හෝ සොයා ගෙන ජීවිතේ ගැට ගසා ගන්නා තැනට පත් වුණා. සමහර උපාධිධාරිනියන් මැද පෙරදිග ගෘහ සේවිකා රක්ෂාවලට ගියා. කලා උපාධිධාරීන් සිමෙන්ති අනන්න ගියා. එහෙම ගිය දකුණු පළාතේ එක් කලා උපාධිධාරියෙක් පලංචියෙන් වැටිලා මිය ගියා කියලා පසු ගිය දවස්වල මාධ්‍ය වාර්තා කරලා තිබුණා. උතුරු නැඟෙනහිර පළාත්වලත් රැකියා විරහිත උපාධිධාරීන් විශාල පිරිසක් ඉන්නවා. ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉතාමත් කටුකයි. යුද්ධය නිමා වෙලා තිබියදීත් උතුරු නැඟෙනහිර උපාධිධාරීන්ට රක්ෂා දෙන්න ආණ්ඩුව අසමත් බව ගෙවී ගිය වසර තුන තුළ ආණ්ඩුව ඔප්පු කර අවසන්. උපාධිධාරීන්ගේ ජීවිතවල සැබෑ තත්ත්වය මේකයි.

2009 නොවැම්බර් මාසයේ 20වන දින උපාධිධාරීන්ට පත්වීම් ලබා දීම සඳහා අයදුම් පත් කැඳවීමට රජය මඟින් ගැසට් නිවේදනයක් නිකුත් කළා. ඒ 1629 කියන ගැසට් පත්‍රිකාව යටතේයි. ජනසභා ලේකම් නමින් එම තනතුර නම් කරනු ලැබුවා. එම ගැසට් නිවේදනයට අනුව උපාධිධාරීන් 14,400ක් සඳහා ජනසභා ලේකම් තනතුරු ලබා දීමට නියමිතව තිබුණා. ඒ අනුව මෙලෙස විධිමත් ලෙස ගැසට් කොට බඳවා ගැනීමට කටයුතු නොකොට "ජනසභා ලේකම්" යන තනතුරද මේ වන විට ඉවත් කොට ඇත. උපාධිධාරීන් මහත් බලාපොරොත්තුවකින් අයදුම් පත් ඉදිරිපත් කළද, ඔවුන්ගේ අයදුම් පත් හා සම්මුඛ පරීක්ෂණයට සිදු වූයේ කුමක්ද කියාවත් ඔවුන්ට අවබෝධයක් නොමැත. අයදුම් පත් කැඳවා ඔවුන් සම්මුඛ පරීක්ෂණ සඳහා පවා යොමු කළා. ඒ සියල්ල කරලා අද වන විට එම තනතුරට එකදු උපාධිධාරියෙක්වත් බඳවා ගත්තේ නැත. 2010 ජනාධිපතිවරණය ආසන්නයේ උපාධිධාරීන් මුළා කිරීමට පමණක් ගෙනා යෝජනාවක් ලෙස ඒක එහෙමම කුණු කූඩයට ගොස් තිබේ.

කරුණු මෙසේ පවතිද්දී ආණ්ඩුව විසින් රුපියල් 10,000ක් - ප්‍රකාශයේ රුපියල් 1,000ක් ලෙස සඳහන් වී ඇත්තේ වැරදීමකින්- වැනි සොච්චම් දීමනාවකට අභ්‍යාසලාභී යනුවෙන් බඳවා ගැනීමේ පටිපාටිය උල්ලංඝනය කිරීම සඳහා පුවත් පත්වල ප්‍රසිද්ධ කොට, දේශපාලන මැදිහත් වීම මඟින් එම තනතුර ලබා දීම විසින් සමස්ත උපාධිධාරීන් අපේක්ෂා භංගත්වයට හා දැඩි මානසික පීඩනයට ලක් කොට ඇත. එමෙන්ම විශ්වවිද්‍යාලවලින් එළියට එන උපාධිධාරීන් වෙනුවෙන් විටින් විට මෙවැනි පැලැස්තර විසඳුම් සොයනවා වෙනුවට ස්ථිරසාර විසඳුමක් අවශ්‍ය වී ඇත. හැම අවුරුද්දකම විශ්වවිද්‍යාලයකින් අලුතින් උපාධි ලබා ගත් පිරිසක් එළියට යනවා කියන එක පොදු කාරණයක්. එහෙම පිට වෙන උපාධිධාරීන් ආර්ථිකයට අවශෝෂණය කර ගැනීමටත්, ඔවුන් මහ මඟ රස්තියාදු කරන එක නතර කිරීමටත්, ආණ්ඩුවට වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. උපාධිධාරීන් මතක් වෙන්නේ හැම දාම උපාධිධාරීන්ගේ පෝලිම හැටියට 40,000ක පෝලිමක් දැක්කාම නම් ඒක ඛේදජනක තත්ත්වයක්. වසරකට විද්‍යා, කලා, වෛද්‍ය, ඉංජිනේරු, කෘෂි හා සෞන්දර්ය යන ක්ෂේත්‍රවල උපාධිධාරීන් කොපමණ ප්‍රමාණයක් බිහි වනවාද, ඔවුන්ට රැකියා ලබා දෙන්නේ කෙසේද යන්න පිළිබඳව රජයට ජාතික වැඩ පිළිවෙළක් තිබීම අවශ්‍යයි. ඒ නිසා ආණ්ඩුව විසින් කළ යුතුව ඇත්තේ වැස්සට තෙමෙද්දී ගෙවල් හදන්න යනවා වාගේ ඉන්නේ නැතුව, හැම දාම 40,000ක පෝලිමක් හැදෙන කම් නිකම් බලා ගෙන ඉන්නේ නැතුව, වසරින් වසර උපාධිධාරීන්ට රක්ෂා ලබා දීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීමයි.

එහෙයින් පහත ප්‍රශ්න සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා පිළිතුරු ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරමි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අනුර දිසානායක මහතා]

01. අභ්‍යාසලාභී පත්වීම් කොපමණ ප්‍රමාණයක් ලබා දෙන්නේද? අභ්‍යාසලාභී පත්වීම් ලබා දීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කුමක්ද?

02. අයදුම්පත් කැඳවීමේ පුවත් පත් දැන්වීම දැමීමට පෙර රැකියා ලබා දී තිබේද?

03. පුවත් පත් දැන්වීමට අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය මාර්තු 30 ලෙස පවතිද්දී ඊට පෙර අභ්‍යාසලාභී පත්වීම් ලබා දීමට කටයුතු කළේද? එසේ නම් ඒ මන්ද?

04. අනෙකුත් රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ ක්‍රමවේදය හා දින වකවානු කුමක්ද?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Public Administration and Home Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රකාශයට මගේ පිළිතුර මෙසේයි.

2005 වර්ෂයේදී උපාධිධාරීන් 45,000කට රජයේ රැකියා ලබා දෙන ලදී. එතැන් සිට සෑම වසරකම වරින් වර පළාත් සභා හා මධ්‍යම රජය විසින් විශාල පිරිසකට රජයේ රැකියා ලබා දී ඇත. මෙහි අරමුණ වන්නේ උපාධිධාරීන් සඳහා හැකි ඉහළම අයුරින් රැකියා ලබා දීමයි. මෙයට සමගාමීව උපාධිධාරීන් විශාල පිරිසකට පෞද්ගලික අංශයේද රැකියා ලබා දී ඇති බව ඔබ සැම දන්නා කරුණකි.

මේ අතර දැනටමත් රජයේ සේවයට මේ දක්වා රැකියා විරහිත උපාධිධාරී අභ්‍යාස යෝජනා ක්‍රම යටතේ බඳවා ගත් උපාධිධාරීන් සඳහා ව්‍යවස්ථාවක් අනුමත කර ඇති අතර, එමඟින් ඔවුන් සඳහා ක්‍රමානුකූල උසස්වීම් පටිපාටියක් හා සේවා පහසුකම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

එසේම මෙම රජය පත් වීමට පෙර වර්ෂ කිහිපයක් තුළ නොපවත්වන ලද දීප ව්‍යාප්ත සේවාවන්වලට අයත් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ගණකාධිකාරි සේවයේ, සැලසුම් සේවයේ, ඉංජිනේරු සේවයේ තරග විභාග පැවැත් වූ අතර එකී විභාග ප්‍රතිඵල මත සුදුසුකම් ලත් උපාධිධාරීන්ට එකී සේවාවල පත්වීම් ලබා දී ඇත. එසේම වෛද්‍ය සේවයේ පුරප්පාඩු සඳහා වෛද්‍ය උපාධිධාරීන් බඳවා ගෙන ඇත. සෞන්දර්ය උපාධිධාරීන් සියලු දෙනාටම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගුරු පත්වීම් ලබා දීමට ක්‍රියා කර තිබේ. ඒ අනුව මේ දක්වා වර්තමාන රජය යටතේ උපාධිධාරීන් 5,000කට අධික ප්‍රමාණයක් රාජ්‍ය සේවයට බඳවා ගැනීමට කටයුතු කර ඇත.

ඉහතින් සඳහන් කරන ලද ක්‍රමවේදය තුළින් රැකියා ලබා දීමෙන් අනතුරුවද තවදුරටත් රැකියා විරහිත උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ අරමුණින් 2011 දෙසැම්බර් මස 14 වන දින අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී රැකියා විරහිත උපාධිධාරීන් අභ්‍යාසලාභීන් වශයෙන් බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත. එම අනුමැතියට පෙරද ඉන් පසුවද ජනාධිපති ලේකම් කාර්යාලයටද, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයටද, මගේ අමාත්‍යාංශයටද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලටද රැකියා අපේක්ෂාවෙන් රැකියා විරහිත උපාධිධාරීන්ගෙන් විශාල අයදුම්පත් ප්‍රමාණයක් ලැබී තිබුණි. එසේ ලැබී තිබූ අයදුම්පත් අතුරින් සුදුසුකම් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගැනීමට ක්‍රියා කර ඇත.

ඉහත පරිදි අයදුම්පත් ඉදිරිපත් කිරීමට නොහැකි වූ රැකියා විරහිත උපාධිධාරීන්ටද අභ්‍යාසලාභීන් ලෙස පත්වීම් ලබා දීමට අවස්ථාවක් සලසා දීම සඳහා 2012.02.16 දින පළ කරන ලද පුවත් පත් දැන්වීම් මඟින් එම පුද්ගලයන්ගෙන්ද අයදුම් පත් ලබා ගැනීමට කටයුතු යොදා තිබේ. එම ඉල්ලුම් පත් ලබන මාර්තු 30 වෙනිදා දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යැවිය හැක.

මෙම අභ්‍යාසලාභීන් 2012 වර්ෂය සඳහා වන අය වැය මඟින් අපේක්ෂිත ශීඝ්‍ර ආර්ථික සංවර්ධනය නියමිත කාල රාමුවක් තුළ සාක්ෂාත් කර ගැනීම පිණිසත්, විශේෂයෙන්ම දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටම්වලින් 2012 අය වැය යෝජනා කඩිනම් කිරීමේ හදිසි අවශ්‍යතාව සහ දත්ත හා තොරතුරු රැස් කිරීමත්, ප්‍රමුඛතා පදනමින් ව්‍යාපෘති හා වැඩසටහන් හඳුනා ගැනීමත්, දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති ඇගයීම මෙන්ම එක් එක් දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ නිශ්චිත කාර්ය භාරයන් සපුරාලීමේදී මතු වන බාධා හා ගැටලු හඳුනා ගැනීමත් සඳහා යොදවනු ලැබේ.

ඒ අනුව පුවත් පත් දැන්වීම් පරිදි අයදුම් පත් ඉදිරිපත් කරනු ලබන රැකියා විරහිත උපාධිධාරීන්ද සම්මුඛ පරීක්ෂණයකට කැඳවා අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගැනීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. එසේ අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගනු ලබන නිලධාරීන් දැනට අනුමත වැඩසටහන් නිලධාරි සේවා ව්‍යවස්ථාව අනුව ඉදිරියේදී රාජ්‍ය සේවයේ ස්ථිර සේවයට බඳවා ගැනීමට ක්‍රියා කරන බවද වැඩිදුරටත් දන්වා සිටින අතර මෙම ගරු සභාවේ දැන ගැනීම සඳහා දැනට ගැසට් කිරීමට රජයේ මුද්‍රණාලයාධිපති වෙත ලබා දී ඇති වැඩසටහන් නිලධාරි සේවා ව්‍යවස්ථාවේ පිටපතක්ද **සභාගත*** කරමි.

ඉහත සඳහන් කරුණු අනුව අභ්‍යාසලාභී පත්වීම් ලබා දෙන ප්‍රමාණය තීරණය කළ නොහැකි අතර දැනට ලැබී ඇති අයදුම් පත් අනුව හා පුවත් පත් දැන්වීම් අනුව ලැබෙන අයදුම් පත් මත සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අභ්‍යාසලාභී පදනමින් රැකියා විරහිත උපාධිධාරීන් බඳවා ගැනීමට ක්‍රියා කරනු ලබන බව දන්වා සිටිමි. ලැබී ඇති හා දැනටමත් ලැබෙමින් පවතින අයදුම් පත් සියල්ල සලකා බලා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ නිශ්චිත කාර්ය භාරයන් සපුරා ගැනීමට දායකත්වයක් ලබා ගැනීමට රැකියා විරහිත උපාධිධාරීන්ගේ සහය ලබා ගැනීම රජයේ අපේක්ෂාව වන බැවින් කිසිවකුට අසාධාරණයක් හෝ අයුක්තියක් නොවන ලෙසින් අභ්‍යාසලාභී පදනම මත රැකියා විරහිත උපාධිධාරීන් බඳවා ගැනීමට ක්‍රියා කරනු ලබන බවද දන්වා සිටිමි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇමතිතුමා, අයුක්තියක් කියන්නේ මොකක්ද?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
මොකක්ද?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
මොකක්ද?

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා 23(2) යටතේ -

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
එතුමාට විවාදයක් ඕනෑ නම් විවාදයක් ගනන පුළුවන්. ඔබතුමා කියන්නා වාගේ අද තිබෙන්නේ 23(2) යටතේ ප්‍රකාශයක්. ඒකට පිළිතුරු දෙන්නයි මට තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පිළිතුර වැරදියි.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඇයි වැරදි? [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ-[බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා 23 (2) යටතේ ප්‍රකාශයක් කළා. ඇමතිතුමා පිළිතුර දුන්නා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ රීති ප්‍රශ්නය මෙයයි. මේ ප්‍රකාශයට උත්තරයක් විධියට ගරු ඇමතිතුමා, මේ සභාව නොමග යවන ප්‍රකාශයක් කළා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එය රීති ප්‍රශ්නයක් නොවෙයි. [බාධා කිරීම්] ගරු සජිත් ප්‍රේමදාස මහතා ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද? [බාධා කිරීම්] ගරු සජිත් ප්‍රේමදාස මහතා [බාධා කිරීම්] රීති ප්‍රශ්නය. [බාධා කිරීම්]රීති ප්‍රශ්නයක් නැද්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
තිබෙනවා. තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
පැහැදිලි කරන්න ඕනෑ.[බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉන්න. මෙතුමා කථා කරනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ කියන්නේ බොරුවක්. [බාධා කිරීම්]

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
මේ පත්තර වාර්තා, පත්තර දැන්වීම් අනුව ඉල්ලුම් කරන්න අවස්ථාව ලැබෙනවා. ඒ ඉල්ලුම් කරන සියලුම උපාධිධාරීන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඒ අයටත් පත්වීම් දෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා රීති ප්‍රශ්නයක් තිබෙනවාද? ශෝක ප්‍රකාශ යෝජනා ගන්නද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
තිබෙනවා. තිබෙනවා. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්නය අහනවාද? [බාධා කිරීම්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අහනවා. මේකෙන් පස්සේ අහන්නම්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ශෝක ප්‍රකාශ යෝජනා. [බාධා කිරීම්] Hon. Sajith Premadasa, what is the point of Order? [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පත්තරේ දැන්වීම දාන්න කලින් ලියුම් දෙනවා. අප ඒකයි කියන්නේ. ලජ්ජයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සම්පූර්ණ බොරුවක්. [බාධා කිරීම්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ disturbances අතර මට point of Order එක ගේන්න බැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
හිටපු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත රූපසේන කරුණාතිලක මහතා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. - [*Interruption.*]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order? [බාධා කිරීම්] ශෝක ප්‍රකාශ යෝජනාව. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. [බාධා කිරීම්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පළමුකොට සභාව පාලනය කරන්න. සභාව පාලනය කළාට පසු ශෝක යෝජනාව ගෙනෙන්න පුළුවන්. [බාධා කිරීම්] සභාව පාලනය කරන්න. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?[බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ලක්ෂ ගණන් පගාව ගන්නවා. මන්ත්‍රීගේ ලිපිය ගන්නවා. ඒ ලිපියට රක්ෂා දෙනවා. ඇවිල්ලා මෙතැන උපාසකයා වාගේ බොරු කියනවා. [බාධා කිරීමක්] මොකක්ද කියන්නේ?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
පදනම් විරහිත චෝදනාවක්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පදනම් විරහිත වෙන්නේ මොකක්ද? [බාධා කිරීමක්] පදනම් වුණු පත්තරේ දැන්වීම මෙන්න. මෙන්න පත්වීම් ලිපිය. [බාධා කිරීම්] පත්තරේ දැන්වීම තිබෙන දවසේම පත්වීම දීලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
උපාධිධාරීන් අසූ දාහක් ඉන්නවා රක්ෂා නැතිව. හතළිස්පන්දාහ නොවෙයි. [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ලජ්ජා වෙන්න ඕනෑ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙක් හැටියට. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සජිත් ප්‍රේමදාස මහතා. [බාධා කිරීම්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම කොහොමද point of Order එකක් raise කරන්නේ. මට ඇහෙන්නේ නැහැ. [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
උපාධිධාරීන්ට රක්ෂා දෙන්න ලක්ෂයක් පගාව ගන්නවා. මන්ත්‍රීගේ ලියුම ඕනෑ. [බාධා කිරීම්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇහෙන්නේ නැහැ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා මේ පිළිබඳව ඔබතුමන්ලාට අවශ්‍යතාවයක් තිබෙනවා නම් විවාදයක් ඉල්ලා සිටිය හැක. නමුත් දැන් 23(2) යටතේ ප්‍රකාශය කර අවසන්. [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා ඔබතුමාගේ point of Order එක [බාධා කිරීම්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කොහොම ද මම point of Order එකක් raise කරන්නේ? මේ ඝෝෂාව මැද්දේ point of Order එකක් ඉදිරිපත් කරන්න බැහැනේ. [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේවාට විවාද මොකටද? [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අභාවප්‍රාප්ත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, රූපසේන කරුණාතිලක මහතා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව.[බාධා කිරීම්] ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. [බාධා කිරීම්]

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
කෙහොමද බොරු කිව්වාය කියන්නේ? වගකීමක් නැතිව කථා කරන්න එපා. මේ ගරු සභාවේ ඉඳගෙන වගකීමක් නැතිව කථා කරන මන්ත්‍රීවරු-[බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මහතා. [බාධා කිරීම්] Hon. Premadasa, if you have a point of Order to raise, you do it. Otherwise, I will have to proceed with - [බාධා කිරීම්] Hon. Sajith Premadasa, - [බාධා කිරීම්] Order, please!

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ලජ්ජා වන්නට ඕනෑ. [බාධා කිරීම්]

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
උපාධිධාරීන්ට රක්ෂා දීම ලජ්ජාවට හේතුවක්ද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ලජ්ජා වෙන්න ඕනෑ. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ලජ්ජා වෙන්න ඕනෑ පගාවට රක්ෂා දීම ගැන. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකර වාඩි වෙන්න. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වාඩි වෙන්න. [බාධා කිරීමක්] ගරු සජිත් ප්‍රේමදාස මහතා රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. කරුණාකර වාඩි වෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානාකතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරන්නට කැමතියි, ස්ථාවර නියෝග 1(ආ) යටතේ සහ ස්ථාවර නියෝග 5(1) (2)(3) යටතේ මේ සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සියලුම ප්‍රතිපාදනයන් ආරක්ෂා කරන්නට කැප වෙලා සිටිනවාය කියන එකට. විශේෂයෙන් මම ඔබතුමාගේ අවධානය යොමු කරන්නට කැමතියි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11වන ව්‍යවස්ථාවට. -III වන පරිච්ඡේදය මූලික අයිතිවාසිකම්- එහි මෙසේ සඳහන් වනවා:

> "කිසිම තැනැත්තකු වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය."

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 14.(1) (අ) සහ (ආ) අනුව්‍යවස්ථාවලට මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

14. (1) අනුව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වනවා:

(අ) භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහසට;

(ආ) සාමකාමීව රැස්වීමේ නිදහසට;

ඒ නිදහස අපේ රටේ පුරවැසියන් සතු නිදහසක්. එය ආරක්ෂා කරන්නට අර ප්‍රතිඥාව හරහා හෝ දිවුරුම් දීම හරහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන් ආරක්ෂා කරන්නට මහජන නියෝජිතයන් වන අප සියලු දෙනාම බැඳී සිටිනවා. ඒ වාගේම මම ඔබතුමාගේ අවධානය යොමු කරන්නට කැමතියි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VI වන පරිච්ඡේදයට. ඒ යටතේ රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් අනුව ශ්‍රී ලංකාවේ රජය ඇප කැප වී සිටිනවා, ප්‍රමාණවත් ආහාර පාන, ඇඳුම් පැළඳුම්, නිවාස පහසුව, ජීවන තත්ත්වය නිරන්තර වර්ධනයකට යොමු කරන්නට. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
So, what is the point of Order? [බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
No, no, let me raise my point of Order. - [*Interruption.*] කරුණාකර මගේ point of Order එක -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Sajith Premadasa, -

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
Sir, I would like to know what the point of Order is about. Has it got any relevance to the matter I spoke

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

about? What is this? You are just wasting the time of the House. - [*Interruption.*]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes, Hon. Sajith Premadasa?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාට සඳහන් කරන්නට කැමතියි. අපේ සම්ප්‍රදායක් තිබෙනවා. Kaul and Shakdherගේ "Practice and Procedure of Parliament"හි සඳහන් වනවා, that the Members of the House have a right to raise and formulate a point of Order කියා. ඒ වාගේම - [බාධා කිරීම්] No, no. Give me a hearing, Hon. Member. Sir, in that, Kaul and Shakdher state, I quote:

"A member wishing to raise a point of Order has the right to be heard before a decision can be given by the Speaker."

ඒ නිසා කරුණාකරලා මට සවන් දෙන්න. මම මේ අදහස ඉදිරිපත් කරන්නේ සම්ප්‍රදායයට අනුකූලවයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හයවැනි පරිච්ඡේදයේ, රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම යටතේ ශ්‍රී ලංකාවේ රජය ඇප කැප වෙලා සිටිනවා, ප්‍රමාණවත් ආහාර පාන, ඇඳුම් පැළඳුම් සහ නිවාස පහසුවද, ජීවන තත්ත්වයෙහි නිරන්තර වර්ධනයද, විවේකය හා සමාජයීය සහ සංස්කෘතික ඉඩ ප්‍රස්තා සලසා දෙන්නටත්, ඒ වාගේම සමාජ සුරක්ෂිතභාවය හා සුබසාධනය ඇති කිරීමටත්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, you may raise your point of Order precisely, without elaborating.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකරලා සම්ප්‍රදායයට අනුකූලව මට,- [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ඔබතුමා Kaul and Shakdherගේ "Practice and Procedures of Parliament" කියන පොත දන්නවාද?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
I know.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඒකෙන් උපුටා ගත්තේ. ගරු ඇමතිතුමනි, ඒක නිසා පොඩ්ඩක් බාධා කරන්නේ නැතිව ඉන්න. අඩු ගණනේ ඔබතුමා පොඩ්ඩක් ඉගෙන ගන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ රීති ප්‍රශ්නය කෙටියෙන් ඉදිරිපත් කරන්න. [බාධා කිරීමක්]Order, please!

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ස්ථාවර නියෝග යටතේ ඔබතුමාටත් කරුණු කාරණා පැහැදිලි කරමින් තමයි මේ කරුණ ඉදිරිපත් කරන්නේ. මේ සභාවේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වැනි පරිච්ඡේදයේ විවිධ ප්‍රතිපාදන සහ හයවැනි පරිච්ඡේදයේ ප්‍රතිපාදන ආරක්ෂා කරන්න බැඳිලා ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකරලා මට සවන් දීමක් කරලා ඔබතුමාගේ නියෝගය නිකුත් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

පසු ගිය දවසේ බොර තෙල් බැරලයක මිල සියයට 8කින් වැඩි වුණාට පසුව, භූමිතෙල් වැඩි වුණා සියයට 49කින්; ඩීසල් වැඩි වුණා සියයට 38කින්; පෙට්‍රල් වැඩි වුණා සියයට 18කින්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමා ඉදිරිපත් කරන ප්‍රශ්නය, it should be relevant to the procedure of Parliament.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Of course, it is.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
You have no -

**සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම වගකීමෙන් කියන්නේ-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායයට - procedure එකට - අදාළ දේවල් පමණක් කථා කරන්න. සභාවේ කටයුතුවලට අදාළව කථා කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පාර්ලිමේන්තු සම්ප්‍රදායයට අනුකූලව තමයි කථා කරන්නේ. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීතුමන්ලා සැදී පැහැදී සිටිනවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන ආරක්ෂා කරන්නට. මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වැනි පරිච්ඡේදයට. ඔබතුමා පොඩ්ඩක් මේක බලන්න.

"11. කිසිම තැනැත්තකු වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේ ය."

මම ඔබතුමාට කියන්නට කැමැතියි, හලාවත, එගොඩවැල්ලේ, ඇන්ටනි ප්‍රනාන්දු මැතිතුමා ඝාතනයට ලක් කිරීම-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, that is not a point of Order. You can raise it subsequently. [බාධා කිරීම්] ඒක ස්ථාවර නියෝගයක් යටතේ පැන නඟින ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, I have given a Ruling. I have listened to you; it has nothing to do with the procedure of Parliament.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
No, it has.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
No, no. The Chair has -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, I have given a Ruling -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව තත්පර තිහක කාලයක් ලබා දෙන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
When the Chair gives a Ruling - [*Interruption.*] Hon. Member, the Chair has given a Ruling. Now, let us get on to the next Item. - [*Interruption.*] Chair එක Ruling එකක් දුන්නා. Ruling එකක් ඉල්ලුවා. ඒක දුන්නා. He must sit down. නැහැ, නැහැ Ruling එකක් දීලා තිබෙනවා. You have given a Ruling, Sir. Do not go back on the Order.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Kaul and Shakdherගේ "Practice and Procedure of Parliament" කියන පොත කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඒකේ සඳහන් වෙනවා,-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
So, what is your point of Order?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට අවස්ථාව දෙන්නේ නැති නිසා මම මේ සම්ප්‍රදායය සඳහන් කරන්නයි යන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I have given a Ruling on the matter that you raised.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Hon. Deputy Speaker, how can you give a Ruling without hearing me?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I have given you enough hearing.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
I have not concluded my presentation.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, you have attempted to elaborate on your point. But there was -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
But, I have not concluded it.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
If you want to conclude -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Just give me 30 seconds to conclude, please.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
You may raise it very briefly.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
It is very short and only a few sentences.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Right.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාගේ අවධානය යොමු කරන්නේ,-

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ point of Order එකෙන් පස්සේ ඔබතුමා කථා කරන්න. ඔබතුමා වාඩි වෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කළා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වැනි පරිච්ඡේදයටයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හය වැනි පරිච්ඡේදයටයි. ඔබතුමා පොඩ්ඩක් මට සවන් දෙන්න. මේ තුන්වැනි පරිච්ඡේදයේ කියන මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ වගකීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපි සතුව තිබෙනවා. ආණ්ඩුව නියෝජනය කරන සියලුම ඇමතිවරුන්, සියලුම මන්ත්‍රීවරුන් බැඳිලා ඉන්නවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! My Ruling again is that it is not a point of Order.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ තෙල් මිල වැඩිවීම තුළින්-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මී ළඟට ශෝක ප්‍රකාශ යෝජනා.

## ශෝක ප්‍රකාශය : ගරු රූපසේන කරුණාතිලක මහතා
## அனுதாபத் தீர்மானம் : மாண்புமிகு ரூபசேன கருணாதிலக
## VOTE OF CONDOLENCE : HON. RUPASENA KARUNATILLAKE

[අ.භා. 3.09]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගාල්ල දිස්ත්‍රික්කයේ පොදු මහජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් පමණක් නොව, කැබිනට් අමාත්‍යවරයකු වශයෙන්ද මෙම උත්තරීතර සභාව ශෝභාවත් කරන ලද කීර්තිමත් දේශපාලනඥයකු වූ රූපා කරුණාතිලක මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මම මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරන්නෙමි.

ලොකුගමගේ ආරියදාස කරුණාතිලක මුහන්දිරම්තුමාගේත්, කාරියවසම් බෝවිතන්ත්‍රි හින්නිහාමි මහත්මියගේත් පවුලේ බාලම සාමාජිකයා වශයෙන් වර්ෂ 1933 මාර්තු මස 15 වැනි දින ගාලු දිසාවේ, හිනිදුම් පත්තුවේ, තල්ගස්වල, නියාගමදී ලොකුගමගේ රූපසේන කරුණාතිලක මහතා මොලොව එළිය දුටුවේය.

නියාගම රජයේ විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ එතුමා කොළඹ ආනන්ද මහා විද්‍යාලය විමධ්‍යගත කිරීමේදී ස්ථාපිත කරන ලද ඇල්පිටිය ආනන්ද විද්‍යාලයේ පළමු ශිෂ්‍ය කණ්ඩායමට ඇතුළත්ව ඉගෙනීම් කටයුතු මැනවින් සිදු කළේය. ඉන් අනතුරුව ගාල්ල මහින්ද, කොළඹ නාලන්ද සහ කොළඹ පොලිටෙක්නික් වැනි විද්‍යාල තුළින් උසස් පෙළ දක්වා සිප් සතර හැදෑරුවේය.

ඉඩම් හිමි වැවිලිකරුවකු වූ සිය පියාගෙන් ලද පන්නරය හා ව්‍යාපාර පරිපාලනය පිළිබඳව ලද පරිචය කැටි කර ගනිමින් ව්‍යාපාර ක්ෂේත්‍රයට පිවිසුණු කරුණාතිලක මහතා "කලර් ප්‍රඩක්ට්ස්" වැනි ආයතනයන්හි අයිතිකරු ලෙස ඉතා කෙටි කාලයක් තුළදී අගනුවර ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරිකයන් අතර කැපී පෙනෙන ස්ථානයක් හිමි කර ගත්තේය.

සුප්‍රසිද්ධ සමාජ සේවිකාවක මෙන්ම දේශපාලන ක්ෂේත්‍රයේ ප්‍රබල ස්ථානයක වැජඹුණු කාන්තාවක වූ සිරිදත්තා ජයකොඩි මැතිනියගේ දියණියක වූ හේතුමතී ජයකොඩි මෙනෙවිය සමඟින් 1963 වසරේදී යුග දිවි ගමන් ඇරඹූ කරුණාතිලක මහතා එම විවාහය තුළින් අමල්, සංගීතා සහ සංජීව නැමති දූ පුතුන් තිදෙනෙකු මොලොවට දායාද කළේය.

දකුණු පළාතටත්, රටටත් ඉමහත් සේවාවක් ඉටුකරන ලද වර්තමාන ගාලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගයන්ත කරුණාතිලක මහතාගේ පියාගේ බාල සහෝදරයා වශයෙන්ද හැඳින්විය හැකි රූපා කරුණාතිලක මහතා, මහර හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත කමලවර්ණ ජයකොඩි මැතිතුමාගේ මස්සිනාද විය.

ගණකාධිකරණය හා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උසස් අධ්‍යාපනය ලබමින් සිටි එතුමා තුළ පැවති චතුර කථිකත්වය පිළිබඳව පැහැදීමට පත් දිවංගත ඩඩ්ලි සේනානායක මැතිතුමා, 1967දී බෙන්තර- ඇල්පිටිය එක්සත් ජාතික පක්ෂ ප්‍රධාන සංවිධායක වශයෙන් එතුමාව පත් කරන ලදී. 1970 පැවැති මහ මැතිවරණයට එම ආසනයේ එක්සත් ජාතික පක්ෂ අපේක්ෂකයා වශයෙන් ඉදිරිපත් වුවද ජයග්‍රහණය ලැබිය නොහැකි වුවත්, රූපා කරුණාතිලක මහතා ප්‍රදේශය තුළ ලොකු, කුඩා කාගේත් සිත දිනාගෙන සිටි බැවින්, 1977 වසරේ පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී දකුණු පළාතෙන් වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබා ගනිමින් බෙන්තර - ඇල්පිටිය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වශයෙන් තේරී පත්ව මෙම උත්තරීතර සභාවට පළමුවරට පිය නැඟුවේය.

එසේ මන්ත්‍රී ධුරයක් ලැබූ එතුමා වෙත ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විසින් ගාල්ල දිස්ත්‍රික් අමාත්‍ය ධුරය පිරිනමනු ලැබුවේය. 1987දී පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන්ද, ඉන් අනතුරුව පළාත් සභා රාජ්‍ය ඇමති වශයෙන්ද ජනතා මෙහෙවරෙහි යෙදුණු එතුමා 1988 වසරේදී රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ රජයේ වරාය හා නාවික අමාත්‍යවරයා වශයෙන්ද කටයුතු කෙළේය. එම අවස්ථාවේදී වෙරළ ඛාදනය වළක්වාලීම සඳහා නොරාඩ් ආයතනයේ ආධාර මත ආරක්ෂක වැටි ඉදි කිරීමේ ව්‍යාපෘතියක්ද ආරම්භ කළ මෙම මානව හිතාවදී දේශපාලනඥයා ඉන් අනතුරුව වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා වශයෙන් වගකීම භාර ගෙන කුඩා තේ ශක්ති අරමුදල අරඹා එම ක්ෂේත්‍රයේ නියැලුණු ජනතාව වෙනුවෙන්ද ශක්තියක් ලබා දුන් අතර, අපේ රටේ තේ කර්මාන්තයේ මහා පෙරළියකටද හවුල් වුණේය.

1989 පැවැති මහ මැතිවරණයේදී ගාල්ල දිස්ත්‍රික් මන්ත්‍රීවරයකු වශයෙන් ජයග්‍රහණය අත් පත් කර ගත් එතුමා ඇමති, නියෝජ්‍ය ඇමති ආදී විවිධ තනතුරු දරමින් එකී වකවානු තුළ ප්‍රදේශයට සිදු කළ සේවාව අගය කළ යුතුයි. බෙන්තර - ඇල්පිටිය භාරකාරත්ව අරමුදල පිහිටුවා එමඟින් සුවිසල් මෙහෙවරක් තම උපන් ප්‍රදේශයට ඉටු කළ කරුණාතිලක මහතා, පාසල් ගණනාවක සංවර්ධනය උදෙසාද කටයුතු කළේය. ඒ වාගේම කරුණාතිලක මහතා තරුණ වයසේදී තම පියාගෙන් මුදල් ලබා ගෙන අලුතින් පාසලක් ඉදි කරන්නට තරම් ආදර්ශවත් ලෙස කටයුතු කළ බවද සඳහන් කරන්න කැමැතියි. විශාල වියදමකින් ඇල්පිටිය නගරයට ජල යෝජනා ක්‍රමයක්ද ලබා දුන්නා. සෞඛ්‍ය පහසුකම් මෙන්ම, ගමනා ගමන පහසුකම්ද වැඩි දියුණු කරමින් ප්‍රදේශයට නව ජීවනයක් ලබා දුන් අතර, රැකියා ප්‍රශ්නය විසඳාලීම උදෙසාද එතුමා ඉමහත් වෙහෙසක් දැරුවේය.

මහ පොළ තාක්ෂණික ආයතනය, ඇල්පිටිය රූපා කරුණාතිලක රංගශාලාව හා ඇල්පිටිය කැටපොල පොලිස් අභ්‍යාස විද්‍යාලය වැනි ආයතන පිහිටුවීම, ඇල්පිටිය සඳහා වෙනමම පොලිස් අධිකාරි කොට්ඨාසයක් වෙන් කර දීම වැනි කාර්යයන් රැසක් ඉටු කළ එතුමා ප්‍රදේශය තුළ බැංකු ශාඛා ගණනාවක් ආරම්භ කිරීමටද මැදිහත් වී නායකත්වය දුන්නේය. රුහුණු සංවර්ධන බැංකුවේ ප්‍රධාන කාර්යාලය ඇල්පිටියේ ස්ථාපනය කිරීමද ඒ උත්සාහයේ තවත් ප්‍රතිඵලයක් බවට පත් වුණි. මහා සඟරුවනට කළ සේවය, පළාතේ ශාසනික, ආගමික සංවර්ධනයටද, දහම් පාසල් සඳහා එතුමා ලබා දුන් නායකත්වයද අප තවමත් විශේෂයෙන් සිහි කළ යුතු ආදර්ශයන් බවටද එක් වෙයි.

ඇල්පිටිය මහජන ක්‍රීඩාංගනය, බෙන්තර ජනකලා කේන්ද්‍රය, ඇල්පිටිය ස්වයංක්‍රීය දුරකථන හුවමාරු මධ්‍යස්ථානය වැනි මහජන අවශ්‍යතා රැසක් සපුරා දුන් එතුමා ඇල්පිටිය රූපා කරුණාතිලක නිවාස යෝජනා ක්‍රමය යටතේ සූරියගම ආදර්ශ ගම්මානයද, බෙන්තර සිංහරූපා ගමද, ඉතාලි ආධාර යටතේ මෛත්‍රී ගමද, බෙල්ජියානු ආධාර මත බෙල්ජියානු ගමද ජනතා අයිතියට පවරා දුනි.

ඇල්පිටිය නගරයේ පවත්නා වාහන තදබදයට පිළියමක් වශයෙන් විකල්ප මාර්ගයක් ඉදි කිරීමට පියවර ගත් කරුණාතිලක මැතිතුමා විදේශීය දානපතියන්ගේ පෞද්ගලික ධන පරිත්‍යාග යොදා ගනිමින් නියාගම අනුබද්ධ විශ්ව විද්‍යාල පරිශ්‍රය පිහිටුවීමටද, දිවයින පුරා පාසල් 62ක කුඩා විද්‍යාගාර පිහිටුවීමටද අවශ්‍ය පියවර ගත්තේය. 1994දී ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් යළි මෙම සභාව වෙත පැමිණි කරුණාතිලක මහතා 2000 වසර දක්වාම විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයකු ලෙස තමන් වෙත පැවරුණු කාර්ය භාරයන් සාමාන්‍ය මහ ජනතාව වෙනුවෙන් නොපිරිහෙළා ඉටු කළේය.

අනතුරුව, 2002දී නෙදර්ලන්තයේ ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස උත්තරීතර සේවාවක නියැලුණු කරුණාතිලක මහතා දේශපාලනඥයකු වශයෙන් පමණක් නොව, රාජ්‍ය තාන්ත්‍රිකයකු වශයෙන් ද ගාලු දිසාවට කරන ලද සුවිශාල මෙහෙවර අප ගෞරවයෙන් සිහිපත් කරමි. ගාල්ල දිස්ත්‍රික් දහම් පාසල් අරමුදල පිහිටුවීම, ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගනය සඳහා මූලික පදනම දැමීම, ගාල්ල උරුමය සුරැකීමේ වැඩ පිළිවෙළට නෙදර්ලන්ත රජයේ ආධාර ලබා ගැනීම වැනි කිසිදා අමතක කළ නොහැකි සේවාවන් රැසක්ද ඒ අතරට එක් වුණි.

ලංකා කලා සංගමයේ උපලේකම් ධුරය දැරූ මෙම මානව හිතවාදියා ඕල්කට් ශත සංවත්සරය අවස්ථාවේදී ඒ සඳහා උපරිම දායකත්වය ලබා දුන්නේය. බෙන්තර ගලපාත රජමහා විහාරයේ වාර්ෂික අනුබුදු මිහිඳු පෙරහැර පැවැත්වීමට ද, ගාල්ල සමනල රජමහා විහාර පූජා භූමි සංවර්ධන කටයුතු ඇරඹීමට ද, විදේශ දානපතියන්ගේ ආධාර උපකාර මත මාතර වෙහෙරහේන බුදු පිළිමය සඳහා මහ වියනක් ඉදි කරවීමට ද, ශ්‍රී දළදා මාලිගාවේ වහලයේ රන් ආලේප කිරීම සහ ශ්‍රී මහා බෝධි රන් වැට සඳහා දායකත්වය සපයමින්ද බෞද්ධාගමේ අභිවෘද්ධිය වෙනුවෙන් අනුපමේය මෙහෙවරක් ඉටු කළේය.

චාම් දිවි පෙවෙතක් ගෙවමින්, මහත්මා දේශපාලනයක නියැලුණු රූපා කරුණාතිලක නම් වූ කෘතහස්ත දේශපාලනඥයා වෙත එක්සත් ජාතික පක්ෂයේ 65 වැනි සංවත්සරය අවස්ථාවේදී ස්වර්ණ හස්ති සම්මානය පුද කළේ එතුමන් විසින් ගාල්ල දිස්ත්‍රික් ජනතාවටත්, රටටත් කළ මහඟු මෙහෙවර අගය කිරීමක් වශයෙනි. කලක් දේශපාලන කටයුතුවලින් ඈත්ව සිටි එතුමා 2011 ඔක්තෝබර් මස 11 වැනි දින තම ඥාතීන්ටත්, ප්‍රදේශවාසී ජනතාවටත් ඉමහත් වේදනාවක් ගෙන දෙමින් අවුරුදු 78ක් ආයු වළඳා සදහටම දෙනෙත් පියා ගත්තේය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමස්ත ශ්‍රී ලංකාව වෙනුවෙන්ම ජාතික වශයෙන්ද, දේශපාලනමය වශයෙන්ද, ආගමික වශයෙන්ද සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කළ ප්‍රතිපත්තිගරුක දේශපාලනඥයකු වූ ගාල්ල දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ අමාත්‍ය ලොකුගමගේ රූපසේන කරුණාතිලක මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමාගේ දයාබර භාර්යාවටත්, දරු තිදෙනා ඇතුළු පවුලේ ඥාතීන්ටත්, විශේෂයෙන්ම ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගයන්ත කරුණාතිලක මැතිතුමාටත් දන්වා යවන ලෙස මා යෝජනා කරමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

විපක්ෂ නායක, ගරු රනිල් වික්‍රමසිංහ මහතා. Order, please! Will an Hon. Member propose the Hon. Gayantha Karunatileka to take the Chair.

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)

I propose that the Hon. Gayantha Karunatileka do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ගයන්ත කරුණාතිලක මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. GAYANTHA KARUNATILEKA *took the Chair.*

[අ.භා. 3.21]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාගේ මිත්‍රයකුගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන්නයි මා මේ අවස්ථාවේදී නැඟී සිටියේ. මේ කාරණයේදී මූලාසනයේ සිටින ගරු මන්ත්‍රීතුමාටත් විශේෂ සම්බන්ධයක් තිබෙනවා. මා හිතන විධියට ප්‍රථම වතාවට මෙම ගරු සභාවේ මූලාසනයේ ඉඳගෙන තමන්ගේ බාප්පාගේ අභාවය වෙනුවෙන් කෙරෙන ශෝක ප්‍රකාශයට ඇහුම් කන් දුන්නු මන්ත්‍රීවරයෙක් හැටියට අද ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා වාර්තාවක් තබා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ගරු රූපා කරුණාතිලක මන්ත්‍රීතුමාව දැන හඳුනා ගන්න ලැබුණේ එතුමා සංවිධායකවරයෙක් වශයෙන් පත් වුණාට පසුවයි. ඒ කාලයේදී එතුමාත්, මාත් ජීවත් වුණේ අල්ලපු ගෙවල්වලයි. විටින් විට අපි අත්තනගල්ලට සහ අනෙකුත් ස්ථානවලට සත්‍යග්‍රහවලට ගියා. ඒ තැන්වලදී මුණ ගැහිලා තමයි අප අතර මිත්‍රත්වයක්, සම්බන්ධකමක් ඇති වුණේ. අපි -ගරු ගාමිණී අතුකෝරල මැතිතුමා, ගරු නන්ද මැතිව් මැතිතුමා, ඒ වාගේම ගරු කමලවර්ණ ජයකොඩි මැතිතුමා සහ මා- හැන්දෑ වරුවේ, රාත්‍රී කාලයේ ගරු රූපා කරුණාතිලක මැතිතුමාගේ ගෙදරට එකතු වෙනවා. මේ එක් කෙනෙක්වත් එදා පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. සමහරු එක වතාවක් පාර්ලිමේන්තුවේ ඉඳලා ඊට පස්සේ පාර්ලිමේන්තු මැතිවරණයෙන් පරාජය වුණු අය. අනෙක් අය පාර්ලිමේන්තුවේ සිටියේ නැහැ.

ආණ්ඩු පාර්ශ්වයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා සඳහන් කළා ගරු කමලවර්ණ ජයකොඩි මැතිතුමාත්, ගරු රූපා කරුණාතිලක මැතිතුමාත් අතර තිබුණු සම්බන්ධය. ගරු රූපා කරුණාතිලක මැතිනියත් මහර, ගනේමුල්ල ජයකොඩි පවුලේ සාමාජිකාවක්. අපේ කමලවර්ණ ජයකොඩි මැතිතුමාගේ වැඩිමහල් සහෝදරිය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම රූපා කරුණාතිලක මැතිතුමා එක්ක ඒ කාලයේ ළඟින්ම ආශ්‍රය කරපු තවත් පුද්ගලයෙක් තමයි ඒ.සී.එස්. හමීඩ් මැතිතුමා. එහෙම අපි ඔක්කොම එකට එකතු වෙලා එක් එක් අතුරු මැතිවරණවලට, සත්‍යග්‍රහ ව්‍යාපාර ගණනාවකට සහභාගි වුණා. රූපා කරුණාතිලක මැතිතුමාගේ දක්ෂකම පෙන්වුවේ ගාලු දිසා ඇමතිවරයා හැටියටයි. එදා ගාලු දිස්ත්‍රික්කයේ සංවර්ධනය සීමා වෙලා තිබුණා. බෙන්තොට වටේ හෝටල් කිහිපයක් තිබුණා. ඒ හැර ගාලු දිස්ත්‍රික්කයේ දියුණුවක් තිබුණේ නැහැ. එදා රූපා කරුණාතිලක මැතිතුමා දිසා ඇමති හැටියට ඒ දිස්ත්‍රික්කයේ අනෙකුත් ඇමතිවරු එක්ක එකට එකතු වෙලා තමයි ඒ විශාල දියුණුව ඇති කළේ. තමන් දන්නා හැම ඇමතිවරයකුටම එතුමා කථා කළා. ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමා මුණගැහිලා එතැනින් ආධාර උපකාර ලබා ගත්තා; ගාමිණී දිසානායක මැතිතුමාගේ අමාත්‍යාංශයෙන් ඒ වාගේම ආධාර ලබා ගත්තා. අපේ ජනාධිපති ප්‍රේමදාස මැතිතුමා තමයි ඒ කාලයේ අගමැතිතුමා. එතුමාගෙන් ආධාර උපකාර ගත්තා. එම්.එච්. මොහොමඩ් ඇමතිතුමාගෙන්, අපේ ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමාගෙන් ආදී වශයෙන් හැම ඇමතිවරයකුගෙන්ම ප්‍රයෝජන අර ගෙන තමයි මුළු ගාලු දිස්ත්‍රික්කයම දියුණු කළේ. එතුමා ඒ සංවර්ධනය බෙන්තර ඇල්පිටියට පමණක් සීමා කළේ නැහැ. ඒ සංවර්ධනය අද මුළු ගාලු දිස්ත්‍රික්කය තුළම දකින්න පුළුවන්.

බෙන්තර-ඇල්පිටිය කොට්ඨාසයේ එදා ඇති වුණ දියුණුව ගැන මට වඩා හොඳට ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ප්‍රකාශ කරයි. ඇල්පිටිය කියන්නේ එදා කුඩා නගරයක්. නැත්නම් විශාල ගමක්. අද ඇල්පිටිය නගරයක් බවට පත් වෙලා තිබෙනවා. ඒක කළේ රූපා කරුණාතිලක මැතිතුමා. එතුමා ඇල්පිටිය නගරයේ එතුමාගේ නිවසත් ඉදි කළා. එදා මම අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට ඉන්න කාලයේ විශේෂයෙන්ම ඇල්පිටිය ආනන්ද විද්‍යාලය දියුණු කරන්න මගෙන් ආධාර උපකාර ඉල්ලුවා. එහෙත් ඒ උදවු ඇල්පිටිය ආනන්ද විද්‍යාලයට සීමා කළේ නැහැ. ගාමිණී විද්‍යාලය ඇතුළුව තවත් විද්‍යාල ගණනාවක ලැයිස්තුවක් අර ගෙනයි එන්නේ. ඒ ගමන් එතුමා ගාලු දිස්ත්‍රික්කයේ අනෙක් පාසල් ගැනත් මතක් කරනවා. විශේෂයෙන්ම ඒ පාසල්වල ගුරු හිඟය -ගුරු අඩු පාඩුව- නැති කරන්නට, ඉංග්‍රීසි ගුරුවරු බඳවා ගන්නට එතුමා කටයුතු කළා. ඒ වාගේම ඩී.බී. විජේතුංග මැතිතුමා විදුලි හා බලශක්ති ඇමති හැටියට සිටින කාලයේත්, තැපැල් හා විදුලි සන්දේශ ඇමති හැටියට සිටින කාලයේත් එතුමා සමඟ එතැන වාඩි වෙලා, ඒ ප්‍රදේශවල විදුලි රැහැන් අදින්නේ කොහොමද, විදුලිය ලබා දෙන්නේ කොහොමද, දුරකථන පහසුකම් ලබා දෙන්නේ කොහොමද කියලා සාකච්ඡා කරනවා මම දැක තිබෙනවා. එතුමා සැලැස්මක් ඇතිව ගාලු දිස්ත්‍රික්කයටත් බෙන්තර ඇල්පිටියටත් දියුණුවක් ලබා දුන්නා. සංචාරක ව්‍යාපාරය සඳහා අලුතින් හෝටල් හදන එක පමණක් නොවෙයි කුඩා සංචාරක ව්‍යාපාරිකයන්ටත් ඒ වාගේම සහයෝගය දුන්නා. එතුමාට ඒ හැම කෙනකු සමඟම සම්බන්ධකම් තිබුණා. අන්න ඒකයි එතුමාගේ ශක්තිය. ගාලු දිස්ත්‍රික්කයේ ඕනෑම කෙනකුගේ නම ඇහුවොත් එතුමා දන්නවා. බී.ආර්. දිසානායකගේ සිට හිනිදුම ඈත ගම්මානයක සිටින පුද්ගලයන් ගැන පවා එතුමාට හොඳ දැනීමක් තිබුණා. අන්න ඒ බිම් මට්ටමේ දේශපාලනයට එතුමාගේ දක්ෂකම තිබුණා.

මම තවත් කරුණක් කියන්න කැමැතියි. අද සංචාරක මධ්‍යස්ථානයක් හැටියට මුළු ලෝකයම ගාලු නගරය, ගාලු කොටුව දිහා බලා ගෙන ඉන්නවා. මේ ගාලු කොටුව දියුණු කිරීම ගැන ඉස්සරවෙලාම උනන්දුවක් දක්වලා, ගාලු කොටුව සංරක්ෂණය කිරීම පිළිබඳව ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට අදහස් දීලා ඒ දියුණුව ඇති කළේ රූපා කරුණාතිලක මැතිතුමා කියලා මම මතක් කරන්න කැමැතියි.

ඇමතිවරයකු හැටියට ඉන්න කොට එදා එතුමාට ගාලු කොටුවේ නිල නිවසක් තිබුණා. අපි විටින් විට ගිහිල්ලා එතැන දී එතුමාව හම්බ වනවා. ඒ නිල නිවසේ ඉඳ ගෙන එතුමා අපට

පෙන්වනවා මේ ගාලු කොටුව දියුණු කරන්න පුළුවන්, මේ ප්‍රදේශය දියුණු කරන්න පුළුවන් කියලා. ගාලු කොටුවේ වටිනාකම මමත් ඉගෙන ගත්තේ ඒ අවස්ථාවේ යි. 2001 ආණ්ඩුව භාර ගත්තාට පසුව විශේෂයෙන්ම රුපා කරුණාතිලක මැතිතුමා ඇවිල්ලා මට කිහිප වතාවක් කිව්වා, මේ ගාලු කොටුව තවත් දියුණු කරලා, සංචාරක මධ්‍යස්ථානයක් බවට පත් කරන්න ඕනෑ කියලා. ඒ සඳහා එතුමාත් එක්ක සහභාගි වුණා. එතුමා ඒ වැඩ කටයුතු කළේ නැත්නම් අද ඒ වාගේ දියුණුවක් ගාල්ලේ තිබෙන්නේ නැහැ. එතුමා විශේෂයෙන්ම එම්.එස්. අමරසිරි ඇමතිතුමා සමඟ එකතු වෙලා තමයි නාවික විදුහලක් ආරම්භ කරන්නට ක්‍රියා කළේ. ඒ ඇති කරපු විශාල දියුණුව තමයි අදත් ගාලු නගරයේ තිබෙන්නේ.

අන්තිම කාලයේදී අපට කථා කළා, ගාලු නගරයේ ලයිට් හවුස් හෝටලය හදන්න ඉඩම් ලබා දෙන්න කියලා. මට ඒකත් මතකයි. මම හිතන හැටියට 1991 නැත්නම් 1992 වෙන්න ඕනෑ, මටත් ඇවිල්ලා කථා කළා. අපි අන්තිමට රජයේ ඒ ඉඩම ලබා දුන්නා, ලයිට් හවුස් හෝටලය හදන්න. ඒකෙන් අද ගාල්ලේ තිබෙන අනික් හෝටල්වලටත් විදේශීය සංචාරක ව්‍යාපාරයේ විශේෂ තැනක් හිමි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කුඩා තේ වතු හිමියන් ගැන කථා කරන්න එතුමා අමතක කළේ නැහැ. කුඩා තේ වතු හිමියන් ගැන එතුමා හැම වෙලේම කථා කළා. කැබිනට් මණ්ඩලයේදී, පාර්ලිමේන්තුවේදී, අපේ ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමේදී කුඩා තේ වතු හිමියන් ගැන කථා කළා. ඒ ප්‍රදේශයේ රබර් කර්මාන්තය තිබෙනවා. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගැන දන්නවා. ඒ වාගේම කුරුඳු කර්මාන්තය තිබෙනවා. මේ හැම එකක් ගැනම එතුමාගේ උනන්දුවක් තිබුණා. ව්‍යාපාරිකයෙක් හැටියට එතුමා ඒ උනන්දුව තියා ගත්තා. වැවිලි කර්මාන්ත ඇමතිතුමා හැටියට එතුමා එක්ක වැඩ කරන්න මට අවස්ථාව ලැබුණා. ලංකා ජාතික වතු කම්කරු සංගමයේ සභාපති හැටියට එතුමා එක්ක වැඩ කටයුතු කරන කොට තමයි අපි -රාජා සෙනෙවිරත්න මැතිතුමා ඇතුළු සියලු දෙනාම- විශේෂයෙන්ම වතුකරයේ ජනතාවට නිවාස ලබා දෙන අරමුදල ගැන සාකච්ඡා කළේ.

බෙන්තර-ඇල්පිටිය භාරකාරත්ව අරමුදල ආරම්භ කරද්දී රුපා කරුණාතිලක මැතිතුමා තමයි ඒ කාලයේදී ගාල්ල දිස්ත්‍රික් ඇමතිතුමා හැටියට ක්‍රියා කළේ. එතුමා හැම එකටම සහයෝගය දුන්නා. තොණ්ඩමන් ඇමතිතුමාත්, මමත් එතුමා එක්ක මේ කාරණා ගැන කථා කළා. එතුමාට වතුකරය ගැන දැනුමක් තිබුණා. ඒත් එතුමා ඒ දැනුම මුළු ලංකාවටම පෙන්වන්න ගියේ නැහැ. අනික් අතින් ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා කිව්වා වාගේ එතුමා දක්ෂ ක්‍රීඩකයෙක්. එතුමාට ක්‍රීඩකත්වයේ දක්ෂකමක් තිබුණා. මම දන්නවා, සමහර රැස්වීම්වලදී ප්‍රධාන ක්‍රීඩකයා එනකම් ඒක ඇදගෙන ගියේ රුපා කරුණාතිලක මන්ත්‍රීතුමාය කියලා. මෙහෙම සම්බන්ධයක් ඇති කරගෙන දේශපාලනයේ නිරත වෙලා හිටපු එතුමා 2000 වර්ෂයේදී දේශපාලනයෙන් ඉවත් වෙන්න තීරණය කළා.

ඒ වන කොට තමයි මෙතුමාට බෙන්තර - ඇල්පිටිය ආසනයේ තරග කරන්නට අවස්ථාව ලබා දීලා තිබෙන්නේ. ඇල්පිටියේ දියුණුව ගැන, ගාලු දිස්ත්‍රික්කයේ දියුණුව ගැන, ගාලු නගරයේ දියුණුව ගැන කථා කරන කොට රුපා කරුණාතිලක මැතිතුමාව අදත් මතක් කරනවා. පුද්ගලයෙක් හැටියට අපි එතුමාව ආශ්‍රය කරලා තිබෙනවා. එතුමා හොඳ ආදර්ශවත් පුද්ගලයෙක්. දේශපාලනඥයෙක් හැටියට වාම් ජීවිතයක් එතුමා ගත කළේ. අද ඇමතිවරුන්ට චෝදනා කරනවා, දූෂණය කළාය, සල්ලි ගත්තාය කියලා. ඔවුන්ට ගරු රුපා කරුණාතිලක මන්ත්‍රීතුමා හොඳ උදාහරණයක්. කාටවත් එතුමාට විරුද්ධව චෝදනා කරන්න බැරි වුණා. එතුමා එතුමාගේ ව්‍යාපාර ටික කරගෙන ගියා. එතුමාට ඒ අයිතිය තිබුණා. කවුරුවත් එතුමාට චෝදනා කළේ නැහැ. මම එතුමා මන්ත්‍රීවරයෙක් හැටියට ආශ්‍රය කළා; ඇමතිවරයෙක් හැටියට ආශ්‍රය කළා. ඒ වාගේම මිත්‍රයෙක් හැටියට ආශ්‍රය කළා. ඒ එක්කම එතුමාගේ සම්බන්ධකම නිසාම මම හිතන්නේ මටත් වාසියක් ලැබුණා. එතුමා එක එක වැඩ කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා 2002 දී නෙදර්ලන්තයේ ශ්‍රී ලංකා තානාපතිවරයා හැටියටත් පත් වුණා. ඒ කාරණය මට මතක් වුණේ මෙකයි. නෙදර්ලන්තයේ ශ්‍රී ලංකා තානාපති හැටියට රුපා කරුණාතිලක මැතිතුමා එදා නෙදර්ලන්තයෙන් ආධාර අරගෙන ගාලු කොටුව දියුණු කරන්න, ගාලු නගරය දියුණු කරන්න ක්‍රියා කළා. ඊට පස්සේ තමයි ඊ ළඟ ආණ්ඩුවෙනුත් ඒක ඉදිරියට ගෙන යන්න ක්‍රියා කළේ.

අද නෙදර්ලන්තයට, ගාලු නගරය පිළිබඳව විශේෂ උනන්දුවක් තියෙන්නේ විශේෂයෙන්ම එතුමා එදා ඇති කර ගත්ත ඒ සම්බන්ධකම් උඩයි. ඉතින් එහෙම පුද්ගලයෙක් ගැන අපි මේ සභාවේ කථා කරන්න ඕනෑ. එහෙම පුද්ගලයෙක් මතක් කරන්න ඕනෑ. එතුමාගේ ජීවිතය අපේ ඉන්න මන්ත්‍රීතුමන්ලාට ආදර්ශයක්. ඒ නිසා එතුමාගේ මරණය ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. කරුණාතිලක මැතිනියටත්, පවුලේ අයටත් මගේ ශෝකය ප්‍රකාශ කරනවා. කරුණාතිලක මැතිනිය නිශ්ශබ්දව එතුමාගේ දේශපාලන ජීවිතයට ශක්තියක් ලබා දුන්නා. ඒකත් සඳහන් කරමින් ගරු රුපා කරුණාතිලක මැතිතුමාට නිවන් සැප ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මම අවසන් කරනවා.

[අ.භා. 3.33]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපා කරුණාතිලක අපේ හිටපු ඇමතිතුමාගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ අභාවය ගැන අද අප සිහිපත් කරන්නේ අතිශයින්ම කනගාටුවෙන්. එතුමා අපේ පක්ෂයට හිටපු ප්‍රධාන පෙළේ බල කණුවක්. ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ කාල පරිච්ඡේදයේ පටන් එතුමාගේ දේශපාලන යුගය ආරම්භ කරලා 1977දී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට පාර්ලිමේන්තුවේ හයෙන් පහක බලයක් ගන්න දකුණු පළාතේ නායකත්වය දුන්නු පුද්ගලයෙක් තමයි රුපා කරුණාතිලක මැතිතුමා. 1977දී පවත්වපු ඒ මැතිවරණයෙන් පස්සේ එතුමාට ඇමතිකම් රාශියක් ලැබුණා. ගාල්ල දිස්ත්‍රික්කයේ දිසා ඇමතිවරයා හැටියට තමයි එතුමා විශාල ප්‍රසිද්ධියක් ලැබුවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාලයේ අප දකුණු පළාත ගැන කථා කරන කොට රුපා කරුණාතිලක මැතිතුමා තමයි අපට මුලින්ම සිහිපත් වන්නේ. ඒ තරම් ජනප්‍රිය මන්ත්‍රීවරයෙක්, ඇමතිවරයෙක් හැටියට තමයි මම එතුමාව හඳුනා ගත්තේ. එතුමාට අපේ පක්ෂයේ හිටපු නායකයෝ සියලු දෙනාගෙන්ම වරප්‍රසාද ලැබුණා. මොකද එතුමා අවංක, නිහතමානී, ඒ වාගේම ක්‍රියාශීලී, දූෂණයට නැඹුරු නොවෙච්ච දේශපාලනඥයෙක්. එතුමා හොබවපු ඇමතිකම් තුළින් එතුමාට කෝටි ගණන් හම්බ කරන්න තිබුණා. අද වන දේවල් දිහා බැලුවාම එදා වරාය හා නාවික කටයුතු ඇමතිවරයා හැටියට මා හිතන්නේ ඒ කාලයේ එතුමාටත් විශාල මුදල් සම්භාරයක් හම්බ කර ගන්න පුළුවන්කම තිබුණා. නමුත් එතුමා ඒ කිසි දෙයක් කෙරුවේ නැහැ. එතුමා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම අවංක දේශපාලනඥයෙක් හැටියට ජනතා සේවයේ නිරත වුණා. ඒ වාගේම එතුමා ආදර්ශවත් දේශපාලනඥයෙක්. එතුමාගේ ඥාතියා -ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා- අද මූලාසනයේ ඉන්නවා. ගරු රුපා කරුණාතිලක මැතිතුමා ගිය අඩි පාරේ තමයි එතුමාත් ගමන්

[ගරු ජෝන් අමරතුංග මහතා]

කරන්නේ. අප රූපා කරුණාතිලක මැතිතුමාගේ අභාවය පිළිබඳව හුඟක් කනගාටු වුණා. එක්සත් ජාතික පක්ෂයට විශිෂ්ට සේවාවක් ඉටු කරපු මන්ත්‍රීවරයෙක්, ඇමතිවරයෙක්, දේශපාලනඥයෙක් හිටියා නම් ඒ රූපා කරුණාතිලක මැතිතුමායි කියන එක මම කිසිම බයක් සැකක් නැතිව ප්‍රසිද්ධියේ සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම වැඩිදුර කථා කරන්න යන්නේ නැහැ. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත්, ඒ වාගේම අපේ විපක්ෂ නායකතුමාත් රූපා කරුණාතිලක මැතිතුමාගේ ක්‍රියා කලාපය, එතුමාගෙන් පක්ෂයට වෙච්ච දායකත්වය, එතුමාගෙන් රටට වෙච්ච සේවාව පිළිබඳව දීර්ඝ ලෙස සඳහන් කළා. මමත් ඇත්ත වශයෙන්ම රූපා කරුණාතිලක මැතිතුමාගේ වැඩ පිළිවෙළ, ක්‍රියා කලාපය අතිශයින්ම අගය කරනවා. මොකද, එතුමා ජ්‍යෙෂ්ඨයෙක් හැටියටයි ඒ වෙලාවේ පාර්ලිමේන්තුවේ කටයුතු කළේ. එතුමා ඒ කටයුතු කරපු ආකාරය අප සියලු දෙනාටම ආදර්ශයක් වුණාය කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. විශේෂයෙන්ම එතුමා අපේ පක්ෂයට දීපු නායකත්වය, එක අතකින් දක්ෂිණාංශික ලංකාවේ දියුණුවට කරපු සේවාව, අනික් අතින් ඇමතිවරයෙක් හැටියට රටේ දියුණුවට, සංවර්ධනයට දුන් දායකත්වය අප අතිශයින්ම අගය කරනවා. අප අද කනගාටු වෙනවා එවැනි පුද්ගලයෙක් අප අතරින් තුරන් වෙලා යාම ගැන. ඒ අඩු පාඩුව පියවන්න තමයි ගයන්ත කරුණාතිලක මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් අද දකුණු පළාතින් ඉදිරිපත් වෙලා ඉන්නේ.

රූපා කරුණාතිලක මැතිතුමාගේ වියෝව වෙනුවෙන් අපගේ කනගාටුව එම මැතිනියට, ඒ දූ දරු පිරිසට සහ ඥාතීන්ට මම මේ අවස්ථාවේදී පිරිනමනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගම්පහ දිස්ත්‍රික්කයට එතුමාගේ විශේෂ සම්බන්ධකමක් තිබුණා. එතුමාගේ මැතිනිය ගම්පහ දිස්ත්‍රික්කයේ ශ්‍රේෂ්ඨ පවුලකින් පැවත ආ මැතිනියක් නිසා ඒ තුළින් අපේ සම්බන්ධකමත් වැඩිදියුණු වුණා. හැම අවස්ථාවකදීම කඩවත, නැත්නම් මහර ආසනයේ උත්සවයක් තිබුණාම රූපා කරුණාතිලක මැතිතුමා ඇවිල්ලා එයට සහභාගි වුණා. ඒ නිසා අපේ හිතවත්කම් වැඩිදියුණු වුණා. එතුමාගේ වියෝව වෙනුවෙන් අපේ කනගාටුව ඒ සියලු දෙනාටම මේ අවස්ථාවේදී පිළිගන්වමින්, එතුමාට නිවන් සැප ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 3.37]

**ගරු මනූෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රූපා කරුණාතිලක කියන ඒ අපරිමිත ගුණ සමුදායකින් හෙබි මානව හිතවාදී දේශපාලනඥයා ගැන බොහෝ කරුණු කියන්නට තරම් මම දේශපාලනික වශයෙන් පරිණත මදි. නමුත් පාසල් අවධියේ ශිෂ්‍යයන් විධියට අප ගරු කරපු දේශපාලනඥයකු හැටියට, දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයකු හැටියට, අද දිස්ත්‍රික්කයේ දේශපාලනය කරද්දී අපට මහා ආදර්ශයක් ගන්නට පුළුවන් තරමේ මහා සේවාවක් කරපු, අනෙක් පැත්තෙන් මානව හිතවාදී දේශපාලනඥයකු හැටියට, බිම් මට්ටමේ ජනතාවගේ දුක හඳුනා ගත්තු ජනතා හිතවාදී දේශපාලනඥයකු හැටියට හැඳින්විය හැකි එතුමාගේ අභාවය සම්බන්ධයෙන් ශෝකය ප්‍රකාශ කිරීම, ඒ වාගේම එතුමා සම්බන්ධයෙන් ගුණ කථනයක් ඉදිරිපත් කිරීම ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට මගේ යුතුකමක් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලාංකීය දේශපාලනයේ පූර්වාදර්ශී අද්විතීය දේශපාලන නායකයකු ලෙස, හිටපු අමාත්‍ය ගරු රූපසේන කරුණාතිලකයන් නම් කළ හැකියි. එසේම එතුමා දේශපාලනඥයකුට වඩා එහා ගිය අසීමිත ගුණ සමුදායකින් හෙබි අව්‍යාජ මනුෂ්‍යයකු වූ බව මා මේ සභාවේදී සඳහන් කරන්න කැමැතියි. අප ගරු රූපා කරුණාතිලක මැතිතුමා පිළිබඳව පසු ගිය කාලයේදී එහෙන් මෙහෙන් තොරතුරු අසා දැන ගනිද්දී, අප දේශපාලනයට ආපු කාලයේ දේශපාලනය පිළිබඳව තොරතුරු විමසද්දී එතුමාගේ රියැදුරු මහත්මයා මට හමු වුණා. එතුමා මට සඳහන් කළා, රූපා කරුණාතිලක කියන ඒ අව්‍යාජ පුද්ගලයා එදා ප්‍රබල ඇමතිවරයකුව සිටියදී වූ සිද්ධියක්. ඒ කාලයේ බලපිටියේ රිය අනතුරක් සිද්ධ වෙලා තිබෙනවා. සුදු ජාතික ඇඳුම ඇඳ ගෙන හිටපු ගරු රූපා කරුණාතිලක ඇමතිතුමා ඒ රිය අනතුරින් තුවාලයට පත් වෙච්ච පුද්ගලයකු තමන්ගේ දෑතින් අර ගෙන බලපිටිය රෝහලට ගිහින් තිබෙනවා. රජයේ ප්‍රධාන කැබිනට් ඇමතිවරයකු රෝගියකු දෑතට අර ගෙන රෝහලට එන කොට රෝහලේ හෙදියන්, සේවක සේවිකාවන් ඇමතිවරයාගේ ඇඳුම දැකලා එතුමාට මොකද වුණේ කියලා අසා තිබෙනවා. "මගේ ගැන බලන්න එපා, ඉස්සර වෙලා මේ රෝගියාගේ රෝගී තත්ත්වය ගැන බලන්න" කියලා එතුමා එතැනදී තමන්ගේ මානව හිතවාදී ලක්ෂණය පෙන්නුම් කර තිබෙනවා. එවැනි එක අවස්ථාවක් නොවෙයි තිබෙන්නේ. අප එතුමා පිළිබඳව දැන කියා ගත් හැටියට, එතුමා, කෙනකුට සැරෙන් කථා කළත්, "මම එයාට බැණපු එක වැරැදියි" කියා නැවත කල්පනා කරන තරමේ මානව හිතවාදී දේශපාලනඥයෙක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ පියා ගමේ සාමාන්‍ය දේශපාලන කටයුතු කරද්දී එවකට දිසා ඇමතිවරයාව හිටපු ගරු රූපා කරුණාතිලක මැතිතුමා අපේ පවුල් සමඟ ඉතාම ළඟ සම්බන්ධතාවක් පැවැත්වුවා. ඒ වාගේම එතුමා ඥාතිවරයකු හැටියට අප සමඟ ළඟ සම්බන්ධතාවක් පවත්වා ගෙන ගියා. 1988 -1989 භීම සමයේ, දේශපාලනය කළ වරදට ජනතා විමුක්ති පෙරමුණේ සන්නද්ධ කණ්ඩායම් මගේ පියාණන් ඝාතනය කෙරුණු අවස්ථාවේදී අපේ දුක සැප සොයා බලා, අපට ඉදිරි මාර්ගය කියා දීලා, පාක්ෂිකයන් රැක ගැනීම වෙනුවෙන් රූපා කරුණාතිලක මැතිතුමා එදා ඉදිරිපත් වුණා; මැදිහත් වුණා. ඒ කාලය තුළ ඒ ජනතාව ආරක්ෂා කරන්න මුළු දිස්ත්‍රික්කය පුරා කැප වෙලා වැඩ කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගෙන් ඇල්පිටියට කෙරුණු සංවර්ධනය පිළිබඳව, දිස්ත්‍රික්කයට කෙරුණු සංවර්ධනය පිළිබඳව, රටට කෙරුණු සංවර්ධනය පිළිබඳව අද මේ සභාවේදී කථා කළා. මා එතුමා පිළිබඳව ඒ හැම දේකටම වඩා ගරු කරන කාරණාවක් තිබෙනවා. අදත් ඇල්පිටියට ගියාම, හිනිදුමට ගියාම, දිස්ත්‍රික්කයේ වෙනත් ඕනෑම තැනකට ගියාම "රූපා මහත්තයා" කියලා බොහොම ආදරයෙන් හැමෝම එතුමා ගැන කථා කරනවා. "රූපා මහත්තයා" කියන නම ඒ ඕනෑම පුද්ගලයකුගේ කටට හුරු පුරුදුයි. "රූපා මහත්තයා" කියලා බොහොම ආදරයෙන් කථා කරන්න තරම් බැඳීමක්, දැවැන්ත ආදරයක් ජනතාව අතර ඇති වෙලා තිබෙනවා. අද අප ඒ ප්‍රදේශවලට යන කොට තේරෙනවා එතුමාට දක්වපු ඒ ආදරය ගාල්ල දිස්ත්‍රික්කයේ වෙනත් දේශපාලනඥයකුට දිනා ගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ කියන එක. ජනතාව එතුමාට ඒ තරම් ළෙන්ගතුකමක්, ආදරයක් දැක්වූයේ එතුමා ජනතාවට ඒ ආකාරයෙන්ම ආදරය කරපු නිසායි. රෝගාතුරව හිටපු පසු ගිය කාලයේ එතුමාට කොළඹට වෙලා විවේක සුවයෙන් ඉන්න හැකියාව තියෙද්දීත් එතුමා ඇල්පිටියේ ගෙදරට ගිහිල්ලා තමන්ගේ පරණ හිතවතුන් මිතුරන් සහසම්බන්ධ කර ගෙන, දේශපාලනයේදී තමාට උදවු කරපු ගම්වල හිතවතුන් හම්බ වෙලා කථා කර කර තමන්ගේ කාලය ගත කළා අපට මතකයි. එහෙම අවස්ථාවලදී අප එතැනට ගියාම අපට පරණ කථා අහන්න හම්බ වුණා. නිර්ව්‍යාජ දේශපාලනඥයකු හැටියට, මානව හිතවාදී දේශපාලනඥයකු හැටියට, ඒ වාගේම ඉතාම හොඳ මනුෂ්‍යයකු හැටියට අපි එදා එතුමාව දැක්කා.

එතුමා අමල්, සංගීතා, සංජීව යන තමන්ගේ දරුවන්ට යහ මඟ පෙන්නලා හොඳ දරුවන් හැටියට ඉස්සරහට අරගෙන ගියා. එතුමා තමන් ගැන, තමන්ගේ දරුවන් ගැන, තමන්ගේ පවුල් ගැන හිතන්නේ නැතිව තමන්ගේ රට ගැන හිතලා, තමන්ගේ ප්‍රදේශය ගැන හිතලා කටයුතු කළා. මා අසා තිබෙනවා, සංජීව කරුණාතිලක මහත්මයා උපදින අවස්ථාව වන කොට ගෙදර ඉන්නට තරම්වත් රූපා කරුණාතිලක හිටපු ඇමතිතුමාට ඉඩ කඩ ලැබුණේ නැති බව.

අතුරු මැතිවරණයක කටයුතුවලට සහසම්බන්ධ වන්න -දේශපාලන කටයුතුවලට- ගිහින් තමන්ගේ දෙවන දරුවා බලන්න හම්බ වුණේ දවස් හතකට පසුව කියා මට අහන්න ලැබී තිබෙනවා. ඒ තරම් ජනතාව වෙනුවෙන් කැප වුණු නායකයෙක් හැටියට, මානව හිතවාදී නායකයෙක් හැටියට මා එතුමා ගැන සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. මම දේශපාලනයට අත්පොත් තියද්දි රූපා කරුණාතිලක කියන ජ්‍යෙෂ්ඨ අසහාය නායකයා හමු වෙන්න ගියාම එතුමා මට ලබා දුන් උපදෙස්, මට ලබා දුන් සහයෝගය, ශක්තිය, ඒ වාගේම ගාල්ල මහින්ද විද්‍යාලයෙන් අධ්‍යාපනය හැදෑරූ එතුමා ගාල්ල මහින්ද විද්‍යාලය ගැන කථා කරපු කැක්කුම මොන තරම්ද කියනවා නම්, එතුමා එදා මට කිව්වා, "ඥාතිකම කොහොම වුණත්, පක්ෂය කොහොම වුණත් උඹ මහින්ද විද්‍යාලයෙන් බිහි වූවෙක් නිසා මම උඹට ඡන්දයක් දෙන්න ඕනෑ" කියා. මම පොඩි කොල්ලෙක් හැටියට 2004 අවුරුද්දේ එතුමා හමු වුණාම එතුමා මට එහෙමයි කිව්වේ. එතුමා ඒ විධියට පුදුම ළෙන්ගතුකමක්, තමන්ගේකමක් තිබුණු කෙනෙක් හැටියට මා මේ වෙලාවේ විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. ගාල්ලේ දේශපාලන කටයුතුවලදී එතුමා බොහොම නොසැලී කටයුතු කළා. නොයෙක් නොයෙක් අවස්ථාවලදී දේශපාලන වශයෙන් තිබුණු බලපෑම්, තාඩන පීඩනවලදී බොහොම නොසැලී ශක්තිමත්ව තමන්ගේ ජනතාවත් එක්ක ඉඳගෙන තමන්ගේ සේවාව ඉෂ්ට කරපු නායකයෙක් හැටියට එතුමා අපිට උදාහරණයට ගන්න පුළුවන්.

පසු ගිය කාලයේ ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාලාට අපට දේශපාලනික වශයෙන් යම් යම් ගැටලුවලට මුහුණ දෙන්න සිදු වුණාම එතුමා අපිට දුරකථනයෙන් කථා කරලා මොකද වන්නේ කිය අපේ දුක සැප අහලා එතුමා අපිට දීපු ආදර්ශය, හයිය සහ ශක්තිය මට මේ වෙලාවේ මතක් වනවා. එතුමා ජනතාවට ආදරය කරපු නිසාම තමයි පසු ගිය අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ එතුමා අවසන් ගමන් ගියපු මොහොතේදී අති විශාල ජන ගංගාවක් වැල නොකැඩී ඇල්පිටියට ගැලුවේ. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ගරු ජනාධිපතිතුමන් ඇතුළුව සියලුම මැතිඇමතිවරුන් එතුමාගේ අභාවයට සහසම්බන්ධ වුණා. මා කථාවක් අහලා තිබෙනවා, 1970 අතුරු මැතිවරණය වෙලාවේ රූපා කරුණාතිලක මැතිතුමා බෙලිඅත්ත, මුල්කිරිගල ප්‍රදේශයේ මැතිවරණ ව්‍යාපාරයේ යෙදිලා ඉන්නකොට යම්කිසි කණ්ඩායමක් එතුමා සමඟ ගැටුමක් ඇති කර ගන්න හදපු අවස්ථාවකදී අද ජනාධිපතිතුමා -මහින්ද රාජපක්ෂ මැතිතුමා- එවකට ඒ ප්‍රදේශයේ මන්ත්‍රීවරයා හැටියට එතැනට ගිහින්, "රූපා කරුණාතිලක කියන්නේ එසේ මෙසේ මනුෂ්‍යයෙක් නොවෙයි. ගරු කළ යුතු මනුෂ්‍යයෙක්. එතුමාට කරදර කරන්න එපා" කියා එතුමාත් සමඟ ඒ ස්ථානයෙන් නික්ම ගිහින් එතුමාට සහයෝගය ලබා දීලා තිබුණා කියලා. අතිගරු ජනාධිපතිතුමන් සහ රූපා කරුණාතිලක මැතිතුමන් අතර පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඒ වාගේ බොහොම හොඳ යාළු මිත්‍රකමක් පාර්ලිමේන්තුව ඇතුළේදීත්, පිටතදීත් තිබුණා. ගාල්ල දිස්ත්‍රික්කයේ සංවර්ධනයට අත්තිවාරම් දමා එතැනින් එහා සංවර්ධනයක් කරන්න අපිට ඉඩ තියලා ගාල්ල දිස්ත්‍රික්කය ගොඩ නඟන්න, ගාල්ල නගරය ගොඩ නඟන්න අපිට සහාය ශක්තිය දීපු දේශපාලනික වශයෙන් ගුරුවරයෙක් ඒ වාගේම අපිට පූර්වාදර්ශ ගත හැකි නායකයෙක් වශයෙන් එතුමා අපට හඳුන්වන්න පුළුවන්. අප අතරින් සමු ගත් රූපසේන කරුණාතිලක මැතිතුමන්ට නිවන් සැප ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් හේතුමති මැතිනියට ඒ වාගේම අමල්, සංගීතා, සංජීව ඇතුළු දරු පරම්පරාවට ඒ වාගේම සමස්ත ගාල්ල දිස්ත්‍රික් ජනතාවට රූපා කරුණාතිලක මැතිතුමන්ගේ අභාවය පිළිබඳ අපගේ ශෝකය මේ අවස්ථාවේදී සඳහන් කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.47]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ තියා ගෙන ඔබතුමාගේ කීර්තිමත් බාප්පා ගැන කථා කිරීමට අවස්ථාව ලැබීම මා විශේෂත්වයක් වශයෙන් දකිනවා. දිවංගත රූපා කරුණාතිලක අමාත්‍යතුමාගේ විශිෂ්ට චරිතාපදානය සම්බන්ධයෙන් මට ඉහත කථා කරපු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාත් විපක්ෂ නායකතුමාත් විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් මනුෂ නානායක්කාර පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාත් එතුමාගේ චරිතයේ තිබුණු ගුණාංග ගැන විස්තර කරපු නිසා කාලය සම්බන්ධයෙන් සීමාවක් ඇති හෙයින් මම ඒ කරුණු නැවත එකින් එක කියන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් මා සඳහන් කරන්න කැමැතියි, රූපා කරුණාතිලක මැතිතුමා වැනි දේශපාලනඥයන් බිහි වන්නේ බොහොම කලාතුරකින් බව. ඒ වාගේම එවැනි දේශපාලනඥයන් නැති වූ විට විශාල හිදැසක් -පුරවන්න බැරි හිදැසක්- ඒ දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසය දිහා බලන කොට පෙනෙනවා, එතුමා දේශපාලනයට ඇතුළත් වී ඇත්තේ අහම්බෙන් බව. එතුමාගේ තරුණ වියේදී, 1957 වසරේදී තමන්ගේ ගමට පාසලක් අවශ්‍ය වෙලා, තමන්ගේ අර්ථ පතීත්වයෙන් ඒ ගමට පාසලක් හදලා දීලා, පසුව ඒ පාසල එතුමා රජයට පවරා දුන්නා. ඒ කාලයේ සිටම එතුමා තුළ සමාජ සේවයට තිබුණු කැප වීම, ඇල්ම, මහ ජනතාව කෙරෙහි තිබුණු ආදරය, සෙනෙහස හොඳින් පෙන්නුම් කළා. ඒ නිසා තමයි 1962 දී දිවංගත ඩඩ්ලි සේනානායක අග්‍රාමාත්‍යතුමා විසින් එතුමාව එක්සත් ජාතික පක්ෂයේ බෙන්තර-ඇල්පිටිය සංවිධායකවරයා වශයෙන් පත් කළේ.

එතුමා හොඳ දෙමාපියන්ට දාව උපන් පුත්‍රයෙක්. තල්ගස්වල විසූ මුහන්දිරම් එල්.ජී.ඒ. කරුණාතිලක යුවළගේ බාල පුතණුවන් වුණු රූපා කරුණාතිලක මැතිතුමා ගාල්ල මහින්ද විද්‍යාලයෙනුත්, ඒ වාගේම කොළඹ නාලන්දා විද්‍යාලයෙනුත් දීප්තිමත් ශිෂ්‍යයකු වශයෙන් අධ්‍යාපනය ලැබුවා. ඒ වාගේම එතුමා තම පවුලේ දේපළ පරිපාලනය කරමින්, ප්‍රදේශයටත් විශාල සේවාවක් කළා. එතුමා ගනේමුල්ලේ හිටපු කීර්තිමත් ජයකොඩි පවුලේ හේතුමතී ජයකොඩි මෙනවිය සමඟ විවාහ වුණා. මට මතකයි, ඒ හේතුමතී ජයකොඩි මහත්මියගේ මවු සිරිදත්තා ජයකොඩි මැතිනිය විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ කාන්තා ක්ෂේත්‍රයට විශාල නායකත්වයක් දුන්න කීර්තිමත් චරිතයක් බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා ඔබතුමාගේ බාප්පා වනවා වාගේම මහර හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී කමල් ජයකොඩි මැතිතුමාගේ -එවැනිම බොහොම වැදගත් දේශපාලනඥයෙක්- මස්සිනා වුණා. කරුණාතිලක හිටපු අමාත්‍යතුමා හොඳ පවුල් ජීවිතයක් ගත කළා. කේතුමතී ජයකොඩි මැතිනියගේ සෙවණැල්ල තුළ එතුමාට දේශපාලන ක්ෂේත්‍රයේ විශාල සේවාවක් කරන්න ලැබුණා වාගේම රටට වැඩ දායක පුතුන් දෙදෙනෙකුත් දියණියකුත් -අමල්, සංගීතා සහ සංජීව- බිහි කළා.

[ගරු කරු ජයසූරිය මහතා]

අපේ රූපා කරුණාතිලක මැතිතුමාගේ දේශපාලන ජීවිතය, එතුමා කරපු සේවාවන්, මීට ඉහත කළ කථාවලින් හොඳින් පැහැදිලි කළා. කොහොමද, බෙන්තර - ඇල්පිටිය දියුණු කළේ; සංවර්ධනය වුණේ කියලා පැහැදිලි වුණා. විශේෂයෙන්ම එතුමා දිස්ත්‍රික් අමාත්‍යවරයා වශයෙන් ඓතිහාසික සේවාවක් එදා ගාලු දිස්ත්‍රික්කයට කළා. මටත් මතකයි, ඒ දවස්වල එතුමා කටයුතු කළ ආකාරය. එතුමා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යවරයෙක් වශයෙන් සේවය කළා; ඒ වාගේම තවත් වරෙක, වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා වශයෙන් සේවය කළා; තවත් අවස්ථාවක වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළා.

එතුමා කොච්චර වාමිද නිරහංකාරද කියලා කියනවා නම් මට මතකයි, එතුමා වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා වශයෙන් ඉන්දැද්දී - 1988 දී පමණ - මම පෞද්ගලික අංශයේ ඉන්දැද්දී අප දෙන්නාට පැපුවා නිව් ගිනියාවලට යන්න වුණා, එදා තිබුණු අන්තර්ජාතික රබර් කටයුතු පිළිබඳ සම්මේලනයකට. පැපුවා නිව්ගිනි වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා එදා රට කෑම වේලක් අපට දුන්නාම, කරුණාතිලක අමාත්‍යවරයා කිව්වා, "අපිත් මෙතුමාට ලංකාවේ කෑම වේලක් දෙමුද?" කියලා. ඊට පහු වෙනි දාට ආරාධනා කළා. මගෙත් සහායෙන් එතුමා තමයි අපි නැවතිලා සිටි ස්ථානයේ ලංකාවේ කෑම වේලක් ඉව්වේ. මට මතකයි, ඒ දුන්නු කෑම වේල. අල බැදුම්, පොල් සම්බෝල, කිරි හොද්දක් සහ චිකන් කරි එකක් හදලා පැපුවා නිව්ගිනි අමාත්‍යතුමාට එදා අපි සංග්‍රහ කළා. මට හොඳට මතකයි, ඒ අවස්ථාව. ඒ වාගේම මෙම අමාත්‍යවරයා බුලත් කන අමාත්‍යවරයෙක්. පැපුවා නිව්ගිනියාවලදීත් හැම දාම බුලත් විටක් කාලා, සුරුට්ටුවක් බීලා තමයි සිටියේ. ඒ ඇති කර ගත් සම්බන්ධතාව හුඟක් කාලයක් යන තෙක් පවත්වා ගත්තා. එතුමා සමඟ විවිධ අවස්ථාවල ලියුම් කියුම් හුවමාරු කර ගත්තා.

මම මේ කරුණු සඳහන් කළේ එතුමා ඒ තරමටම වාම් පුද්ගලයකු බව කියන්නයි. තමන්ගේ රට වෙනුවෙන් තමන්ගේ රටේ කෑම වේලක් පිට රට අමාත්‍යවරයකුට දෙන්න එතුමා එදා ක්‍රියා කළා. ඒ වාගේම එතුමා අමාත්‍ය ධුර දරපු සෑම අවස්ථාවකදීම, විශේෂයෙන්ම වරාය හා නාවික අමාත්‍යවරයා වශයෙන් ධුරය දරද්දී සියලුම නිලධාරින්ගේ සිත් දිනාගෙන, ඒ අයට නායකත්වය දීලා, දර්ශනයක් ඇතිව, පක්ෂයේ ආර්ථික දර්ශනය තුළ කොළඹ වරාය දියුණු කරන්නට කටයුතු කරපු ආකාරයත් මේ අවස්ථාවේ දී සිහිපත් කළ යුතුය. ඒ වාගේම බොහොම දුෂ්කර කාලයක වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරද්දී, තම තීක්ෂණ බුද්ධිය පාවිච්චි කරලා වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයට විශාල සේවාවක් කිරීමට එතුමාට හැකි වුණා. නමුත් මේ සියලු කරුණුවලට වඩා මා එතුමාට ගරු කරන්නේ එතුමා තුළ තිබුණු බොහොම දුර්ලභ ගණයේ ගතිගුණවලටයි. එතුමා ගත කළේ බොහොම නිරහංකාර වාම් ජීවිතයක්.

සාමාන්‍යයෙන් දේශපාලනයේදී දකින කුහකත්වය, දේශපාලනයේදී තිබෙන පළිගැනීම වාගේ දේවල් එතුමා කිසිම විටක තමන්ට විරුද්ධ මත දක්වන අය කෙරෙහි පෙන්වූයේ නැහැ. සෑම කෙනාටම සම සේ සැලකුවා. මා දන්නවා, එතුමාට විරුද්ධව ඡන්දය දුන් අයට පවා එතුමා සලකපු ආකාරය. ලෙඩක්, දුකක්, මරණයක්, මඟුලක් වැනි ඕනෑම අවස්ථාවකදී නම කියලා කථා කරලා, එතුමා හදවතින්ම ඒ අයට උදවු කළා. දේශපාලනයේ මෙවැනි චරිත දකින්නට ලැබෙන්නේ බොහොම කලාතුරකින්. ඒ වාගේම එතුමා ගරු මන්ත්‍රීතුමා, ගරු ඇමතිතුමා කියලා ගෞරවයෙන් කියන්න පුළුවන් විධියේ චරිතයක්. දෑත පිරිසිදුව තබා ගෙනයි එතුමා දේශපාලනයට ඇතුළත් වුණේ. එතුමා දේශපාලනයෙන් පිට වුණේත් දෑත පිරිසිදුව තබා ගෙනයි. අන්න එවැනි විශේෂ කීර්තිමත් චරිතයක් තමයි එතුමාට තිබුණේ.

මට මතකයි එතුමා නෙදර්ලන්තයේ තානාපති වශයෙන් පත් වුණු අවස්ථාව. ලංකාවත්, නෙදර්ලන්තයත් අතර සම්බන්ධතාව දියුණු කරන්න, ඒ වාගේම ලංකාවට විශාල වශයෙන් ආධාර උපකාර ලබා ගන්න එතුමා ඒ කාලයේ ක්‍රියා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා සඳහන් කරන්නේ එතුමාට තිබුණේ දුර්ලභ චරිතයක් කියන එකයි.

එතුමා තම දෙමවුපියන්ට හොඳ පුත්‍ර රත්නයක් වුණා. එතුමා තම බිරිඳට හොඳ ස්වාමි පුරුෂයකු වුණා. එතුමා තම දරුවන්ට හොඳ පියකු වුණා. ඒ වාගේම තම ඥාතීන්ට හොඳ ඥාතියකු වුණා. ඒ වාගේම රටට හොඳ වැඩදායී පුරවැසියකු වුණා.

ලංකාවේ බිහි වූ කීර්තිමත් දේශපාලනඥයකු වශයෙන්, ඒ වාගේම දුර්ලභ ගණයේ දේශපාලනඥයකු වශයෙන් අපි එතුමාට ගරු කරනවා. මා පෞද්ගලිකව එතුමා සමඟ ඉතාම කිට්ටු ඇසුරක් පවත්වාගෙන ගියා. ඒ නිසා මේ අවස්ථාවේදී අපගේ ශෝකය එම මැතිනිය, දරුවන් ඇතුළු පවුලේ සියලු දෙනාටම පුද කරමින්, එතුමාට නිවන් සුව ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් අපගේ ශෝකය මේ අවස්ථාවේ දී පළ කරනවා. විශේෂයෙන්ම එතුමාගේ ඒ කීර්තිමත් නාමය ආරක්ෂා කරගෙන, එතුමාට ගෞරවයක් ලබා දෙන විධියට ඔබතුමා කටයුතු කරන ආකාරය එතුමා කොතැනක සිටියත් බලාගෙන, බොහොම සන්තෝෂ වනවා ඇතැයි මා මේ අවස්ථාවේ දී සඳහන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.56]

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**

(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)

(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අපි බොහොම ගෞරවයෙන් කථා කරන්නේ රූපා කරුණාතිලක මැතිතුමා පිළිබඳවයි. අපි එතුමාව දැන හඳුනා ගත්තේ 1977 වර්ෂයට පෙර. එතුමා ක්‍රියාශීලී දේශපාලනයට ඇවිල්ලා, බෙන්තර ඇල්පිටිය ආසනයේ එක්සත් ජාතික පක්ෂ අපේක්ෂකයා හැටියට, සංවිධායකවරයා හැටියට කටයුතු කළ කාලයේ තමයි අපි එතුමාව හඳුනා ගත්තේ. අවසාන කාලය දක්වාම එතුමාත් එක්ක අපේ ඒ මිත්‍රත්වය, හිතවත්කම පැවතුණා. එතුමා මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු හැටියට පමණක් නොවෙයි, අමාත්‍යවරයකු වශයෙනුත් විවිධ අමාත්‍යාංශ ගණනාවක තනතුරු දැරුවා. ඒ වාගේම එතුමා ගාලු දිස්ත්‍රික්කයේ ප්‍රධාන ඇමතිතුමා හැටියට කටයුතු කළා. මේ හැම කාලයකම අපි බොහොම කිට්ටුවන්ත කල්‍යාණ මිත්‍රයන් හැටියට කටයුතු කළා.

1989දී මා සංචාරක රාජ්‍ය ඇමතිවරයා හැටියට පත් වුණු අවස්ථාව මට මතකයි. සංචාරක කර්මාන්තය පිළිබඳව එතුමාට ඉතා පුළුල් දැනුමක් තිබුණා. ඒ වාගේම එතුමා ඒ ක්ෂේත්‍රයට සම්බන්ධ වෙලා සිටියා. ඉතාම හිතවත් මිත්‍රයකු විධියට එතුමා අපට ඒ කටයුතුවලදී අතහිත දුන්නා පමණක් නොවෙයි, අපට ඉතාම හොඳ උපදෙස් පවා ලබා දුන්නා.

වැවිලි කර්මාන්ත ඇමතිවරයා හැටියටත් එතුමා කටයුතු කළා. ඒ හැම අවස්ථාවකදීම එතුමා ඉතාම දක්ෂ දේශපාලනඥයකු හැටියට රටටත්, තමන්ගේ පළාතටත් ප්‍රයෝජනවත් විධියට කටයුතු කළා. ඒ වාගේම එතුමා හොඳ කල්‍යාණ මිත්‍රයකු හැටියට කටයුතු කළා; සුහදශීලී මිත්‍රයකු හැටියට කටයුතු කළා. අපි දේශපාලනය කළා වාගේම මිත්‍රයන් හැටියටත් ඉතා හොඳින්

ආශ්‍රය කළා. අපි ඒ කාලයේ එතුමාගේ මැතිවරණ කොට්ඨාසයට ගිහිල්ලා, එතුමාගේ නිවසේ නැවතිලා මැතිවරණ කටයුතු කළා. පළාත් සභා මැතිවරණවලදී සති ගණන් එතුමාගේ නිවසේ නැවතිලා ඒ කටයුතු කළා. ඒ වාගේම එතුමාත් අපේ කටයුතුවලට අත හිත දුන්නා.

මට අද වාගේ මතකයි, එතුමාගේ නෝනා මහත්මියගේ සහෝදරයා, කමලවර්ණ ජයකොඩි මැතිතුමාත්, මාත් එකම දවසේ පාර්ලිමේන්තුවට ආව හැටි. එතුමාත් අපිත් එක්ක බොහොම කිට්ටුවෙන් සිටියා. රූපා කරුණාතිලක මැතිතුමා හැම විටම තමන්ව පාර්ලිමේන්තුවට පත් කරපු ජනතාවගේ ගෞරවය ආරක්ෂා කරපු දේශපාලනඥයකු හැටියට කටයුතු කළා. ඒ වාගේම එතුමා මිතුරන් අතර හොඳ මිතුරකු හැටියට කටයුතු කළා. තමන්ගේ පළාතේ උදවිය පිළිබඳව ගැඹුරු දැනුමක් ඇතිව කටයුතු කළා.

රූපා කරුණාතිලක මැතිතුමා කරපු සේවය පිළිබඳව මා දීර්ඝ කථාවක් කරන්න යන්නේ නැහැ. අපේ දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත්, විපක්ෂ නායකතුමාත් ඇතුළු කරීක මන්ත්‍රීවරු එතුමා ගාල්ල දිස්ත්‍රික්කයට කරපු සේවාව පිළිබඳව දීර්ඝ වශයෙන් කථා කළා. නමුත් එතුමාත් එක්ක කිට්ටුවෙන් ඇසුරු කරපු උදවිය හැටියට අපට යුතුකමක් තිබෙනවා, මේ පාර්ලිමේන්තුවේ හිටපු ගුණවත් ඇමතිවරයකු ගැන වචන කිහිපයක් කථා කරන්න. ඒ යුතුකම ඉෂ්ට කරන්න තමයි අද අපි මේ සභාවේ කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තවත් සිද්ධියක් මට මතකයි. යුද්ධය කරන කාලයේදී ආණ්ඩුවට උදවු කරන්න, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට උදවු කරන්න තීන්දුවක් ගන්න අපට සිද්ධ වුණා. දවසක් මා එතුමාව මුණ ගැහිලා ඇහුවා, "අපි ගත්ත තීන්දුව ගැන තමුන්නාන්සේ මොකද කියන්නේ?" කියලා. "ගාමිණී, ගාමිණීලා ගත්තේ රට වෙනුවෙන් ගන්න තිබෙන වැදගත්ම තීන්දුව. මේ කටයුත්ත වෙනුවෙන් මා තමුන්නාන්සේලාට සුබ පතනවා" කියා එතුමා කිව්වා. එතුමාට රට ගැන ඒ තරම් කැක්කුමක්, ඇඟැයීමක් තිබුණා. යුද්ධය අවසන් වුණාම, ඒ ගැන සතුටු වුණු අය අතර ප්‍රධානියකු හැටියට එතුමාත් සිටියා. යුද්ධය අවසන් වෙලා දවස් කීපයකට පස්සේ එතුමා මට කථා කරලා කිව්වා, "ගාමිණී, ඔබතුමන්ලා ගත්ත තීන්දුවේ ප්‍රතිඵලය අද තිබෙනවා" කියලා. එතුමා එහෙම නායකයෙක්. එතුමාට දේශපාලන ප්‍රතිපත්තියක් තිබුණත්, රට ගැන කථා කරන කොට එතුමා අවංකව කල්පනා කළා; තීන්දු ගත්තා. එම නිසා අද අපි ඉතාම ගෞරවයෙන් එතුමාව සිහිපත් කරනවා. එතුමාගේ නෝනා මහත්මියට, දරුවන්ට අපේ ශෝකය ප්‍රකාශ කරන අතරම, අපි කර ගත්ත පින්, කුසල් එතුමාටත් අනුමෝදන් වෙලා එතුමාට නිවන් සුව ලැබේවා!යි ප්‍රාර්ථනා කරනවා. එතුමා පිළිබඳව අපේ කනගාටුව අපේ මිත්‍ර ගයන්ත කරුණාතිලක මැතිතුමාටත් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 4.01]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මා මීට කලින් කිසිම දවසක ශෝක ප්‍රකාශ යෝජනාවක් සම්බන්ධයෙන් කථා කරලා නැහැ. පළමුවන වතාවට තමයි අද ඒ වාගේ කථාවක් කරන්නේ. ඒ කථාව කරන්නේ, අපෙන් වෙන් වුණු රූපා කරුණාතිලක හිටපු ගරු ඇමතිතුමා වෙනුවෙන් ඒ පවුලේ අයට ශෝකය ප්‍රකාශ කරන්නයි.

ගරු රූපා කරුණාතිලක හිටපු ඇමතිතුමා මා දන්නේ අමල්ගේ තාත්තා හැටියටයි. අමල් සහ මම 1970 දී Royal College Primary Section එකේ Grade I A එකට ඇතුළත් වුණු දවසේ ඉඳලා අද වන තුරු මිත්‍රයන් හැටියට ආශ්‍රය කරනවා. අපේ නායකතුමා කිව්වා වාගේ ඒ කාලයේ අමල්ගේ ගෙදර තිබුණේ JOC එක ළඟ. අමල්ගේ තාත්තාට "uncle" කියලා තමයි අපි කථා කරන්නේ. අමල්ගේ සහෝදරිය සහ මල්ලි ගැන විස්තර මා දන්නේ නැහැ. නමුත් ඒ අය හමු වෙලා තිබෙනවා. දේශපාලන කරපු අයගේ ළමයි එදා අපේ පන්තියේ සිටියා. අමල්ගේ තාත්තා රූපා කරුණාතිලක මැතිතුමා වුණාට, එතකොට එතුමා මන්ත්‍රී කෙනෙක් නොවෙයි. අපේ පන්තියේ සිටි ගයා සමන් කාරියවසම්ගේ තාත්තා තමයි ඇල්බට් කාරියවසම් මැතිතුමා. මා හිතන හැටියට ඒ කාලයේ එතුමා මන්ත්‍රී කෙනෙක්.

ඊ ළඟට මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා. එතුමාගේ තාත්තාත් නාවලපිටියේ මන්ත්‍රී කෙනෙක් වශයෙන් සිටියා. අපි පොඩි කාලයේ ඉස්කෝලේ යනකොට දේශපාලනය කරන අයවලුන්ගේ පුතාලා හැටියට, එතුමන්ලා කරපු දේශපාලන කතා අහලා අපි ඒ කට්ටියව දැන හඳුනාගෙන සිටියා. කොහොමටත් මම පොඩි දවස්වල ඉඳලාම දේශපාලනයට කැමැති කෙනෙක්. ඒ නිසා මා ඉස්සර පාර්ලිමේන්තුවට ගිහින් ගැලරියේ වාඩි වෙලා, මන්ත්‍රීවරුන් කරන කථා අහගෙන ඉන්නවා. මා එහිදී තේරුම් ගත්තා, මෙතුමා දේශපාලන කටයුතු කරගෙන ගියේ මොන විධියටද කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අපට වඩා අවුරුද්දක් වැඩිමහල්. අපි දැනගෙන සිටියා ඔබතුමා අමල්ගේ ඥාති සහෝදරයාය කියන එක. කෙසේ වෙතත් මම කියපු මිත්‍රයන් තුන් දෙනාගෙන් අමල් -කථානායක ගැලරියේ අසුන් ගෙන සිටිනවා මට පේනවා.- සහ ගයා සමන් කාරියවසම් කියන දෙදෙනාම දේශපාලනයට ආවේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා රූපා කරුණාතිලක මැතිතුමාගේ මල්ලිගේ පුතා හැටියට දේශපාලනයට පැමිණුනා. මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාත් දේශපාලනයට පිවිසුණා. අපේ පන්තියේ අපිත් එක්ක හිටපු තවත් මිත්‍රයෙක් තමයි අශෝක මිලින්ද මොරගොඩ මැතිතුමා. එතුමාත් දේශපාලනය කළා. අන්තිමට කොහෙන් හරි කැරකිලා මමත් දේශපාලනයට ආවා. අපේ පාසලේ පළමු වසර පන්තියේ හිටපු ළමයින් අතරින් අවසානයේදී මේ මම කියපු අයවලුන් තමයි දේශපාලනයට ආවේ. මම වැඩි වේලාවක් කතා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අභාවප්‍රාප්ත හිටපු ඇමති රූපා කරුණාතිලක මැතිතුමා අවසාන වරට මට හමු වුණේ සිරිකොතේදීයි. ඒ මෑතකදීයි. එහිදී එක්සත් ජාතික පක්ෂයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්ට සම්මාන වගයක් ලබා දුන්නා. එතකොට ඒ සම්මානය ලබා ගන්න ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාගේ අත අල්ලාගෙන එතුමාත් ආවා. සමරු තිළිණයක් හැටියට එතුමා අපේ නායකතුමාගෙන් ලොකු අලියෙක් ලබා ගත්තා. එහෙම නේද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ඒ සමරු තිළිණය - අලියා- ලබා ගෙන, එතුමා මාව දැකලා, "හර්ෂ මෙහාට එන්න." කියලා මට කතා කළා. එතුමා මට කිව්වා, "හර්ෂ, මම ඔයා කරන වැඩ ගැන බලා ගෙන ඉන්නවා. හොඳයි. දිගටම කටයුතු කරගෙන යන්න." කියලා. මම එතුමාට කිව්වා, "ඔබතුමන්ලා වාගේ කට්ටියගෙන් තමයි එක්සත් ජාතික පක්ෂයේ දේශපාලනය මොකක්ද කියන එක අපි ඉගෙන ගත්තේ. අපි ඒවාට ගරු කරනවා." කියලා. ඊට ටික දවසකට පසුව එතුමා මෙලොවින් සමු ගත්තා. මම එතුමාගේ දේශපාලනයට ගරු කරනවා. අපි වාගේ තරුණ දේශපාලනඥයන්ට එවැනි දේශපාලනඥයන්ගෙන් ඉගෙන ගන්න බොහෝ දේවල් තිබෙනවා. මම මේ අවස්ථාවේදී අමල්ටත්, අමල්ගේ නංගිටත්, මල්ලිටත්, අමල්ගේ අම්මාටත් එතුමාගේ අභාවය පිළිබඳව මගේ ශෝකය ප්‍රකාශ කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, අපේ ශෝක ප්‍රකාශය ඒ පවුලේ සාමාජිකයන් වෙත දන්වා යවන්නය කියා. අවසාන වශයෙන් එතුමාට නිවන් සුව

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)

කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙන නිසා මෙතැන් පටන් සියලුම කථිකයන්ට ලබා දෙන වේලාව විනාඩි පහකට සීමා කරන්න වෙලා තිබෙනවා. මී ළඟට ගරු පියසේන ගමගේ ඇමතිතුමා.

[අ.භා. 4.07]

**ගරු පියසේන ගමගේ මහතා (ජාතික සම්පත් පිළිබඳ අමාත්‍යතුමා)**
**(மாண்புமிகு பியசேன கமகே - தேசிய வளங்கள் அமைச்சர்)**
(The Hon. Piyasena Gamage- Minister of National Resources)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ සිටින අවස්ථාවේදී, 1977 සිට 2002 දක්වා එක දිගටම මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු, ඒ වාගේම බෙන්තර - ඇල්පිටිය ආසනය, ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරපු ශ්‍රේෂ්ඨ ජන නායකයකුගේ අභාවය පිළිබඳව ගෙනෙන ලද ශෝක ප්‍රකාශ යෝජනාවේදී මට කථා කරන්නට ලැබීම අහඹු සිදුවීමක් වශයෙනුයි මා දකින්නේ.

අපි මේ කථා කරන අභාවප්‍රාප්ත ගරු රූපා කරුණාතිලක අපේ හිටපු ඇමතිතුමා උපත ලැබුවේ ගාල්ල දිස්ත්‍රික්කයේ මගේ ආසනයේ -හිනිදුම ආසනයේ- නියාගමයි. නියාගම උපත ලැබූ එතුමා නියාගම කනිෂ්ඨ විද්‍යාලයෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලැබුවා. ඉන් පසුව ඇල්පිටිය ආනන්ද විද්‍යාලයෙනුත්, ගාල්ල මහින්ද විද්‍යාලයෙනුත්, කොළඹ නාලන්දා විද්‍යාලයෙනුත් අධ්‍යාපනය ලැබුවා. එතුමා ව්‍යාපාර ක්ෂේත්‍රයට පිවිසිලා විශේෂයෙන්ම එතුමාගේ පියාණන් ගෙන ගිය ව්‍යාපාර කටයුතුවල නිරත වෙලා හොඳ ව්‍යාපාරිකයෙකු බවට පත් වුණා. ඒ කාලය තුළ, 1966 වසරේ පැවැති මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂ රැස්වීමක කථා කරලා, ඒ කථාව, ඒ දක්ෂකම, ඒ වාගේම එතුමාට හොඳ කථිකත්වයක් ඇති බව තේරුම් ගත්ත එවකට හිටපු එක්සත් ජාතික පක්ෂයේ නායකයන්, විශේෂයෙන්ම ඩඩ්ලි සේනානායක මැතිතුමා එතුමාට බෙන්තර - ඇල්පිටිය ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකකම ලබා දී තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා එක්සත් ජාතික පක්ෂය යටතේ 1970දී මැතිවරණයට ඉදිරිපත් වුණා. 1970 මැතිවරණයේදී එතුමාට ජයග්‍රහණය කරන්න බැරි වුණත් බෙන්තර - ඇල්පිටිය ආසනයෙන් සැලකිය යුතු ඡන්ද ප්‍රමාණයක් ලබා ගනිමින් ලබමින් ජනතාව අතර ලොකු කුඩා කාගේත් සිත් දිනාගෙන සිටියා. එතුමා 1977 වසරේ පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී දකුණු පළාතෙන් වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගනිමින් -වැඩි ඡන්ද 11,000 ගණනක් ලබා ගනිමින්- බෙන්තර - ඇල්පිටිය ආසනය ජයග්‍රහණය කළා. එදා ඉඳලා 2002 දක්වා දිගටම බෙන්තර - ඇල්පිටිය ආසනය නියෝජනය කරමින් ගාල්ල දිස්ත්‍රික්කයේ අපේ කෘත හස්ත දේශපාලනඥයෙක් වශයෙන් ජනතාව අතරේ නිරන්තරයෙන්ම කථා බහට ලක් වෙච්ච හොඳ දේශපාලනඥයෙකු වශයෙන් එතුමා ප්‍රසිද්ධියට පත් වුණා.

1978 දී එතුමා පළමුවෙන්ම අපේ දිස්ත්‍රික්කය භාර -ගාල්ල දිස්ත්‍රික්කය භාර- දිසා ඇමති ලෙස පත්ව දිගු කලක් -වර්ෂ කිහිපයක්- කටයුතු කළා. ඒ කාලය තුළ තමයි එතුමාට දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතුවලට වැඩි දායකත්වයක් ලබා දෙන්න පුළුවන්කමක් ලැබුණේ. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා පළාත් පාලන ඇමතිවරයා වශයෙන් සිටියදී එතුමා පළාත් පාලන නියෝජ්‍ය ඇමති තනතුර දැරුවා. ඒ කාලය ඉතාම වැදගත් කාල පරිච්ඡේදයක් බවට පත් වුණා. මොකද, පළාත් සභා පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන්න, ඒ වාගේම පළාත් සභා පනත් කෙටුම්පත සම්පාදනය කරන්න සිදු වුණේ එතුමාගේ කාලයේයි. එතුමා ඒ කාර්යයට විශාල දායකත්වයක් ලබා දුන්නා. පළාත් සභා පනත සම්මත කිරීමත් එක්ක පළාත් සභා රාජ්‍ය අමාත්‍ය ධුරය දැරුවෙත් එතුමායි. ඒ වාගේම තවත් ප්‍රධාන ඇමතිකම් කිහිපයක් එතුමා දැරුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා 1990 වරාය හා නාවික අමාත්‍යවරයා වශයෙන් පත් වුණා. ඒ අමාත්‍යාංශ සහ තනතුරු සියල්ලම අලුත් ඒවා. ඒ නිසා අලුත් අමාත්‍යාංශ හැම එකකම අලුත් දෙයක් කරන්න එතුමාට ඒ කාලය තුළ හැකියාව ලැබුණා. 1991 අපේ රටේ වැදගත්ම අමාත්‍යාංශයක් වන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වශයෙන් එතුමා පත් වුණා. ඒ කාලය අපේ රටේ වැවිලි ක්ෂේත්‍රයට විශේෂයෙන් වැදගත් වනවා. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වතු පාඩුවට යනවාය කියන තත්ත්වය තුළ වතු කළමනාකරණය කිරීම සඳහා සමාගම්වලට දුන්නා. ඒ කාලය තුළ කිසිම ප්‍රශ්නයක් ගැටලුවක් ඇති නොවන ආකාරයට ඒ කටයුතු කිරීමට එතුමාට හැකියාව ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අප මේ අවස්ථාවේ විශේෂ සඳහනක් කරන්නට ඕනෑ. ගාලු දිස්ත්‍රික්කය තුළ දැවැන්ත ව්‍යාපෘති රාශියක් එතුමා ක්‍රියාත්මක කළා. එතුමා ගැන කථා කළ ගරු මන්ත්‍රීතුමන්ලා හැම කෙනෙක්ම සඳහන් කරන්නට යෙදුණා, විශේෂයෙන් බෙන්තර ඇල්පිටිය ආසනයේ බොහොම ඉහළම වැඩ කොටසක් ඒ කාලයේ හැටියට කළාය කියා. අපේ ජනතාවගේ මතය ඒකයි. මහා මාර්ග, පාසල්, බැංකු ඒ වාගේම එම ප්‍රදේශයේ විදුලි යෝජනා, ක්‍රීඩා පිටි, බස් නැවතුම්පළවල්, ප්‍රවාහන පහසුකම්, සෞඛ්‍ය පහසුකම් මේ හැම ක්ෂේත්‍රයකම විශාල දියුණුවක් ඇති කරන්නට එතුමා ඒ කාලය තුළ විශේෂ උනන්දුවක් දැක්වූවා. එතුමාට ලැබුණු විමධ්‍යගත මුදල්වලින් එතුමා නියෝජනය කළ ආසනයේ පාසල්වල දියුණුවට තමයි වැඩිපුර මුදල් ප්‍රමාණයක් වියදම් කර තිබෙන්නේ. ඇල්පිටිය ආනන්ද විද්‍යාලයේ දියුණුවට එතුමා කටයුතු කළා. රූපා කරුණාතිලක රඟහල, ඒ වාගේම රූපා කරුණාතිලක ක්‍රීඩාංගණය එතුමා වෙනුවෙන්ම නම් කරන ලද ඒවා. ඒ පළාතේ පමණක් නොවෙයි, ඇතුමලේත් තිබෙනවා. එතුමාගේ පවුලේ භූමිය පරිත්‍යාග කර අපේ හිනිදුම ආසනයේ, මාපලගම ක්‍රීඩාපිටියක් සකස් කර දී තිබෙනවා. ඒ වාගේ කටයුතු බෙහොමයක් එතුමා සිදු කරන්නට යෙදුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ, අපේ බෞද්ධ මධ්‍යස්ථාන, පාසල්, පන්සල් වාගේම දහම් පාසල් සංවර්ධනය කරන්නටද එතුමා අලුත් වැඩ පිළිවෙළක් හඳුන්වා දුන්න බව. දහම් පාසල් අරමුදලක් පිහිටුවා දහම් පාසල් දියුණු කරන්නට අත හිත දෙන වැඩ පිළිවෙළක් සකස් කළා. ඒ වාගේම ගාලු උරුමය රැක ගැනීම සඳහා නෙදර්ලන්තය සමඟ සම්බන්ධ වෙලා ගාලු කොටුව සංවර්ධනය සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්නට පුරෝගාමියකු බවට පත් වුණා.

අප විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ දෙයක් තිබෙනවා. රූපා කරුණාතිලක මැතිතුමා ඥාතීත්වයට වඩා හිතවත්කමට තමයි සැලකීම දැක්වූයේ. එතුමාට හොඳ යහළුවෝ හිටියා. අපේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් එතුමා ගැන කථා කළා. කවුරුත් කථා කළේ ඒ ගැන. මෙහි යහළුවෝ වාගේම විදේශ යහළුවෝත් එතුමාට හිටියා. මේ හැම කෙනෙකුගෙන්ම ප්‍රයෝජනයක් ලැබුණා.

විශේෂයෙන් රටේ ඉන්න අයට වඩා විදේශ මිත්‍රයන්ගෙන් තම ප්‍රදේශයට මොනවා හෝ ප්‍රයෝජනයක් ගන්නට පුළුවන් වෙනවා නම් ඒ ප්‍රයෝජනය ලබා ගෙන ලස්සනට ඒ කාර්යයන් ඉටු කළා. එවැනි අවස්ථා බොහොමයක් තිබෙනවා. ඒ අතරතුරේ වතුරුවිල තිබෙන බෙල්ජියානු ගමත් එතුමාට ලැබුණු එවැනි පරිත්‍යාගයක්. ඉතාලියේ පියතුමෙකුගෙන් ලැබිච්ච ආධාරයක් උපයෝගී කර ගෙන ඇල්පිටියේ ගොළුවාමුල්ලේ, මෛත්‍රීගම සකස් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ, එතුමා වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා වශයෙන් සිටි කාලයේ මා නියෝජනය කරන මිනිදූම ආසනයේ එතුමාගේ මහ ගෙදර, අපේ ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාගේ නිවස ආසන්නයේ නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අසළ අක්කර 10ක භූමියක් වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා වශයෙන් වැවිලි සමාගමෙන් අර ගෙන රුහුණු විශ්වවිද්‍යාලයට අනුබද්ධ විශ්වවිද්‍යාලයක් ආරම්භ කළා කියලා. මේකට සම්පූර්ණ ප්‍රතිපාදන ලබා ගත්තේ එතුමාගේ ජපානයේ මිත්‍රයෙකුගෙන්. එහෙම ප්‍රතිපාදන අර ගෙන අනුබද්ධ විශ්වවිද්‍යාලයක් සකස් කළා. සකස් කර එය පවත්වාගෙන ගියා. නමුත් දිගට අර ගෙන ගියේ නැහැ. කලක් වැහිලා තිබුණා. වෘත්තීය පුහුණු අමාත්‍යවරයා වශයෙන් මා පත් වුණාට පස්සේ එම භූමිය හා තිබුණු අනුබද්ධ විශ්වවිද්‍යාලයේ ඒ ගොඩනැඟිලි සියල්ල උපයෝගී කර ගෙන මුළු ලංකාවේම තිබෙන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන අතරේ ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් කොරියන් ආධාර යටතේ අප ඉදි කර තිබෙනවා. නිරන්තරයෙන් එහි උත්සව පවත්වන හැම අවස්ථාවකම අපි රූපා කරුණාතිලක මැතිතුමාගේ නම සිහිපත් කරනවා. මොකද හේතුව, රූපා කරුණාතිලක මැතිතුමා එම භූමිය අරගෙන අනුබද්ධ විශ්වවිද්‍යාලය එතැන හදා තිබුණේ නැත්නම් අලුතෙන් අපට එහෙම එකක් කරන්නට හම්බ වන්නේ නැහැ. එහෙම නම් නියාගමට පමණක් නොවෙයි, මුළු දිස්ත්‍රික්කයටම, සමස්ත රටට ආදර්ශයක් විධියට අද තිබෙන හොඳම ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වශයෙන් නියාගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය දැන් දියුණු වෙමින් පවතිනවා. විශාල සේවාවක් ප්‍රදේශයේ තරුණ තරුණියන්ට සිදුවන මධ්‍යස්ථානයක්. මේකේ පුරෝගාමියා වුයේ රූපා කරුණාතිලක මැතිතුමායි. නැත්නම් මේක සකස් කිරීමට අපට අවස්ථාව සැලසුණේ එතුමා නිසායි. එම නිසා අප නිරන්තරයෙන් ඒ පිළිබඳව සිහිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම එතුමා අපේ දිස්ත්‍රික්කයට හිටපු දේශපාලනඥයන් අතර මහත්මා ගතිගුණවලින් හෙබි හොඳ නිහතමානී, ඒ වාගේම හොඳ නිවුණු පුද්ගලයෙක් කලබලකාරී කෙනෙක් නොවෙයි; දඩබ්බර කෙනෙක් නොවෙයි; දේශපාලන වශයෙන් ප්‍රතිවාදීන් පිළිබඳව හොයලා පස්සෙන් එලවන පුද්ගලයෙක් නොවෙයි. එවැනි ගතිගුණ නැති බොහොම අවංක දේශපාලනඥයෙක් වශයෙන් තමයි එතුමා ගැන ජනතාව කථා කරන්නේ; ඒ වාගේම අප දකින්නේ. විශේෂයෙන් 1988-1989 කාලයේ තිබුණු භීෂණ යුගය දිහා බලනකොට දේශපාලනඥයෙකුට පාරේ බැහැලා යන්නට බැරිව තිබුණු කාලයක්. අපේ සමහර අය අපව අමාරුවේ දාන්න හැදුව ඒ කාලයේ රූපා කරුණාතිලක මැතිතුමා අප ගැන සොයා බලා , අපට තිබෙන විවිධ ප්‍රශ්න පිළිබඳව සොයා බලා ඒවාට අපට රැකවරණ ලබා දීමටත් කටයුතු කළාය කියන එක මම මේ වෙලාවේදී බොහොම ගෞරවයෙන් සිහිපත් කරනවා.

එතුමා අපේ ප්‍රදේශයට, බෙන්තර-ඇල්පිටිය ආසනයට පමණක් නොවෙයි, මිනිදූම ආසනයට පමණක් නොවෙයි, අපේ දිස්ත්‍රික්ක දෙකටම සම්බන්ධයි. අපේ ගමේ මිනිදූම ආසනයේ ඉපදිලා, බෙන්තර-ඇල්පිටිය ආසනයේ සංවිධායකවරයා වශයෙන්, මන්ත්‍රීවරයා වශයෙන්, ඇමතිවරයා වශයෙන්, ඒ වාගේම දිස්ත්‍රික්කයේ දිසා ඇමතිවරයා වශයෙන්, දිස්ත්‍රික්කයේ නායකයෙකු වශයෙන් ඒ කාල පරිච්ඡේදය හා සසඳන විට අති මහත් කාර්යයක්, උපරිම මෙහෙවරක් අපේ දිස්ත්‍රික්කයේ සංවර්ධනයට, දිස්ත්‍රික්කයේ ජනතාවගේ සුබ සිද්ධිය සඳහා කළා කියලා අපි මේ වෙලාවේ බොහොම සතුටින් සඳහන් කරනවා.

සදහටම අපෙන් සමු ගත්ත රූපා කරුණාතිලක මැතිතුමා වෙනුවෙන් අපි ඒ අවමංගල කටයුතුවලට නිරන්තරයෙන් සම්බන්ධ වෙලා කටයුතු කළා. අපේ මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ වසර 25ක පමණ කාලයක් මහජන මන්ත්‍රීවරයෙක් වශයෙන්, ඇමතිවරයෙක් වශයෙන් මුළු රටට අපරිමිත මෙහෙවරක් සිදු කළ අභාවප්‍රාප්ත රූපා කරුණාතිලක මැතිතුමාට නිවන් සුව ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා. පවුලේ අයට අපේ සාතිශය ශෝකය ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.19]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමන්ගේ ජ්‍යෙෂ්ඨ ඥාතියා ගැන උපහාරය පුදන විට ඥාති පුත්‍ර රත්නය හැටියට ඔබතුමා මුලසුන සිටින මේ අවස්ථාව ඉතා දුර්ලභ අවස්ථාවක්. මම හිතන හැටියට මේ පළමුවෙනි අවස්ථාව වෙන්න ඇති ඉතිහාසයේ එවැනි අවස්ථාවක් ඉස්මතු වුණ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම රූපා කරුණාතිලක මැතිතුමාව හඳුනන්නේ, -මම දන්නේ නැහැ ඔබතුමාගේ වයස කීයද කියලා- මම පොඩි සිසුවෙක් කාලයේ සිට. මගේ වැඩිමහල් සහෝදරයා නාලන්දා විද්‍යාලයේ බෝඩිමේ හිටියේ. අපි පොඩි ළමයි විධියට, කොල්ලෝ විධියට නාලන්දා විද්‍යාලයේ බෝඩිමට ගිය වෙලාවේ මගේ වැඩිමහල් සහෝදර ලින්කන් පෙරේරා එක්ක ගජ මිත්‍රයෙක් හිටියා. ඒ ජග මිත්‍රයා තමයි මේ රූපා කරුණාතිලක මහතා.

මගේ වැඩිමහල් සහෝදරයා අපි වාගේම නීතියට ටිකක් තද, ඒ කාලයේ නාලන්දයේ captain. රූපා කරුණාතිලක මහතා සහෝදරයෙක් විධියට පුදුම කරුණාවන්තකමක් තිබුණ කෙනෙක්. මට තාම මතක් වෙනවා, මට පේනවා රූපා කරුණාතිලක කියන ඒ බෝඩිමේ චරිතය. එතුමා පාර්ලිමේන්තුවේ සිටි කාලයේත්, ඇමති විධියට සිටි කාලයේත් එදා ඒ බෝඩිමේ සිටිය චරිතයමයි මම දැක්කේ. එකම චරිතයක්. තැන්පත්කම ඇති,බොහොම කරුණාවන්තව වචන කථා කරන, සංවරකම ඇති උතුම් මහත්මයෙක්. එතුමා නාලන්දා විද්‍යාලයේ පාසල් ජීවිත කාලයේ සිටම කාටවත්ම තමන්ට ඇඟිල්ලක් දික් කරන්න ඉඩ තැබූ කෙනෙක් නොවෙයි. ඒ කාලයේ පාසල් ජීවිතයේ - බෝඩිමේත්, නාලන්දයේත්- දඩබ්බර පිරිස් හිටියා. ඒ අය අතරත් මෙතුමා බොහොම තැන්පත්. කවදාවත් පටලැවෙන්න ගියේ නැහැ. කවදාවත් රණ්ඩු දබරයකට ගියේ නැහැ. හිටියේ කොතැනද, මැද. මැද ඉඳලා සමථයකට පත් කරන්න ක්‍රියා කරනවා. මම කුඩා කාලයේ ඉඳලා ඒ චරිතයට ගරු කළා. දෛවෝපගත සිදුවීමක් වාගේ රූපා කරුණාතිලක මැතිතුමා පාර්ලිමේන්තු දේශපාලන ජීවිතයට එද්දී, මමත් පාර්ලිමේන්තු දේශපාලන ජීවිතයට ආවා. එහිදී මමත්, එතුමාත් මිත්‍රයින් විධියට කටයුතු කරන විට සමහර වෙලාවට එතුමා මට ගමේ භාෂාවෙන් "මචං" කියනවා. මමත් ඒ වචනයමයි පාවිච්චි කළේ. එතුමා ඒ තරම් නිහතමානීකමක්, ඒ තරම් ප්‍රතිපත්ති ගරුක බවක් තිබුණ කෙනෙක්. තමාට තනතුරු ලැබුණා කියලා කවදාවත් ඒකෙන් තමන් බැබළෙන්න ගියේ නැහැ, තමන්ට ලැබුණ තනතුර බැබළෙව්වා මිසක. රූපා කරුණාතිලක කියන මගේ මිත්‍රයා තනතුර බබළවමින් නිහතමානී මහත්මා ගාන්ධි කෙනෙක් විධියට ගමන් කළ චරිතයක්. එතුමා තනතුරු දැරූ කාලය බැලුවත් ඒවාගේයි. එතුමාගේ ආදරණීය බිරිඳ අපි දන්න ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රභූ පවුලක කෙනෙක්.

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

මගේ පුත්‍රයා වන අසංකත් රූපා කරුණාතිලක මැතිතුමාගේ පුත්‍රයනුත් රෝයල් කොලේජ් එකේ ඉගෙන ගනිද්දී එදා ඒ ගොඩ නඟා ගත් මිත්‍රත්වය අපේ ගෙවල්වලට යන එන මට්ටම දක්වා ඉතා දැඩි සම්බන්ධතාවක් බවට පත් වුණා. එතුමා පළාත් සභා ඇමති වෙලා ඉන්න අවස්ථාවේ මා වයඹ ප්‍රධාන ඇමති වෙලා සිටියා. ඒ වෙලාවේ එතුමා මට හරියට උදවු කළා. ඒ කාලයේ අපේ ආණ්ඩුව තිබුණාට මම පළාත් සභාවට ගියා කියලා, තමන්ට තිබුණු බලයක් කඩලා ප්‍රාන්ත මට්ටමකට දෙනවා කියලා අපේ ආණ්ඩුවේ ඇමතිවරුන්ගෙනුත් කෙනෙහිලිකම් සිදු වුණා. ඒ වෙලාවේ රූපා කරුණාතිලක මැතිතුමා මට කිව්වා, "මචං ජයේ, ඉවසලා වැඩ කරන්න. ඕවා ඔහොම තමයි. බල තණ්හාව තුළ තමයි ඕවා වෙන්නේ" කියලා. තවම මගේ මනසේ එය රැව් පිළිරැව් දෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා වැනි නිහතමානි පුද්ගලයන් අපේ මේ පාර්ලිමේන්තුවට නුදුරු අනාගතයේදී පත් කර ගත යුතුය කියලා මම හිතනවා. පාර්ලිමේන්තුවට පත් කරලා එවපු මේ මහජන නියෝජිතයන් දෙස බලපුවාම මට පෙනෙන දෙයක් තිබෙනවා. ඊ ළඟ මැතිවරණය එද්දී මේ රටේ ඡන්දදායක දායිකාවනුත්, තරුණ පෙළත් කියයි, "අපේ රටට ඕනෑ මහත්මා ගති ගුණ තිබෙන, මහත්මා ප්‍රතිපත්ති තිබෙන රූපා වැනි දේශපාලකයනුයි" කියලා.

අපිත් එක්සත් ජාතික පක්ෂය විධියට ඒ ප්‍රතිපත්තිය වෙනුවෙන් දැඩි ස්ථාවරයක ඉන්න ඕනෑ. මේ උත්තරීතර සභාවට අපව පත් කරලා තිබෙන්නේ ඒ ප්‍රතිපත්තිය සඳහායි. මහත්මාකම ප්‍රතිපත්තිගරුකව ක්‍රියාවෙන් ඔප්පු කරපු රූපා වැනි උත්තමයන් අපට ලොකු ආදර්ශයක් කියලා මම කියනවා.

රූපා කරුණාතිලක මැතිතුමා තානාපති වෙලා නෙදර්ලන්තයට ගියා. මම වාරි මාර්ග හා ජල කළමනාකරණ ඇමති විධියට වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරින් එක්ක එකතු වෙලා වාර්තාවක් හදලා එතුමා ලංකාවට ආපු වෙලාවේ දුන්නා. ඒ වාර්තාව මොකක්ද? ලන්දේසින් මේ රට පාලනය කළ සමයේ එතුමා නියෝජනය කළ දකුණු පළාතේ මාතර සිට පුත්තලම දක්වා ඉදි කළ, එදා අලි ඇතුන් පවා ගෙන ගිය ලන්දේසි ඇළ ගොඩ වෙලා තිබුණා. ඒ ඇළ ගැනයි මම වාර්තාවක් හදලා දුන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මාවත් එක්ක ගෙන ගියා, බෙන්තර - ඇල්පිටිය ආසනයට. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සැලසුමක් තිබුණා, සංචාරක අංශය දියුණු කරන්න. මේ ඇළ ගැඹුරු කිරීම තුළින් අද ගං වතුර ගැලීම් ඇති වෙලා තිබෙනවා. කොළඹ දිස්ත්‍රික්කයේ පමණක් අක්කර 40,000ක් වගා කරන්න බැරිව තිබෙනවා. මේ ඇළ ගැන වාර්තාව හදලා එතුමාට දුන්නාම එතුමා නෙදර්ලන්තයේ තානාපති ලෙස නෙදර්ලන්ත රජයත් එක්ක කථා කරලා ඒක අනුමත වෙලා ඔන්න මෙන්න තියෙද්දී තමයි අපේ රජය විසුරුවා හැරියේ. ඒ උදාර සේවය එතුමාට කර ගන්න බැරි වුණා. ඒක එතැනින් එහෙමම හමස් පෙට්ටියට දැමුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රූපා කරුණාතිලක මැතිතුමා සෑම දෙයක්ම කළේ තමා ගැන හිතලා නොවෙයි. මීට කලින් ගරු මන්ත්‍රීතුමෙකු කිව්වා වාගේ තමාගේ එක දරුවකු ඉපදිලා සතියකට පස්සෙයි එතුමාට දරුවා දකින්නට ලැබුණේ. මා පළමුවැනි වතාවටයි එවැනි දෙයක් ඇසුවේ. බොහොම දුර්ලභ සිද්ධියක්. හදවතින් බොක්කෙන් ජනතාව වෙනුවෙන් වැඩ කරන අන්න එවැනි අය තමයි මහජන සේවකයෝ කියන්නේ. ජනතාවගේ ඡන්දයෙන් පත් වුණු නායකයන් වන අප ජනතාව කර උඩ තියා ගෙන යනවා මිසක් ජනතාවගේ කර උඩින් යන දේශපාලනයක් නොවෙයි කරන්න ඕනෑ. අනාගතයේදී මේ රටේ ඡන්ද දායක දායිකාවන් එවැනි උදාර පිරිසක් මන්ත්‍රීවරු කරලා මේ උත්තරීතර සභාවේ ගෞරවය රකිනු ඇතැයි කියා මා විශ්වාස කරනවා.

මා මේ අවස්ථාවේ එතුමා දරපු තනතුරු ගැන කියන්න ඕනෑ නැහැ. හුඟක් අයගේ කථාවලින් එය කියැවුණා. තනතුරෙන් එතුමා බැබළෙන්න හැදුවේ නැහැ, එතුමා තනතුර බබළවපු කෙනෙක්. ඒ විධියේ උදාර, උත්තම කෙනෙක් එතුමා. මට බැරි වුණා, මගේ මිත්‍රයාගේ ආදාහනයට එන්න. මොකද, විෂබීජයක් ශරීර ගත වීම නිසා මම රෝගාතුරව ආරෝග්‍යශාලාවේ හිටියේ. මම ඒ වෙලාවේ ලොකු වේදනාවකිනුයි හිටියේ. එතුමා මගේ මිත්‍රයා. ගයන්ත මැතිතුමාට මම කිව්වා, "කවුරු කිව්වත්, නොකිව්වත් ආදාහන උත්සවය දවසට අවසන් ගෞරවය දක්වන්න මම යන්න ඕනෑ" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ උපහාර උළෙලකට ඔබතුමා මට ආරාධනා කළා. මම ඒ උපහාර උළෙලට ආවා. තනතුරක් නැතුව සිටියත් රූපා කියන චරිතයට ගරු කරන්න, උපහාර කරන්න ආපු සෙනඟ මම දැක්කා. අන්න ඒක තමයි මිනිහෙක් මනින්න ඕනෑ, කිරන්න ඕනෑ විධිය. ඒ උපහාර උළෙලට ජනතාව ආවේ ඇයි? ඒ වෙලාවේ එතුමාට තනතුරක් තිබිලා නොවෙයි, එතුමා තනතුරු බබළවපු නිසා, ඒ තනතුරු තුළින් ජනතා හිතකාමී සේවකයකු විධියට වැඩ කරපු නිසා තමයි ජනතාව ආවේ. මගේ මිත්‍රයාගේ ආදාහන කටයුත්ත සඳහා මට යන්න නොහැකි වුණාට මම මගේ හදවතින් එතුමාට පින් දුන්නා. එතුමාගේ දරුවන්ට මම කථා කළා. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන නිසා මේ අවස්ථාවේ මගේ මිත්‍ර රූපා කරුණාතිලක කියන මහා උත්තමයාට අමා මහා නිවන් සුව අත් වේවායි කියා ප්‍රාර්ථනා කරමින්, එම මැතිනියටත්, දරුවන් තිදෙනාටත්, ඥාතීන් සෑම දෙනාටමත් අපේ ශෝකය පුද කරනවා.

ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමනි, රූපා කරුණාතිලක නාමය සදාකල් අමරණීය වන අයුරින් ඒ ගමන ඔබතුමා ඒ විධියටම යන්න ඕනෑ. ඒ අඩි පාරේ යමින් ඔබතුමා පාර්ලිමේන්තුවේ සේවය කරන්න ඕනෑ. ඊට එහා මහක් නැහැ. අපේ ඡන්ද දායකයෝ රට වෙනුවෙන් බලාපොරොත්තු වන්නේ ඒකයි.

ගරු ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමාට ඉස්සෙල්ලා මට කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුති කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 4.30]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

මූලාසනාරූඪ අපේ හිතවත් ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, රූපා කරුණාතිලක අපේ හිතවතාගේ වියෝව පිළිබඳව අද පාර්ලිමේන්තුවේදී ශෝකය පළ කරන අවස්ථාවේදී එතුමා වෙනුවෙන්, එතුමාගේ පවුල වෙනුවෙන්, එතුමාගේ නෑදෑ හිතවතුන් වෙනුවෙන් මටත් වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මම රූපා එක්ක හුඟක් ආශ්‍රය කරලා තිබෙනවා. මට එතුමා පළමුවෙන්ම හමු වුණේ 1976 අතුරු මැතිවරණය දවස්වල, එතුමාගේ නෑදැයිනුත් සමඟ ජාඇලට ඇවිල්ලා කමලවර්ණ මැතිතුමාත් සමඟ -ඔබතුමාගේ නෑදැයිනුත් සමඟ- ඒ මැතිවරණය දිනන්නට වැඩ කරපු අවස්ථාවේයි. එතුමා ඒ දවස්වල බොහොම තරුණයි. අපිත් ඒ විධියටම තමයි හිටියේ. එතුමා අපේ වේදිකාවේ කිහිප අවස්ථාවකම කථා කරලා තිබෙනවා. එදා එතුමා කථා කරද්දී එතුමාගේ කථාවේ ස්වරූපයත්, කටහඬත් මගේ මතකයට එන කොට අද ඔබතුමා කථා කරද්දී ඔබේ කථා ස්වරූපයත්, කට හඬත් එක විධියටම තිබෙනවා කියලායි මට හිතෙන්නේ. එතැනින් අපට පෙන්නුම් කරනවා, එතුමාගේ පරම්පරාවේ තවත් පුරුකක්

ගාල්ල දිස්ත්‍රික්කයෙන් ජාතික දේශපාලනයට සම්බන්ධ වෙලා, රූපා කරුණාතිලක ගරු ඇමතිතුමා වාගේ යහපත් දේශපාලනයක නිරත වෙලා ඉන්නවාය කියන එක. ඒක සතුටක්.

රූපා කරුණාතිලක මැතිතුමා විවාහ වුණේ අපේ ප්‍රදේශයේ -ගනේමුල්ලේ- හිටපු කමලවර්ණ ජයකොඩි මන්ත්‍රීතුමාගේ සොහොයුරියත් සමඟයි. ඒ දෙන්නා දේශපාලන වශයෙන් කොයි තරම් සුහද තත්ත්වයකින් සිටියාද කියලා මට අදත් මතක් වෙනවා. ඒ වාගේම රූපා කරුණාතිලක මැතිතුමාත් ඇල්පිටිය ප්‍රදේශයේ ඉතාමත්ම වැදගත් පවුලකින්, පරම්පරාවකින් පැවත එන කෙනෙක්. බොහොම ඈත ඉතිහාසයේ මම ඒ පළාතේ රැස්වීම්වලට ගියාම ඒ ගෙදරට ගිහිල්ලා කෑම කාලා ආපු විධිය මට මතක් වෙනවා. රූපා කරුණාතිලක මැතිතුමා ඔය කියන ආකාරයේ වතු හිමියෙක්ය, එහෙම නැත්නම් ඉහළ පන්තියේ කෙනෙක්ය කියන එක එතැනදී නම් මම දැක්කේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අනෙක් අතින් බැලුවාම, එතුමා ගනේමුල්ල ප්‍රදේශයේ වලව්වකින් විවාහයක් කරගෙන තිබුණත්, එවැනි කාන්තාවක් එතුමාගේ භාර්යාව හැටියට මම දැක්කේ නැහැ. මම ඒ දෙපළ දැක්කේ සාමාන්‍ය පවුලක මේ අපි වාගේ බොහොම සුහදව කථාබහ කරන, වැඩ කරන අය හැටියටයි; දේශපාලනඥයෝ හැටියට නොවෙයි, මනුෂ්‍යයෝ හැටියටයි.

ඒ පසුබිම තුළ -දැන් කියාපු ඔක්කෝම මම ආපසු කියන්න යන්නේ නැහැ- මේ පාර්ලිමේන්තුව තුළ අලුත් චරිත දෙකක් මම දැක්කා. එක් අයෙක් ගරු රූපා කරුණාතිලක ඇමතිතුමා. අනෙක් කෙනා ගරු කමලවර්ණ ජයකොඩි මන්ත්‍රීතුමා. මා හිතනවා අපේ මේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීතුමන්ලා ඉතිහාසය අධ්‍යයනය කරනවා නම් -ඉගෙන ගන්නවා නම්, සොයා බලනවා නම්- අපි හැම දෙනාටම හොඳයි කියලා. මේ තරම් මහා සේවයක් කරපු දෙදෙනෙකු පිළිබඳ අපි ගුණ කථනය කරන කොට, ඒ අයගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන කොට අද මේ පාර්ලිමේන්තුවේ මීට වඩා පිරිසක් ඉන්න තිබුණා. නමුත් එක අතකින් අපි අද කනගාටු වෙනවා, මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා අපි අවුරුදු ගණනක් වැඩ කරලා අවසානයේ අපිට අපේ මන්ත්‍රීවරුන් සලකන්නේ මෙහෙමද කියලා. ඒ කොහොම වුණත් ඒවා බලාපොරොත්තුවෙන් නොවෙයි මන්ත්‍රීවරුන් හැටියට අපිවත්, ගරු රූපා කරුණාතිලක මැතිතුමාවත්, ගරු කමලවර්ණ ජයකොඩි මැතිතුමාවත් වැඩ කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රූපා කරුණාතිලක මැතිතුමාගේ චරිතය තුළින් අද අපි හැම දෙනාටම ඉගෙන ගන්න තිබෙන හොඳ පාඩමක් තිබෙනවා. එනම්, එතුමා මේ පාර්ලිමේන්තුව තුළ බොහොම හොඳට ඇහුම් කන් දුන්නු කෙනෙක්. කාගේවත් කථාවකට බාධා කළේ නැහැ. විරුද්ධ මත තියෙන්න පුළුවන්; වෙනත් මත තියෙන්න පුළුවන්; ඒ ඔක්කෝටම හොඳට ඇහුම් කන් දුන්නා. ඒක ඉතාමත්ම වැදගත්, පාර්ලිමේන්තු සම්ප්‍රදායක් හැටියටයි මා පිළි ගන්නේ. ඒ වාගේම එතුමා කථා කරන කොටත් කවදාවත් කෙනකුට හිත රිදෙන්න වචනයක් කිව්වේ නැහැ; බැන්නේ නැහැ; පෞද්ගලික ප්‍රශ්නයක් මතු කළේ නැහැ. ජාතික වශයෙන් හෝ වේවා; තමුන්ගේ කාර්ය භාරය ගැන හෝ වේවා; තමුන්ගේ දිස්ත්‍රික්කය ගැන හෝ වේවා, එපමණයි එතුමා කථා කළේ. එවැනි සහෝදර මන්ත්‍රීවරයෙක් අහිමි වීම ඇත්ත වශයෙන්ම මේ පාර්ලිමේන්තුවට ලොකු පාඩුවක්. අද මේ පාර්ලිමේන්තුවේ කථාවල් පටිගත කරන කොට මම හිතනවා එදා ඒ කථා පටිගත කරලා තිබුණා නම් අද ඉන්න ගරු මන්ත්‍රීවරුන්ට හොඳ class එකක් තියන්න තිබුණා කියා. නමුත් දැන් එහෙම නැහැ. කොහොම වුණත් මතකයෙන්වත් අපි නැවතත් අලුත් කර ගත්තොත්, මේ පාර්ලිමේන්තුවේ අපට මවා ගන්නට පුළුවන් චරිතයක් තමයි ගරු රූපා කරුණාතිලක මැතිතුමා කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

දැන් කාල වේලාව ඉක්මවා ගිහිල්ලා තිබෙන නිසා මා වැඩිදුරට කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. පෞද්ගලික හිතවතෙක් හැටියට මගේත්, මගේ දරු පවුලේත් ශෝකය ගරු රූපා කරුණාතිලක මැතිතුමාගේ දයාබර බිරිඳටත්, ඒ දරුවන්ටත් ඒ වාගේම ඒ මැතිනියගේ පවුලේ -කමලවර්ණ ජයකොඩි පවුලේ- සියලු දෙනාටත් මේ අවස්ථාවේදී පුද කරමින් සහෝදර ගරු රූපා කරුණාතිලක හිටපු ඇමතිතුමාට එතුමා අදහන ලද ආගම අනුව නිවන් සම්පත්තිය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. ඔබතුමාට ස්තුතියි.

[අ.භා. 4.38]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම 1999 පාර්ලිමේන්තුවට විපක්ෂ මන්ත්‍රීවරයෙක් හැටියට ආපු වෙලාවේ ගරු රූපා කරුණාතිලක මැතිතුමා ආණ්ඩු පක්ෂයේ ඇමතිවරයෙක් හැටියට කටයුතු කෙරුවා. විශේෂයෙන්ම වැවිලි කර්මාන්ත ඇමතිවරයා හැටියට කන්ද උඩරට පළාත්වල ජීවත් වන වතු කම්කරු ජනතාවගේ ප්‍රශ්න ගැන එතුමාත් එක්ක උපදේශක කාරක සභාවේදී, ඔහුගේ කාර්යාලයේදී මට සාකච්ඡා කරන්න අවස්ථාවක් ලැබුණා. නවක මන්ත්‍රීවරයකු වුවත් -විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට- ඒ කාලය තුළ අපගේ ඉල්ලීම්වලට, අපි කරන ලද යෝජනාවලට එතුමාගේ නොමසුරු අවධානය යොමු වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම 1991 වකවානුව වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ අභියෝගාත්මක යුගයක්. මොකද, අවුරුදු ගණනාවක් තිස්සේ රාජ්‍ය වැවිලි සංස්ථාවටත්, ජනවසමටත් මේ වතු පවරා ගෙන පාලනය කරලා, ඒ වතුවලින් අලාභ ලබන නිසා අවුරුදු විස්සකට විතර පසුව පෞද්ගලික සමාගම්වලට කළමනාකාරිත්වය ලබා දෙන්න ඒ කාලයේ පැවැති රජය තීරණය කළා. ඒ අභියෝගයට රූපා කරුණාතිලක හිටපු අමාත්‍යතුමා ඉතාමත් එඩිතරව මුහුණ දුන්නා. මුල් වතාවේ කළමනාකාරිත්වය දුන්නේ අවුරුදු පහකටයි. ඒ පරීක්ෂණය - experiment එක- සාර්ථක වුණ නිසා 1994 බලයට පත් වුණු රජය අවුරුදු පණහකට මේ වතු පෞද්ගලික සමාගම්වලට පැවරුවා. 2001-2004 කාලයේ මා වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා හැටියට වැඩ කරන අවස්ථාවේ අමාත්‍යාංශ නිලධාරින් සමඟ හිටපු ඇමතිවරුන්ගේ කාල පරිච්ඡේදය තුළ සිදු වූ සේවාව ගැන අධ්‍යයනය කිරීමේ සිරිතක් අපේ අමාත්‍යාංශයේ තිබුණා. ඇත්ත වශයෙන්ම හිටපු වැවිලි කර්මාන්ත ඇමතිවරුන් අතරින් වතු කම්කරුවන් සමඟ, වෘත්තීය සමිති සමඟ, වතු අධිකාරිවරු සමඟ, වතු සමාගම්වල අයිතිකරුවන් සමඟ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ ඉතාමත් සුහදව කටයුතු කරපු ඇමතිවරයකු හැටියට ඒ අමාත්‍යාශයේ හිටපු නිලධාරින් සෑම විටම රූපා කරුණාතිලක හිටපු ඇමතිතුමා ගැන සඳහන් කළා.

විශේෂයෙන්ම කුඩා තේ වතු ක්ෂේත්‍රය ගැන කථා කරන කොට, එතුමා දකුණේ කුඩා තේ වතු ව්‍යාපාරයට නව ජීවයක් ලබා දුන්නා. රූපා කරුණාතිලක මැතිතුමා අමාත්‍ය ධුරය දරපු ඒ වකවානුව තුළ තමයි, දකුණේ කුඩා තේ වතු ප්‍රමාණය සියයට 40කින්, 50කින් වැඩි වුණේ. ඒ වාගේම මට තව කාරණයක් මතක් වනවා. අපේ රටේ ඉතිහාසයේ ප්‍රථම වරට නියං සහනාධාරය වතු හිමියන්ට ලබා දුන්නේ රූපා කරුණාතිලක මැතිතුමා අමාත්‍ය ධුරය දරන කාලයේයි. ඒ වාගේම තේ කර්මාන්තශාලා හිමියන් අපහසුතාවට පත් වුණු අවස්ථාවේදී එතුමා ඔවුන්ගේ ප්‍රශ්න ගැන සානුකම්පිකව සලකා ක්‍රියා කර තිබෙනවා.

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

ඇත්ත වශයෙන්ම රූපා කරුණාතිලක මැතිතුමා මහත්මා දේශපාලනය කරපු පුද්ගලයකු හැටියට මට මතක් වනවා. ඔහු කිසිම දවසක නුසුදුසු වචන මේ ගරු සභාවේ පාවිච්චි කළේ නැහැ. සෑම විටම එතුමාගේ පරම්පරාවේ අභිමානය ආරක්ෂා කරපු අසහාය නායකයකු හැටියට අපට මේ අවස්ථාවේ එතුමා සිහිපත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම එතුමා දේශපාලනයෙන් විශ්‍රාම යන අවස්ථාවේදී දේශපාලනයට අලුත් පුරුකක් හඳුන්වා දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ඔබතුමායි. මම හිතන්නේ ඔබතුමාත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා හැටියට කටයුතු කළේ එතුමාගේ අනුග්‍රහයෙන් කියලායි. ඒක නිවැරදි තේරීමක් බව අද අපට පෙනෙනවා.

මේ අවස්ථාවේ දී රූපා කරුණාතිලක මැතිනියට, ඒ දරුවන් තිදෙනාට මගේ ශෝකය ප්‍රකාශ කරමින්, බෞද්ධයන් හැටියට අපි කවුරුත් ප්‍රාර්ථනා කරන නිවන් සුවය එතුමාට අත්වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 4.43]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මා හිතවත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටටත්, අපේ පක්ෂයටත් අතිමහත් ගෞරවනීය ඒ වාගේම ගුණාත්මක, ධනාත්මක සේවාවක් ඉටු කරපු දිවංගත රූපා කරුණාතිලක මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කරන මේ මොහොතේ, විශේෂයෙන්ම අද යුගයට ඔබින දේශපාලනඥයකු හැටියට එතුමාව හඳුන්වන්නට පුළුවන්. නිහතමානීව, නිරහංකාරව, පොදු ජනතාවගේ අදහස් උදහස් පිළිබඳව තැකීමක් කරලා, පොදු ජනතාවගේ සිත් සතන් අවබෝධ කරගෙන, අතිවිශිෂ්ට වූ සමාජ සංවර්ධන ගමනක් දියත් කරන්නට ඇප කැප වුණු වීරෝදාර දකුණේ ජනතා පුත්‍රයෙක් තමයි එතුමා.

එදා ඩඩ්ලි සේනානායක මැතිතුමා රූපා කරුණාතිලක මැතිතුමාගේ දක්ෂ, පක්ෂ, හපන්කම් අවබෝධ කරගෙන, එතුමාට ආරාධනා කළා, එක්සත් ජාතික පක්ෂයේ දේශපාලනයට ඇවිල්ලා රටටත්, ගමටත්, ප්‍රදේශයටත් විශිෂ්ට වූ ජනතා සේවාවක් ඉටු කරන්න කියලා.

එතුමාගේ දේශපාලන චරිතය තුළ ගැබ් වුණු වැදගත් ගුණාංග රැසක් තිබෙනවා. ඉතාම හික්මීමෙන්, නිරහංකාරව, නිහතමානීව ජනතාවගේ ගැටලුවලට ඇහුම්කන් දීලා, එම ගැටලු පිළිබඳව හොඳ අවබෝධයක් ලබා ගෙන, යහපත් නිගමනවලට එළැඹිලා, නානාප්‍රකාර වූ ප්‍රශ්නවලට ශක්තිමත් විසඳුම් ලබා දෙන්නට එතුමා තුළ ශක්තියක් තිබුණා.

මේ රටට අතිවිශිෂ්ට වූ ජනතා සේවාවක් ඉටු කරපු රාජ්‍ය නායකයන්, දේශපාලන නායකයන් සමඟ අත් වැල් බැඳගෙන එතුමන්ලාගේ නායකත්වයෙන් දියත් වුණු විවිධ සංවර්ධන වැඩසටහන්වල ප්‍රතිලාභ තමන්ගේ දිස්ත්‍රික්කයට, තමන්ගේ මැතිවරණ කොට්ඨාසයට ගෙනැවිල්ලා, තම දිස්ත්‍රික්කයේ, ආසනයේ දුකට පත්වී සිටින ජනතාව සැපතට පත් කරන්නට, සුවපත් කරන්නට හැකි ඒ උතුම් හැකියාව, දක්ෂතාව එතුමා තුළ තිබුණා.

මට හොඳාකාරවම මතකයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට එතුමා, එවකට දියත් වුණු නිවාස ලක්ෂය, දසලක්ෂය, පහළොස්ලක්ෂය යන සංකල්ප තුළින් වැඩිම ප්‍රතිලාභ ප්‍රමාණයක් තමන්ගේ ආසනයට, තමන්ගේ දිස්ත්‍රික්කයට ලබා දුන්නු බව. හිසට වහලක් නොමැතිව ජීවත් වුණු අහිංසක අසරණ ජනයාට තිරසාර නිවහනක් ඉදි කර දෙන්නට එතුමා නායකත්වය, ශක්තිය, මාර්ගෝපදේශකත්වය ලබා දුන්නා. කුප්පි ලාම්පුවෙන් එළිය ලබලා අධ්‍යාපන තලයේ ඉහළම තැනට යන්නට දක්ෂතාව දක්වපු විශ්වවිද්‍යාල සිසු දූ දරුවන්ට ඇතුලත්මුදලි මැතිතුමාගේ "මහපොළ නැණ පහන" වැඩසටහන තුළින් සුවිශාල වූ ශක්තියක් ලබා දීම සඳහා, බෙන්තර - ඇල්පිටිය මැතිවරණ කොට්ඨාසයට මහපොළ වැඩසටහන ගෙනැවිල්ලා, ඒ හරහා එම මැතිවරණ කොට්ඨාසයේ අධ්‍යාපනය ලබන දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සවිමත් කරන්නට එතුමා උත්සුක වුණා.

විශේෂයෙන්ම දුගී දුප්පත්කම තුරන් කිරීමේ ක්‍රියාදාමය කර ගෙන යෑමේදී ඒ පිළිබඳව ලොකු උනන්දුවක් දක්වලා, ඒ කරන්නා වූ වැඩසටහන්වල අඩු පාඩුකම් පෙන්වා දීලා, ඒවාට ධනාත්මක, ගුණාත්මක, හරයාත්මක විවේචන ඉදිරිපත් කරලා, ඒ වැඩසටහන් ශක්තිමත්ව ජනතාවගේ දෙපතුළ ළඟට ගෙන යන්නට එතුමා හැම විටම කටයුතු කළා. එහෙම නම් රූපා කරුණාතිලක චරිතය කියන්නේ අපේ දේශපාලන ක්ෂේත්‍රයට වැදගත් වූ චරිතයක්. එතුමාගේ චරිතය තුළින් අපේ රටේ දේශපාලන ක්‍රියාදාමය ශක්තිමත් කරන්නට ඉගෙන ගත හැකි පාඩම් රැසක් තිබෙනවා.

එදා ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ ආරාධනයෙන් රූපා කරුණාතිලක මැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ දේශපාලන ක්ෂේත්‍රයට ප්‍රවේශ වුණා සේම, මගේ පියාණන් වූ දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ආරාධනයෙන්, ගයන්ත කරුණාතිලක මැතිතුමාත් දේශපාලනයට ඇවිල්ලා රූපා කරුණාතිලක මැතිතුමාගේ ඒ දේශපාලන අඩි පාරේ යමින්, එතුමාගේ ගමන ශක්තිමත් කරමින් මුළු මහත් ගාලු දිස්ත්‍රික්කයටම නායකත්වය ලබා දෙමින් අද කටයුතු කරන බව මම සතුටින් මතක් කරන්න කැමැතියි. එතුමාත් එවැනි පරිණත ගමනක් හරහා අපේ පක්ෂයටත්, රටටත්, මාතෘ භූමියටත් යම් කිසි සුබවාදී ප්‍රතිඵල රැසක් උදා කර දෙන්නට මේ මොහොතේ කටයුතු කරමින් සිටින බව මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රූපා කරුණාතිලක මැතිතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පවුලේ සාමාජිකයන් සියලුම දෙනාට අපේ ශෝකය පළ කරන අතර, එතුමාට නිවන් සුව අත්වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 4.50]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
මූලාසනය හොබවන ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මේ රටේ හිටපු අවංක, පිරිසිදු, නිහතමානී දේශපාලනඥයකු ගැන කථා කරන්න මට අවස්ථාව ලැබිලා තිබෙනවා. රූපා කරුණාතිලක මැතිතුමා මේ රටේ දේශපාලනයේ අවංකත්වය ගැන හොඳ උදාහරණයක් දෙන්න පුළුවන්, ඊට සුදුසු නායකයකු විධියටයි මම අදහන්නේ. එතුමා දේශපාලනයට පිවිසියේ හරිහම්බ කර ගන්න නොවෙයි. යමක් කමක් තිබෙන, ඉඩකඩම් තිබෙන, දේපළ තිබෙන පවුලක සාමාජිකයකු විධියට එතුමා එදා ඩඩ්ලි සේනානායක මැතිතුමාත් එක්ක දේශපාලන දිවියට පිවිසුණා. එතුමා දේශපාලනයට පිවිසි මුල් අවධියේ, එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වෙලා දේශපාලනය කිරීම නිසා තමන්ගේ

ඉඩකඩම් අහිමි වුණා. තමන්ගේ තෙල් පිරවුම්හල් ඇතුළු දේපළ අහිමි වෙද්දී ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් යම් සේවයක් කරන්න ඕනෑ කියලා හිතා ගෙන එතුමා දිගටම දේශපාලනයේ රැඳී හිටියා.

1977දී -මේ රටේ ලොකුම පෙරළිය වෙච්ච වෙලාවේ- ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ රජයේ මන්ත්‍රීවරයකු විධියට එතුමා තේරී පත් වුණා. ඉතිහාසයේ මේ රටේ වැඩියෙන්ම වැඩ කරපු යුග විධියට මා දකින්නේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ යුගයත්, ඒ වාගේම රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ යුගයත්. එදා මේ රට සංවර්ධනය කරද්දී ගාල්ල දිස්ත්‍රික්කයේ දිසා ඇමතිවරයා විධියට හිටියේ එතුමායි. දිසා ඇමති ක්‍රමය යටතේ තමයි ඉතිහාසයේ වැඩියෙන්ම මේ රටට වැඩ කළේ. එතුමා බෙන්තර-ඇල්පිටියට පමණක් නොවෙයි, මුළු ගාල්ල දිස්ත්‍රික්කයේම නායකයා විධියට ඒ කටයුතු මෙහෙය වූවා.

එතුමා මට මුණ ගැහුණේ, මේ පාර්ලිමේන්තුවට අපි නවක මන්ත්‍රීවරු හැටියට ආපු 1989 දී . එතකොට රූපා කරුණාතිලක මැතිතුමා මේ පාර්ලිමේන්තුවේ හිටපු ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක්. එතුමාගේ පාර්ලිමේන්තු සගයා වුණේ මගේ ආදරණීය ඥාතිවරයා වූ ගරු ආර්.එම්. ධර්මදාස බණ්ඩා මැතිතුමායි. රූපා කරුණාතිලක මැතිතුමාත්, ආර්.එම්. ධර්මදාස බණ්ඩා මැතිතුමාත් පාර්ලිමේන්තුවේ හොඳ මිත්‍රයෝ හැටියට හිටියා; එතුමන්ලා දෙන්නා එකටමයි හිටියේ.

මට මතකයි ඒ නිසාම අපේ සම්බන්ධයත් තව වැඩි වුණා. මට මතකයි අප නවක මන්ත්‍රීවරුන් විධියට ඉන්න කොට එතුමා බොහොම නිහතමානීව අපත් එක්ක ආශ්‍රය කළා; අපට ඕනෑ උපදෙස් දුන්නා; අපට ඕනෑ මඟ පෙන්වීම කළා. මා හිතන හැටියට එතුමාට ඒ ගුණය ලැබුණේ ගරු ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ නායකත්වය යටතේ, ගරු ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ, ගරු රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ නායකත්වය යටතේ වැඩ කරපු නායකයකු වූ නිසයි. මට මතකයි එතුමා වැවිලි කර්මාන්ත ඇමති විධියට මගේ දිස්ත්‍රික්කයේ පිහිටි පැල්වත්ත සහ සෙවණගල සීනි කර්මාන්තශාලාවල අර්බුද විසඳන්න, ගොවි ගැටලු විසඳන්න අපට විශාල සහායක් දුන්නා. මට මතකයි එතුමා මගේ ඉල්ලීම පරිදි සෙවණගල සීනි කර්මාන්තශාලාවට රුපියල් මිලියන දෙසිය ගණනක් වෙන් කළා. එදා විධියට එය විශාල මුදලක්. එතුමා වැවිලි කර්මාන්ත ඇමති කාලයේ තමයි මේ රටේ වැඩිම සීනි නිෂ්පාදනයක් සිද්ධ වුණේ. මා එය ගෞරවයෙන් සිහිපත් කරනවා. එතුමා දේශපාලනයට පිවිසිලා මොනරාගල පිහිටි පැල්වත්තට සහ සෙවණගලට එනවා මට මතකයි. එතුමා දවල් වැඩ කරලා කෑම කාලා හවස බොහොම නිස්කලංකව, බොහොම සැහැල්ලුවෙන් ඉන්න ගමන් බොනවා වැනිලා සුරුට්ටුවක්; කියුබන් සිගා එකක්. මා අහනවා එතුමාගෙන්, "සර්, මේක දිගටම බොනවාද?" කියලා. එතකොට එතුමා කියනවා, "නැහැ. රංජිත්, ඒ දවස්වල මේවා මට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාත් ගෙනැත් දුන්නා." කියලා. එතුමා එය බොන්නේ එතුමාගේ ජීවිතයේ තිබෙන සැහැල්ලුකමට. ඉතින් අපත් එක්ක ඔහොම කථා කරලා බොහොම විනෝදයෙන් එතුමා ජීවත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2000 අවුරුද්ද වෙන කොට එතුමා තීන්දු කළා, "මම පැරැදි පැරැදි ඉන්නේ නැහැ. මාව පරද්දන කල් ඉන්නේත් නැහැ. මම දේශපාලන බිමෙන් ඉවත් වෙනවා." කියලා. එතුමා අපරාජිත නායකයකු විධියට තමයි දේශපාලනයෙන් සමු ගත්තේ. මේ රටේ දේශපාලනඥයන් වැඩි දෙනෙකු පරාජය වුණාට පස්සේ තමයි මේ ක්ෂේත්‍රයෙන් අයින් වන්නේ. මැරෙන කල් දේශපාලනය කරන්න ඕනෑ කියන අයත් ඉන්නවා. නමුත් ගරු රූපා කරුණාතිලක මැතිතුමා පරාජය වන්නේ නැතිව, අපරාජිත දේශපාලනඥයකු විධියට මේ දේශපාලන භූමියෙන් සමු ගත්තා. ඒ විතරක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා එක්සත් ජාතික පක්ෂයේ ජ්‍යෙෂ්ඨ නායකයකු විධියට එක්සත් ජාතික පක්ෂයේ දියුණුව සඳහා, එක්සත් ජාතික පක්ෂය ශක්තිමත් කිරීම සඳහා විශාල කාර්ය භාරයක් කළා. එතුමා දේශපාලනයෙන් සමු ගන්න කොට අද මුල් පුටුවේ ඉන්න ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාව එක්සත් ජාතික පක්ෂයටත්, මේ රටටත් එතුමාගේ ඥාතිවරයකු විධියට එතුමා වෙනුවෙන් හඳුන්නලා දීලා දේශපාලන භූමියට ඇතුළු කළා. අද ගරු රූපා කරුණාතිලක මැතිතුමාගේ ඒ දේශපාලන ගමන තවම අවසන් වෙලා නැහැ කියලා මා කියන්නේ ඒකයි. එතුමාගේ අවසන් ගුණ ගායනා කරන කොට, පාර්ලිමේන්තුවේදී අප එතුමා ගැන කථා කරන කොට, එතුමා එවපු ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා අද මූලාසනයේ -මුල් පුටුවේ- ඉන්නවා. ගරු රූපා කරුණාතිලක මන්ත්‍රීතුමා ගැන කථා කරද්දී අප ඒකත් කියන්න ඕනෑ. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, අද තමුන්නාන්සේ මූලසුනේ තියා ගෙන මේවා කියනවා නොවෙයි. ඔබතුමා අපේ පක්ෂයත්, මේ පාර්ලිමේන්තුවත් නියෝජනය කරන දක්ෂ, බොහොම හොඳ කථිකත්වයක් තිබෙන, කවුරුත් ප්‍රිය කරන මන්ත්‍රීවරයෙක්. අපේ බොහොම හොඳ මිත්‍රයකු විධියට තමුන්නාන්සේ කටයුතු කරනවා. මා මෙය ඔබතුමා මූලාසනයේ තියා ගෙන කියනවා නොවෙයි. මේ ගැන කියන්නම ඕනෑ නිසයි කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රූපා කරුණාතිලක මැතිතුමා අවසාන කාලයේ තානාපතිවරයකු විධියටත් සිටියා. අපේ ගරු මන්ත්‍රීවරුන් කිව්වා වාගේ එතුමා අපේ අවසාන පක්ෂ සම්මේලනයට ඇවිල්ලා එක්සත් ජාතික පක්ෂයේ දස දහස් ගණනක්, ලක්ෂ ගණනක් ඉදිරියේ එක්සත් ජාතික පක්ෂයෙන් උපහාර ලැබුවා, ගෞරවය ලැබුවා මට මතකයි. එතුමා මේ රටේ හිටපු අවංක දේශපාලනඥයෙක්; නිහතමානී දේශපාලනඥයෙක්. මේ රටේ දූෂණයෙන් වංචාවෙන් අත් අපිරිසිදු නොකර ගත් දේශපාලනඥයකු විධියට පිරිසිදු දේශපාලනයක් කරලා බෙන්තර-ඇල්පිටිය ආසනයටත්, ගාල්ල දිස්ත්‍රික්කයටත්, මුළු ලංකාවටත් සේවයක් කරලා එතුමා අප අතරින් වෙන් වෙලා ඉන්න වෙලාවේ එතුමාගේ දයාබර මැතිනියටත්, දරුවන්ටත් අපේ ශෝකය පිරිනමනවා. අපේ හිතවත් රූපා කරුණාතිලක මැතිතුමාට නිවන් සුව ලැබේවායි කියා මම ප්‍රාර්ථනා කරනවා.

[4.59 p.m.]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

*Bismillahir Rahmanir Raheem.*

Mr. Presiding Member, it is my privilege to my pay respect to one of the greatest gentlemen that we met in this House. The Hon. Rupa Karunatillake was a man of amiable qualities, a gentleman to the tips and he never carried any malice or hatred towards anyone. He was a friend of all and enemy of none. I had established a very close rapport with him when we were together on the other side. He displayed very great, sterling qualities. He had a humane outlook. He never detested anybody.

The Hon. Rupa Karunatillake had been of great service not only to the people of the Bentara-Elpitiya seat in the Galle District in the South but also to the rest of the Island. When he was the Minister of Plantation Industries, I remember, taking several deputations to him

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

where the Muslims in estates wanted a piece of land for their burial grounds. When earlier Ministers refused or retracted from helping, the Hon. Rupa Karunatillake willingly came forward and helped. I think it is there in several upcountry districts. Due of the graciousness of the Hon. Rupa Karunatillake, the Muslims were able to bury their *Janazas* in a Muslim cemetery.

The Hon. Rupa Karunatillake had his early education, as was told, at Niyangama Government school, Ananda Vidyalaya, Elpitiya, Mahinda College, Galle and Nalanda College, Colombo. We used to see him around the Zahira College Playgrounds. When Ananda College met Zahira College or when Mahinda College met Zahira College, Colombo, he was there to cheer his own school. I remember the Hon. Gamini Jayawickrema Perera was also there and he led the Nalanda Team at that time. As a result, he understood the aspirations and the rights of the Muslim community. He recognized them. When we wanted quasi-courts established in a proper manner, he was there to help us.

He followed a course in accountancy and business principles at the Polytechnic. After completing his studies, the Hon. Rupa Karunatillake was drawn into politics quite unexpectedly. His prime intention was to be of service to his native village and, in 1957 with the help of his father, he built a school in his village and donated it to the Government. The United National Party at that time picked him as the Chief Organizer for Bentara-Elpitiya and he won the seat at the 1977 General Election by a large majority of nearly 12,000 votes.

He was a very close friend of our dear leader of the Kandyan Province, the late Hon. A.C.S. Hameed, who was a Minister of Foreign Affairs. Whenever we walked into the canteen, we could see both Rupa and A.C.S Hameed engaged in very friendly exchange of ideas. I think they spoke about local politics and international politics. He learnt a lot of things from the Hon. A.C.S. Hameed. As a result, as I told you earlier, he had a mind to help, particularly, the Muslim community.

I remember, when I last visited the Thunduwa Muslim Maha Vidyalaya in Haburugala to which he had given buildings and other facilities, they recalled, Sir, the good work that he had done. But on that day, the *Milad-Un-Nabi* Day, I very sadly missed him in that school. But, the principal wanted more things to be done.

They wanted a nice assembly hall because the present assembly hall was over 75 years old and in a dilapidated condition. There are very talented students in arts and crafts studying there. I saw one of their wonderful exhibitions. Therefore, I would like to urge upon you, Mr. Presiding Member, - as an Hon. Member who represents that area, following the good foot steps of your late stepfather, *bappa* - to help them.

I also remember another gentleman, who very closely associated with him before he went to the Netherlands as Ambassador and even after coming back here. He is President's Counsel, Razick Zarook. They were very good pals. Razick Zarook, coming from Matara and the Hon. Rupasena Karunatillake coming from Bentara-Elpitiya in the Galle District had common aspirations. They wanted to help the people of that area. They were always seen together. As a result, I think he learnt certain things about the legal profession and the intricacies of law from my good friend, Razick Zarook.

Therefore, Sir, all in all, I would like to say, he was a man for whom we can proudly raise our heads and say, "Gentleman, sweet dreams to you!" because he had lived as a gentleman. He lived in this world for 79 years, seven months and four days. In Parliament, he adorned these benches for a long period of 22 years, 10 months and three days.

I wish, at this point of time, to pay our respects to his beloved wife Mrs. Hethumathi Karunatillake, who is in the Speaker's Gallery listening to us and also to his proud children; Amal, Sangeetha and Sanjaya. We must also recall the names of the Hon. Rupasena Karunatillake's father and mother, the late Mr. L.G.A. Karunatillake and Mrs. J. Karunatillake. Though they are no more among the living, it was they who gave an excellent politician and an excellent human being to this world. We say, "Mr. Rupasena Karunatillake, your name will be inscribed in letters of gold in this House for the noble role that you played in order to give a better living for the people of this country through debates and other contributions in this House". May his soul be sanctified!

Thank you.

[අ.භා. 5.07]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඉතාම ගෞරවයක් කොට සලකනවා, විශේෂයෙන් මේ පාර්ලිමේන්තුවේත්, ගාල්ල දිස්ත්‍රික්කයේත්, එක්සත් ජාතික පක්ෂයේත් ගෞරවයට පාත්‍ර වුණු, ඒ වාගේම දේශපාලන ක්ෂේත්‍රයේ මහත්මයෙක් විධියට පිළිගන්න පුළුවන් රූපා කරුණාතිලක මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් අදහස් දක්වන්නට ලැබීම. තමන්ගේ දිස්ත්‍රික්කයේ දේශපාලනය විතරක් නොවෙයි, තමන් කරන කාර්ය භාරය යම්කිසි වෙලාවකදී අවසන් කරන්න සමහර දේශපාලනඥයන්ට තිබෙන නොහැකියාව සහ සමහර දේවල් කල්පනා කරන්නේ නැතිකම අපි දකින කාරණයක්. ඇත්ත වශයෙන් සමහර දේශපාලනඥයෝ යම්කිසි කාල වකවානුවකදී ඉතාම ගෞරවණීය ලෙස ඉවත් වෙලා තව කෙනෙකුට ඒ අවස්ථාව දෙනවා. රූපා කරුණාතිලක මැතිතුමා කියන්නේ විවිධ කාරණා ගණනාවක මුලිකත්වය ගත් කෙනෙක්.

පළමුවන කාරණය මෙයයි. ලංකාවේ දිසා ඇමති ක්‍රමය ක්‍රියාත්මක කරනකොට ඒ දිසා ඇමති ක්‍රමයේ ප්‍රධානියෙක් විධියට එතුමා ක්‍රියා කළා. දේශපාලනය ගත්තාම 1977 කාලවකවානුවේ

ගාල්ලෙන් නමක් කිව්වොත් ඒ රූපා කරුණාතිලක. එතැනින් පසු 1987 පළාත් සභා ක්‍රමය ගෙනල්ලා ඒක ස්ථාපිත කරන්න අවශ්‍ය නීතිමය රාමුව මේ පාර්ලිමේන්තුවට ගෙනල්ලා සම්මත කරන්න යෝජනා කළේ රූපා කරුණාතිලක මැතිතුමා. එතැනින් පසු පළාත් සභා අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට පත් වෙලා, ඊළඟට පළාත් සභා රාජ්‍ය අමාත්‍යවරයා විධියට පත් වෙලා, පළාත් සභා ක්‍රමය ගෙනාපු අමාත්‍යවරයා විධියට ඒ ක්‍රමය ශක්තිමත් කරන්න විශාල වැඩ කොටසක් කරපු නායකයෙක්, එතුමා. ඒකයි මා කිව්වේ, විවිධ අවස්ථාවල විවිධ කාරණාවලට ඉතාම වැදගත් ස්ථානවලදී එතුමා දායකත්වය දුන්නාය කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් කියන්න කැමැතියි, එතුමා ඉතාම නිහතමානී කෙනෙක් බව. මා එතුමා සමඟ කථා කර තිබෙනවා. අපි ගිහින් කථා කළාම එතුමා බොහොම වැදගත් විධියට උපදෙස් සහ අනුශාසනා දෙන නායකයෙක් බවට පත් වෙලා තිබුණා. මා කියා ගෙන ආවේ වෙන කාරණයක් නිසා නොවෙයි. විශේෂයෙන් තමන් තීරණය කරන්න ඕනෑ, තමන්ගේ කාලවකවානු මොකක්ද කියා. ඇත්තටම වුවමනාවක් තිබුණා නම් රූපා කරුණාතිලක මැතිතුමාට තව වතාවක් ඡන්දය ඉල්ලා 2000 දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට එන්න තිබුණා. නමුත් එතුමා තීන්දුවක් ගත්තා, "නැහැ. මගේ දේශපාලන ජීවිතය අවසන් කරනවා.

1970 ඉඳලා මා මෙච්චර අවුරුදු ගණනක් දේශපාලනය කළා" කියා. අවුරුදු 32ක් එකම ආසනයක සංවිධායකවරයෙක් වෙලා ඉන්නවාය කියන්නේ ඉතාම අමාරු දෙයක්. එතුමා අවුරුදු 32ක් එකම ආසනයේ -බෙන්තර-ඇල්පිටිය ආසනයේ- සංවිධායකවරයා වෙලා හිටියා. ඒ තනතුර ඉතාම දීර්ඝ කාලයක් එතුමා දැරුවා. නියෝජ්‍ය අමාත්‍යවරයෙක් විධියට, රාජ්‍ය අමාත්‍යවරයෙක් විධියට, කැබිනට් අමාත්‍යවරයෙක් විධියට දේශපාලන ජීවිතයේ එතුමාට යන්න පුළුවන් ඉහළම ස්ථානයට ගියා. එතුමාට ආයාසයෙන් ලැබුණු ඒවා හැර එතුමා ඒවා ලබා ගන්න කල්පනා කෙරුවේ නැහැ. එතැනට ගියාට පසු එතුමා තීරණය කළා, තවදුරටත් මගේ දේශපාලන ක්‍රියාදාමය කළ යුතු නැහැයි කියා. ඔබතුමා වාගේ අපේ පක්ෂය වෙනුවෙන් එතුමා විශාල කාර්ය භාරයක් කළා විතරක් නොවෙයි හැම දෙනාගේම ගෞරවයට පාත්‍ර වුණා. මධ්‍යස්ථ විධියට හැම කෙනෙක් දිහාම බලන, හැම කෙනෙක් සමඟ වැඩ කටයුතු කරන කෙනෙක් වුණා. අන්තවාදියෙක් වුණේ නැහැ. ඔබතුමාට අවස්ථාව දීලා, එතුමාගේ අඩිපාරේ යන්න ඔබතුමා තියලා තමයි එතුමා ගෞරවණීය විධියට එතැනින් ඉවත් වුණේ.

අදත් බෙන්තර-ඇල්පිටිය ජනතාව විතරක් නොවෙයි මුළු ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවම නායකයෝ හදපු නායකයෙක් විධියට එතුමාට ආදරය සහ ගෞරවය දක්වනවා. ඔබතුමා වාගේ නායකයෙක් ගෙනල්ලා ඒ පුටුවේ ඉන්දවලා යන නැත්නම් ඒ සඳහා අවස්ථාව දෙන දේශපාලනඥයෙක් කියන්නේ දේශපාලනය කරන අපිට මෙයින්ම ලොකු උපදෙස් රාශියක් ලැබෙනවාය කියා මා විශ්වාස කරනවා. මේ සියලු දේවලට වඩා වටින්නේ නියමිත කාලයේ ක්‍රමානුකූලව තව නායකයෝ පෙළක් හදලා තියලා තමන්ට එළියට බැහැලා යන්න පුළුවන් වීමයි. දේශපාලනඥයෙකුට ඒක ඉතාම ගෞරවණීය දෙයක් විධියට මා සලකනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාව එතැනට පත් කරන්න අවශ්‍ය කරන ඒ වටපිටාව හදලා එතැනින් ඉවත් වීම සම්බන්ධව අපේ ගෞරවය සහ ආදරය එතුමාට විශේෂයෙන්ම මේ අවස්ථාවේදී අපි පුද කරනවා. සාමාන්‍යයෙන් අපි දන්නවා, යම් කිසි කෙනෙක් වෙනුවෙන් විරුද්ධ පාර්ශ්වයෙනුත් ආණ්ඩු පාර්ශ්වයෙනුත් මෙහෙම පැය ගණන් කථා කරලා හොඳ කියනවා අහන්න ලැබෙන්නේ බොහොම කලාතුරකින් බව. විශේෂයෙන් අස්වර් මැතිතුමා, ඒ වාගේම අපේ පියසේන ගමගේ මැතිතුමා වැනි විරුද්ධ දේශපාලන මතවාදයන් දරන අයත් රූපා කරුණාතිලක මැතිතුමා වෙනුවෙන් දීර්ඝ ගුණ කථනයන් කළා. එහෙම කළේ එතුමාගේ ඉතිහාසය පිළිබඳ මනා පරිණතභාවයක් ඔවුන් දකින නිසායි. අපි එය බොහොම ගෞරවයෙන් සිහිපත් කරනවා.

එතුමාගේ ඒ කාල වකවානුව තුළ අනුබද්ධ විශ්වවිද්‍යාල පරිශ්‍රයක් හදලා තිබෙනවා. තමන්ට නෑදෑ පරපුරෙන් හිමි වුණු ඉඩ කඩම් පාවිච්චි කරලා පාසලක් හදලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. රූපා කරුණාතිලක මැතිතුමා සහ ගාල්ල කොටුව අන්‍යෝන්‍ය වශයෙන් බැඳී තිබෙන කාරණයක් බවට පත් කරන්නට එතුමා නෙදර්ලන්ත ආධාර අරගෙන ගාල්ල කොටුව සංවර්ධනය කරන්න අවශ්‍ය කටයුතුත් කළා. එතැනින් පස්සේ සංචාරක ව්‍යාපාරය වර්ධනය කරන්න අවශ්‍ය කරන අපි දන්නා දැවැන්ත හෝටලය හදන්න අවශ්‍ය කරන භූමි භාගය ලබා දීලා, ගාල්ලට අවශ්‍ය කරන මූලික කටයුතු ටික අවසන් කරලා තමයි එතුමා තම දේශපාලන ජීවිතයෙන් සමු ගත්තේ.

විශේෂයෙන් එතුමා ස්වර්ණ හස්ති සම්මානයෙන් පිදුම් ලබා අපේ පක්ෂයේ ගෞරවාදරයට පත් වුණු නායකයෙක්. පසු ගිය කාල වකවානුවේදී එතුමාව ගෙන්වලා අපේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා අතින් එතුමාට ඒ සම්මානය දෙන කොට ඇත්තටම මට එතුමා කෙරෙහි විශාල ගෞරවයක් ඇති වුණා. මොකද, රටට සේවයක් කළ යම් කිසි කෙනකුට, පක්ෂය වෙනුවෙන් දර දිය ඇදපු කෙනෙකුට ඒ වාගේ සම්මානයක් ලැබීම ලොකු ගෞරවණීය අවස්ථාවක්.

එතුමා පක්ෂය වෙනුවෙන් තමන්ට කරන්නට පුළුවන් යුතුකම් කොටස කළා. ඩඩ්ලි සේනානායක මැතිතුමා එතුමාව තෝරා ගත්තා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එතුමාව ඉස්සරහට ගෙනාවා, ආර්. ප්‍රේමදාස මැතිතුමා එතුමා ඉහළට ගෙන ගියා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා එතුමාව ලංකාවටත් එහා යවලා, තානාපතිවරයෙක් විධියට මුළු රටටම සේවය කරන්න පුළුවන් තැනකට පත් කරලා, ජාත්‍යන්තර කීර්තියක් අරන් දෙන්න අවශ්‍ය කරන වටපිටාව හැදුවා. ඒ සියලු කාරණා මැද මුළු ගාල්ල දිස්ත්‍රික්කයටම එතුමා කළ සේවයත් එක්ක, අප අතරේ දැවැන්ත චරිතයක් විධියට, නොමියෙන මිනිසෙක් විධියට එතුමා වාර්තාවක් තැබුවාය කියන එකයි මගේ මතය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ පුටුවේ වාඩි වෙලා ඉන්න මොහොතක එවැනි නායකයකු ගැන කථා කරන්නට මට අවස්ථාව ලැබීමත් විශාල ගෞරවයක්. ඒ සියල්ල මතක් කරමින් අපගේ ආගම අනුව, අපගේ බෞද්ධ ධර්මය අනුව එතුමාට නිවන් සුව අත් වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 5.15]

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රූපා කරුණාතිලක හිටපු අමාත්‍යතුමාගේ අභාවය සම්බන්ධයෙන් මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ ශෝකය ප්‍රකාශ කරන අවස්ථාවේදී ඔබතුමා මූලාසනයේ සිටීම, එතුමාගේ ඥාති පුත්‍රයකු වශයෙන් එතුමාට ලබා දෙන්නට පුළුවන් ඉහළම ගෞරවය ලබා දීමක් විධියට මා දකිනවා. විශේෂයෙන්ම ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් රූපා කරුණාතිලක නාමය ඉදිරියට ගෙන යනවා වාගේම එතුමාගේ ජීවිතයේ සෑම විශේෂ අවස්ථාවකම ඒ ගෞරවය ආරක්ෂා කරන්නටත් කටයුතු කිරීම ගැන ප්‍රථමයෙන්ම අපේ ප්‍රණාමය අපි ඔබතුමාට පුද කරනවා.

[ගරු තලතා අතුකෝරල මහත්මිය]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විරුද්ධ පාර්ශ්වයත් ආණ්ඩු පාර්ශ්වයත් යන දෙපාර්ශ්වයෙන්ම රූපා කරුණාතිලක හිටපු ඇමතිතුමාගේ අවංක, අව්‍යාජ, නිරහංකාර දේශපාලනය ගැන හා එතුමා සිදු කළ සමාජ සේවය ගැන දීර්ඝ වශයෙන් ඉදිරිපත් කළ කරුණු කාරණා ගැන අපි හොඳින් ඇහුම් කන් දුන්නා. එතුමාට ඒ වාගේ තත්ත්වයක් ඇති කර ගෙන, ඒ විධියට කටයුතු කර ගෙන යන්නට පුළුවන්කම ඇති වුණේ විශේෂයෙන්ම එතුමාගේ පවුල් පසුබිමයි කියන එක අපි කවුරුත් හොඳින් දන්නවා. තම දෙමවුපියන්ගේ උරුමයෙන් එතුමාට ලැබුණු මහා දේපළත්, එතුමාගේ විවාහයෙන් ජයකොඩි පරම්පරාව සමඟ ඇති වුණු සම්බන්ධතාවත් මත ගොඩ නැඟුණු ශක්තිමත් පදනම තුළ ඒ අව්‍යාජ, නිරහංකාර, ඒ වාගේම අවංක දේශපාලනඥයා මේ රටේ බිහි වුණා. එතුමා ගාල්ල දිස්ත්‍රික්කයට සේවයක් කළා.

ගාල්ල දිස්ත්‍රික්කය ආරක්ෂා කළා වාගේම පසු කාලීනව මේ රටේ දේශපාලන ක්ෂේත්‍රය තුළ දරන්නට පුළුවන් සෑම තනතුරක්ම දැරුවා. දිසා ඇමතිවරයකු හැටියටත්, නියෝජ්‍ය ඇමතිවරයකු හැටියටත්, කැබිනට් ඇමතිවරයකු හැටියටත් එතුමා අවුරුදු 23ක අඛණ්ඩ නියෝජනයක් මේ උත්තරීතර සභාව තුළ පවත්වා ගෙන ගියා. අවසානයේ දේශපාලනයෙන් විශ්‍රාම ගිහිල්ලා, ඊට පසුව රට වෙනුවෙන්, ජාතිය වෙනුවෙන් නෙදර්ලන්ත රාජ්‍ය නියෝජනය කළා.

එතුමාගේ දේශපාලන ඉතිහාසය දිහා බැලුවාම එතුමාට ශූර කමිකත්වයක් තිබුණු බව හොඳින් අවබෝධ කර ගන්නට පුළුවන් වුණා. එදා 1965 මැතිවරණයෙන් පසුව අග්‍රාමාත්‍ය ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ ආරාධනයෙන් තමයි රූපා කරුණාතිලක මැතිතුමා දේශපාලනයට ආවේ. ඒ වාගේම අපිට අමතක කරන්නට බැහැ, 1970-77 කාලය තුළ එදා තිබුණු වෛරී, ක්‍රෝධ දේශපාලනය නිසා එතුමාගේ පරම්පරාවේ -එතුමාගේ පවුලෙන් පැවත ගෙන ආපු- දේපොළ තුළින් එතුමාට වන්දි ගෙවන්නට සිදු වුණු බව. ඒවා රාජසන්තක කරන්නට කටයුතු කළා. හැබැයි, රූපා කරුණාතිලක චරිතය මොන තරම් නිහතමානිද, මොන තරම් අව්‍යාජද කිව්වොත් එතුමා මේ උත්තරීතර පාර්ලිමේන්තුවට පත් වී ආවාට පසුව ඒ කටයුතු කරපු කිසි කෙනෙකුගෙන් පළිගන්න උත්සාහ කළේ නැහැ. එතුමා ඒ අයත් එක්ක ඉතාම සුහදව කටයුතු කළා. අද මේ ගරු සභාවේ දෙපැත්තෙන්ම කියැවුණු විධියට බොහොම නිහතමානි, සුහද චරිතයක් හැටියට අවුරුදු 23ක් එතුමා මේ සභා ගර්භයේ රැඳී සිටියා. ඉතින් අපි රූපා කරුණාතිලක චරිතය දිහා බලන කොට, එතුමාගේ දේශපාලන ගමන් මඟ දිහා බලන කොට, කනිෂ්ඨ මන්ත්‍රීවරුන් හැටියට අපට ඉගෙන ගන්න නොයෙකුත් පාඩම් රාශියක් තිබෙනවා.

අද මේ ගරු සභාවේ ගැලරියට පාසල් දරුවන් ගොඩාක් ඇවිල්ලා ඉන්නවා. එතුමාගේ ව්‍යාපාරික පසුබිම ගැන කථා කරනවා නම්, මේ දරුවෝ කවුරුවත් දන්නේ නැතිව ඇති ඒගොල්ලන් ඉස්කෝලේ ගිහිල්ලා තමන්ගේ art පොතේ චිත්‍ර අඳින අර "Homerun PAS" pastels ව්‍යාපාරයේ අයිතිකරු රූපා කරුණාතිලක මැතිතුමා කියලා. දැන් ඒ ව්‍යාපාරය පවත්වා ගෙන යන්නේ එම පවුලේ දරුවන් කියන එක සමහර විට අද මෙතැනට ඇවිත් සිටින මේ පාසල් දරුවෝ දන්නේ නැතිව ඇති. ඉතින් ඒ වාගේ ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ තමන්ගේ පියාගෙන් පැවත ගෙන එන තේ කර්මාන්තශාලා ඉස්සරහට ගෙන යන්න, වැවිලි කර්මාන්තය ඉස්සරහට ගෙන යන්න කටයුතු කළා. එතුමා පසුකාලීනව වැවිලි කර්මාන්ත ඇමතිවරයා හැටියට කටයුතු කරද්දී ඒ පසුබිම එතුමාට විශාල පහසුවක් වුණා. අද වාගේ සමහර අය බොහොම උත්සාහ කරලා, මහන්සි වෙලා, ඥාති හිත මිත්‍රකම් ආදී සියලුම දේ අමතක කරලා, පොර කාලා දේශපාලනය කරන යුගයක් නොවෙයි එදා තිබුණේ. වැදගත් පවුල්වලින්, යමක් කමක් තිබුණු පවුල්වලින් රූපා කරුණාතිලක මැතිතුමන්ලා වාගේ උදවිය එදා ඩඩ්ලි සේනානායක මැතිතුමා තෝරා ගත්තේ මේ රටේ මහත්මා දේශපාලනය ඉදිරියට ගෙන යන්නට වුවමනා නිසායි. අද කථා කළ අපේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් කියැවුණු ආකාරයට ඉතාම අවංක, අබ මල් රේණුවක දෙයක් දේශපාලනය තුළින් හම්බ කර නොගත් මන්ත්‍රීවරයෙක්, ඇමතිවරයෙක් මේ සභා ගර්භයේ සිටියා නම්, ඒ රූපා කරුණාතිලක මැතිතුමායි කියන එක අපට කිසිම පැකිලීමකින් තොරව බොහොම ආඩම්බරයෙන් කියන්නට පුළුවන්. කුමන පක්ෂයක් නියෝජනය කළත්, ආණ්ඩු පක්ෂයේ අයත් ඒ සම්බන්ධයෙන් අපි සමඟ එකඟ වනවා ඇති කියලා මා හිතනවා.

මේ අවස්ථාවේ දී මා මතක් කරන්නට ඕනෑ, විශේෂයෙන්ම මගේ සහෝදරයා වන දිවංගත ගාමිණී අතුකෝරල මැතිතුමාත්, ගරු රූපා කරුණාතිලක මැතිතුමාත් පුදුමාකාර සම්බන්ධයක් තිබුණු දෙපළක් බව. අපේ විපක්ෂ නායකතුමා එතුමාගේ කථාවේ දී මතක් කළා, 1977ට ඉස්සර වෙලා මගේ සහෝදරයාත්, එතුමාත්, රූපා කරුණාතිලක මැතිතුමාත්, නන්ද මැතිව් මැතිතුමාත් එක කට්ටියක් හැටියට යාළු මිත්‍රකම් පවත්වා ගෙන ගියේ කොහොමද කියලා. ඒ අය ජීවිතයෙන් සමු ගන්නා තුරුම නොකඩවා ඒ මිත්‍රකම ඒ විධියටම පවත්වා ගෙන ගියා. ඒ හැම කෙනෙකුටම තිබුණේ එක අරමුණයි. එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කරවීමත්, ඒ වාගේම මේ පක්ෂය තුළින් රට සංවර්ධනය කිරීමත්, රටට අවශ්‍ය දේ ලබා දීමත් කියන එකම අරමුණ මත තමයි රූපා කරුණාතිලක මහතා ඇතුළු ඒ උදවිය එදා කටයුතු කළේ. මම එතැනින් එහාට ගිහිල්ලා මේ කාරණය ගැනත් මතක් කරන්නට ඕනෑ. මගේ සහෝදරයාත් එක්ක එතුමා පාර්ලිමේන්තු එනකොට මම සිටියේ පාසල් යන අවධියේ.

උදේ පාන්දර පාර්ලිමේන්තුවට එන්න ඉස්සෙල්ලා ඒ දෙදෙනා දුරකථන සංවාදයක යෙදෙනවා, අද මොකද කරන්නේ, කීයටද යන්නේ, කීයටද එන්නේ කියලා. අද මටත්, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාටත් ඒ තත්ත්වය යම් තාක් දුරට ඉදිරියට ගෙන යන්න පුළුවන් වෙලා තිබෙනවා. එදා එක්සත් ජාතික පක්ෂය ආරක්ෂා කරන්න කටයුතු කළා වාගේම අපිත් ඒ විධියටම -ඒ අයුරින්ම- ඒ සම්බන්ධතාවන් ආරක්ෂා කර ගන්නටත් කටයුතු කරනවා.

විශේෂයෙන්ම රූපා කරුණාතිලක මහත්මයා ගැන කථා කරන කොට මේ කාරණයත් කියන්න ඕනෑ. එදා දේශපාලන පළිගැනීම්වලට ලක් වන කොට එතුමාට සිද්ධ වුණු දේ මා හිතන හැටියට කවුරුත් දන්නේ නැති වෙන්න පුළුවන්. එතුමාගේ පවුල් පසුබිමත් එක්ක එතුමාට කුරුඳුවත්තේ ඉන්ධන පිරවුම්හලක් තිබුණා. මේ උත්තරීතර සභාවට ආපු ඉන්ධන පිරවුම්හලක් තිබුණු එකම මන්ත්‍රීතුමා එතුමා වෙන්න ඇති. ඒ කාලයේ ඒකත් රජයට පවරා ගත්තා. එතුමා ව්‍යාපාර ලෝකයේ හොඳ නමක් තබා ගෙන සිටියා.

එතුමාගේ නැන්දණිය සිරිදත්තා ජයකොඩි මැතිනිය මේ රටේ ඉතිහාසයේ බෞද්ධ සිද්ධස්ථානවලට මහා විශාල සේවයක් කරපු, නූතන කාලයේ විශාඛාවක් කියා කියන්න පුළුවන්. එවන් කාන්තාවකගේ දියණියක් තමයි එතුමා සරණ පාවා ගෙන සිටියේ. එතුමාගේ දරුවන් ගැන අපි හොඳින් දන්නවා. ඉතින් ඒ වාගේ යුග පුරුෂයෙක් අද අප අතර නැති වුණත්, එතුමා ගාල්ල දිස්ත්‍රික්කයට නොමැකෙන නාමයක් ලබා දීලා තිබෙනවා.

අද ගාල්ල කොටුවත් ආරක්ෂා වෙලා තිබෙන්නේ එදා නෙදර්ලන්තයේ ආධාර ලබා ගෙන, නෙදර්ලන්ත තානාපතිතුමා හැටියට ඒ ඇති කර ගත්ත සම්බන්ධතාව නිසා කියලා අපට දැන ගන්නට ලැබුණා. ඉතාම කල් පවතින දේවල් කරපු, රටට යමක් කරපු, ඉදිරිය බලා වැඩ කරපු නායකයකුගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේදී අපේ ශෝකය රූපා

කරුණාතිලක මැතිනියටත්, පුතණුවන් දෙපොළටත්, දියණියටත්, ඒ වාගේම ඥාතීන් සියලු දෙනාටමත් පුද කරන ගමන්ම එතුමා ප්‍රාර්ථනා කරන බෝධියකින් එතුමාට අමා මහ නිවන් සුව අත් වේවායි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා.

[5.24 p.m.]

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Mr. Presiding Member, if I do not say a few words on behalf of the late Minister for Plantation Industries, this process of moaning the death of one of the best Ministers of Plantation Industries would not be complete. I, as a person representing the people of the plantation areas, the people of Indian origin, consider it a bounden duty to pay my tribute to that great man. Those Colleagues of mine who spoke in this House today paid tribute to him in very glowing terms.

I had the privilege of meeting him in this House during the period 1994 to 2000.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු ගයන්ත කරුණාතිලක මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு கயந்த கருணாதிலக அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. GAYANTHA KARUNATILEKA, *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

During that period, I saw the Hon. Rupa Karunatillake as a simple, unassuming person, always quiet and calm, always approachable and a person who was generous with advice and guidance when young MPs approached him. He had the reputation as a person of honesty and integrity and nobody could challenge his honesty and integrity.

The Hon. Rupa Karunatillake was Minister for Plantation Industries in the Government of the late President Premadasa. That was a very crucial period for the plantations. The plantations were run by the State. They were running at a heavy loss, a loss of nearly Rs. 400 million each month, which had to be pumped in by the Government. The Government then decided, with the consent of my late leader Savumyamoorthy Thondaman, who was the giant in the trade union movement of the plantations, to privatize the management of those estates. That crucial change was done under the supervision and guidance of the then Minister for Plantation Industries, the Hon. Rupa Karunatillake. The transition was so smooth that, at the beginning the estates were taken over - a lot of assets were there - the companies were not allowed to just throw away or sell those. They were kept under control and monitored. Over a period of time, those estates became profitable and that was due to the close monitoring of the estates by the Plantation Ministry under the guidance of the Hon. Rupa Karunatillake.

Another issue during this period was the welfare activities in the plantations on behalf of their workers. For the first time, a Plantation Social Development and Housing Trust was created. Today, it is called the "Plantation Human Development Trust" and it was through that Trust that welfare activities in the plantations, using foreign aid and Government funds, were started for the first time.

The Plantation Trust was a pioneering effort in transforming the lives of the plantation people and it was done during the period of the Hon. Rupa Karunatillake. It was through that Trust, the Ministry of Estate Infrastructure became a reality later during the period of President Chandrika Bandaranaike Kumaratunga. But, the pioneer was the Trust which was created during the period of the Hon. Rupa Karunatillake. The people in the plantations always looked up to him as a person who considered the welfare of the plantation workers as important as that of any other community in this country. In that regard, we pay our tribute to him.

We wish to convey our condolences and sorrow to the family of the Hon. Rupa Karunatillake and also to our Colleague, the Hon. Gayantha Karunatileka.

Thank you.

[අ.භා. 5.30]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

(The Presiding Member)

Hon. Azwer, he is here as a Minister to reply to the Motion. If he endorses your Motion, how can he reply to your Motion?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

The other Ministers might come.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

No, they might not come.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

You read the Standing Orders.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

In the Standing Orders, nothing of that sort is stated.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
There is no one to second the Motion; I am sorry.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
According to the Standing Orders, it is very clear. -[*Interruption*.] That is why the other Members left. There were so many Members here. He said that he would second it. He is an MP also. So, he can second it. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, දැන් ඔබතුමා කථා කර ගෙන යන්න කෝ. ඔබතුමාට කථා කරන්න ඕනෑ නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, is it okay if the Hon. Athauda Seneviratne seconds the Motion?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Athauda Seneviratne, would you second the Motion?

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
Yes.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Okay.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද විශේෂයෙන් සන්තෝෂ වෙනවා, අපේ අස්වර් මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන සභාව කල් තැබීමේ යෝජනාව සම්බන්ධව විපක්ෂය වෙනුවෙන් කථා කිරීමට ලැබීම ගැන. ඇතත්තටම මේ යෝජනාව තිබෙන්නේ රජයට විරුද්ධව දේශීය හා ජාත්‍යන්තර මට්ටමින් ක්‍රියාත්මක වන කුමන්ත්‍රණ පරාජය කිරීම සඳහා. මොකක්ද මේ කුමන්ත්‍රණය? [බාධා කිරීමක්] එහෙම දාලා නැහැ. ජනාධිපතිතුමා කියලා දාලා නැහැ. ඔව්, අතිගරු ජනාධිපතිතුමා. හරි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතකොට මේ කුමන්ත්‍රණය මොකක්ද කියලා අපි ඉස්සෙල්ලාම හඳුනා ගන්න ඕනෑ. මේ කුමන්ත්‍රණය සංවර්ධනය පිළිබඳ කුමන්ත්‍රණයක්ද? මෙතුමා අද කියන්නේ, ජාත්‍යන්තර වශයෙන් මාධ්‍ය යොදා ගනිමින් රටේ දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව ලෝකයේ ජනතාවට පෙන්වූවාම මේ කුමන්ත්‍රණය පරාජය කරන්න පුළුවන් කියලා. රටට ජාත්‍යන්තර කුමන්ත්‍රණය ඇති වෙලා තිබෙන්නේ ඒ අර්ථයෙන් නොවෙයි. සංවර්ධනය පිළිබඳව ලංකාවේ ආණ්ඩුව, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව, ජනාධිපතිතුමා වැරදි කරලා තිබෙනවා කියලා ජාත්‍යන්තර වශයෙන් ප්‍රශ්නයක් නැහැ. සංවර්ධන කටයුතු පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් ප්‍රශ්නයක් නිසා එල්ල කරපු කුමන්ත්‍රණයක කථාවක් නොවෙයි මේ තිබෙන්නේ. ඔබතුමා කියා ගෙන ගියේ මේ ඇති කරලා තිබෙන කුමන්ත්‍රණය වෙනත් විධියේ කුමන්ත්‍රණයක් විධියට.

මොකක්ද මේ කුමන්ත්‍රණය? ඔබතුමාට මේක හරියට කියා ගන්න බැරි වෙලා තිබෙනවා මේ කථාවේදී. ජනාධිපතිතුමාට විරුද්ධව මේ විධියේ කුමන්ත්‍රණයක් තිබෙනවා කියලා කෙළින් කියන්න තිබුණා. ඒ කුමන්ත්‍රණය හරියට අර්ථ නිරූපණය කරන්නවත් බැරිව තමයි අද මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙක් මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. මේක වැරදියි. මේ යෝජනාවත් වැරදියි. මෙතැන තිබෙන්නේ සංවර්ධනය පිළිබඳ ප්‍රශ්නයක්. ඇත්ත වශයෙන්ම අද කුමන්ත්‍රණයක් තිබෙනවා නම් අපට කියන්න ඕනෑ ඒ කුමන්ත්‍රණය මොකක්ද කියලා. එහෙම කුමන්ත්‍රණයක් මේකේ කියලා නැහැ. මේකේ තිබෙන්නේ සංවර්ධන කටයුතු පිළිබඳව. ඔබතුමා කියන්නේ සඳුදා උදේට ජිනීවාහි මානව හිමිකම් කමිටුවට ගිහිල්ලා, ලංකාවේ නැව් එන්නේ නැති වරායත් හදපු එක සහ අනෙක් ඔක්කොම කරුණු ටික අරන් ගිහින් පෙන්නුවාම ජාත්‍යන්තර ප්‍රජාව සන්තෝෂ වෙයි කියලා. එහෙමද කියන්නේ? නැහැ.

ඊට එහා ගිය චෝදනා රාශියක් ලංකා ආණ්ඩුවට විරුද්ධව තිබෙනවා. ඒක රටට විරුද්ධව තිබෙන චෝදනාවක් නොවෙයි. ඒ චෝදනාව තිබෙන්නේ ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු ආණ්ඩුවට විරුද්ධව. ඒක සංවර්ධනය පිළිබඳව චෝදනාවක් නොවෙයි. ඒ නිසා මම ඉස්සෙල්ලාම කියන්න කැමැතියි, අද අපි යුද්ධයෙන් පසුව රට ඇති කරලා තිබෙන තත්ත්වය පිළිබඳව තමයි ජාත්‍යන්තර වශයෙන් මේ ප්‍රශ්නය තිබෙන්නේ කියලා. තමුන්නාන්සේලා යුද්ධය ඉවර වුණාට පසුව විශාල පොරොන්දු සංඛ්‍යාවක් දුන්නා. ඒක නිසා තමයි බැන් කී මූන් මහත්තයා කිව්වේ මහින්ද රාජපක්ෂ මහත්මයා දකුණු ආසියාවේ නායකයා වෙන්න ඕනෑ කියලා. මම දන්නේ නැහැ, ඔබතුමා දැන් කියපු කථාවක් මම කිව්වේ. මම දන්නේ නැහැ ඕක කිව්වාද කියලා. කොහේවත් කියලා තිබුණේ නැහැ. නමුත් අපි හිතමු එහෙම කිව්වා කියලා. එහෙම කිව්වා කියලා හිතන්නේ ඇයි? යුද්ධයෙන් පසුව රටට අත් වෙලා තිබුණ හානි, විනාශය සහ දෙමළ ජනතාව, සිංහල ජනතාව, මුස්ලිම් ජනතාව අතර ඇති වෙලා තිබෙන ගැටුම්කාරී තත්ත්වයන් එකට එකතු කරලා රට නැවත අලුත් යුගයකට ගෙන යන්න පුළුවන් කියන විශ්වාසයක් යම් කිසි විධියකට ජාත්‍යන්තර ප්‍රජාවට තිබුණ නිසා තමයි එහෙම යෝජනාවක් එතුමන්ලා කරන්න ඇත්තේ. හැබැයි ඒ විශ්වාසයට අද මොකද වෙලා තිබෙන්නේ? ඒ විශ්වාසය අද කඩා වැටිලා තිබෙනවා.

යුද්ධයෙන් පසුව ජාත්‍යන්තර ප්‍රජාව දිගින් දිගටම මේ ආණ්ඩුවට කිව්වා, අපි සහයෝගය දෙන්න සූදානම්, හැබැයි තමුන්නාන්සේලා කරුණාකරලා රටේ සංවර්ධන කටයුතු පිළිබඳව, විශේෂයෙන් සිරකරුවන් පිළිබඳව, මැරුණු අය පිළිබඳව, ඒ අය වෙනුවෙන් මරණ සහතික දීම පිළිබඳව, ඒ වාගේම නඩු පවරා තිබෙන අය සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන තත්ත්වයන්, උතුරු නැඟෙනහිර ඇති වෙලා තිබෙන විවිධ අමානුෂික කල්ලි, කණ්ඩායම්වලින් රට බේරා ගෙන නීතිය හා සාමය ස්ථාපිත කරන අලුත් තැනකට රට ගෙන යන්න ඕනෑය කියලා. ජාත්‍යන්තර ප්‍රජාවෙන් දැවැන්තම අර්බුද තිබෙන කාලයේ ඒ වෙනුවෙන් අපි ඔක්කොම -සියලු දෙනාම- එකට නැඟිට්ටා. අපි මේ පාර්ලිමේන්තුවේ කථා කළා. විවිධ ජාත්‍යන්තර රටවල්වලට ලංකාවේ අරගලවලට අත ගහන්න බැහැයි කියලා අපි කථා කළා. හැබැයි මේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා නොවෙයි ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා තමයි ඒ කාලයේ ගිහිල්ලා කිව්වේ, ජාත්‍යන්තර ආධාර නවත්වන්න කියලා.

1989 දී ගිහිල්ලා කිව්වේ. 1989 දෙසැම්බර් මාසයේ 07 වන දා හැන්සාඩ් වාර්තාව අරගෙන බැලුවොත් ඒකේ තිබෙනවා, මහින්ද රාජපක්ෂ මහත්මයා මොනවාද කිව්වේ කියලා. පිට රටවල්වලට ගිහිල්ලා ලංකාවට ආධාර දෙන එක නතර කරන්නය කිව්වා. එතුමායි කිව්වේ, අපි නොවෙයි. රනිල් වික්‍රමසිංහ මැතිතුමා නොවෙයි කිව්වේ. රට එතැනට ගෙනැල්ලා තිබෙන වෙලාවක තමයි මුළු රටම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විධියට අපි සියලු දෙනාම කිව්වා, ජනාධිපතිතුමාවත්, මේ රටේ හමුදාවේ ඉන්න සෙබළුන්වත් ජාත්‍යන්තර යුද අධිකරණවලට ගෙන යන්න අපි ඉඩ තියන්නේ නැහැයි කියලා. අපි බොහොම පැහැදිලිව කිව්වා. එහෙම ගෙන යන්න බැහැ. එහෙම ගෙන යන්න බැරි වෙන හේතුවක් නිසා නොවෙයි. ජාත්‍යන්තර යුද අධිකරණවලට ඕනෑම රටක රාජ්‍ය නායකයෝ ගෙන යන්න ඕනෑය කියා අත්සන් කරපු ගිවිසුමට එදා අපේ රනිල් වික්‍රමසිංහ මන්ත්‍රීතුමා අත්සන් කළේ නැති නිසයි.

කවදා හෝ දවසක කවුරු හෝ කියනවා නම් මහින්ද රාජපක්ෂ මැතිතුමාව අර ගෙන ගිහින් දඬු කඳේ ගහන්න ඕනෑය කියා, විදුලි පුටුවේ ඉන්දන්න ඕනෑය කියා, ඒක කරන්න බැරි වන්නේ වෙන හේතුවක් නිසා නොවෙයි, අපේ විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා එදා 2001-2004 කාලයේ ඒ සම්මුතියට අත්සන් කළේ නැති නිසායි. එම නිසා අද තමුන්නාන්සේලා ලංකාව පුරා ඇති කරන්න හදන මේ හුඹස් බිය ඇති කරන්න බැහැ. මතක තියා ගන්න. මහින්ද රාජපක්ෂ මහත්මයාව ලෝකයේ කිසිම රටක, කාටවත් ගෙන ගිහින් එල්ලන්න බැහැ. අපේ රටට විරුද්ධව ලෝකයේ කිසිම රටකට එවැනි ක්‍රියාකාරකමක් කරන්න බැරි වුණේ, රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒක අත්සන් නොකළ නිසායි.

රනිල් වික්‍රමසිංහ මැතිතුමා දැන් අරෙහෙට ගිහින් මේක කිව්වාය, අරක කිව්වාය කියා තමුන්නාන්සේලා කියනවා. මම ගරු අස්වර් මන්ත්‍රීතුමාට කියනවා, කරුණාකර ඔප්පු කර පෙන්වන්න කියා. එතුමා කොයි රටේ, කොයි අවස්ථාවේ, කොතැනද, එහෙම කිව්වේ කියා ලිඛිත සාක්ෂියක් ඔප්පු කර පෙන්වන්න. නිකම් බහුබූත කියවන්නේ නැතිව හරියට ඔප්පු කර පෙන්නුවොත් අප සූදානම් ඒ සම්බන්ධව කථා කරන්න. නැතිව අතැන ගිහින් මේක කිව්වා, මෙතැන ගිහින් මේක කිව්වාය කියා අඟුපිලේ, කඩපිලේ කියපු කථා ගෙනැල්ලා රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, එක්සත් ජාතික පක්ෂයටත් මඩ ගහන්න සූදානම් වන්නට එපාය කියා මම විශේෂයෙන් කියන්නට කැමැතියි.

අද අර්බුදය තිබෙන්නේ එතැන නොවෙයි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව විවිධ රටවලට පොරොන්දු වුණා. විවිධ දේවල් කරනවාය කියා පොරොන්දු වුණා. ඒකට තමයි විද්වත් පුද්ගලයින්ගේ කමිටුවක් - Panel of Eminent Persons - තමුන්නාන්සේලා ස්ථාපිත කළේ. ඒක ස්ථාපිත කර ඒක අතහැර දැම්මා. එකේ අදහස් හා යෝජනාවලට මොකද වුණේ කියා මා තමුන්නාන්සේලාගෙන් අහනවා; මා ගරු ඇමතිතුමාගෙන් අහනවා. ඔබතුමා කරුණාකර මේකේ යෝජනා ටික ඉදිරිපත් කරන්න. "Eminent" නැත්නම්, විද්වත් නායකයන්ගේ කමිටුවේ යෝජනා ටික කෝ? තමුන්නාන්සේලා ඒක ඉදිරිපත් කරන්න පාර්ලිමේන්තුවට. එක ඉදිරිපත් කළේ නැහැ. ඒක අතහැර දැම්මා.

ඊළඟට තව කොමිෂන් සභාවක් ඇති කළා. ඒ කොමිෂන් සභාව එහෙම පිටින්ම මැරිලා යන්න ඉඩ දුන්නා. ජාත්‍යන්තර ප්‍රජාවත් එක්ක ගනුදෙනු කරන කොට සරම උස්සා ගෙන ලංකාවේ කෑ ගහනවා වාගේ කෑ ගහලා හරි යන්නේ නැහැ. ඒවා කරන්නට ක්‍රමවේදයක් තිබෙනවා. ජාත්‍යන්තර වශයෙන් අපට ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ ජාත්‍යන්තර වශයෙන් තිබෙන ප්‍රශ්නය බේරා ගන්න අප රාජ්‍ය තාන්ත්‍රික විධියට වැඩ කරන්නට ඕනෑ. ඒකට මැද මූලනයේ theory එක දාලා හරියන්නේ නැහැ. ඒකට ගිහින් ඒ මිනිසුන්ට කෑ ගහලා, ජාත්‍යන්තර ප්‍රජාවට "හූ" කියලා හරියන්නේ නැහැ. ඒක බේරා ගන්නට තිබෙන්නේ ඒ ක්‍රමවේදය අනුවයි. එම නිසා අද මොකක් ද වෙලා තිබෙන්නේ?

එතැනින් පස්සේ තමුන්නාන්සේලා 2011 නොවැම්බර් මාසයේ ගෙනාවා, උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව. එම වාර්තාවේ මොනවා ද තිබෙන ප්‍රධාන නිරීක්ෂණ? බලන්න, එම වාර්තාවේ තිබෙනවා පළමු වෙන්ම, අද රට ඉල්ලන්නේ, තිරසාර එකමුතු බව හා මිත්‍රත්වයයි කියා. එතැනින් පස්සේ මොකක්ද ඔවුන් කියන්නේ? උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවෙන් මම මේ කියන්නේ. ඔවුන් මොනවා ද කියන්නේ? දිගින් දිගටම කියනවා, දමිළ ජනතාවට තිබෙන ප්‍රශ්න; දමිළ ජනතාවගේ දුක් ගැනවිලි. ඔවුන්ට තිබෙන ප්‍රශ්න පිළිබඳව කථා කර තිබෙනවා. එම වාර්තාවේ ඊළඟට කියනවා, "ශ්‍රී ලංකාවේ බහුතර සුළුතර සබඳතාව පිළිබඳ ඓතිහාසික පසුබිම". එතැනින් එහාට, අවතැන් වූවන් පිළිබඳව කියනවා. ඊළඟට කියනවා, "මුස්ලිම් ප්‍රජාවගේ ප්‍රශ්න". ඔවුන් කියනවා, පැරණි අභ්‍යන්තර අවතැන්වූවන් ලෙස සලකන්නට එපාය කියා. ඔවුන්ට සාධාරණව සලකන්නටය කියා කියනවා. ඒ මුස්ලිම් ජනතාවගේ ප්‍රශ්න.

ඊළඟට සිංහල ගම්මාන ගැන කියනවා; ඔවුන්ගේ අධ්‍යාපනය ගැන කියනවා. සිංහල ගම්මානවල අධ්‍යාපනය අහිමි වීම, කැඩී-බිඳී ගිය ජීවිකාවන්, අඩු සෞඛ්‍ය හා ප්‍රවාහන පහසුකම් වැනි දරුණු පීඩනයන්ට ලක් වුණා; ඒවායින් බේරා ගන්නය කියනවා. ඊට පසු කියනවා, "ඉන්දියානු සම්භවයක් සහිත දෙමළ ජනතාවගේ දුක් ගැනවිලි." එම වාර්තාවේ මොනවා ද කියන්නේ?

"මෙම ජනකොටසගේ සෞඛ්‍යය හා අධ්‍යාපන පහසුකම් දියුණු කරන ලෙසද, ඔවුන්ට වතුකරයෙහි වඩා හොඳ ජීවන තත්ත්වයක් ලබා දීමට පියවර ගන්නා ලෙස ද......"

ආණ්ඩුවට මේවා නිර්දේශ කරනවා. මේවා තමුන්නාන්සේලා හමස් පෙට්ටියට දාලා නිකම් හිටියා, මාස ගණනක්. ඒක නිසා තමයි ජාත්‍යන්තර ප්‍රජාව මේවාට විරුද්ධව කථා කරන්නේ. තමුන්නාන්සේලා කිව්වා, ජාත්‍යන්තර ප්‍රජාව ගෙනැල්ලා මෙහෙ ඒවා නිරීක්ෂණය කරන්න ඕනෑ නැහැ කියා. අපත් පිළිගන්නවා ඒක. ඒකේ කිසි ගැටලුවක් නැහැ. හැබැයි, තමුන්නාන්සේලා ලංකාවේ හදපු, තමුන්නාන්සේලා පත් කළ උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ තිබෙන ඒවා ගැන තමුන්නාන්සේලා මොකක් ද කළේ? කිසි දෙයක් කළේ නැහැ. එම නිසා තමයි අද මේ ජාත්‍යන්තර කුමන්ත්‍රණකරුවන් යයි කියා මිනිසුන්ට විරුද්ධව තමුන්නාන්සේලාට චෝදනා කරන්නට සිද්ධ වෙලා තිබෙන්නේ. එතැනින් එහාට ගිහින් බලන්න. එම වාර්තාවේ "නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක කර වීමට නොහැකි වීම" ගැන කියනවා. මොනවා ද කියන්නේ? එහි මෙසේ සඳහන් වෙනවා:

"නීතිය ක්‍රියා කර වීමේ බලධාරීන්ට තිබුණු දේශපාලන බලපෑම් නිසා නීතියේ හස්තය ඔවුන් කරා දිගු නොවුණු බවයි. කිසියම් අර්ථවත් ප්‍රතිසන්ධානයක් ඇති වීමට නම් ස්වාධීන අධිකරණයක් හා විනිවිද භාවයෙන් යුත් නීති ක්‍රමයක් තුළ නීතියේ ආධිපත්‍යය දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම"

එය ඔවුන් නිර්දේශ කරනවා. නීතියේ ආධිපත්‍යයක්, ස්වාධීන අධිකරණයක් ඔවුන් ඉල්ලනවා.

අනෙක් කාරණය බලන්න. එම වාර්තාවේ මෙන්න මේ විධියටත් සඳහන් වෙනවා:

"දේශපාලන සම්බන්ධතා ඇති අය විසින් අපරාධ සිදුකරන අවස්ථාවලදී නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන් එම අපරාධකරුවන් නීතියේ රැහැනට අසුකර ගැනීමට අසමත්වීම. "

මේක ප්‍රශ්නයක්. මේක උගත් පාඩම් කොමිෂන් සභාවෙන් කියන්නේ. මේවා මේ රටේ තිබෙන ප්‍රශ්න. මේවා ඇමෙරිකාවත් එක්ක හෝ බ්‍රිතාන්‍යයත් එක්ක තිබෙන ප්‍රශ්න නොවෙයි. මේ රට ඇතුළේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්නේ නැතිව අප USA

[ගරු දයාසිරි ජයසේකර මහතා]

එකටයි, UN එකටයි, අරහෙටයි මෙහාටයි, මෙහෙ ඉඳලා කෑ ගහලා හරින්නේ නැහැ. මතක තියාගන්න. තවත් බලන්න, මොනවා ද තිබෙන්නේ කියා. එම වාර්තාවේ තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

" 9.204 අනවසර අවි සන්තකයේ ඇති පුද්ගලයින් නිරායුධ කර එවැනි වැරදිකරුවන්ට නඩුපැවරීමට වහා ක්‍රියා කරන කරන ලෙස කොමිසම ආණ්ඩුවට තරයේ නිර්දේශ කරයි."

මේ අනෙක් එක. එතැනින් පස්සේ බලන්න. දිගින් දිගටම උතුරේ පැහැරගෙන යෑම් ගැන බොහොම පැහැදිලිව කියනවා. ඊට අමතරව මොකක්ද කියන්නේ කියා බලන්න. එම වාර්තාවේ මෙසේ සඳහන් වෙනවා:

"නැගෙනහිර පළාතේ 'භාරටී' නමැත්තෙකු විසින් පැහැරගැනීම්, බලෙන් මුදල් පැහැරගැනීම්, සොරකම් ආදී අපරාධ කිහිපයක් කර ඇති බවට චෝදනා ඉදිරිපත් කරන ලදී. කොමිසම මෙම කරුණ නිසි බලධාරින්ට දන්වන ලදී. මෙම චූදිත පුද්ගලයා පිළිබඳ කිසිදු ඵලදායි පියවරක් ගෙන නැති බවත් කොමිසම කනගාටුවෙන් යුතුව සඳහන් කරයි. විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරින් දෙදෙනෙකු සහ පොලිස් නිලධාරින් 600ක් සමග පැහැර ගැනීමට ලක් වූවත් ...."

සම්බන්ධව පරීක්ෂණයක් කරන්න කියලා ඉල්ලීමක් තිබෙනවා. එම වාර්තාවේ තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"ඊළාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ EPDP සාමාජිකයන් විසින් කරන ලද අසාධාරණ අය කිරීම් හා මුදල් පැහැර ගැනීම් පිළිබඳ කිහිප දෙනෙකු විසින් කරුණු ඉදිරිපත් කරන ලදී."

ඊ ළඟට නැගෙනහිර පළාතේ සිද්ධ වන මිනී මැරුම්, ඒ වාගේම එම වාර්තාවේ තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"ආරක්ෂක හමුදාවේ පහසුකම් භාවිතාවේ මුවාවෙන් පැහැර ගැනීම්, මුදල් ආදිය බලෙන් පැහැර ගැනීම් හා සොරකම් පිළිබඳ මේජර් සීලන් නමැති පුද්ගලයකුගේ නායකත්වයෙන් ඇති කල්ලියක නීති විරෝධී ක්‍රියාදාමයන් පිළිබඳව බොහෝ අය දරුණු දැක්වූහ. ...."

මේවා තමයි මේ කොමිෂන් සභා වාර්තාවෙන් කියන්නේ. ඊ ළඟට එතැනින් පස්සේ බලන්න. එම වාර්තාවේ තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"යුක්තියේ පරිපාලනය පිළිබඳව ජනතාව තුළ විශ්වාසයක් ඇති කිරීම සඳහා සියලු චෝදනා පිළිබඳ නිසි පරීක්ෂණයක් පවත්වා වැරදිකරුවන්ට ඔවුන්ගේ දේශපාලන සබඳතා ගැන නොසලකා දඬුවම් කළ යුතු බව කොමිසම තරයේ නිර්දේශ කරයි."

පොලිස් දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් මොකක්ද මේ කියන්නේ? එම වාර්තාවේ තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"පොලිස් දෙපාර්තමේන්තුව වනාහි නීතියේ හා සාමයේ පැවැත්ම භාර කරන ලද සිවිල් ආයතනයකි. එබැවින්, පොලිස් දෙපාර්තමේන්තුව රාජ්‍ය ආරක්ෂාව පිළිබඳව වග කිව යුතු ආරක්ෂක හමුදාවන් සම්බන්ධයෙන් ක්‍රියා කරන ආයතනවලින් වෙන් කිරීම වඩා යෝග්‍ය වනු ඇත."

පොලිස් දෙපාර්තමේන්තුව වෙන් කරන්න ලූ ආරක්ෂක හමුදාවෙන්. මොකක්ද මේ කියන්නේ? වෙනදා ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබුණේ ත්‍රිවිධ හමුදාව විතරයි. පොලීසියට එම අමාත්‍යාංශයේ සෘජු දායකත්වය තිබුණේ නැහැ. ඒක වෙනම හදාගෙන තිබුණා. නමුත් අද ඔක්කෝම එකට එකතු කරලා තිබෙනවා. මෙම වාර්තාවෙන් කියනවා, වහාම ඒක වෙනස් කරන්න, වෙන් කරන්න කියලා. එම වාර්තාවේ තවදුරටත් මෙහෙම සඳහන් වෙනවා:

"පොලීසියේ නිසි ක්‍රියා කිරීම සහතික කිරීමට හා ජනතාව අතර විශ්වාසය ඇති කිරීමට ස්ථිර ස්වාධීන පොලිස් කොමසමක් පත් කිරීම පූර්වාවශ්‍යතාවක් බව කොමිසමේ විශ්වාසයයි. එවැනි කොමිසමකට පොලිස් සේවයේ ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීමට බලය තිබිය යුතු අතර, සෑම පොලිස් නිලධාරියෙක්ම ස්වාධීනව ක්‍රියා කරන බවත්, උසස් මට්ටමේ වෘත්තිමය හැසිරීමක් සහිත වන බවත් සහතික කළ යුතුය."

ඊ ළඟට මොනවාද කියන්නේ? අධිකරණයේ ගැටලු. සියල්ලම හොඳට පැහැදිලිව කියනවා. පුරවැසි දුක්ගැනවිලි පිළිබඳව කටයුතු කිරීමට විශේෂ ආයතනයක් හදන්න කියලා කියනවා. එය මෙසේයි:

"අනෙකුත් ක්‍රියා මාර්ග.

9.222 රාජ්‍ය සේවයේ ක්‍රමවේදයන් සහ කාර්ය පටිපාටීන් සියලු පුරවැසියන්ගේ, විශේෂයෙන්ම සුළුතරයන්ගේ සැකසංකා පිළිබඳව සංවේදී වන මිනුම් දඬු, න්‍යායයන් සහ ආචාර ධර්ම සංග්‍රහයන්ගෙන් නියාමනය විය යුතුය. දුක්ගැනවිලි ඇති විය හැකි වැරදි වැටහීම් වැළැක්වීමට සම්පූර්ණ පාරදෘෂ්‍යභාවය සහ ආණ්ඩුවේ තීරණවල තාර්කිකත්වය සම්බන්ධයෙන් තොරතුරු ජනතාවට ලබා දිය යුතුය."

ජනතාවට තොරතුරු ලබා දෙන්න කියලායි කියන්නේ. "තොරතුරු ලබා ගැනීමේ නිදහස පනත් කෙටුම්පත" අපි තුන් පාරක් පාර්ලිමේන්තුවට ගෙනාවා. කරු ජයසූරිය මැතිතුමා තුන් පාරක් ඒක පාර්ලිමේන්තුවට ගෙනාවා. ඒ තුන් පාරම තමුන්නාන්සේලා ඒක පරාජයට පත් කළා. දැන් තමුන්නාන්සේලාගේම කොමිෂන් සභා වාර්තාවෙන් කියනවා ඒක ගේන්න කිලා. කාගේ වාර්තාවක්ද ඒක? ඒක ඇමෙරිකා එක්සත් ජනපදයේ කුමන්ත්‍රණකරුවෝ හෝ එහෙම නැත්නම් එංගලන්තයේ කුමන්ත්‍රණකරුවෝ හෝ එහෙමත් නැත්නම් වෙනත් කුමන්ත්‍රණකාරයෝ හදපු එකක් නොවෙයි. බලාගෙන ගියාම තමුන්නාන්සේලාම තමයි කුමන්ත්‍රණකාරයෝ. ඒ කොමිසම පත් කළේ තමුන්නාන්සේලායි. අපි කියන්නේ මේ කොමිෂන් සභා වාර්තාව ක්‍රියාත්මක කරන්න කියලායි.

එම වාර්තාවේ මෙසේ සඳහන් වෙනවා:

"කොමිසමේ අවධානයට ලක් කළ නැතිගන්වන සුළු ප්‍රපංචයක් නම් රාජ්‍ය නිලධාරින් පත් කිරීම්, මාරු කිරීම් ආදිය සම්බන්ධයෙන් බලයේ සිටින පක්ෂයේ දේශපාලනඥයින් විසින් සිදු කරන ඉහළ මට්ටමේ ඇඟිලි ගැසීමය. මෙය යහ පාලනයේ පැහැදිලි ප්‍රතිවාදය වේ."

ඊ ළඟට, තවත් මෙහෙම සඳහන් වෙනවා:

"9.226 රාජ්‍ය සේවයේ දේශපාලන ඇඟිලි ගැසීම නොමැති බවටත්, ව්‍යවස්ථාවේ සඳහන් සමානාත්මතා විධිවිධානවලට අනුකූලව රාජ්‍ය සේවයේ පත්වීම් හා උසස්වීම් සිදු වන බවටත් සනාථ කරනු වස්, නොපමාව ස්වාධීන රාජ්‍ය සේවා කොමිසමක් ස්ථාපනය කරන ලෙසට කොමිසම තරයේ නිර්දේශ කරයි."

මේ නිර්දේශ කවුරුවත් කරපු ඒවා නොවෙයි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
පොලිස් කොමිසම පත් කරලා තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මොකවත් කරලා නැහැ. කොහේද හදලා තිබෙන්නේ? කිසිම පොලිස් කොමිසක් පත් කරලා නැහැ. ඒක තමුන්නාන්සේලාගේ කට්ටිය කරන එකක්. ඒක පොලිස් කොමිසම නොවෙයි. ඊට වැඩිය හොඳයි ගෙදර පොලිස් කොමිසමක් තියා ගත්තා නම්. [බාධා කිරීමක්] මම ඔබතුමාට කරදර කළේ නැහැ නේ.

කරුණාකරලා ඉඳගන්න. නමුත් කිසිම වෙලාවක එහෙම එකක් කරලා තිබුණේ නැහැ.[බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
There is no point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Yes, Hon. Azwer, what is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
The Parliamentary Council has met under the Leadership of the Hon. Chamal Rajapaksa and has appointed the PSC, the JSC, the Police Commission and eight other Commissions. But, mind you, for a single meeting the Leader of the Opposition -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is not a point of Order. That is an opinion, Hon. Azwer.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Yes, that is an opinion. අස්වර් මැතිතුමාට මම බාධා කළේ නැහැ. එතුමා කියපු දේවල් ටික මෙච්චර වෙලා මම අහගෙන හිටියා. මම කියන්න කැමැතියි, ඒක ස්වාධීන පොලිස් කොමිසමක් හෝ ස්වාධීන රාජ්‍ය සේවා කොමිසමක් නොවෙයි කියලා. එහෙම නම් කරුණාකරලා ලබන සඳුදා ජිනීවාවලට ගිහිල්ලා කියන්න කියලා කියන්න. ඔබතුමන්ලා හදපු මේ කොමිෂන් සභා වාර්තාවවත් සාකච්ඡා කරන්න ජිනීවා කවුන්සලය සූදානම් නැහැ. අපි අහන්නේ ඒකයි. ලංකා ඉතිහාසයේ ඔය වාගේ ප්‍රශ්න ඕනෑ තරම් ආවා. 1988-1989 කාලයේ තරුණයෝ මැරුවා කියලා මේ චෝදනාව ප්‍රේමදාස මහත්මයාට ආවා. එතුමා ගිහිල්ලා මොනවාද කළේ? එතුමා ජිනීවා මානව හිමිකම් කවුසලයට ගිහිල්ලා කථා කරලා කිව්වා, "ඔව්, අපට ප්‍රශ්නයක් තිබුණා. ත්‍රස්තවාදය කියන්නේ කොහොමත් ත්‍රස්තවාදය. සිංහල ත්‍රස්තවාදය, දෙමළ ත්‍රස්තවාදය කියලා වෙනස් කරන්න බැහැ. ඒ නිසා ඒ කාලයේ සිද්ධ වුණු ඝාතනයන් පිළිබඳව සොයන්න අපි කටයුතු කරනවා. හැබැයි, අපට ප්‍රශ්නයක් තිබෙනවා. අපේ ගම්වල ඉන්න අහිංසක දුප්පත් දරුවෝ තමයි පාරට බැහැලා අවි ආයුධ ටික අරගෙන හමුදාවට හා පොලීසියට ගැහුවේ. අපට රැකියා අර්බුදයක් තිබෙනවා. ඒ නිසා රැකියා අර්බුදයට උත්තර දෙන්න ඔබතුමන්ලා අපට ආයෝජන එවන්න" කියලා.

මේ ඇඟලුම් කර්මාන්තශාලා 200 පටන් ගත්තේ එහෙමයි. තමන්ට ආපු විනාශය සැපතක් බවට පත් කර ගත්තා ආර්. ප්‍රේමදාස මහත්තයා. තමුන්නාන්සේලා මොනවද කරන්නේ? ආපු විපත සැපත නොවෙයි, මුළු රටම විනාශ කරන තැනකට තමයි තමුන්නාන්සේලා ගෙනැල්ලා තියෙන්නේ.

මා අහනවා, මේ කොමිෂන් සභා වාර්තාව ආණ්ඩුවේ වාර්තාවක් කියලා ආණ්ඩුවට පිළිගන්න බැරි ඇයි කියලා. ආණ්ඩුව පත් කෙරුවේ; ආණ්ඩුව පිළිගත්තේ; ආණ්ඩුව මේවා ක්‍රියාත්මක කරනවායි කියලා කිව්වා. අද ජිනීවා මානව හිමිකම් කවුන්සලයේ ප්‍රධාන ප්‍රශ්නය තමයි වගවීම පිළිබඳ ප්‍රශ්නය. අද තිබෙන්නේ accountability එක පිළිබඳ ප්‍රශ්නයක්. ඒ නිසා මම කියනවා, ජාත්‍යන්තර කුමන්ත්‍රණ කියලා ලංකාවේ අද තමුන්නාන්සේලා කරලා තියෙන අපරාධවලින් බේරෙන්න හම්බ වෙන්නේ නැහැ කියන එක. මොනවාද අපේ ලංකාවේ මිනිස්සුන්ට කියන්නේ? බලන්න, Ramasamy Prabhakaran from Wellawatta who was taken into custody, kept and tortured for 28 months, was released. Fundamental Rights case එකක් දැම්මා ගිහිල්ලා. කවුද, රාමසාමි ප්‍රභාකරන්. මොකක්ද කෙරුවේ? මෙයා උසාවි යනකොට අරගෙන ගිහිල්ලා අතුරුදහන් කෙරුවා. අද සුදු වෑන්වලින් ඇවිල්ලා මර්වින් සිල්වා මහත්තයාගේ ළඟම මිනිස්සු ටික අරගෙන යනවා. සම්බන්ධීකරණ ලේකම් අමල් රොද්‍රිගු මහත්මයා අරගෙන ගියා. ඒ වාගේම ඩොනල්ඩ් මහත්මයාවත් අරගෙන ගියා. ඒත් එතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙක්. තව අනෙක් කට්ටියගේත් එක එක් කෙනා පැහැර ගෙන යනවා. යන්තම් ගිහිල්ලා වැදලා භාර ගන්නවා. ඇමතිවරුන්ගේ සම්බන්ධීකරණ ලේකම්වරුනුත් උස්සා ගෙන යනවා නම් මේ ආණ්ඩුවේ තව මොනවාද කථා කරන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව දෙදෙනෙක් වෙඩි තියා ගත්තා. භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මැතිතුමායි, දුමින්ද සිල්වා මැතිතුමායි. අද මොකක්ද ඒකට සිද්ධ වෙලා තියෙන්නේ? අඩුම තරමින් "B" Report එක ඉදිරිපත් කරලා නැහැ. ඒ "B" Report එකේ නැහැ, මේ වෙඩි තිබ්බ පුද්ගලයා කවුද කියලා හොයා ගන්න. දෙයියනේ! මේ රටේ ජනාධිපතිතුමාගේ වෘත්තීය සමිති ලේකම්ටත් බැරි නම් සාධාරණය ඉෂ්ට කර ගන්න රටේ ජනතාවට කොහෙද සාධාරණයක් තියෙන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් හලාවත මොකක්ද සිද්ධ වුණේ? දැන් මෙතුමා කියනවා, උතුරු නැගෙනහිර කවුරුවත් පාරට බැස්සේ නැහැයිලු. බහින්නේ නැහැ. බැස්සොත් වෙඩි තියනවා, හමුදාවෙන්. බොහොම පැහැදිලියි, තංගල්ලේ ධීවරයන්ට කියලා තිබුණා බැස්සොත් වෙඩි තියනවා කියලා. මිනිස්සු තමන්ගේ ජීවිතේ ගැන භයයි. අර හලාවත ධීවරයෝ ටික පහළට බැස්සා. මොකක්ද කළේ? හලාවත ධීවරයින්ට වෙඩි තිබ්බා. මා ළඟ තිබෙනවා හලාවත ධීවරයන්ට වෙඩි තියන photo එක. ඒ මැරුණු ධීවරයාගේ මව ගියා මිනිය බලන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුහුණ ප්‍රදේශයට තියාපු වෙඩිල්ල පිටිපස්සෙන් පදාසයක් කපා ගෙනයි එළියට ගිහින් තිබෙන්නේ. කවුද මේ වෙඩි තියන්න අණ දුන්නේ? වෙඩි තියන්න රටේ තිබෙන නීතිය මොකක්ද? රටේ එහෙම නීතියක් තිබෙනවාද, වෙඩි තියන්න පුළුවන් කියලා. නැහැ. එහෙම නීතියක් නැහැ. නීතිය උල්ලංඝනය කරලා තමයි ඒ වෙඩි තැබීම සිද්ධ කළේ. ඒකයි මම කියන්නේ. මේවා කරලා ජාත්‍යන්තර ප්‍රජාවට කෑ ගහලා වැඩක් නැහැ. වඩා වැදගත් වෙන්නේ මේවා කරපු පුද්ගලයන්ට විරුද්ධව අවශ්‍ය කරන කටයුතු ටික කරන එකයි. ඒකයි මම කියන්නේ. කරුණාකර, තේරුම් ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ධීවරයෝ පෙළපාළි ගියේ ඇයි? පෙළපාළි ගියේ ඔවුන්ට ජීවත් වෙන්න විධියක් නැති නිසා. ලෝකයේ පෙට්‍රල් මිල ඇමෙරිකානු ඩොලර් 98ට තියෙන කොට තමුන්නාන්සේලා මොනවාද කළේ? තමුන්නාන්සේලා වැඩි කෙරුවා පෙට්‍රල් මිල. ඒකේ ප්‍රතිඵලයක් විධියට ජීවත් වෙන්න බැරි මිනිස්සු පාරට බැස්සා. ඒක තමයි සිද්ධ වුණේ. එතකොට ඒ මිනිස්සුන්ට මොකක්ද තමුන්නාන්සේලා කළේ? වෙඩි තියලා මරා දමලා අන්තිමට යෝජනාවක් ගෙනාවා, සහනාධාර දෙන්න. මේ සහනාධාරය අනෙක් මිනිස්සුන්ටත් දෙන්න තිබුණා නේ. ඇයි,

[ගරු දයාසිරි ජයසේකර මහතා]

අනෙක් කට්ටියට දෙන්න බැරි වුණේ? සහනාධාර දෙන්න පුළුවන් කියන්නේ එහෙනම් යම් කිසි විධියකට ලාභයක් තියා ගෙන විකුණන නිසායි.

ගරු ඇමතිතුමනි, උදාහරණයක් විධියට ඔබතුමා කඩයක් කරනවා කියා හිතමු. සීනි කිලෝ එකක් රුපියල් 80යි. සමහර වෙලාවට ඔබතුමාගේ ලාභය තියෙන නිසා ඔබතුමා කියනවා 78ට අරගෙන යන්නය කියලා. ඇයි එහෙම අරගෙන යන්නය කියන්නේ? ලාභයක් තිබෙන නිසා. එහෙනම් තෙල්වලින් ආණ්ඩුවට ලාභයක් තිබෙනවා. ලාභයක් තිබෙන නිසා කියනවා, "හොඳයි, එහෙනම් පොඩි මිනිස්සුන්ට සහන දෙන්නම්" කියලා. දැන් බලන්න, මේක වුණාය කියලා භාණ්ඩවල මිල අඩු වෙලා තිබෙනවාද? නැහැ. සාමාන්‍ය පවුල්වල අහිංසක, දුප්පත් දරුවෝ යනවා පාසල් බස් රථයේ. පාසල් බස් රථයේ ගණන වැඩි කරලා ඉවරයි. බස් රථවල අයට රුපියල් 500ක සහනාධාරය දෙනවා. හැබැයි සහනාධාර දුන්නාය කියලා අර ගණන අඩු වෙන්නේ නැහැ. ධීවරයාට සහන දුන්නාය කියලා මාළු කිලෝ එකේ ගණන අඩු වෙන්නේ නැහැ. මාළු කිලෝ එකේ මිල තවත් වැඩි කරලා දෙනවා මිසක අඩු කරලා දෙන්නේ නැහැ.

දැන් ඊළඟට කිරි පිටි මිල වැඩි වෙනවා හෙට අනිද්දා වන කොට. අද රාත්‍රියේ වැඩි වෙනවා පාන්වල මිල. කවුද මේවාට වග කියන්නේ? තමුන්නාන්සේලා මෙතැන ඇවිල්ලා මේ දේවල් කළාම මේවාට විරුද්ධව පාරට බහිනවා මිනිස්සු. උද්ඝෝෂණ හැම තැනම. අපි කියලා නොවෙයි, මිනිස්සු පාරට බහින්නේ ස්වේච්ඡාවෙන්. ස්වේච්ඡාවෙන් පාරට බහින මිනිස්සුන්ට තමුන්නාන්සේලා අන්තිමට පාවිච්චි කරන්නේ දේශ ප්‍රේමය. සඳුදාට කුමන්ත්‍රණකාරයන්ට විරුද්ධව මිනිස්සුන්ව පාරට බස්සවන්නයි තමුන්නාන්සේලා හදන්නේ. සඳුදාට පාරට බහින හැම මිනිහෙකුටම මම කියනවා, "බෝඩ් දෙකක් අතේ තියා ගන්න" කියලා. එකක්, රටට එරෙහිව කටයුතු කරන ජාත්‍යන්තර ප්‍රජාවට, නැත්නම් ජාත්‍යන්තර කටයුතුවලට විරුද්ධව. අනෙක, රටේ ජාතික ධනය කොල්ල කන මේ කාලකණ්ණි ආණ්ඩුව ගෙදර යවන්න කියන බෝඩ් එක. ඒක අනෙක් අතේ තියා ගන්න. දෙකක් අතේ තියා ගෙන උද්ඝෝෂණය කළ හැකියි. කිසි ප්‍රශ්නයක් නැහැ. දෙකම අතේ තියා ගන්න. [බාධා කිරීම්]

අද තමුන්නාන්සේ මෙතැන දී මෙම යෝජනාව ඉදිරිපත් කළා. මේ යෝජනාව ඉදිරිපත් කරන කොට අඩුම තරමින් ඒක ස්ථිර කරන්නවත්, මහ ලොකු තුනෙන් දෙකේ බලයක් තිබෙන ආණ්ඩුවේ එක මන්ත්‍රීවරයෙක් මේක ඇතුළේ නැහැ. තමුන්නාන්සේ ජනාධිපතිතුමාට ආවඩන්න මේවා ගෙනැල්ලා ඉදිරිපත් කරනවා. පන්සියයක් විතර ගෙනැල්ලා මේක ඇතුළේ ඉන්දවන්නකෝ. ගෙන්වා ගන්න විධියක් නැහැ. කවුරුවත් නැහැ. ඒකයි මම කියන්නේ. ලජ්ජයි, තමුන්නාන්සේට. ඒ නිසා මම බොහොම පැහැදිලිව කියනවා - [බාධා කිරීම්] මේ ආණ්ඩුවට එරෙහිව අද මිනිස්සු පාරට බහිනවා.

අද මේ ආණ්ඩුව තනිවම සොරා කන තැනට වැටිලායි තිබෙන්නේ. ඒ නිසා අහිංසක දුප්පත් මිනිස්සු - [බාධා කිරීම්] තමුන්නාන්සේ තුනෙන් දෙකක බලයක් තිබෙන ආණ්ඩුවක මන්ත්‍රී කෙනෙක්. අපිට ඉන්නේ 43යි. තමුන්නාන්සේලාගේ තුනෙන් දෙකටම එන්න කියන්න, තනිවම - කවුරුවත් නැතිව- විවාදය කරන්න, තමුන්නාන්සේලාට විරුද්ධව කථා කරන්න මට හැකියාවක් තිබෙනවා. තමුන්නාන්සේලාගේ තුනෙන් දෙකත් නැහැ. ඉන්න මිනිස්සුත් නැහැ. අනේ දෙවියනේ, අපේ අතාවුද සෙනෙවිරත්න ඇමතිතුමා ඉන්න නිසා යන්තම් බේරා ගන්න පුළුවන් වුණා. නැත්නම් ඒකත් නැහැ. යන්තම් අද එතුමා ඒකට පිළිතුරක් දෙන්න සූදානම්. මම තමුන්නාන්සේට කියනවා, අපේ 43ම ඕනෑ නැහැ, විපක්ෂයේ එක්කෙනෙක්වත් ඕනෑ නැහැ. තමුන්නාන්සේලාගේ තුනෙන් දෙකම ගෙනැල්ලා ඉන්දවන්න, තමුන්නාන්සේලාත් එක්ක මම කථා කරන්නම්. එහෙම හයියක් අපට තිබෙනවා. මේවා මතක තියා ගන්න. හොරකම් කරලා- [බාධා කිරීම්]

අද මොනවා කියලාද මිනිස්සු ගම්වල බැනර් ගහලා තිබෙන්නේ? "තෙල් මිල ඉතිහාසයේ නොවූ විරූ අයුරින් වැඩි කරමින් ආශ්චර්ය සඳහා යන මෙම ගමනට අතිගරු ජනාධිපතිතුමා ඇතුළු රජයට අපගේ ගෞරවණීය ස්තුතිය." ලජ්ජයි. කවුරුවත් මේවා ඉරන්නේත් නැහැ. තියා ගෙන ඉන්නවා. තමුන්නාන්සේලා තෙල් මිල වැඩි කරලා මිනිස්සුන්ගේ බඩට ගහලා දැන් ජාත්‍යන්තර ප්‍රජාවගේ, ජාත්‍යන්තර කුමන්ත්‍රණකාරයන්ගේ කාරණා අර ගෙන ඇවිල්ලා, රටේ ජනතාව පාරට බස්සලා ඒක නතර කරන්න හදන්නේ. ඒකයි අද තිබෙන ප්‍රශ්නය. ජාත්‍යන්තර විධියට වැඩ කළා නම්, රාජ්‍ය තාන්ත්‍රික විධියට වැඩ කළා නම් ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේ ප්‍රශ්නය බේරා ගන්න තිබුණා, එතැන. අද සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද?

බලන්න, අද මිනිස්සු අහන කථා මම මේ කියන්නේ.

"ලයිට් බිල වැඩි කරන්න නම් මොකටද, කුකුළේ ගහ බලාගාරය?", "වාහන එළියට ගන්න බැරි තරම් පෙට්‍රල්, ඩීසල් මිල වැඩි නම් මොකටද highway?", "අවුරුදු දෙකක් තිස්සේ එක නැවක්වත් ආවේ නැත්නම් මොකටද වරායක්?", "Open කළාට පස්සේ එක නාට්‍යයක්වත් පෙන්නුවේ නැත්නම්, මොකටද නෙළුම් පොකුණු?", "එක වැස්සකට මුළු කොළඹම යට වෙනවා නම් මොකටද කැටයම් දාපු පාරවල්?" [බාධා කිරීම්] "එල්ටීටීඊකාරයෝ පාර්ලිමේන්තු යවලා වීරයෝ හිර ගෙට යවන්න මොකටද යුද්දෙ දිනුවේ?", "ඊළාම් වෙනුවට Thirteen Plus දෙනවා නේ. මොකටද දහස් ගණන් යුද සෙබළු මරා ගත්තේ?", "වෙලාවට A/L ප්‍රතිඵල නිවැරදිව දෙන්න බැරි නම් මොකටද අධ්‍යාපන ඇමතිවරු හතර දෙනෙක්?", "සල්ලිවලට උපාධි ගන්න පුළුවන් නම් මොකටද ආයෙත් Z-score එකක්?", "ඇමෙරිකාවේ තෙල් මිල වැඩි වන කොට මෙහෙත් වැඩි වෙනවා නම් මොකටද මහත්තයෝ අපට ආණ්ඩුවක්?" මෙහෙමයි මිනිස්සු අහන්නේ. අපි නොවෙයි. මේවා තමයි අද ආණ්ඩුවට තිබෙන චෝදනා.

අද ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමාව හිර කෙරුවා. අද ඇමෙරිකානු ආණ්ඩුවේ පළමුවැනි කාරණය මොකක්ද? එතුමන්ලා කියනවා, ජනරාල් සරත් ෆොන්සේකා මහත්තයා කියන්නේ දේශපාලන හිරකාරයෙක් කියලා. තමුන්නාන්සේලා දේශපාලන හිරකාරයෙක් විධියට ජනරාල් සරත් ෆොන්සේකා මහත්තයාව ඇතුළේ තියා ගෙන දැන් කථා කරනවා.

මම දැක්කා ඊයේ විමල් වීරවංශ මහත්තයලා, චම්පික රණවක මහත්තයලා ලජ්ජා නැතිව රූපවාහිනිය ඉස්සරහට ඇවිල්ලා කථා කරනවා. මොකක්ද ඒ අය කියන්නේ? අපේ යුද වීරයෝ කවුරුවත් ජාත්‍යන්තර අධිකරණය ඉදිරියට ගෙන යන්න දෙන්නේ නැහැයි කියනවා. හැබැයි, තමුන්නාන්සේලා ජනරාල් සරත් ෆොන්සේකා මහත්තයාව අමු අමුවේ හිරකාරයෙක් විධියට ඇතුළට දමලා තිබෙනවා. ඒවා කරන්න හොඳයි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අධිකරණයේ තීන්දුවක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒවා කරන්න හොඳයි. රටේ ආණ්ඩුව තමයි අද ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමාව හිරේ දමලා එතුමාව ජීවිතාන්තය දක්වා

හිරේ තියා ගන්න හදන්නේ. පොහොය දවසට කුඩුකාරයෝ, ගංජාකාරයෝ, නම් නැති මිනිස්සු ඔක්කොම එළියට යවනවා. එහෙම එළියට යවන ආණ්ඩුවක් මේක. [බාධා කිරීම්] වෙසක් පොහොය දවසට කුඩුකාරයෝ, ගංජාකාරයෝ ඔක්කොම එළියට යවනවා. රට බේරා ගත්ත ජනරාල් සරත් ෆොන්සේකා මහත්තයා අද ඇතුළේ තියා ගෙන ඉන්නවා. ජිනීවා මානව හිමිකම් කවුන්සිලයට ගිහිල්ලා අන්න ඒවා කථා කරන්න. අද තමුන්නාන්සේ කෙළින් කටින් ඉන්නේ ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමන්ලා කරපු යුද්ධයේ ප්‍රතිඵලයක් විධියටයි. නැත්නම් ඇමතිවරු පාර්ලිමේන්තුවෙන් යන කොට මොකා ඇවිල්ලා වෙඩි තියයිද කියලා පපුව ගැහෙනවා. අන්න ඒක නැති කරලා දුන්නේ ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමායි. ඒ නිසා සරත් ෆොන්සේකා මැතිතුමාව එළියට දමලා නැවත රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන බවට තමුන්නාන්සේලා හෙට අනිද්දා ගිහිල්ලා කථා කරන්න. තමුන්නාන්සේ මෙතැන ඇවිල්ලා මොනවා කථා කළත් එතැනින් පස්සේ සිද්ධ වන්නේ අන්න ඒකයි. තමුන්නාන්සේලා ඔප්පු කරලා පෙන්නුවේ තවදුරටත් අපේ රටේ අහිංසක දුප්පත් මිනිහාට සහනාධාර දෙන්න ලැහැස්ති නැහැයි කියන එකයි. ඒකයි කිව්වේ එළියට බැස්සොත් වෙඩි තියනවා කියලා. ඒක නිසා තමයි එළියට බැස්ස මිනිස්සුන්ට වෙඩි තිබ්බේ. මේ විධියට මිනී පෙන්වලා ජාත්‍යන්තර ප්‍රජාවට කථා කරන්න පුළුවන්ද? අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කරනවා.

අපේ මිනිස්සුන්ට අද පාරට බහින්න බැහැ. මේ අවුරුද්දේ පෙබරවාරි 04 නොවෙයි, ගිය අවුරුද්දේ පෙබරවාරි 04 අපි රටේ නිදහස නැහැයි කියලා රාත්‍රී කාලයේ උද්ඝෝෂණ ව්‍යාපාරයක් තිබ්බා. අපේ ගරු අතාවුද සෙනෙවිරත්න මැතිතුමා කියන්නේ හොඳ සටන්කාමී පුද්ගලයෙක්. ඔවුන් තමන්ගේ දේශපාලන ව්‍යාපාරය වෙනුවෙන් තමන්ගේ ලේ, දහඩිය, කඳුළු හෙළපු නායකයෝ. අන්න ඒ වාගේ අපිත් කල්පනා කළා, නිදහසක් නැති රටට නිදහසක් නැහැයි කියලා පෙන්වන්න. ඒ සඳහා අපි රාත්‍රී කාලයේ vigil එකක් කළා. මොකක්ද කළේ? ඒකට ඇවිල්ලා පහර දුන්නා; අපේ වාහන කුඩු කළා. ඒකට අවශ්‍ය කරන අපරාධකාරයෝ ටික හොයා ගන්න මේ වන තුරු තමුන්නාන්සේලාට පුළුවන් වුණාද? නැහැ, අපරාධකාරයෝ අරගෙන ගිහිල්ලා තමුන්නාන්සේලාගේමකට්ටිය මරනවා. ඒකයි මම කිව්වේ.

නේව් රුවන්ලා අපේ vigil එකට ගැහුවා; නේව් රුවන්ට වෙච්ච දෙයක් නැහැ. කරාටේ ධම්මික අපේ vigil එකට ඇවිල්ලා ගැහුවා; වෙච්ච දෙයක් නැහැ. ස්වාභාවිකව ඒ ගොල්ලන්ට ඒක පළ දීලා තිබෙනවා. තමුන්නාන්සේලා වෙනුවෙන් ගිහිල්ලා මැර වැඩ කරලා අපේ වාහන කුඩු කරපු මිනිස්සු තමුන්නාන්සේලාගේම ආණ්ඩුව අද අරගෙන ගිහිල්ලා වෙඩි තියලා මරලා දානවා. මම කියන්නේ ඒකත් වැරදියි කියලායි. මර්වින් සිල්වා මැතිතුමන්ලා තමයි ඒ පහර දීමට නායකත්වය දුන්නේ. අද මොකද වෙලා තිබෙන්නේ? ඔය පහරදීම්වලට දුමින්ද සිල්වා මැතිතුමන්ලා නායකත්වය දුන්නා. මොකද වුණේ? අද මේ ආණ්ඩුව යටතේ ඒ ගොල්ලන්ට අත් වෙලා තිබෙන ඉරණම ගැන අපි කනගාටු වනවා. මම කියන්නේ ඒකයි, ලංකාව ඇතුළේ ප්‍රජාතන්ත්‍රවාදය නැහැ කියලා. නිකම් සාමාන්‍ය උද්ඝෝෂණයකට කඳුළු ගෑස් ගෙනැල්ලා පහර දෙනවා. අද කන්න විධියක් නැහැ. සීනිවල මිල ගණන් ගිහිල්ලා; පිටිවල මිල ගණන් ගිහිල්ලා; පාන්වල මිල ගණන් ගිහිල්ලා. බඩුවල මිල ගණන් ගිහිල්ලා තියෙන වෙලාවේ මිනිස්සු පාරට බහින කොට තමුන්නාන්සේලා මිනිස්සුන්ට කඳුළු ගෑස් ගහනවා. කඳුළු ගෑසුත් නොවෙයි, ඒවා පොටෑසියම් අඩංගු කඳුළු ගෑස්. තමුන්නාන්සේලා ලංකාවට ඒවා ආනයනය කරන්න ආපසු වැඩ පිළිවෙළ ගෙනැල්ලා තියෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක නිසා මම කියනවා, මේ කුමන්ත්‍රණය ජාත්‍යන්තර ප්‍රජාව ආණ්ඩුවට එරෙහිව ඉදිරිපත් කරන එකක් මිස රටට එරෙහි එකක් නොවෙයි කියලා. රටට එරෙහිව ජාත්‍යන්තර කුමන්ත්‍රණ කළොත් අපි පාරට බහින්න සූදානම්. මේක ආණ්ඩුව තමන්ගේ අමන, මෝඩ තකතීරුකම නිසා ඇති කර ගත්ත කුමන්ත්‍රණයක් මිසක රටට විරුද්ධ කුමන්ත්‍රණයක් නොවෙයි. රටට විරුද්ධ කුමන්ත්‍රණයේදී අපි කෙළින් එකා වාගේ මැරෙන්න හෝ ජාත්‍යන්තර ප්‍රජාවට විරුද්ධව එළියට බහින්න සූදානම්. විපක්ෂය මර්දනය කරලා, හාමුදුරුවන්ට කඳුළු ගෑස් ගහලා, අහිංසක දුප්පත් මිනිස්සුන්ට වෙඩි තියලා මරලා දාලා, ධීවරයින්ට වෙඩි තියලා මරලා දාලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කරලා රට විනාශ කරන්න හදන ඒ අමන, තකතීරු වැඩේ කරලා ජාත්‍යන්තර ප්‍රජාවෙන් බැණුම් අහනවා නම් ඒක බලා ගන්න ඕනෑ, ආණ්ඩුවයි. අපි නොවෙයි. ඒ සඳහා අපි සූදානම්, රට ඇතුළේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න. එතකොට බැන් කී මූන්ට නොවෙයි; ඇමෙරිකාවට - USA - නොවෙයි; බ්‍රිතාන්‍යයට නොවෙයි; කාටවත් ලංකාවට අත තියන්න බැහැ. රට ඇතුළේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න; රට ඇතුළේ පොලිස් කොමිසම හදන්න; රට ඇතුළත ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කරන්න; රාජ්‍ය සේවය ස්වාධීන කරන්න; දෙමළ ජනතාවට තමන්ට නිවැරදිව ජීවත් වෙන්න පුළුවන් බලය බෙදීමේ ක්‍රියාදාමයක් කරන්න.

තමුන්නාන්සේලා ගිහිල්ලා ඉන්දියාවට එකක් කියනවා. පහුවදා උදේ ඇමෙරිකාවට තව එකක් කියනවා. පහුවදා උදේ බ්‍රිතාන්‍යයට තව එකක් කියනවා. මේක තමයි තමුන්නාන්සේලාගේ ක්‍රියාකාරකම. ඒ නිසා මම බොහොම පැහැදිලිව කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාත්‍යන්තර කුමන්ත්‍රණ, ජාත්‍යන්තර බලවේග ආදී විවිධ කටයුතුවලදී අපි එකා වාගේ වැඩ කරන්න ඕනෑය කියලා. හැබැයි ආණ්ඩුව කරන අමන වැඩවල ප්‍රතිඵලයක් හැටියට ජාත්‍යන්තර කුමන්ත්‍රණ එනවා නම් අපි ආණ්ඩුවට බොහොම පැහැදිලිව කියනවා, "කරුණාකරලා රට ඇතුළේ තියෙන තත්ත්වය තේරුම් අරගෙන වැඩ කරන්න" කියලා. රටේ ජනතාව පාරට බහින්නේ ඇයි කියලා තේරුම් ගන්න කියලා ගෞරවයෙන් ඉල්ලනවා. මේ යෝජනාව ගෙනාපු අපේ ගරු අජිත් මැතිතුමාට මම ඉතාම ගෞරවයෙන් කියනවා, මේ යෝජනාව පොඩ්ඩක් වෙනස් කරලා නැවත ඉදිරිපත් කරන්න කියලා. ජාත්‍යන්තර ප්‍රජාවේ එන ගැටුම්වලට විසඳුම් දෙන්න ඕනෑ, සංවර්ධන වැඩ පිළිවෙළවල්වලින් නොවෙයි කියලා ප්‍රකාශ කරමින් ඔබතුමා මේ යෝජනාව ගෙනාපු එකට මගේ ස්තුතියත්, ගෞරවයත් පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා (ග්‍රාමීය කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - கிராமிய அலுவல்கள் அமைச்சர் )

(The Hon. Athauda Seneviratne - Minister of Rural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාත්‍යන්තර කුමන්ත්‍රණයක් පටන් ගත්තේ මේ හෙට අනිද්දා ඉදිරිපත් කිරීමට නියමිතව තිබෙන යෝජනාවෙන්ම නොවෙයි. ඒ කියන්නේ ජිනීවාවල තියෙන මේ යෝජනාව නිසාම නොවෙයි. මීට පෙර වුණු සිද්ධියක් තමුන්නාන්සේලාට උදාහරණයක් හැටියට කියන්න පුළුවන්. ඇමෙරිකාවේ රාජ්‍ය ලේකම්වරිය එක අවස්ථාවක ප්‍රකාශ කළා, ලංකාවේ සොල්දාදුවන් කාන්තාවන් දූෂණය කළාය කියලා. ඒක බරපතළ චෝදනාවක්. මේ රටට රට හැටියට, හමුදාවට, ආණ්ඩුවට මේ ඔක්කොටම කරපු බරපතළ අපහාසයක්.

ඒ අවස්ථාවේදී ජනාධිපතිතුමා ඒක ප්‍රතික්ෂේප කරලා කිව්වා, "මේක ඉල්ලා අස් කර ගන්න" කියලා. දවස් තුනකට පස්සේ එතුමිය ඒක ඉල්ලා අස් කර ගත්තා. ජනාධිපතිතුමා කිව්වා, "හමුදාවේ වුණත්, පොලිසියේ වුණත්, ඒ වාගේම සිවිල් වැසියෙක් වුණත් වැරැද්දක් කෙරුවොත්, ඒ ගැන පරීක්ෂා කරලා, අවශ්‍ය නඩු පවරලා දඬුවම් කරනවා" කියලා. එතුමිය ඒක ඉල්ලා අස් කර ගත්තා.

[ගරු අතාවුද සෙනෙවිරත්න මහතා]

පසු ගිය දා එතුමිය ඉන්දියාවට ආවා. ඇවිල්ලා එතුමිය ඉන්දියාවේ අගමැතිතුමා හම්බ වුණා. හම්බ වෙලා එතුමාටත් කිව්වා, "ලංකාවට බලපාන්න, ලංකාවට බලපෑම් කරන්න, ලංකාවට සුදුසු, ඒ විධියේ බලපෑම් කිරීම සඳහා ඉදිරිපත් වෙන්න" කියලා. එහෙම කියලා එතුමිය දකුණු ඉන්දියාවට ගියා. දකුණු ඉන්දියාවට ගිහින් එතුමිය ජයලලිතා මහත්මිය හම්බ වෙලා කිව්වා, " ලංකාවට -ඒ දේශපාලනයට- බලපෑම් කරන්න" කියලා. මේ විධියට කථා කරලා එතුමිය ගියා. එහෙම ඒ අය පිට රටින් ඇවිල්ලා ඉන්දියාවේ අගමැතිතුමාත් හම්බ වෙලා පහළට ඇවිල්ලා ජයලලිතා මහත්මියත් හම්බ වෙලා ඒ විධියට කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්වය තුළ එහෙම යන කොට, පසු ගිය දා රොබට් ඕ. බ්ලේක් හිටපු තානාපතිතුමා ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ තවත් සහකාර ලේකම්වරුත් සමඟ ලංකාවට පැමිණිලා ප්‍රකාශ කෙරුවා, "අප ජීනීවාවල ඉදිරිපත් කරන යෝජනාවට සහයෝගය දෙනවා, කොටස්කාරයෝ වෙනවා" කියලා. ඔවුන් එහෙම කථා කළා. [බාධා කිරීමක්] ඉතින් දයාසිරිත් නැහැ; සිරිත් නැහැ; දයාත් නැහැ; මොකුත් නැහැ. එතුමා කථා කරලා මේ ගරු සභාවේ ඉන්නේ නැතිව යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අනුව මම මතක් කරන්නේ මේකයි. මේ ලෝකයේ ප්‍රධානම රටක් තමයි ඇමෙරිකාව. ඔවුන් ලංකාව ගැන මේ වාගේ ආකල්පයක් ඇති කරගෙන කටයුතු කරමින් එක්සත් ජාතීන්ගේ සංවිධානයට බලපෑම් කරනවා. ඒ බලපෑම් අනුව තමයි බැන් කී මූන් කොමිටියක් පත් කෙරුවේ, එතුමාට ඒ කරුණු හදාරන්න. ඒක එක්සත් ජාතීන්ගේ මණ්ඩලය පත් කරපු එකක් නොවෙයි, බැන් කී මූන් මහත්තයා මේ පිළිබඳව පෞද්ගලික වශයෙන් කරුණු සොයා බලන්න පත් කරපු Commission එකක්. ඒකෙන් තමයි දරුස්මාන් වාර්තාව ඉදිරිපත් කළේ. ඒ දරුස්මාන් වාර්තාව කවුරුවත් පිළිගත්තේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් මේකෙන් මතයක් ඇති කරන්න උත්සාහ කෙරුවා. මොකද ආණ්ඩුවට විරුද්ධව, ලංකාවට විරුද්ධව ජාත්‍යන්තර තලයේ සහයෝගය අරගෙන, ලංකාවට කිසි යම් රිද වීමක්, ලංකාවට කිසි යම් පහර ගැහීමක් කරන්න පාර කපා ගන්න. ඒ එක පැත්තකින් සිදු වෙච්ච දේවල්. තවත් පැත්තකින් තමුන්නාන්සේලා දන්නවා එක්සත් ජාතීන්ගේ මණ්ඩලය පත් කර තිබෙන මානව හිමිකම් Commission එක ඉදිරියේ දැනට අවුරුදු එකහමාරකට විතර පෙර -මට හරියටම දිනය මතක නැහැ- ලංකාවට විරුද්ධව යෝජනාවක් ගෙනාපු බව. ඒ ගෙනාපු යෝජනාව පරාජය කර ගන්න අපට ශක්තිය ලැබුණා. එහිදී අපට ඡන්ද 29ක් ලැබුණා. අනික් පැත්තට ඡන්ද 12ක් ලැබුණා. එක්සත් ජාතීන්ගේ මණ්ඩලය තුළ මේක රහසක් නොවෙයි. එක්සත් ජාතීන්ගේ මණ්ඩලය තුළ යුරෝපයේ සමහර රටවල් එකතු වෙලා ලංකාවට විරුද්ධව මෙහෙය වීමක් තිබෙනවා; ක්‍රියාකාරකමක් තිබෙනවා. ඒ අනුව අප තේරුම් ගත යුතුව තිබෙනවා මොකටද මේවා හොයන්නේ, මොකටද මේවා කරන්න යන්නේ කියලා. මේ කරන්න හදන්නේ මේකයි. ලංකාව කොටි පරාජය කරන්න කටයුතු කරගෙන යන වෙලාවේ සමහර රටවල් ලංකාවට බලපෑම් කෙරුවා.

අවසාන මොහොතේත් බලපෑම් කෙරුවා, යුද්ධය නතර කරන්න කියලා. යුද්ධය නතර කරන්න කියලා ජනාධිපතිතුමාට පවා බලපෑම් කෙරුවා, අවසාන මොහොත දක්වා. යුරෝපයේ රටවලට ඕනෑ කරලා තිබුණේ මොකක් කරන්නද? ඒ අයට ඕනෑ කරලා තිබුණේ මේ රටෙන් කොටසක් කඩලා වෙනම රාජ්‍යයක් හැටියට කොටින්ට දෙන්නයි. වෙනම රාජ්‍යයක් හදලා දීමේ පදනම යටතේ ඒ අයට ඕනෑ කරලා තිබුණේ මොකක්ද? ඒ අයට ඕනෑ කරලා තිබුණේ ඒ හරහා දකුණු ඉන්දියාවත් කඩන්නයි. දකුණු ඉන්දියාවේත් ද්‍රවිඩ ජනතාව ඉන්නවා කෝටි හතක් විතර. මේ රටෙන් කෑල්ලක් කඩලා වෙනම රාජ්‍යයක් හදලා දුන්නොත් කොටි සංවිධානයට ලැබෙනවා ස්වාධීන රාජ්‍යයක්. ඒ රාජ්‍යයෙන් ලැබෙන උදවු පදවු අනුව දකුණු ඉන්දියාවත් කැඩෙන විධියට වැඩ කටයුතු සලස්වන්නයි ඒ අයට ඕනෑකම තිබුණේ.

යුරෝපය එදා ඉඳලාම කැමැති නැහැ ඉන්දියාව මහා රටක් වෙනවාට. ඉන්දියාව ලෝක බලවතකු වනවාට යුරෝපය කැමැති නැහැ. ඒ නිසා ඉස්සර ඒ අය පාකිස්ථානය හරහා උදවු කළා West Punjabවලට හෙවත් බටහිර පන්ජාබයට. අර තලප්පාව බැඳ ගත්තු ජනතාව ඉන්න රටට පාකිස්ථානය හරහා උදවු කරලා වෙනම රටක් හදන්න යුද්ධ කළා. ඒවා දිනුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කොටින්ට යමක් බෙදලා දෙන්න එකඟ වෙච්ච නායකයෙක් අපේ රටේ ඉන්නවා. එතුමා තමයි යුරෝපයේ බලපෑමට යට වෙලා කොටින්ගේ පාලන ප්‍රදේශ, ආණ්ඩුවේ පාලන ප්‍රදේශ කියලා උතුරු නැඟෙනහිර පළාත බෙදුවේ. එහෙම බෙදලා ගිවිසුමක් අත්සන් කළා. ඒ ගිවිසුම කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළේත් නැහැ, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේත් නැහැ, ඒ කාලයේ හිටපු ජනාධිපතිනියට ඉදිරිපත් කළේත් නැහැ. උතුරට ගිහිල්ලායි ඒ ගිවිසුම අත්සන් කළේ. උතුරට ගිහිල්ලා, කොටි නායකයා එක්ක එකතු වෙලා ඒ ගිවිසුම අත්සන් කළා නම් ඒත් කමක් නැහැ. කොටි නායකයා එක්කත් නොවෙයි ඒක අත්සන් කළේ. එතුමා ඒ ගිවිසුමකට වෙනම අත්සන් කළා උතුරට ගිහින්. ඒකට උතුරට යන්න ඕනෑ නැහැ, මෙහේදීම අත්සන් කරන්න තිබුණා. එහෙම ගිවිසුමක් අත්සන් කරලා පළාත බෙදලා දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඒ පළාතට අපි කාටවත් යන්න බැරි වුණා. ඒත් ඒ පළාතේ අයට මෙහාට එන්න පුළුවන් වුණා. ඒ පළාතේ අයට ශක්තියක් දුන්නා යුරෝපයේ රටවල බලපෑමට යට වෙලා. ඒ අයගේ හඬට ඉඩ දීලා මේ රට කඩන තැනට ගෙනෙන්න කටයුතු කළා. ඒ අනුව ඒ අයට ආයුධ ගෙනෙන්න පුළුවන් වුණා; ලොකු ආයුධ, පොඩි ආයුධ ගෙනෙන්න පුළුවන් වුණා. ආයුධ ගෙනැල්ලා වළ දැම්මා, සුදුසු වෙලාවට අර ගෙන පාවිච්චි කරන්න. ඔවුන්ගේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර ගන්නයි ඒවා කළේ. මායිම් ලකුණු කරලා බෙදා වෙන් කර දීපු නිසා ඒ පැත්තට අපේ කාටවත් යන්න බැරි වුණා. හමුදාවට යන්න බැහැ; පොලීසියට යන්න බැහැ; කාටවත් යන්න බැහැ. ඒ පැත්තට යන්න අවසරයක් නැති වුණා. හැබැයි, එහේ සිට මෙහාට එන්න ඕනෑම කෙනකුට අවසර තිබුණා.

ඒ විතරක් නොවෙයි, ඒ අය ඒ ගිවිසුමේ කොන්දේසිත් නොයෙක් වර කැඩුවා. එහෙම කඩලා තියෙද්දීත් ඒ ගිවිසුම වෙනස් කිරීමට ශක්තියක් තිබුණේ නැහැ, යුරෝපයේ, ලෝක බලවතුන්ගේ වුවමනාව ඉෂ්ට කරන්න ඕනෑ කරන නිසා. අවසානයේදී අපි කොටි ත්‍රස්තවාදීන් පරාජය කරපු එක ගැන සමහර රටවල් කිසිසේත් කැමැති නැහැ. යුරෝපයේ සමහර රටවල් ඒකට කැමැති නැහැ. ඒ කැමැති නැතිකම නිසා අපේ රට අවුස්ස අවුස්සා පොටක් සොයා ගන්න පුළුවන්ද කියලා දැන් ඒ අය බලනවා.

ෆොන්සේකා මහත්මයා පිළිබඳවත් නඩුවක් ගියා නේ. ත්‍රස්තවාදීන් සුදු කොඩි ඔසවා ගෙන ආවා; සාමයට කැමැති වුණා; යටත් වුණා; නමුත් ඒ අය මැරුවා කියන කථාවක් ගෙන යනවා නේ. ඒ වාගේ කරුණු සොයා ගන්න ඒ රටවල් උත්සාහ කරනවා. ඒ කරුණු සොයා ගෙන අපට විරුද්ධව ජාත්‍යන්තර අධිකරණයේ නඩුවක් පවරන්න පුළුවන්ද කියලා බලනවා. තවම ඒ උත්සාහය දරනවා. ඒ උත්සාහය අත් හැරලා නැහැ. ඒ කාර්යය ඉෂ්ට කර ගන්න, එය ක්‍රියාවට නඟා ගන්න උත්සාහ කරනවා මානව හිමිකම් කොමිසම හරහා. මේක රහසක් නොවෙයි. එක සැරයකුත් ගෙනාවා ඒ වාගේ යෝජනාවක්. එය ඡන්ද 17කින් පරාද වුණා. දැන් තවත් සැරයක් යෝජනාවක් ගෙනෙන්න හදනවා. තවත් ඒ

ගැන සාකච්ඡා කරනවා. මේ අභියෝගය අපට තිබෙනවා. ලංකාවට එරෙහි මේ කුමන්ත්‍රණය තවම තිබෙනවා.

ඒ කුමන්ත්‍රණය මොකක්ද? අර අපේ ශවේන්ද්‍ර සිල්වාට නඩුවක් දැම්මා. ඒකට කරන්න දෙයක් නැහැ කියලා ඒ නඩුව උසාවියෙන් ප්‍රතික්ෂේප වුණා. දැන් හමුදාවේ හිටපු ඒ අය පිටරට ඉන්න වෙලාවේ නඩු දමන්න උත්සාහ කරනවා. මේ රටේ ඉන්න අයට නඩු දමන්න බැහැ නේ. ඒ විධියට එක එක්කෙනා අල්ලාගෙන එහෙම ක්‍රියා කරන්නත් උත්සාහ කරනවා. ඒ අනුව අපට විරුද්ධව මහා කුමන්ත්‍රණයක් තිබෙනවා.

ත්‍රස්තවාදය පැවැති කාලයේ මේ රටින් පැන ගිය පිරිසක් ඉන්නවා. ඒ අය දෙමළ ඩයස්පෝරාවේ වෙන්නත් පුළුවන්; වෙනත් අය වෙන්නත් පුළුවන්. ඒ අය හොයා ගත්තු මිල මුදල් තිබෙනවා. සමහර රටක ඒ ජනතාව ලක්ෂ ගණනක් ඉන්නවා. සමහර රටවල පනස් දහසක් විසිපන් දහසක් ඉන්නවා. එහෙම ඉන්න අයගෙන් එකතු වුණු විශාල මුදල් ප්‍රමාණයක් තිබෙනවා. ඒ සමහර රටවල දේශපාලනඥයන්ටත් මේ මුදල් දීලා, උදව් පදව් කරලා ඒ අයගේ දේශපාලනයට මේ අය සහයෝගය දීලා තිබෙනවා. ඒ වාගේම සමහර රටවල නීතිය අනුව යම් යම් අයට ඡන්ද බලය ලැබෙනවා; පුරවැසිකම ලැබෙනවා. ඒ නිසා මන්ත්‍රීවරු පත් කර ගන්න -සුදු මන්ත්‍රීවරු පත් කර ගන්න- මේ අයගේ ඡන්දත් ඕනෑ කරනවා. ඒ විධියට මේ අයගේ සල්ලිත් යොදා ගන්නවා; ඡන්දත් යොදා ගන්නවා. ඒ වෙනුවෙන් යම් කිසි පිරිසක් පෙනී සිටිනවා. නැවත මේ රටට එන්න බැහැ, ඒ රටේ මෙහෙමයි, මේ විධියට මරලා තිබෙනවා කියලා ඒ රටවල අය අවුස්සලා ඒ රටවල සහයෝගය ගන්න උත්සාහ කිරීමකුත් එක පැත්තකින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ රට තුළත් යම් යම් අයට ඒ විධියට කටයුතු කරන්න ඕනෑ කරලා තිබෙනවා. මේ රටට ප්‍රජාතන්ත්‍රවාදය ඕනෑකමකට නොවෙයි ඒ අය එහෙම කරන්නේ. අද කථා කරන මේ යූඑන්පී එකේ අයගේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන අපට කියන්න පුළුවන්. රිචඩ් ද සොයිසා වාගේ අය මරලා දමපු ඒවා, මාධ්‍යවේදීන් මරලා දමපු ඒවා, බින්න බැස්සා වාගේ රනිල් වික්‍රමසිංහ මහත්මයා බටලන්දේ පදිංචි වෙලා හිටපු ඒවා, කැලණියේ වධකාගාරයේදී මරාපු ඒවා ප්‍රසිද්ධ කාරණා. ඒවාට නඩු නැහැ. ඒ කාලයේ කොල්ලෝ කෙල්ලෝ මර මරා පාර දිගට දැම්මා.

ඒ කාලයේ හිටපු එක ආරක්ෂක ඇමති කෙනකුට මම කිව්වා, "මෙහෙම පාරවල් දිගට මරලා දමන්න එපා" කියලා. එතකොට එතුමා කිව්වා,"අපි මේවා අපි කරන්නේ ඊශ්‍රායලය කරනවා වාගේ. ඒවා දැකපුවාම කොල්ලෝ කෙල්ලෝ මේ ක්‍රියාවලට එන්න භය වෙනවා. ඒක නිසා මෙහෙම මරලා දමනවා" කියලා. අන්න එහෙමයි එක්සත් ජාතික පක්ෂය ක්‍රියා කරලා තිබෙන්නේ.

නඩුකාරයන්ගේ ගෙවල්වලට ගල් ගහපු වෙලාවේ, ඒ ගැන විවේචනයක් කරන කොට ජේ.ආර්. ජයවර්ධන කිව්වා, "නඩුකාරවරුන්ගේ ගෙවල්වලට ගල් ගහන්න පුළුවන් තරමට දැන් ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙනවා. කොච්චර හොඳ ප්‍රජාතන්ත්‍රවාදයක්ද?" කියලා.

උද්සෝෂණයක් කරන එක, පෙරහැරක් යන එක, picketing කරන එක, placards අල්ලා ගෙන ඉන්න එක වෙනම එකක්. දැන් මේ අය උද්ඝෝෂණය කරන්න අවි ආයුධත් අරගෙන යනවා; ගලුත් අරගෙන යනවා; පොලුත් අරගෙන යනවා; බෝම්බත් අරගෙන යනවා. එතකොට යම් හඬක් ඇති කරන්න නොවෙයි, විනාශයක් ඇති කරන්නයි ඒ කටයුතු කරලා තිබෙන්නේ. මේගොල්ලන්ගේ වැඩ ගැන මම ඊට වැඩිය කථා කරන්න යන්නේ නැහැ.

මේ අනුව අපි තේරුම් ගන්න ඕනෑ, යුරෝපයට support කරන්න, ලබන මාසයේ තිබෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සමුළුවට ගෙනෙන යෝජනාවට සහාය දෙන්න, ඒ යෝජනාව ගෙනෙන වෙලාවේ මෙහෙනුත් යම් කිසි බලපෑමක් ඇති කරන්න, යම් යම් දේශපාලන පක්ෂවල උත්සාහයක් තිබෙන බව. ඒ වාගේම තෙල් මිල වැඩි වීම පාවිච්චි කරලා, මේ විධියේ හඬක් ඇති කරලා හෝ ඒ බලපෑම ඇති කරන්න පුළුවන්ද කියලා උත්සාහ කරලා බලනවා.

තෙල් මිල වැඩි කළ නිසා බස් හිමියන්ට සහනයක් දෙනවා කියලා අපි කිව්වා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, please wind up now.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
මට තව විනාඩියක් දෙන්න.

බස් රථවලට, පාසල් ළමුන් ප්‍රවාහනය කරන වාහනවලට, ත්‍රී වීලර්වලට, ධීවරයන්ට, සමෘද්ධිය ලබන දුප්පත් අයට සහනයක් ලබා දෙනවා කියලා අපි මුලින්ම කිව්වා. එහෙම කියද්දීත් තමුන්නාන්සේලා මේ විරෝධතා කෙරුවේ අවුලක් ඇති කරන්න ඕනෑ නිසායි; ගැටුමක් ඇති කරලා, ඒක ජාත්‍යන්තරයට වාර්තා කරන්න ඕනෑ නිසායි. මේ විධියට කටයුතු කරලා ආණ්ඩුවක් පෙරළන්න පුළුවන්ද බලන්නයි, ඒ කුමන්ත්‍රණ ජය ගන්න පුළුවන්ද බලන්නයි ඒ උත්සාහය කෙරුවේ. ජනාධිපතිතුමා ධීවරයන් අතරටම ගිහිල්ලා සාකච්ඡා කරලා අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදයක් නැත්නම් එහෙම යන්න බැහැ. අපි තෙල් මිල වැඩි කළේ සතුටින්ද? නැහැ. ලිබියාවේ, ඊජිප්තුවේ, ඉරාකයේ, ඇෆ්ඝනිස්තානයේ ප්‍රශ්න ඇති වුණා. දැන් ඉරානයේ ප්‍රශ්න ඇති කරන්න යනවා. ඒ ප්‍රශ්න නිසා තෙල් මිල නඟින එක වළක්වන්න බැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, please wind up now.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
තව එක විනාඩියක් දෙන්න.

තමුන්නාන්සේලා ෆොන්සේකා මැතිතුමා ගැන කිව්වා. හාමුදුරුවෝ මහා නායක වෙලා සිටියත්, වැරැද්දක් කෙරුවොත්, ගැහැනු ළමයෙක් ඉදිරියේ වැරදියට හැසිරුණොත් එහෙම නඩුවක් දමනවා; සිවුරක් දමා ගෙන සිටියත් නඩු දමනවා.

ෆොන්සේකා මැතිතුමා ඒ කාලයේ කරපු යම් කිසි දූෂණයක්, වංචාවක් අනුව තමයි නඩු දාලා තිබුණේ. ඒ නඩුවට වැරදිකරු වෙලා, ශ්‍රේෂ්ඨාධිකරණයටත් ගියා. ඒවා එහෙමයි වෙලා තිබෙන්නේ. එතුමාගේ බෑනාව අද වන තෙක් ඉදිරිපත් කෙරුවේ නැහැ. ඒ, හොරකමට සම්බන්ධ නිසා එයාත් ඒකට අහු වෙයි, එයාටත් හිරේ යන්න වෙයි කියලා ඉදිරිපත් වුණේ නැහැ.

මම මේවා මතක් කරන්නේ මේකයි. මේ කුමන්ත්‍රණ කරලා, කොයි ආණ්ඩුව ගෙනැල්ලාද මේ රට බේරා ගන්න පුළුවන් වන්නේ? මේ ආණ්ඩුව පෙරළලා කොයි ආණ්ඩුවටද මේ රට

[ගරු අතාවුද සෙනෙවිරත්න මහතා]

බේරා ගෙන, රට වැසියෝ බේරා ගෙන ඉදිරියට යන්න පුළුවන්කම තිබෙන්නේ? මේ ආණ්ඩුව පෙරළලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන්න බැහැ. මේ රටේ අඛණ්ඩතාව හදන්න බැහැ; රටේ ප්‍රජාව රකින්න බැහැ. ඒකෙන් අපි බලාපොරොත්තු වන දේ නොවෙයි ලැබෙන්නේ. ඒ නිසා විරුද්ධ පාර්ශ්වයේ අය මේ වෙලාවේ වැරැදි විධියට දඟලන්නේ නැතුව කටයුතු කරන්න ඕනෑ. මේ රටත් රැක ගෙන ඉදිරියට යන්න, ජාත්‍යන්තර කුමන්ත්‍රණ පරාජය කරන්න, මේ රට සංවර්ධනය කරන්න, ඒ වාගේම ඒ වැඩ පිළිවෙළට උදවු දීමේ වෙලාව තමයි මේ ඇවිල්ලා තිබෙන්නේ කියන එක තමුන්නාන්සේලාට මතක් කරමින් මගේ කථාව අවසාන කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.24ට, 2012 මාර්තු මස 06 වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 7.24 மணிக்கு பாராளுமன்றம், 2012 மார்ச் 06, செவ்வாய்க்கிழமை பி.ப.1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 7.24 p .m. until 1.00 p.m.on Tuesday, 06th March, 2012.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් :** පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.